

2018

# වාර්ෂික
# වාර්තාව

සාර්ථක වීමට මඟ පෙන්වීම

ශ්‍රී ලංකා
රක්ෂණ
නියාමන
කොමිෂන් සභාව

# පටුන


| | |
|---|---|
| වසරේ වැදගත් සිදුවීම් | 4 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය | 6 |
| කොමිෂන් සභාවේ සාමාජිකයින් | 10 |
| කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව | 11 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 13 |
| කාර්ය මණ්ඩලය | 14 |
| සමාලෝචන | |
| පොදු සමාලෝචනය | 18 |
| සංඛ්‍යානමය සමාලෝචනය | 23 |
| මෙහෙයුම් සමාලෝචනය | |
| - අධීක්ෂණ සමාලෝචනය | 59 |
| - නියාමන සමාලෝචනය | 63 |
| - විමර්ශන සමාලෝචනය | 66 |
| - වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය | 70 |
| - පරිපාලනමය සමාලෝචනය | 72 |
| - මූල්‍ය සමාලෝචනය | 73 |
| මූල්‍ය තොරතුරු | |
| - මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 76 |
| - මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය | 77 |
| - ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙන්සවීමේ ප්‍රකාශනය | 78 |
| - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 79 |
| - රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 80 |
| - ගිණුම්කරණ ප්‍රතිපත්ති | 81 |
| - මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 83 |
| විගණකාධිපති වාර්තාව | 90 |
| විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම | 100 |
| පරිශිෂ්ඨය I | 107 |
| පරිශිෂ්ඨය II | 108 |
| පරිශිෂ්ඨය III | 110 |
| පාරිභාෂික ශබ්ද මාලාව | 111 |



# දැක්ම

ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ බවට පත්වීම.





# මෙහෙවර

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ අභිවෘද්ධිය සඳහා පහසුකම් සැලසීම සිදුකරලමින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සුරැකීම.

# වසරේ වැදගත් සිදුවීම්

- රක්ෂණ සමාගම් - 25
- රක්ෂණ තැරැව්කාර සමාගම් - 63
- රක්ෂණ සමාගම් නියෝජනය කරන රක්ෂණ නියෝජිතයින් - 44,919
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12ක ග්‍රාම නිලධාරී කොට්ඨාශ 773ක් වෙත ලබා දුන් රක්ෂණ දැනුවත්භාවය

## රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

| | 2018 | 2017 | වෙනස % |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන) | 181,506 | 164,960 | 10.03% |
| මුළු වත්කම් (රු. මිලියන) | 623,477 | 581,685 | 7.18% |
| දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස ව්‍යාප්තිය | 1.26 | 1.23 | 2.44% |
| රක්ෂණ ඝනත්වය (රු.) | 8,376 | 7,693 | 8.88% |

## කොමිෂන් සභාවේ කාර්යසාධනය

| | 2018 | 2017 | වෙනස % |
|---|---|---|---|
| ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රු. මිලියන) | 5,042.80 | 4,110 | 22.7% |
| සෙස් ආදායම (රු. මිලියන) | 479.09 | 418.23 | 14.6% |
| වාර්ෂික ගාස්තුව (රු. මිලියන) | 168.50 | 142.17 | 18.52% |

**රු.මිලියන 623,477**
රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්

**රු. මිලියන 181,506**
රක්ෂණ කර්මාන්තයේ ද.ලි.වා.ආ.



# කළමනාකරණ තොරතුරු

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය



"නාමික තත්ත්වයන් යටතේ ක්ෂේත්‍රයේ ලාභදායීත්වය 2017 හි වාර්තා වූ රු. මිලියන 49,084 සිට 2018 දී රු. මිලියන 37,017 දක්වා පහත වැටුනද 2018 දී ඒකෝච්ත අතිරික්තය (one off surplus) බැහැර කිරීමෙන් පසු ලාභදායීත්වය රු. මිලියන 36,636 ක් වශයෙන් වාර්තා වූ අතර එය 2017 දී වාර්තා වූ රු. මිලියන 33,217 ට සාපේක්ෂව 10.29% ක ලාභ වර්ධනයකි. සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය 19.52% ක වසරින් වසර වර්ධන අනුපාතයක් සමගින් ලාභයෙහි කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. සමාගම් 4 ක් හැරුනු විට සෙසු සාමාන්‍ය රක්ෂණ සමාගම් (10) ලාභ වර්ධනයන් වාර්තා කළේය. කෙසේවුවද, ඒකෝච්ත අතිරික්තය නොසළකා හල විට ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය යහපත් කාර්යසාධනයක් අත්පත් කරගැනීමට අපොහොසත් විය. 2018 දී සමාගම් 14 අතුරින් මෙහෙයුම් කටයුතු වලින් ලාභ වාර්තා කරන ලද්දේ සමාගම් 4 ක් පමණි."

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

කොමිෂන් සභාවෙහි සාමාජිකයින් සහ කාර්ය මණ්ඩලයෙහි මගපෙන්වීමෙන් හා සහයෝගයෙන් යුතුව අඛණ්ඩව 4 වැනි වසරේදීත් සැලසුම්ගත අරමුණු සාක්ෂාත්කර ගැනීම උදෙසා කොමිෂන් සභාව මෙහෙයවනු ලදුව, වසර 2018 සඳහා වූ කොමිෂන් සභාවෙහි කාර්යසාධනයන් මෙසේ සටහන් කිරීමට හැකිවීම මා හට ඉමහත් වූ අභිමානයකි.

අභියෝග රැසකින් පිරි මෙම වසර තුළ වඩාත් සවිමත්ව හා ස්ථාවරව නියාමනය, අධීක්ෂණය සහ ක්ෂේත්‍රයේ සංවර්ධනය ආශ්‍රිතව පහසුකම් සැලසීම යන අපගේ කාර්යභාරය ඉටු කිරීමට අපි කටයුතු කළෙමු. වසර තුළදී වෙන වෙනම මණ්ඩල ත්‍රිත්වයක් ස්වකීය කාර්යභාරයන් ඉටු කරනු දක්නට ලැබිණි. දිගු කාලීන කොමිසමෙහි නිල කාලය 2018 පෙබරවාරි මස අවසන් විය. දෙවන අනුප්‍රාප්තික මණ්ඩලය අප්‍රේල් මස සිට ඔක්තෝබර් 26 වැනි දින දක්වා කටයුතු කිරීමෙන් අනතුරුව රජය වෙනස්වීමත් හේතුවෙන් ඉල්ලා අස්වීම සිදු කරන ලද අතර, ඉන්පසු වසර 2019 සිට අඛණ්ඩව ක්‍රියාත්මක විය. කොමිසමෙහි කාර්යභාරයන් නිසි පරිදි ඉටු කිරීම සඳහා පහසුකම් සලසනු වස් තෙවන මණ්ඩලය 2018 අවසාන කාර්තුව තුළ සිය මෙහෙයුම් සිදු කලේය. ස්වකීය මහඟු මාර්ගෝපදේශනය වෙනුවෙන් වසර තුළ සේවා සලසන ලද කොමිෂන් සභාවෙහි සියළුම සාමාජිකයින් වෙත මාගේ ප්‍රණාමය පුද කරමි.

## ප්‍රමුඛ නියාමන ව්‍යාපෘති

කොමිසම මගින් වසර 2018 දී ඇතැම් නීතිරීති, රෙගුලාසි සහ නිර්ණායකයන් සංශෝධනය කරමින් ක්ෂේත්‍රය වෙත නව නියෝගයන් නිකුත් කරන ලදී. ඒවා, වර්ධනය වෙමින් පවතින නියාමන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සිදුකරන ලද වාර්තාකරණ ආකෘතීන් ආශ්‍රිත ප්‍රතිශෝධනයන් සහ ඇතැම් ගාස්තු ව්‍යුහයන් ආශ්‍රිත ප්‍රතිශෝධනයන් වශයෙන් වර්ගීකරණයට ලක් කළ හැකි වේ.

ඒකෝච්ත අතිරික්තය (one off surplus) ආශ්‍රිත හා කාර්තුමය වශයෙන් බාහිර විගණකවරයාගේ සහතිකත්ව අවශ්‍යතාව ඇතුළත් කිරීම යන අවශ්‍යතා සපුරාලීම උදෙසා කාර්තුමය විස්තර වාර්තා ආකෘතිය වෙතද, රක්ෂණ තැරැව්කරුවන්ගේ කාර්තුමය විස්තර වාර්තා ආකෘතිය වෙතද, වාර්තාකරණ ආකෘතීන් ආශ්‍රිත ප්‍රතිශෝධනයන් සිදු කරන ලදී.

වසර තුළදී ඇතැම් ගාස්තු ව්‍යුහයන්ද සංශෝධනය කෙරිණි. එහිදී රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි එක් කාණ්ඩයක් සඳහා රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචිවීමේ ගාස්තුව රු.100,000/- සිට රු.150,000/- දක්වා ඉහළ නැංවිනි.

කොමිෂන් සභාව මගින්, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයෙහි අදහස් සැළකිල්ලට ගනිමින් රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචි විය. නැවත අළුත්කිරීමේ ගාස්තුව අඩු කිරීමක් ක්‍රියාත්මක කරන ලදී. අදාළ සංශෝධිත ගාස්තුව 2018 අගෝස්තු 13 වැනි දින සිට අදාළ විය.

ප්‍රධාන වශයෙන් කුසලතා සංචිතයෙහි ව්‍යාප්තීකරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් කොමිසමෙහි වියදම් ඉහළ යාම හේතුවෙන් රක්ෂකයන් විසින් දළ ලිඛිත වාරිකය මත ගෙවනු ලබන වාර්ෂික ගාස්තුව 0.10% සිට 0.125% දක්වා ඉහළ නැංවුනි.

නව නියෝග වශයෙන් කොමිෂන් සභාව මගින් රක්ෂණ ක්ෂේත්‍රය තුළ වංචා හෝ මුදල් අවභාවිතය හේතුවෙන් සේවයෙන් නෙරපන ලද පුද්ගලයින් සේවයේ යෙදීම සීමා කිරීමේ අරමුණින් යුතුව, ක්ෂේත්‍රයේ සමාගම් මගින් එබඳු පුද්ගලයින් සේවයේ යොදවා ගැනීම වළකාලමින් නියෝග අංක 14 නිකුත් කරන ලදී. මෙම නියෝගය නිකුත් කරන ලද්දේ උදක්ම රක්ෂණවර හිමියන්ගේ අයිතීන් සුරැකීමේ හා ක්ෂේත්‍රයේ සුපිළිපන්බව වර්ධනය කිරීමේ අරමුණිනි.

තවත් නියෝගයක් ඔස්සේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ රක්ෂණ අරමුදල් කළමනාකරණය සම්බන්ධ ක්‍රියාපටිපාටීන් ස්ථාපනය කෙරිණි. මෙම නියෝගය මගින් ස්වකීය අරමුදල් කළමනාකරණයේදී සමාගම් මගින් ආදේශ කරගැනීම සඳහා ඒකමිතික ක්‍රියාපටිපාටීන් විදහා දක්වනු ලැබේ. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ අරමුදල් සම්බන්ධ විනිවිදභාවය ඇති කිරීම සහ එකිනෙකට වෙනස් උප කාණ්ඩයන් වෙත අරමුදල් වෙන්කිරීම මෙම නියෝගයෙහි අරමුණ වේ.

තවත් බොහෝ කලක් තිස්සේ අපේක්ෂා කරන ලද නියෝගයක් වූයේ රක්ෂණ ක්ෂේත්‍රයේ සාංගමික පාලනය සම්බන්ධ නියෝගයයි. මෙම නියෝගය පිළියෙල කිරීමේදී, අප විසින් බැංකුකරණ ක්ෂේත්‍රයට අදාළ පාලනය සම්බන්ධ නීතිරීති, ලැයිස්තුගත සමාගම් වලට අදාළ සාංගමික පාලන නීතිරීති සහ ක්ෂේත්‍රයට අදාළ ඇතැම් විශේෂිත නීතිරීති පිළිබඳව අවධානය යොමු කෙරිණි. මෙම පාලන ආකෘතිකරාමුව කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ සියළුම බලපත්‍රලාභී රක්ෂණ සමාගම් වෙත අදාළ වන අතර, එය 2019 ජූලි මස සිට බලපැවැත්වේ. අදාළ රක්ෂකයින්ගේ වාර්ෂික වාර්තාවන්හි අනුකූලතා හෙළිදරව්කිරීමක් ඉදිරිපත් කිරීමද මෙම ආකෘතිකරාමුවෙහි අවශ්‍යතාවයකි.

## රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යසාධනය

### දළ ලිඛිත වාරිකය

වසර 2018 දී දළ දේශීය නිෂ්පාදිතය පහළයාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කිරීම හමුවේ රක්ෂණ ක්ෂේත්‍රයද දළ ලිඛිත වාරික වර්ධනය 15.3% (2017) සිට 10.03% (2018) දක්වා අඩුවීමක් වාර්තා කලේය. වසර තුළ උපයන ලද වාරික මුදල රු. මිලියන 16,546 ක් පමණ වූ අතර වසර අවසානයේදී දළ ලිඛිත වාරිකය රු. මිලියන 181,506 ක් වශයෙන් වාර්තා විය. මෙම පහළයාම කෙරෙහි වසර තුළ පැවති ආර්ථික හා දේශපාලනික අස්ථාවරත්වයන් හමුවේ ව්‍යාපාරික විශ්වාසය පළුදුවීම බලපාන්නට ඇත. පදනම් ලකුණු 50 කින් පමණ පහළයමින්, සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයෙහි වර්ධන අනුපාතය 2017 හි පැවති 17.3% සිට 2018 දී 8.3% දක්වා පහත වැටීම මගින් මේ බව මැනවින් සනාථ වන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 ට සාපේක්ෂව සමස්ත දළ ලිඛිත වාරිකය පහළ අගයක් වාර්තා කලේය. ගිනි, මෝටර් රථ, විවිධ යන කාණ්ඩයන්හි පහළ දළ ලිඛිත වාරික වර්ධනය සහ සෞඛ්‍ය රක්ෂණ ක්ෂේත්‍රයෙහි සෘණාත්මක වර්ධනය සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයෙහි දළ ලිඛිත වාරිකය පහළ යාම කෙරෙහි දායක විය. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ඇතැම් ජීවිත රක්ෂණ සමාගම් වල සංකේන්ද්‍රණය ද සාමාන්‍ය රක්ෂණ සමාගම් සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රය ආශ්‍රිතව දළ ලිඛිත වාරිකය සම්බන්ධ සෘණාත්මක වර්ධනයක් ඇතිවීම කෙරෙහි හේතු පාදක විය.

සාමාන්‍ය රක්ෂණ කාණ්ඩයෙහි සමස්ත දළ ලිඛිත වාරිකයෙන් 61% කට පමණ

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

දායකත්වය සපයන ලද මෝටර් රක්ෂණ ව්‍යාපාරය වසර 2015 පැවැති 19.10% සිට 2018 දී 11.47% දක්වා අවගමනකාරී වර්ධන අනුපාතයක් වාර්තා කලේය.

තවත් කැපීපෙනෙන සිදුවීමක් වශයෙන් ප්‍රමුඛ සමාගම් 5 හි වෙළඳපොල කොටස 69% (2017) සිට 74% දක්වා ඉහළයාම දැක්විය හැකි අතර, ඒ හේතුවෙන් දළ ලිඛිත වාරිකය වෙත සෙසු සාමාන්‍ය රක්ෂණ සමාගම් වල දායකත්වය 31% (2017) සිට 26% දක්වා පහත වැටිනි.

කෙසේවුවද, වසර 2017 සහ 2018 දී 12% වැඩි වර්ධනයක් සමගින් ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධන ප්‍රවණතාව අඛණ්ඩවම ස්ථාවර තත්ත්වයක පැවතිනි. වසර 2018 දී රු. මිලියන 80,303 ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමින් දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය මගින් සමස්ත දළ ලිඛිත වාරිකයෙන් 44% ක් සඳහා දායකත්වය සපයන ලදී. එහිදී දිගු කාලීන ව්‍යාපාරයෙහි සමස්ත දළ ලිඛිත වාරිකය වෙත ලාභය සඳහා හිමිකම් ලද (Par), ලාභය සඳහා හිමිකම් නොලද (Non Par) සහ සබැඳි (Linked) හි දායකත්වය පිළිවෙලින් රු. මිලියන 20,588 ක්, රු. මිලියන 57,660 ක් සහ රු. මිලියන 2,053 ක් විය. තවද 2017 සමග සැසඳීමේදී වසර 2018 දී ලාභය සඳහා හිමිකම් ලද (Par) සහ සබැඳි (Linked) දිගු කාලීන ව්‍යාපාරය පිළිවෙලින් 7.3% ක සහ (0.13%) ක වර්ධනයක් වාර්තා කලේය. එමගින් 2018 දී 14.6% ක වර්ධන අනුපාතයක් වාර්තා කරන ලද ලාභය සඳහා හිමිකම් නොලද (Non Par) සැලසුම් අලෙවි කිරීම කෙරෙහි රක්ෂණ සමාගම් මගින් වැඩි අවධානයක් යොමු කරනු ලබන බව පැහැදිලි වේ. මේ සඳහා එක් හේතුවක් වශයෙන් අතිරික්ත මාරුකිරීම් මත රක්ෂණවර හිමියන්ගෙන් අය කරනු ලබන ඉහළ බදු මුදල දැක්විය හැක.

තවද, කැපීපෙනෙන ඉහළ යාමක් නිරූපනය කරන ලද ප්‍රමුඛ රක්ෂණ සමාගම් 5 හි වෙළඳපොල කොටසට සාපේක්ෂව, දිගු කාලීන ව්‍යාපාරයන්ගෙන් සමස්ත දළ ලිඛිත වාරිකය වෙත දායකත්වය 80.26% (2017) සිට 80.95% (2018) දක්වා අතිශයින්ම සුළු වර්ධනයක් පමණක් වාර්තා කලේය.

2017 දී නිකුත් කරන ලද නව දිගු කාලීන රක්ෂණවර සංඛ්‍යාව වූ 643,483 ට සාපේක්ෂව 2018 දී 10.65% ක වර්ධනයක් සමගින් නව දිගු කාලීන රක්ෂණවර 712,013 ක් නිකුත් කරන ලදී. සක්‍රීයව පවතින මුළු ජීවිත රක්ෂණවර සංඛ්‍යාව 4.79% වර්ධනයක් සමගින් 3,215,911 කරා ළඟා වූ අතර එමගින් සේවාලාභීන් තුළ ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය ආශ්‍රිත සුබවාදී දැක්ම පිළිබිඹු කෙරේ.

2018 දී සාමාන්‍ය රක්ෂණවර සංඛ්‍යාවද 5.94% ක වර්ධනයක් සමගින් 6,492,003ක් වශයෙන් වාර්තා විය. එහිදී 5,614,901ක් වූ මෝටර් රක්ෂණවර අතුරින් පරිපූර්ණ ආවරණයට සාපේක්ෂව 3වන පාර්ශ්වීය රක්ෂණවරයන්ගෙන් ඉහළම දායකත්වය හිමි විය. 7% ක ඍණාත්මක වර්ධනයක් වාර්තා කල පරිපූර්ණ ආවරණය සමග සසඳන කල තෙවන පාර්ශ්වීය රක්ෂණවරයන් 14.6% ක වර්ධනයක් පෙන්නුම් කලේය.

## ලාභදායීත්වය

නාමික තත්ත්වයන් යටතේ ක්ෂේත්‍රයේ ලාභදායීත්වය 2017 හි වාර්තා වූ රු. මිලියන 49,084 සිට 2018 දී රු. මිලියන 37,017 දක්වා පහත වැටුනද 2018 දී ඒකෝචිත අතිරික්තය (one off surplus) බැහැර කිරීමෙන් පසු ලාභදායීත්වය රු. මිලියන 36,636ක් වශයෙන් වාර්තා වූ අතර එය 2017 දී වාර්තා වූ රු. මිලියන 33,217 ට සාපේක්ෂව 10.29% ක ලාභ වර්ධනයකි. සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය 19.52% ක වසරින් වසර වර්ධන අනුපාතයක් සමගින් ලාභයෙහි කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කලේය. සමාගම් 4 ක් හැරුනු විට සෙසු සාමාන්‍ය රක්ෂණ සමාගම් (10) ලාභ වර්ධනයන් වාර්තා කලේය. කෙසේවුවද, ඒකෝචිත අතිරික්තය නොසළකා හල විට ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය යහපත් කාර්යසාධනයක් අත්පත් කරගැනීමට අපොහොසත් විය. 2018 දී සමාගම් 14 අතුරින් මෙහෙයුම් කටයුතු වලින් ලාභ වාර්තා කරන ලද්දේ සමාගම් 4 ක් පමණි. මෙයට හේතුව වශයෙන් පසුගිය වසර පහක කාලය ඇතුළත ගෙවන ලද ඉහළම හිමිකම්පෑම් වටිනාකම වන රු. මිලියන 34,337 ක මුදලක් වසර 2018 දී ගෙවනු ලැබීම දැක්විය හැක.

## සිදුකෙරෙමින් පවතින ප්‍රමුඛ නියාමන ප්‍රතිසංස්කරණ

රජය මගින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛ නියාමන ආයතනයක් වශයෙන් හඳුනාගනු ලැබ ඇති අතර, එමගින් මූල්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා කොමිෂන් සභාවෙහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතිය යටතේ ලබාගන්නා ලද ණය මුදලෙන් ඩොලර් මිලියන 9 ක මුදලක් වෙන් කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය දැනටමත් අරඹනු ලැබ ඇති අතර, ක්ෂේත්‍රය සඳහා සැලසුම්ගත අදියර මට්ටමේ ප්‍රතිසංස්කරණ ඔස්සේ 2022 දක්වා ක්‍රියාත්මක වනු ඇත. එවැනි එක් කැපීපෙනෙන ප්‍රතිසංස්කරණයක් වනුයේ, අධීක්ෂණ ක්‍රියාවලිය වඩාත් ඵලදායී තත්ත්වයට පත් කිරීම උදෙසා තොරතුරු තාක්ෂණ සහායද සහිතව අංග සම්පූර්ණ අවදානම් මත පදනම් වූ අධීක්ෂණ පද්ධතියක් වෙත සංචරණය වීමයි. කොමිෂන් සභාව මගින් අවධානය යොමු කරනු ලැබ ඇති ප්‍රධාන ප්‍රතිසංස්කරණ අතර IFRS 17 වෙත පරිවර්තනය වීම ක්‍රියාවට නැංවීම, රක්ෂණ අධීක්ෂකයින්ගේ ජාත්‍යන්තර සංගමයෙහි (IAIS) රක්ෂණ මූලික ප්‍රතිපත්ති වලට සමගාමී වූ පුළුල් බලතල සහිත නව රක්ෂණ නියාමන පනත ක්ෂුද්‍ර රක්ෂණ නියාමනය, අධීක්ෂණය සහ නිෂ්පාදන සංවර්ධන සමාලෝචනය (Product Development Review) ප්‍රධාන ප්‍රතිසංස්කරණයන් ලෙස සලකා බැලෙන කරුණු අතර වේ.

බොහොමයක් ප්‍රතිපත්තිමය ව්‍යාපෘතීන් ආශ්‍රිතව සපයන ලද නිසි මාර්ගෝපදේශකත්වය සම්බන්ධයෙන් සභාපතිවරයා සහ කොමිසමෙහි සාමාජිකයින් වෙත මාගේ ප්‍රණාමය පුද කෙරේ. ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමෙහිලා දක්වන ලද නිරන්තර සහයෝගය වෙනුවෙන් රක්ෂණ ක්ෂේත්‍ර සංගම් වෙත මාගේ කෘතඥතාවය පළ කෙරෙන අතර, අවසන් වශයෙන් කොමිෂන් සභාවෙහි අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා දරන ලද ප්‍රශංසනීය ප්‍රයත්නයන් උදෙසා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි කාර්ය මණ්ඩලය වෙත මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනැමේ.



**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජනරාල්



# කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ කාර්ය මණ්ඩලය

# කොමිෂන් සභාවේ සාමාජිකයින්




[1] මනෝ තිත්තවැල්ල මහතා - සභාපති
[2] ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා
[3] එච්. ඒ. කරුණාරත්න මහතා
[4] ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා
[5] වයි. කනගසබේ මහතා
[6] එරල් පෙරේරා මහතා
[7] උපුල් දේශප්‍රිය මහතා

# කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව

## (1) මනෝ තිත්තවැල්ල මහතා සභාපති

මනෝ තිත්තවැල්ල මහතා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ.

මනෝ තිත්තවැල්ල මහතා ශ්‍රී ලංකාවේ සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ මහ ලේකම්වරයා වේ. හෙතෙම ගරු මුදල් අමාත්‍යවරයාගේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයා වශයෙන්ද කටයුතු කරයි.

තිත්තවැල්ල මහතා 2003 අගෝස්තු මස සිට 2005 නොවැම්බර් මස දක්වා ආර්ථික කටයුතු සම්බන්ධ ජ්‍යෙෂ්ඨ ජනාධිපති උපදේශකවරයා සහ ජනාධිපති කාර්යාල ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන්ද ක්‍රියා කලේය. හෙතෙම ක්‍රමෝපායික ව්‍යවසාය කළමනාකරණ ඒජන්සියේ (SEMA) ප්‍රථම සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය ව්‍යවසායන්හි වගවීම, යහ පාලනය සහ කාර්යසාධනය වර්ධනය කිරීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කලේය. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණයේ උත්තරීතර ආයතනය වන ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික කවුන්සිලයේ (NCED) අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු වශයෙන් සේවය කිරීමට අමතරව ඒ මහතා, මෙරට පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිසාධනය සඳහා ස්ථාපනය කරන ලද ජාතිය යළි ගොඩනැංවීම සඳහා වන කාර්ය බලකායේ (TAFREN) සභාපතිවරයා වශයෙන් ද කටයුතු කලේය.

තිත්තවැල්ල මහතා එවකට ශ්‍රී ලංකා රජයේ පෞද්ගලීකරණ නියෝජිත ආයතනය වූ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමෙහි (PERC) අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුවේ සභාපති සහ ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වැනි රජයේ ඉහළ තනතුරු රැසක් හොබවා ඇත. පෞද්ගලික අංශයේද ජ්‍යෙෂ්ඨ නිලතල දරමින් අවුරුදු 35 කට අධික අත්දැකීම් මනෝ තිත්තවැල්ල මහතා සතුය.

මනෝ තිත්තවැල්ල මහතා කොළඹ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ අතර එඩින්බර්ග් සරසවියේ ප්‍රාග්ධන වෙළඳපොල සහ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි. හෙතෙම බ්‍රිතාන්‍ය විවෘත විශ්ව විද්‍යාලයේ මානව පරිගනක අන්තර් ක්‍රියාකාරීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකුද වේ. ඒ මහතා වසර 2000 සිට 2003 දක්වා ජාත්‍යන්තර භාරකාරත්ව මණ්ඩලයේ සහ එක්සත් රාජධානි වරලත් අලෙවිකරුවන්ගේ සංගමයේ සාමාජිකයකු වශයෙන්ද කටයුතු කලේය.

## (2) ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා

ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු වන අතර මහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තුවල වසර 25ට අධික සේවා පළපුරුද්දක් ඔහු සතු වේ. වර්තමානයේ ඔහු ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙක් ලෙස සේවය කරයි.

මෙම කාල සීමාව තුළ ඔහු ජාත්‍යන්තර මූල්‍ය, මූල්‍ය වෙළඳපළ, ප්‍රාථමික අංශ සංවර්ධනය, ක්ෂුද්‍ර මූල්‍ය අංශය සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා සංවර්ධන මූල්‍යයෙහි ක්‍රමෝපායික සැලසුම්කරණය ආදී විවිධ අංශයන්හි සේවය කළ අතර සහකාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආදී මහා භාණ්ඩාගාරයේ විවිධ තනතුරු දරා ඇත. ඔහු මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් යන වර්තමාන තනතුරේ රාජකාරී භාර ගැනීමට පෙර සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කළේය. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ඔහු විසින් ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද “සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය” (SMERDP) නම් වූ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම, ලෝක බැංකුව මගින් අරමුදල් සපයන ලද “සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන පහසුකම් ව්‍යාපෘතිය” (SMEDeF), ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද “සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය දාමය” (SMELoC) ක්‍රියාත්මක කරන ලදි. තවද ඔහු විසින් ජර්මන් ජාත්‍යන්තර සංස්ථාව මගින් අරමුදල් සපයන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන හා ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද “Rooftop Solar Power Generation Line of Credit” (RSPGLOC) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

වර්තමානයේ අතපත්තු මහතා “එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය” භාරව කටයුතු කරන අතර ඔහු භාණ්ඩාගාරය නියෝජනය කරමින් මහජන බැංකුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ජාතික ලොතරැයි මණ්ඩලයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරයි.

අතපත්තු මහතා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ කළමනාකරණ උපාධියක් ලබාගෙන ඇති අතර ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්ව විද්‍යාලය වෙතින් ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. තවද ඔහු කොළඹ විශ්ව විද්‍යාලය වෙතින් පිරිනමන ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක් හා ජපානයේ ආර්ථික වර්ධන ආයතනය වෙතින් පිරිනමන සංවර්ධන ආර්ථිකය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක් ලබා ඇත.

## (3) එච්.ඒ. කරුණාරත්න මහතා

එච්. ඒ. කරුණාරත්න මහතා දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි මූල්‍ය සේවා අංශවලට අදාළ අත්දැකීම් රැසක් ඔහු සතු වේ. ඔහු මුදල් ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයෙකු වන අතර මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවේ, ජාතික ගෙවීම් කවුන්සිලයේ හා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන අධීක්ෂණ කමිටුවේ සභාපති ද වේ. ඔහු ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ

ආයතනයෙහි සභාපති ලෙස සේවය කරයි. මීට අමතරව, ඔහු සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, කොළඹ ඩොක්යා(ර්)ඩ් සහ වෙස්ට් කෝස්ට් පවර් (පුද්) සමාගමෙහි යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. ඔහුගේ වසර තිස් තුනක වෘත්තීය ජීවිතය තුළ ඔහු දැරූ ප්‍රධාන තනතුරු වන්නේ මුදල් මණ්ඩලයේ සහකාර අධිපති හා ලේකම්, මුදල් මණ්ඩල උපදේශක විගණන කමිටුවේ ලේකම්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණුදෙනුකරු වේ.

කරුණාරත්න මහතා සිංගප්පූරුවේ රෙෆ්කෝ පුද්ගලික සමාගමේ ස්ථාවර ආදායම් දෙපාර්තමේන්තුවේ සහ සිංගප්පූරුවේ මෑන් ෆයිනෑන්ෂල් පුද්ගලික සමාගමේ උප සභාපති වශයෙන් සිංගප්පූරුවේ වෙළඳ අනාගත විකල්ප සහ වෙනත් ව්‍යුත්පන්න නිෂ්පාදන පිළිබඳ මූල්‍ය අධිකාරියෙන් බලපත්‍රය ලබාගන්නා ලදි.

කරුණාරත්න මහතා 2009 මැයි මස සිට 2015 ඔක්තෝම්බර් දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ හා වෙළඳපළ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු විය. ඔහු ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වෙතින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් හා ඇමරිකාවේ ඔහියෝ විශ්ව විද්‍යාලය වෙතින් ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගෙන ඇත. තවද ඔහු වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරයි.

කරුණාරත්න මහතා සංචිත හා ආයෝජන කළඹ කළමනාකරණය පිළිබඳ විවිධ දේශීය හා විදේශීය සංසදවල දේශකයෙකු ද වේ.

## (4) ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා

ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යාව පිළිබඳ ගෞරව ශාස්ත්‍රවේදී උපාධිධරයෙකු සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳ උපාධිධාරියෙකු වේ. එසේම ඒ මහතා එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණය සහ බුද්ධිමය දේපල විෂයයන් සමඟින් ජාත්‍යන්තර ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් නීතිය පිළිබඳ පශ්චාත් උපාධිධරයෙකු වේ. වෘත්තියෙන් නීතිඥවරයෙකු වන ඒ මහතා 1988 දී සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සේවයට එක් වන අතර දැනට වසර 30 කට අධික කාලයක් මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන ඒ මහතා වර්තමානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වන සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් ලෙස රාජකාරි කරනු ලබයි. ඒ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයෙහි, ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් අධීක්ෂණ මණ්ඩලයෙහි සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙහි නිලබලයෙන් සාමාජිකයකු වේ.

## (5) වයි. කනගසබේ මහතා

2018 පෙබරවාරි 1 වැනි දින සිට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂකවරයකු වශයෙන් කටයුතු කරන කනගසබේ මහතා, විගණන කමිටුවේ සභාපතිවරයාද, පාරිශ්‍රමික හා ප්‍රතිලාභ කමිටුවේ සාමාජිකයකුද වේ.

හෙතෙම ලංකා දුම්කොළ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ සභාපතිවරයා වශයෙන්ද, මිලේනියම් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගමෙහි, සීමාසහිත කාර්ගිල්ස් ෆුඩ් සමාගමෙහි, සීමාසහිත හන්ටර්ස් පීඑල්සී සහ ලංකා කැනරීස් සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂකවරයකු සහ විගණන කමිටුවේ සාමාජිකයකු වශයෙන්ද කටයුතු කරයි.

හෙතෙම 2016 අගෝස්තු මස සිට 2018 දෙසැම්බර් 31 දින තෙක් යුනියන් බැංකුව පීඑල්සී (ටෙක්සාස් පැසිෆික් සමූහයේ අනුබද්ධ ආයතනයකි) විගණන කමිටු සභාපතිවරයා වශයෙන්ද, වසර 2006 දී ප්‍රයිස්වොටර්හවුස්කූපර්ස් හි ජ්‍යෙෂ්ඨ හවුල්කරු/ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන්ද සේවය කළේය. ඒ මහතා 2017 මාර්තු මස 31 වැනි දින සේවයෙන් විශ්‍රාම ලැබීය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයෙහි සාමාජිකයකු වන හෙතෙම ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් ආරම්භයේ පටන් සේවය කළේය.

## (6) එරල් පෙරේරා මහතා

එරල් ඒ. ඩී. පෙරේරා මහතා එංගලන්තය, මැලේසියාව සහ ශ්‍රී ලංකාව යන රටවල විවිධ වර්ගයේ ව්‍යාපාරික අංශයන්හි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හොබවන ලද පරිනත වෘත්තිකයෙකි. පෙරළා ශ්‍රී ලංකාවට පැමිණීමෙන් අනතුරුව හෙතෙම විදේශ ආයෝජන සහ තාක්ෂණික හුවමාරු සහිත හවුල් ව්‍යාපාර ව්‍යාපෘතීන් ප්‍රවර්ධනය කෙරෙහි සිය අවධානය යොමු කළේය. ඒ මහතා දුරකථන නාමාවලි ප්‍රකාශනය, ජේ ෆෝන් සහ ජේජර් හවුල් ව්‍යාපාර ව්‍යාපෘතීන් සඳහා පුරෝගාමී තත්ත්වයේ ආයෝජන මණ්ඩල අනුමැතිය ලබාගැනීමට සමත් විය. කොමර්ෂල් බැංකුව සහ විදේශීය සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ වෙන්චර් කැපිටල් සහ ඒකක භාර ඇරඹුම් ව්‍යාපෘතීන් දියත් කිරීම උදෙසාද හෙතෙම ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. වසර 1990 දී සභාපතිවරයාගේ ජාත්‍යන්තර කුසලානය (මේ වන විට Verizon USA නමින් හැඳින්වෙන) දිනාගත් සාඩම්බර ජයග්‍රාහකයා වූයේද පෙරේරා මහතාය. වසර 1995 දී ඔහුගේ ප්‍රමුඛත්වයෙන් යුතුව, දුරකථන නාමාවලි ප්‍රකාශන කණ්ඩායම විසින් එදාමෙදා තුර ශ්‍රී ලංකාවේ ප්‍රථම තත්ත්ව සම්මානය දිනාගැනීමට සමත් විය. ඒ මහතා ඇමරිකානු වාණිජ මණ්ඩලයේ ආරම්භක සාමාජිකයෙකි. හෙතෙම මේ වන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික සමාගම් කිහිපයක ස්වාධීන අධ්‍යක්ෂකවරයකු වශයෙන් කටයුතු කරයි.

## (7) උපුල් දේශප්‍රිය මහතා

වෘත්තියෙන් නීතිඥවරයකු වන දේශප්‍රිය මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ එල්එල්බී (ගෞරව) උපාධිධරයෙකි. හෙතෙම 2015 සිට 2018 දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයකු වශයෙන්ද 2014 සිට 2016 දක්වා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු භාණ්ඩාගාරිකවරයා වශයෙන්ද කටයුතු කළේය.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම




[1] දමයන්ති ප්‍රනාන්දු මහත්මිය (අධ්‍යක්ෂ ජනරාල්)
[2] චමරී ඒකනායක මහත්මිය (අධ්‍යක්ෂ - අධීක්ෂණ)
[3] සතීෂ් කුමාර් මහතා (අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන)
[4] කසුනි පින්නවල මහත්මිය (අධ්‍යක්ෂ - නීති)
[5] රාජන් නිරූබසිංහම් මහතා (සහකාර අධ්‍යක්ෂ - නීති)
[6] බිම්සර විජේසිංහ මහතා (සහකාර අධ්‍යක්ෂ - වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා)
[7] සාරිකා වත්තුහේවා මහත්මිය (සහකාර අධ්‍යක්ෂ - අධීක්ෂණ)

# කාර්ය මණ්ඩලය



වමේ සිට දකුණට

තුෂාරි විජේගුණවර්ධන මහත්මිය, පවිත්‍රා පුංචිහේවා මහත්මිය, එතිර්රාජ් ශ්‍රීකාන්තන් මහතා, කෞශාලි දයාරත්න මහත්මිය, ප්‍රියංගි ද සිල්වා මහත්මිය



වමේ සිට දකුණට

නිලංකා වලිසුන්දර මහත්මිය, ජයනි රාජපතිරණ මෙනවිය, උපලක්ෂි රණසිංහ මෙනවිය, රොෂාන් ද කොස්තා මහතා, චන්දිමා කඹුරුගමුව මහත්මිය, කෝකිලා සිරිවර්ධන මහත්මිය, ලක්ෂ්මන් විජේසිංහ මහතා

## කාර්ය මණ්ඩලය



වමේ සිට දකුණට

චතුනි තල්පාවිල මෙනවිය, ශානිකා නානායක්කාර මහත්මිය, ඩෙසිකා රත්නායක මහත්මිය, නයන රවීන්ද්‍ර මහතා, තිළිණි වාකිෂ්ඨ මහත්මිය, චානක ලංකානාත මහතා



වමේ සිට දකුණට

ශිරෝමි රත්නායක මෙනවිය, උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය, ඩී.ඩබ්ලිව්.එස්.එස්. සුපුලි මහත්මිය, ෂශිනි ප්‍රේමලාල් මහත්මිය, කළණ පුෂ්පකුමාර මහතා, වින්ද්‍යානි තුලපිටිය මහත්මිය

# කාර්ය මණ්ඩලය



වමේ සිට දකුණට

ලසන්ති තොටහේවා මහත්මිය, චමින්ද ලාල් කුමාර මහතා, රුවිනි ලියනගේ මහත්මිය, චරිත වික්‍රමසිංහ මහතා, අනුෂ්ක බණ්ඩාර මහතා, ශ්‍යාමලී අත්තනායක මහත්මිය, මෙරීනා ඩයස් මහත්මිය



වමේ සිට දකුණට

නලින් තලගල මහතා, වීණා සෙනෙවිරත්න මහත්මිය, ලක්මිණ පතිරාජ මහතා, මල්හාරී වික්‍රමසිංහ මහත්මිය, සුජීවා රණසිංහ මහත්මිය, සනත් උදයංග මහතා, සඳමාලි කරුණාතිස්ස මෙනවිය, සමන් සේනාධීර මහතා



# සමාලෝචන


| | |
|---|---|
| පොදු සමාලෝචනය | 18 |
| සංඛ්‍යානමය සමාලෝචනය | 23 |
| මෙහෙයුම් සමාලෝචනය | 59 |

# පොදු සමාලෝචනය

## පනත ක්‍රියාත්මක කිරීම සහ නියාමන ප්‍රතිසංස්කරණ

### නීති සම්පාදනය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සද්භාවයෙන්ද වෘත්තීමය හා විචක්ෂණභාවයෙන්ද යුතුව කරගෙන යනු ලබන බවට සහතික කිරීම (මෙහි මින් මතු කොමිෂන් සභාව යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පරමාර්ථය හා වගකීම වේ.

රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම් රක්ෂණ නියෝජිතයන් හා අලාභ ගලපන්නන් නියාමනය හා අධීක්ෂණය සඳහා අවශ්‍ය නෛතික රාමුව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙහි මින්මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් සලසා ඇත.

මෙම පනත 2007 අංක 27, 2011 අංක 3 සහ 2017 අංක 23 දරන කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් වලින් සංශෝධනය වී ඇත.

### උප නීති සම්පාදනය

පනත යටතේ වර්ෂ තුල නිකුත් කරන උප නීති පහත නියාමන ප්‍රතිසංස්කරණ යටතේ දක්වා ඇත.

නියාමන ප්‍රතිසංස්කරණ පනත් සංශෝධනයේ වෙනත් කරුණු අතරතුර ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ලෙස ශ්‍රී ලංකා රක්ෂණ නියාමකගේ නාමය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙසට වෙනස් කිරීම ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කිරීම ආදී කරුණු 2017 අංක 23 දරන සංශෝධන පනත මගින් පහත සඳහන් වෙනස්කම් පනතට සිදුකරන ලදී.

### නියාමන ප්‍රතිසංස්කරණ

#### රීති

i) **රක්ෂණ තැරැව්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා වන ලියාපදිංචි ගාස්තුව වැඩි කිරීම**

රක්ෂණ තැරැව්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා වන ලියාපදිංචි ගාස්තුව රු 100,000 සිට රු 150,000 (එක් ව්‍යාපාර පන්තියකට) දක්වා ඉහළ දමන ලදී. මෙම රීතිය වර්ෂ 2018 මැයි 1 වන දින සිට බලාත්මක විය.

ii) **රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා වන කාර්තුමය වාර්තා ආකෘතිය සංශෝධනය කිරීම**

වැඩිදුර තොරතුරු එක් රැස් කිරීමේ අරමුණින් යුතුව කොමිෂන් සභාව විසින් රක්ෂණ තැරැව්කරුවන් සඳහා අදාළ කාර්තුමය වාර්තා ආකෘතිය සංශෝධනය කරන ලදී. මෙම රීතිය වර්ෂ 2018 ඔක්තෝබර් 8 වන දින සිට බලාත්මක විය.

#### පනත 96 අ වගන්තිය යටතේ නිකුත් කළ විධාන

i) **විධාන අංක 14**

මූල්‍ය අයථා පරිහරණය හෝ වංචා සිදුකිරීම හේතුවෙන් සේවය අවසන් කරන ලද තැනැත්තන් රක්ෂණ කර්මාන්තයේ සේවය සඳහා බඳවා ගැනීමෙන් වැලකිය යුතු බව

මූල්‍ය අයථා පරිහරණය හෝ වංචාවලට වැරදිකරු වීමේ පදනම මත සේවය අවසන් කරනු ලැබූ තැනැත්තන් රක්ෂණ කර්මාන්තයේ (ඕනෑම රැකියා තත්වයක) රැකියාවක් සඳහා බඳවා ගැනීමෙන් වැලකී සිටිය යුතු බවට දක්වමින් කොමිෂන් සභාව විසින් විධාන අංක 14 කර්මාන්තය වෙත නිකුත් කරන ලදී. මෙම විධානය 2018 ජනවාරි 09 දින සිට බලාත්මක විය.

ii) **විධාන අංක 15**

දීර්ඝ කාලීන රක්ෂණ අරමුදල් කළමනාකරණය කිරීම සඳහා ක්‍රියා පටිපාටිය

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL) විසින් ඉදිරිපත් කල කරුණුද සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව විසින් අංක 15 දරන විධානය සියලුම දීර්ඝ කාලීන රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී. මෙම විධානය 2018 පෙබරවාරි 16 වන දින සිට බලාත්මක විය.

iii) **විධාන අංක 16**

එක් වරක් පමණක් ඇතිවන අතිරික්තය හඳුනා ගැනීම සහ ප්‍රතිකර්මය (Identification and Treatment of one-off surplus)

එක්වරක් පමණක් ඇතිවන අතිරික්තය හඳුනා ගැනීම සහ ප්‍රතිකර්ම සඳහා අනුගමනය කල යුතු ක්‍රමවේදය දක්වමින් කොමිෂන් සභාව සියලු දිගුකාලීන රක්ෂණ සමාගම් වෙත විධාන අංක 16 නිකුත් කරන ලදී. මෙම විධානය වර්ෂ 2018 ක් වූ මාර්තු 20 දින සිට බලාත්මක විය.

iv) **විධාන අංක 17**

රක්ෂණ සමාගම් උදෙසා ආයතනික පාලනය

රක්ෂණ සමාගම්වල කටයුතු හැසිරවීම වඩාත් විනිවිදභාවයකින් යුතුව සිදුකිරීම සහතික කිරීමේ අපේක්ෂාවෙන් යුතුව කොමිෂන් සභාව විසින් විධාන අංක 17 කර්මාන්තය වෙත නිකුත් කර ඇත. මෙම විධානය වර්ෂ 2019 ජූලි 01 වන දිනෙන් පසු ක්‍රියාත්මක වේ.

#### නිශ්චයන්ට සිදු කළ සංශෝධන

i) **දැනට පවතින නිශ්චයන් #9 සඳහා ප්‍රතිශෝධන**

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය විසින් ඉදිරිපත් කළ කරුණු ද

සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව විසින් රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තුවට අදාලව නිශ්චයන් #9 ප්‍රතිශෝධනය කරන ලදී. එකී ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු 2018 අගෝස්තු 13 වන දා සිට අදාල වේ.

**ii) දැනට පවතින නිශ්චයන් #12 සඳහා ප්‍රතිශෝධන**

විධාන #16 හා අනෙකුත් සංශෝධනයන්හි අවශ්‍යතාවයන් ඇතුළත් කිරීම සඳහා රක්ෂණකරුවන්ට අදාල කාර්තුමය වාර්තා ආකෘති පත්‍ර ප්‍රතිසංශෝධනය කරන ලදී. සෑම රක්ෂණකරුවෙක්ම, 2018 අප්‍රේල් 01 දායින් ආරම්භ වෙන සෑම කාර්තුවක් සඳහා සංශෝධිත කාර්තුමය වාර්තා ආකෘතියට අනුකලව තම කාර්තුමය වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. මාසික වාර්තා ඉදිරිපත් කිරීමට නියමිත රක්ෂණකරුවන් ඉහත අවශ්‍යතාවය සඳහා 2018 ජූලි 31 දා සිට විධාන කර ඇති කාල සීමාව තුල අනුකූලතාවය දැක්විය යුතුය.

**iii) දැනට පවතින නිශ්චයන් #14 සඳහා ප්‍රතිශෝධන**

විධාන #16 යටතේ අවශ්‍යතාවයන් ඇතුළත් කිරීම සඳහා රක්ෂණකරුවන්ට අදාල වාර්ෂික වාර්තා ආකෘති පත්‍ර සංශෝධනය කරන ලද අතර විධාන #14 සහ විධාන #15 අනුව බාහිර විගණකවරයෙකුගේ සහතික කිරීම අවශ්‍ය වේ. නව ආකාති පත්‍ර 2017 දෙසැම්බර් 31 දා සිට අදාල වේ.

**iv) දැනට පවතින නිශ්චයන් #15 සඳහා ප්‍රතිශෝධන**

විධාන #16 යටතේ අවශ්‍යතාවයන් හා විධාන #14 සහ විධාන #15 හි ඇති බාහිර ජීවගණක සහතික කිරීම ඇතුළත් කිරීම සඳහා රක්ෂණකරුවන්ට අදාල ජීවගණක ආකෘති පත්‍ර සංශෝධනය කරන ලදී. නව ආකෘති පත්‍ර 2017 දෙසැම්බර් 31 දා සිට අදාල වේ.

**රක්ෂකයින්ගේ වාර්ෂික ගාස්තු ඉහළ නැංවීම සඳහා රෙගුලාසි සංශෝධනය කිරීම.**

රක්ෂණකරුවන්ට අදාලව දැනට පවතින වාර්ෂික ගාස්තුව ඔවුන්ගේ දළ ලිඛිත වාරික අගයන් 0.10 ප්‍රතිශතයේ සිට 0.125 ප්‍රතිශතයක් දක්වා සංශෝධනය කර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ සහය ලබා ගැනීමට ඊට අදාල ලියකියවිලි ඉදිරිපත් කරන ලදී. ඉහත දැක්වූ සංශෝධනය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර 2018 දෙසැම්බර් 31 දා සිට බලාත්මක වේ.

## වෙළඳ පොල ව්‍යුහය


### රක්ෂණ සමාගම්

පනතේ 12 වන වගන්තියට අනුව, පනතේ විධිවිධාන වලට යටත්ව, යම් තැනැත්තෙකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙනයාමට මේ පනත යටතේ තත් කාලයේ ලියාපදිංචි වී ඇත්නම් හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන්නේ නම් මිස, වී තැනැත්තා ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙන යනු නොලැබිය යුතුය.

පනතේ 13 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන්නට උනන්දුවක් දක්වන තැනැත්තෙකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් සංස්ථාපනය විය යුතු අතර පනතෙන් නිශ්චිතව දක්වා ඇති අනෙකුත් සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව පනත යටතේ ලියාපදිංචි වී රක්ෂකයෙක් වශයෙන් බලපත්‍රය ලබා ගත යුතුය.

වසර අවසාන වන විට සමාගම් 25 ක් රක්ෂකයන් ලෙස ක්‍රියාකාරීව පැවැතුණි. දීර්ඝකාලීන සහ සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ ව්‍යාපාර ගෙන ගිය සීමාසහිත එම් බී එස් එල් (MBSL) රක්ෂණ සමාගමේ ලියාපදිංචිය වර්ෂ 2017 ජුනි මස 28 වන දින සිට අත්හිටුවන ලදි. තවද, ශ්‍රී ලංකාවෙන් බැහැර වීමේ ක්‍රියාවලියේ නියුතුව සිටින සීමාසහිත ඒ අයි ජී (AIG) රක්ෂණ සමාගම තවදුරටත් නව රක්ෂණ ව්‍යාපාර කටයුතු භාර ගැනීම නවතා ඇති අතර 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන අනුව ඈවරකරුවෙකු පත් කර ඇත.

රූප සටහන 1
රක්ෂණ සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්




රක්ෂණ ව්‍යාපාර සමාගම් මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තින් රූප සටහන 1 මගින් දැක්වේ. ක්‍රියාකාරීව පවතින සමාගම් 25 න් 02 ක් දිගුකාලීන හා සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ කටයුතු සිදු කරන අතර සමාගම් 12 ක් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයද සමාගම් 11 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු ද සිදු කරනු ලබයි.


### රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කරුවන් යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි යෙදීම සඳහා පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වේ. රක්ෂණ තැරැව්කරුවන් යනු තැරැව්කාර ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ ප්‍රතිරක්ෂණ සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරන්නන් අදහස් කෙරේ.

වසර අවසානයේ දී සමාගම් 63ක් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී තිබුණි. එම සමාගම් අතරින් සමාගම් 45ක් දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර යන දෙකෙහිම ලියාපදිංචි වී සිටි අතර සමාගම් 18ක් සාමාන්‍ය රක්ෂණ

තැරැව්කාර ව්‍යාපාර කටයුතුවල පමණක් යෙදී සිටියේය. පහත 2 වන රූප සටහන මගින් රක්ෂණ තැරැව්කාර සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් දැක්වේ.

රූප සටහන 2
රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්තීන්




## රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමඟ ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාව ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයින් වේ. එලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇත.


පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයින් රක්ෂණ සමාගම් වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකක් වේ.

රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරු වලට අනුව, වසර තුළ දී රක්ෂණ නියෝජිතයින් වශයෙන් බඳවා ගෙන ඇති මුළු තනි පුද්ගලයින් සංඛ්‍යාව 15,798 පමණ වන අතර එය පසුගිය වසරේ 14,595 සිට 8.24% ඉහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිතයින් සංඛ්‍යාව 44,919 ක් පමණ වූ අතර එය පසුගිය වසරේ 45,228 සිට 0.68% අඩුවීමකි.

රක්ෂණ නියෝජිතයින් වශයෙන් සමාගම් 53 රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි වී ඇත.

රූප සටහන 3
2018.12.31 දිනට මුළු රක්ෂණ නියෝජිතයන්




3 වන රූප සටහන මගින් රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි වී සිටින තනි රක්ෂණ නියෝජිතයින් පෙන්නුම් කරයි. රක්ෂණ නියෝජිතයන් වශයෙන් තනි පුද්ගලයන් 456 රක්ෂණ තැරැව්කාර සමාගම් සමග වසර අවසාන වන විට ලියාපදිංචි වී ඇත.

## අලාභ ගැලපුම්කරුවන්

තනි පුද්ගල අලාභ ගැලපුම්කරුවන් 10, වසර අවසානය වන විට ලියාපදිංචි වී තිබුණි.

අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචිවීම පිළිබඳ රීති 2017 ජුලි 5 දිනැති අංක 2026/27 අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇත.

2011 වසරේදී 2011 අංක 3 දරන සංශෝධන පනත මගින් සංශෝධනය වූ පරිදි යම් තැනැත්තෙකු කොමිසම සමඟ ලියාපදිංචි වීමෙන් තොරව අලාභ ගැලපුම්කරුවකු (පනතේ 114 (1) යටතේ අර්ථ නිරූපනය කර ඇති පරිදි) ලෙස පෙනී සිටීම හා කටයුතු කිරීම තහනම් කරන ලදී. සීමිත ව්‍යතිරේඛයන් 89 A (2) වගන්තියේ සඳහන් කර ඇත.

පනතේ 89 B වගන්තිය යටතේ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචිවීමට අදාල සුදුසුකම් හා පලපුරුද්ද සඳහන් කරමින් රීති සාදනු ලැබේ.


පනතේ 89 C (1) වගන්තිය අනුව අවශ්‍ය තොරතුරු, ලේඛණ සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු නිශ්චය කරමින් රීති සාදනු ලැබේ.

ඒ අනුව කොමිෂන් සභාව විසින් යම් තැනැත්තෙකු අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපංදිංචිවීම සඳහා අවාසි සුදුසුකම් පලපුරුද්ද නිශ්චය කරමින් රීති නිකුත් කර ඇත.

## සමාගම්වල තත්ත්වය සහ ප්‍රාග්ධන වෙනස්කම්

රක්ෂණ සමාගම් අතරින් සමාගම් 9 ක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොට ඇත. නම් වශයෙන් ඒවා ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී, යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී, සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී, එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී, අමානා තකාෆුල් පීඑල්සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී, ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී සහ පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී වේ. ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 වන රූප සටහනේ දැක්වේ.

රූප සටහන 4
ලයිස්තුගත කරන ලද/ලයිස්තුගත නොකරන ලද රක්ෂණ සමාගම්වල තත්වය




2011 අංක 03 දරන සංශෝධිත පනතින්, රක්ෂණ සමාගම්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය කරයි. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තුගත කිරීමට ද අවශ්‍ය වේ.

2011 අංක 3 දරන සංශෝධිත පනත බලාත්මකවීමෙන් පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක්, කොමිෂන් සභාව මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව වසර තුනක කාලයක් ඇතුලත දී, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභි කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට දක්වා ඇත.

2011 ජූනි මාසයට පෙරාතුව ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම්, 2015 පෙබරවාරි මාසය වන විට හෝ එදිනට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රු. මිලියන 500ක අවමයක් දක්වා වැඩි කළ යුතු බවට කොමිෂන් සභාව නියම කර ඇත.

2011 ජූනි මාසයට පසුව ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්වලට රු. මිලියන 500කට නොඅඩු ගෙවා නිමි ප්‍රාග්ධනයක් ඇත.

## රක්ෂණ සමාගම් වලින් සෙස් බද්දක් අය කිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අය කිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මගින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.2%ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.4%ක් ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කළ යුතු බවට පැහැදිලි කොට ඇත. රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2018 වසරේ එසේ එකතු කරන ලද මුදල රුපියල් මිලියන 479කි.

## ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල


පනතේ 103 වන වගන්තිය ප්‍රකාර ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ. වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.

අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේදීත්, රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම් කටයුතු වලදීත් සිදුවන වියදම් පියවාලීම සහ

ආ) කොමිෂන් සභාව එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේ දී දරනු ලබන වියදම් පියවා ගැනීම.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල සහ රාජ්‍ය බැංකු ස්ථාවර තැන්පතු වල ආයෝජනය කෙරේ. 2018 දෙසැම්බර් 31 වන දිනට එම අරමුදලේ සංචිතය රුපියල් මිලියන 5,043ක් විය. මෙය පසුගිය වසරට වඩා (රුපියල් මිලියන 4,110) 22.70% ක වර්ධනයකි.

රූප සටහන 5
සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ගන




## රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නැත. 2002, 2005 හා 2007 යන වර්ෂවල ජනවාරි 1 වැනි දින සිට අනුපිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය සහ කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

## පනතේ බලපෑමෙන් නිදහස්වීම

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ පනත මගින් ස්ථාපනය කරන ලද කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 1996 අංක 17 දරන සමාජ රක්ෂණ මණ්ඩලය පනත යටතේ ස්ථාපිත සමාජ රක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12(3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැණවෙන නීති රීති අදාළ නොවේ.

## ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, පනතට කරන ලද සංශෝධනයක් මගින් මණ්ඩලයේ විෂය පථය තුළට ග්‍රහණය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම්, අයකර ගන්නා වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරන සංශෝධන පනත අනුව සියලු ලියාපදංචි රක්ෂණ සමාගම් සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50%ක් නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සියලු රක්ෂණ සමාගම් වෙත නියෝගයක් පනවමින් 2013 ජනවාරි මස 1 වැනි දින සිට සියළුම වර්ගයේ ප්‍රතිරක්ෂණ සම්මුතීන් සහ වෛකල්පිත ප්‍රතිරක්ෂණ සැලසුම් සඳහා 30%ක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දක්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය.

## අනෙකුත් අදාල කරුණු

### මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථවාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතී.

මෝටර් රථවාහන රක්ෂණ ආවරණ ලබාදෙන රක්ෂකයින් සෑම කෙනෙකුම තෙවන පාර්ශ්වික රක්ෂණ ආවරණයකින් 1%ක් මාර්ග ආරක්ෂක අරමුදලට දායක කළ යුතුය. මෙම ජාතික සභාවේ පාලක සභාවෙහි ද රක්ෂණ කොමිෂන් සභාවට නියෝජනයක් ඇත.

මෙම දායක මුදල් මගින් හඳුනා නොගත් මෝටර් වාහනවලින් සිදුවන අනතුරුවල වින්දිතයන් සඳහා වන්දි ලබා දීම සිදු කරනු ලැබේ.

## Financial Sector Oversight Counsil

අන්තර් නියාමන ආයතන සභාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද්දකි. ඉහළ මට්ටමේ කමිටුවක් වන මෙහි ප්‍රධානත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් උසුලනු ලබන අතර මෙය පිහිටුවීමේ අරමුණ වූයේ මූල්‍ය වෙළඳපොළෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ථ මූල්‍ය පද්ධතියේම අභිවෘද්ධිය උදෙසා සියලු නියාමන නියෝජිතයින් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීමයි. රක්ෂණ කොමිෂන් සභාව අන්තර් නියාමන සභාවේ ද නියෝජනය වෙයි.

## **ශ්‍රී ලංකා රක්ෂණ සංගමය** (IASL)

1989 දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකටම ලබා ගත හැකිය. ජාතික රක්ෂණ භාර අරමුදල් හැර අනෙක් සියලු රක්ෂණ සමාගම් මෙම සංගමයේ සාමාජිකයෝය.

සියලු රක්ෂණ සමාගම්හි ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව සමස්ත කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

- ජීවිත රක්ෂණ සංසදය
- සාමාන්‍ය රක්ෂණ සංසදය
- මූල්‍ය තාක්ෂණ අනුකමිටුව
- නීති උපදේශන සංසදය
- මානව සම්පත් අනුකමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණය හා විකුණුම් සංසදය
- ජීවගණක අනු කමිටුව

යන කමිටු විසින් විධායක කමිටුවට සහය වෙමින් ස්වකීය වගකීම් හා අදාල වන්නාවූ විෂය ක්ෂේත්‍ර පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

## **ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය** (SLIBA)

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය නියෝජනය කරනු ලබන්නේ රක්ෂණ කොමිෂන් සභාව සමග ලියාපදිංචි වූ රක්ෂණ තැරැව්කාර සමාගම්ය. රක්ෂණ තැරැව්කාර සමාගම්වල සුබසිද්ධිය සඳහා මෙම සංගමය පිහිටුවන ලදි.

## **ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය** (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්තවන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම් වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල් වලිනි.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය, ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ කර්මාන්තයෙහි නියැලෙන්නන් සඳහා සංගමය විසින් කෙටි කාලීන රක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වනු ලැබේ.

රක්ෂණ නියෝජිතයින් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවා ගැනීම් පරීක්ෂණ සිදු කිරීමේ වගකීම කොමිෂන් සභාව විසින් මෙම ආයතනයට පවරා ඇත. රක්ෂණ ක්ෂේත්‍රයෙහි සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පන්ති දෙවර්ගය සඳහාම ආයතනය විසින් පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ පවත්වනු ලැබේ.

## **රක්ෂණ ඔම්බුඩ්ස්මන්**

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් 2019 පෙබරවාරි මස, රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා ලෙස ආචාර්ය රංජිත් රණරාජා මහතා පත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව රක්ෂණ ඔප්පු හිමියන් විසින් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආරවුල් නිරාකරණය හා සමථ කිරීම සඳහා එකී පාර්ශ්වයන් දෙක විසින් තමන්ගේ උපරිමයෙන් කටයුතු කරනු ලැබේ.

## **රක්ෂණ අධික්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය** (IAIS)

රක්ෂණ අධික්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙක් වශයෙන් ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්ෂණ ක්‍රියාපිළිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු නිතිපතා කොමිෂන් සභාවට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන සමහර ප්‍රධාන රක්ෂණ ක්‍රියා පිළිවෙත් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්ෂණය කරනු හා මෙහෙයවනු පිණිස කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## **රක්ෂණ නියාමකයන්ගේ ආසියාතික සංසදය** (AFIR)

රක්ෂණ නියාමකයින්ගේ ආසියානු සංසදය 2006 දී ආරම්භ කරන ලදි. චීන රක්ෂණ නියාමන කොමිෂන් සභාව මේ සඳහා මුල් පුරන ලදි. කොමිෂන් සභාව මෙහි දායකත්වය දරයි. ආසියාතික රක්ෂණ නියාමකයින්ගේ රට රටවල් අතර අධීක්ෂණ කටයුතු සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

AFIR රක්ෂණ නියාමකයින් අතර නියාමන තොරතුරු තාක්ෂණය සහ නියාමන අත්දැකීම් හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සහ රක්ෂණ කර්මාන්තයේ වෘතිකයන් හුවමාරු කර ගැනීම රට රටවල් අතර පවතින නියාමනය කිරීමේ අවධානම අඩු කරමින් සහයෝගිතාව වැඩි දියුණු කරමින්ද රක්ෂණ කටයුතු නියාමනය කිරීමේ හා ශක්‍යතාවය වැඩි දියුණු කිරීම් තුලින් ගෝලීය රක්ෂණ නියාමනයේ වඩාත් ක්‍රියාකාරී දායකත්වයක් ලබාදීම අරමුණ වේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්

| | රක්ෂණ සමාගම | කෙටි යෙදුම |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | ඒඅයිඒ ලයිෆ් |
| 2 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඒඅයිජී |
| 3 | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | අලියාන්ස් ජෙනරල් |
| 4 | අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | අලියාන්ස් ලයිෆ් |
| 5 | අමානා තකාෆුල් පීඑල්සී | අමානා ජෙනරල් |
| 6 | අමානා තකාෆුල් ලයිෆ් පීඑල්සී | අමානා ලයිෆ් |
| 7 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | ආර්පිකෝ |
| 8 | සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සෙලින්කෝ ජෙනරල් |
| 9 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සෙලින්කෝ ලයිෆ් |
| 10 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | කොන්ටිනෙන්ටල් |
| 11 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | කෝපරේටිව් ජෙනරල් |
| 12 | කෝප්ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | කෝප්ලයිෆ් |
| 13 | ෆෙයාෆර්ස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ෆෙයාෆස්ට් |
| 14 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | එච්එන්බී ලයිෆ් |
| 15 | එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | එච්එන්බී ජෙනරල් |
| 16 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | ජනශක්ති ලයිෆ් |
| 17 | ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ජනශක්ති ජෙනරල් |
| 18 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | එල්අයිසී |
| 19 | එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | එල්ඕඑල්සී ජෙනරල් |
| 20 | එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ් | එල්ඕඑල්සී ලයිෆ් |
| 21 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | එම්බීඑස්එල් |
| 22 | ජාතික රක්ෂණ භාර අරමුදල | එන්අයිටීඑෆ් |
| 23 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඔරියන්ට් |
| 24 | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | පීපල්ස් |
| 25 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | සණස |
| 26 | සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී | සොෆ්ට්ලොජික් ලයිෆ් |
| 27 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | එස්එල්අයිසී |
| 28 | යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී | යුනියන් ලයිෆ් |

### සංඛ්‍යානමය සමාලෝචනයෙහි වගු සහ සටහන් අර්ථ දැක්වීමේ දී පහත දැක්වෙන පොදු සටහන් උෞණපූර්ණයක් වේ:

1. මෙම වාර්තාවෙහි දක්වා ඇති වගු හා රූප සටහන් රක්ෂණ සමාගම් හා රක්ෂණ තරැව්කාර සමාගම් මගින් සපයන ලද සංඛ්‍යා ලේඛන මත පදනම් වේ.
2. ඒඅයිඒ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් 2016 දී ඒකාබද්ධ කරන ලද අතර" ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" ලෙස හැඳින්වේ.
3. 2018 දී අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් මගින් ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අත්පත් කර ගන්නා ලද අතර 2018 සැප්තැම්බර් 28 දින ඒකාබද්ධ කෙරිණි. එය "අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්" ලෙස හැඳින්වේ.
4. 2016 ට පෙර සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී හඳුන්වනු ලැබුවේ ඒෂියන් අලියාන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී ලෙසයි.
5. 2015 වර්ෂයේ දී ෆෙයාෆැක්ස් ඒෂියා ලිමිටඩ් මගින් ඒෂියන් අලියාන්ස් ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අත්පත් කර ගන්නා ලද අතර එය "ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" ලෙස හැඳින්වේ.
6. ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් මගින් යුනියන් ජෙනරල් ලිමිටඩ් අත්පත් කර ගන්නා ලද අතර 2017 පෙබරවාරි 28 දින සිට ඒකාබද්ධ කෙරිණි. එය "ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" ලෙස හඳුන්වනු ලැබේ.
7. ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් 2014 දී ව්‍යාපාර කටයුතු වලින් ඉවත් වී ඇති අතර ස්වේච්ඡාවෙන් ඈවර කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටියි. ඒ අනුව 2018 දී ඒඅයිජී සමාගමෙහි සංඛ්‍යා ලේඛන සැලකිල්ලට නොගන්නා ලදී.
8. එන්අයිටීඑෆ් මගින් විවිධ රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ කටයුතු කරන බැවින් සංසන්ද්‍යතාව පවත්වා ගැනීම සඳහා එන්අයිටීඑෆ් මගින් අවදානම් පාදක ප්‍රාග්ධනයට අදාළව ඉදිරිපත් කරන ලද දත්ත සැලකිල්ලට ගෙන නොමැත.
9. එන්අයිටීඑෆ්හි වගා හා ණය ආරක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය දත්ත 2014 සිට සංඛ්‍යාලේඛන වලින් ඉවත් කරන ලදී. මන්ද යත් එකී කාර්යය "ආරක්ෂණය" ලෙස නොසලකනු ලැබූ බැවිනි.
10. ඇතැම් වගුවල සංඛ්‍යා ආසන්නතම සංඛ්‍යාංකයට වටයන ලදී. ඒ අනුව දක්වා ඇති එකතුව හා එහි සංරචකයන්ගේ එකතුව අතර යම් වෙනසක් පැවතිය හැකිය.
11. මින් පෙර ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යා සමග සැසඳීමේ දී වෙනස්කම් පසුව සංශෝධනය වීමට නියමිතය.
12. වරහන් තුළ දක්වා ඇති අගයන් ඍණ අගයන් වේ.
13. "ජීව කාලය" හා "දිගු කාලීන" යන වචන මෙම වාර්තාවෙහි මාරු කෙරෙමින් භාවිතා කෙරේ.
14. පහත සංකේත වාර්තාව පුරා භාවිතා කර ඇත :-

   (අ) = ප්‍රතිස්ථාපිත හා විගණිත සංඛ්‍යා
   (ආ) = තාවකාලික සංඛ්‍යා
   \- = ශූන්‍ය

## ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය

### ගෝලීය රක්ෂණ වෙළඳපොළ පිළිබඳ සැකෙවින්

2018 වසර තුළ මූර්ත අගය 3-4% පමණ වාරික වර්ධනයක් වාර්තා කිරීම මගින් ගෝලීය රක්ෂණ ක්ෂේත්‍රයෙහි ධනාත්මක ආර්ථික ගම්‍යතාවක් සහිතව ස්ථාවර වර්ධනයක් වාර්තා කර ඇත. නැගී එන වෙළඳපළවල දායකත්වය සමග දියුණු වෙළඳපළවල තිරසර වර්ධනය මගින් වසර තුළ ගෝලීය රක්ෂණ වාරික වර්ධනයට මග පාදා ඇත. කෙසේ වුවද, රක්ෂණ ක්ෂේත්‍රයේ ලාභදායීත්වය අඩු පොළී අනුපාත සහිත පරිසරයන් තුළ පීඩනයට ලක් වී පැවතිනි.

ඇමරිකා එක්සත් ජනපදය හා චීනය අතර වෙළඳ යුද්ධය, චීනයේ වේගවත් ආර්ථික පසුබෑම, භූ දේශපාලනික අස්ථාවරත්වය සහ සියලු මහ බැංකු විසින් අදාළ කර ගන්නා ලද දැඩි මූල්‍ය ප්‍රතිපත්ති 2018 වසර තුළ රක්ෂණකරුවන්හට කැපී පෙනෙන බාධක ලෙස පැවතිනි.

තාක්ෂණය මගින් ගෝලීය රක්ෂණ ක්ෂේත්‍රය වේගයෙන් පරිවර්තනය කරනු ලබයි. වංචා වැළැක්වීම, ක්‍රියාවලිය සරළ බවට පත් කිරීම තුළින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, ශක්තිමත් ප්‍රතිරක්ෂණය හා ඩිජිටල් ෆස්ට් ප්‍රතිපත්තිය පරිපාලනය, වාර්තා තබා ගැනීම, ස්වයංක්‍රීය සකසන ලද වියදම් ආදිය සඳහා බ්ලොක්චේන් යෙදුම් සංඛ්‍යාව මගින් රක්ෂණ ක්ෂේත්‍රයේ පසුබිම සම්පූර්ණයෙන් වෙනස් කරනු ඇත. රක්ෂකයන් විසින් සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ හැසිරීම හා පිරිවැය කෙරෙහි බලපෑම් එල්ල කිරීම සඳහා දත්ත විශ්ලේෂකයන් සහ මූලාරම්භයන් සඳහා බහුල වශයෙන් ආයෝජනය කරනු ලැබේ. ව්‍යාපාර කෙරෙහි එල්ල වන ප්‍රධාන තර්ජනයක් ලෙස සැලකෙන ලොව පුරා බහුලව සිදු වන දත්ත අවභාවිතයට ප්‍රතිචාරයක් ලෙස සයිබර් රක්ෂණය ඇති වී තිබේ.

හිමිකම් කළමනාකරණය මෙන්ම අවදානම් වළක්වා ගැනීම සහ තක්සේරු කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නංවන ඩ්‍රෝන, චන්ද්‍රිකා රූප වැඩි වශයෙන් භාවිතා කිරීම මගින් ලොව පුරා මෙම විනාශකාරී සිදුවීම් පාලනය කිරීම සඳහා විසඳුම් සොයමින් පවතියි. Munich Re Publications අනුව 2018 දී දරුණු කුණාටු, ලැව් ගිනි සහ නියඟ හේතුවෙන් දැඩි ස්වභාවික විපත් සිදු විය. උතුරු කැලිෆෝනියාවේ හට ගත් ලැව් ගිනි සහ ඇමරිකා එක්සත් ජනපදයේ "මිෂෙල්" චන්ඩ මාරුතය, ඉන්දුනීසියාවෙහි ඇති වූ සුනාමි සහ බිලියන ගණනාවක හානි ඇති කරමින් ජපානයේ ඇති වූ ටයිෆූන් ගණනාවක් හා භූමි කම්පා ද්විත්වය ආදී බරපතල ස්වභාවික විපත් මීට ඇතුළත් වේ. 1980 සිට මේ දක්වා කාලය තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ ස්වභාවික විපත්වලට අදාළව සිව් වෙනියට වියදම් අධිකම වසර 2018 විය. කාලගුණ හා ස්වභාවික විපත් අවදානම කළමනාකරණය කිරීමට අදාළ ප්‍රතිරක්ෂකයන්ගේ කාර්ය භාරය ද 2018 තුළ දක්නට ලැබේ.

රක්ෂකයන් කිහිප දෙනෙකු විසින් සම්බන්ධතාව සහ ඩිජිටල් ආකාරයට පවතින වෛද්‍ය දත්ත මත පදනම් වූ ඉහළ මට්ටමේ විශ්ලේෂණය, ඖෂධ නියම කිරීමට අදාළ තොරතුරු සහ අයදුම්කරුවකුගේ ආයු අපේක්ෂාව තක්සේරු කර සාම්ප්‍රදායික වෛද්‍ය පරීක්ෂණ වළක්වා ගැනීම සඳහා භාවිතා කළ හැකි මුහුණ විශ්ලේෂණය කිරීමේ තාක්ෂණයට (Facial Analysis Technology) අදාළව අත්හදා බැලීම් සිදු කරනු ලැබේ. Swiss Re මගින් ප්‍රකාශයට පත් කරන ලද ආකාරයට කන්තුකවාහිනී ආබාධය සහ දියවැඩියාව වැනි නිදන්ගත රෝග පැතිරීම ඉහළ යමින් පවතියි. ඉන්දියාවේ 2005 දී සිදු වූ මරණ අතුරින් 53% ක් කන්තුකවාහිනී ආබාධ, පිළිකා හා වෙනත් නිදන්ගත රෝග හේතුවෙන් සිදු වී ඇති අතර 2030 වන විට මෙය 67% දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. දැනුවත්භාවය ඉහළ නැංවීම හා ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණ විසඳුම් සැපයීමට අදාළව රක්ෂණකරුවන් විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

ලොව පුරා රක්ෂණ ක්ෂේත්‍රයේ ඒකාබද්ධ කිරීම් හා පවරා ගැනීමේ කාර්යයන් අඛණ්ඩව සිදු කෙරෙන අතර පසුගිය වසරට සාපේක්ෂව 2018 දී 9% කින් (ආසන්න වශයෙන්) ඉහළ ගොස් ඇත.

### ශ්‍රී ලංකාවේ ආර්ථිකය සැකෙවින්

වර්ෂය තුළ මෙරට මුළු දළ දේශීය නිෂ්පාදිතය රු.බි. 14,450 ක් ලෙස වාර්තා වී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදය, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය ක්ෂය වීම, දේශීය ඛණිජ තෙල් නිෂ්පාදන මිළ ඉහළ යාම හේතුවෙන් අස්ථායී මිළ නිසා ඇති වන පීඩනය සහ වෙනත් පරිපාලනමය වශයෙන් තීරණය කෙරෙන මිළ ගණන්, ක්ෂේත්‍රයට අදාළ කාර්යයන් සිදු කිරීමේ වේගය අඩු වීම ආදිය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි දැඩි ලෙස බාධා එල්ල වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2018 දී වසර 17 කින් වාර්තා වූ අඩුම වර්ධන අනුපාතය වන 3.2% දක්වා අඩු විය. එසේම 4.7% කින් ව්‍යාප්ත වූ සේවා ක්‍රියාකාරකම් සහ වර්ධනය 4.8% ක් ලෙස වාර්තා වූ කෘෂිකාර්මික කටයුතු යථා තත්වයට පත් වීම මෙම වර්ධනයට ඉවහල් විය.

තවද වසර පුරා කොටස් මිළ ගණන් කැපී පෙනෙන අයුරින් පහළ බැසීම, වෙළඳපළ පිරිවැටුම, වෙළඳපළ ප්‍රාග්ධනීකරණය සහ මිළ හා ඉපැයීම් අනුපාතයන් තුළින් කොළඹ කොටස් වෙළඳපළ දුර්වල කාර්යසාධනය පෙන්නුම් කෙරිණි.


(මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2018)

### ශ්‍රී ලංකා රක්ෂණ වෙළඳපොළ

2018 දී ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂේත්‍රය තුළ ලියාපදිංචි කරන ලද රක්ෂණ සමාගම් විසි හයක් ක්‍රියාත්මක විය (2017 ජූනි 28 සිට 2019 අප්‍රේල් 2 දක්වා ගණුදෙනු කටයුතු අත්හිටුවන ලද එම්බීඑස්එල් හැර). රක්ෂණ සමාගම් හයක් විදේශ ආයෝජනයන්හි ප්‍රධාන කොටස් හිමිකරුවන් සමග ක්‍රියාත්මක විය. බොහෝ සමාගම් සමූහ, අනුබද්ධ ආයතන හා ආශ්‍රිත කණ්ඩායම් ලෙස සංවිධානය වී ඇත. තවද 2018 දෙසැම්බර් 31 දින වන විට සමාගම් නවයක් කොළඹ කොටස් වෙළඳපළෙහි ලැයිස්තුගත කර තිබිණි.

2015 වසරේ දී රක්ෂණකරුවන්ගේ ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් වෙන් කිරීමෙන් පසු මෑතදී විශේෂයෙන් සාමාන්‍ය රක්ෂණ අංශය තුළ පවරා ගැනීම් හා එක් කිරීම් කිහිපයක් දක්නට ලැබිණි. අත්පත් කර ගැනීම් හා ඒකාබද්ධ කිරීම් පිළිබද සැලකීමේ දී ගෝලීය ව්‍යාපාර ආකෘති වෙනස් කිරීමට අපේක්ෂා කරන ගෝලීය රක්ෂණ ආයතන වෙත හිමිකාරීත්වය මාරු වීමේ නැඹුරුවක් දක්නට ලැබිණි. වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය උඩු යටිකුරු කළ එක් විශාල අත්පත් කර ගැනීමක් සිදු විය. ශ්‍රී ලංකාව තුළ 6% ක් පමණ වූ (2017 දී) වෙළඳපළ

රූප සටහන 1
**රක්ෂණ කර්මාන්තයෙහි වාරික ආදායම සහ වර්ධන වේගය**




කොටස් ප්‍රමාණයක් වාර්තා කළ අලියාන්ස් ජෙනරල් සමාගම මගින් අලියාන්ස් ඒස්ඊ සමාගමෙහි සහාය ඇතිව එම කොටස් මෙන් දෙගුණයක් හිමි ජනශක්ති ජෙනරල් පවරා ගන්නා ලදී.

“ක්ෂුද්‍ර රක්ෂණය” යන සංකල්පය පුද්ගලයන් රැසක් වෙත ළඟා විය හැකි සරළ සහ දැරිය හැකි රක්ෂණ නිමැවුම්වල සංකල්පීය වැදගත්කම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ සාකච්ඡාවට බඳුන් වන ප්‍රධාන මාතෘකාවක් වේ. ජනවිකාශන සංක්‍රමණය සමග පරායත්තතා අනුපාතය ඉහළ යාමේ ප්‍රවනතාව සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම මගින් ප්‍රමාණවත් ආවරණයක් නොමැති වීම හා විනිවිදීම අඩු මට්ටම්වල පැවතීම මගින් රක්ෂණකරුවන් සහ ක්ෂුද්‍ර රක්ෂණකරුවන් සඳහා වැඩි අවස්ථා නිර්මාණය කරනු ලැබේ.

2018 මැයි මස වාර්තා වූ දැඩි මෝසම් වර්ෂාපතනය හේතුවෙන් ජලගැලීම් හා නායයාම් නිසා බරපතල හානි සිදු විය. තවද දෙසැම්බර් මස අග භාගයේ දී ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ඇති වූ අකුණු කුණාටු හේතුවෙන් හානි සිදු විය. කෙසේ වුවද, විපත් අවදානම හේතුවෙන් 2018 දී රක්ෂණ කර්මාන්තයට එල්ල වූ බලපෑම 2017 වසරට සාපේක්ෂව එතරම් බරපතල නොවේ.

2018 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව ප්‍රකාරව ඔවුන් විසින් සිදු කරන ලද ව්‍යාපාර සමීක්ෂණ මත පදනම්ව ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හා වසර පුරා පැවති ප්‍රතිපත්තිමය අස්ථාවරත්වය සහ වසර අග භාගයේ පැවතුණු දැඩි දේශපාලන නොසන්සුන්තාව මගින් ඉතා අවශ්‍ය වූ ව්‍යාපාර ස්ථාවරභාවය හා ආයෝජක අභිප්‍රාය කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කරන ලදී. මෙම ආර්ථික හා දේශපාලන අස්ථාවරභාවයන් තිබියදී වුවද සමස්ථ රක්ෂණ ව්‍යාපාරය 2017 දී වාර්තා වූ රු.මි. 164,960 ට සාපේක්ෂව 2018 දී රු.මි. 181,506 ක දළ ලිඛිත වාරික ප්‍රමාණයක් වාර්තා කළ අතර 2017 දී සාමාන්‍ය තත්ත්වයන් යටතේ වාර්තා වූ 15.30% ට සාපේක්ෂව 2018 දී 10.3% ක සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කෙරිණි. පසුගිය වසරවල සේම මෝටර් රථ රක්ෂණය දළ ලිඛිත වාරිකය කෙරෙහි විශාල වශයෙන් බලපාන ලදී. කෙසේ වුවද, 2015 දී වාර්තා වූ 10% ට වැඩි වර්ධනයට සාපේක්ෂව සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය අඩු වේගයකින් (8.37%) වර්ධනය විය. ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය ද 2018 දී රු.මි. 80,303 ක වාරික ආදායමක් වාර්තා කිරීමට සමත් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 12.20% ක සාමාන්‍ය වර්ධන අනුපාතයක් විය. 1 වන ප්‍රස්තාරය මගින් පසුගිය වසර 05 තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ වාරික ආදායම හා වර්ධන අනුපාතය දැක්වේ.

**වගුව 01**
**වාරික ආදායම සහ ව්‍යාප්තිය**

| | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 (ආ) |
|---|---|---|---|---|---|
| වාරික ආදායම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය (රු. මිලියන) | 44,596 | 53,691 | 63,477 | 71,571 | 80,303 |
| වාරික ආදායම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (රු. මිලියන) | 61,202 | 69,271 | 79,590 | 93,389 | 101,203 |
| සමස්ථ වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාරය (රු. මිලියන) | 105,798 | 122,962 | 143,067 | 164,960 | 181,506 |
| මුළු වාරික ආදායම් වර්ධන අනුපාතය - රක්ෂණ ව්‍යාපාරය (%) | 5.84 | 16.22 | 16.35 | 15.30 | 10.03 |
| ප්‍රතිරක්ෂණ වාරික ආදායම (රු. මිලියන)** | 2,041 | 1,738 | 2,397 | 3,683 | 4,056 |
| ප්‍රවර්තන වෙළඳපල මිළට දළදේශීය නිෂ්පාදිතය (රු. බිලියන)* | 10,361 | 10,951 | 11,996 | 13,418 | 14,450 |
| දළ දේශීය නිෂ්පාදන වර්ධන අනුපාතය %* | 4.90 | 4.84 | 4.50 | 3.40 | 3.20 |
| ව්‍යාප්තිය % (ද.දේ.නි. % ලෙස රක්ෂණ ව්‍යාපාරවල මුළු වාරික ආදායම) | 1.02 | 1.12 | 1.19 | 1.23 | 1.26 |
| ව්‍යාප්තිය % (ද.දේ.නි. % ලෙස දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වාරික ආදායම) | 0.43 | 0.49 | 0.53 | 0.53 | 0.56 |
| ව්‍යාප්තිය % (ද.දේ.නි. % ලෙස සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාරික ආදායම) | 0.59 | 0.63 | 0.66 | 0.70 | 0.70 |
| රක්ෂණ ඝණත්වය - (මුළු වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාරය/ ජනගහනය) (රුපියල්) | 5,094 | 5,865 | 6,747 | 7,693 | 8,376 |
| ජනගහනය ’000 (මධ්‍ය වාර්ෂික)* | 20,771 | 20,966 | 21,203 | 21,444 | 21,670 |

* මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

• වර්තමාන වෙළඳපළ මිළට අදාළ දළ දේශීය නිෂ්පාදිතය ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව - 2018 මත පදනම්ව 2014 සිට යාවත්කාලීන කරන ලදී.

** ප්‍රතිරක්ෂණ වාරික ආදායම මගින් එන්අයිටීඑෆ් වෙත පවරා දෙන ලද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිරක්ෂණ වාරික අනිවාර්ය පැවරීම පෙන්නුම් කෙරේ.

## රක්ෂණ කර්මාන්තයෙහි වාරික ආදායම සහ වර්ධන වේගය

රටේ මුළු දළ ජාතික නිෂ්පාදිතය කෙරෙහි රක්ෂණයේ දායකත්වය 1.26% (2017:1.24%) ක් වැනි අඩු මට්ටමක පවතියි. උපයෝජ්‍ය ආදායම් මට්ටම රක්ෂණ මගින් රක්ෂණ විනිවිදීම් මට්ටම කෙරෙහි සෘජු බලපෑමක් එල්ල කරනු ලැබේ. රක්ෂණය සහ දැනට පවතින සමාජ රක්ෂණ ප්‍රතිලාභ පිළිබඳ වන ඇතැම් සෘණාත්මක සංජානනයන් අඩු විනිවිදීම් මට්ටම් කෙරෙහි බලපාන අනෙකුත් සාධක වේ.

රටේ ජනගහනයට අදාළ මුළු දළ ලිඛිත වාරික මත පදනම්ව ගණනය කෙරෙන රක්ෂණ ඝණත්වය (Insurance density) රු. 8,376 ක් විය. 2018 වසරේ දී ශ්‍රී ලංකාව තුළ රැකියා නියුක්තිකයන් මිලියන 8 ක් වාර්තා විය (මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 1-1 2018). ඒ අනුව, රටේ රැකියා නියුක්තිකයන්ට අදාළව මුළු දළ ලිඛිත වාරිකය රු. 22,688 ක් විය. පසුගිය වසර 05 තුළ දළ ලිඛිත වාරිකය, රක්ෂණ විනිවිදීම හා රක්ෂණ ඝණත්වය පිළිබඳ විස්තර 1 වන වගුවෙන් දැක්වේ.

## රක්ෂණ සමාගම්හි මුළු වත්කම්


2018 දෙසැම්බර් 31 දිනට රක්ෂණකරුවන් විසින් වාර්තා කරන ලද මුළු වත්කම් ප්‍රමාණය රු.මි. 623,477 ක් විය. මෙම වාර්තාවේ මීට පෙර සාකච්ඡා කළ අන්දමට ශ්‍රී ලංකා ආර්ථිකයේ අවදානමට ලක් විය හැකි හේතුවෙන් කර්මාන්තයෙහි මුළු වත්කම් වර්ධනය කෙරෙහි අහිතකර බලපෑම් එල්ල වී ඇත. ඒ අනුව, 2017 තුළ රක්ෂණ කර්මාන්තය තුළ වාර්තා වූ අඩු වන වර්ධක අනුපාතය වන 10.73% ට සාපේක්ෂව 2018 වසර තුළ එම අගය 7.18% ක් ලෙස වාර්තා වී ඇත.

පසුගිය වසරවල්වලට සමානව 2018 දී 2017 ට සාපේක්ෂව දිගු කාලීන රක්ෂණ කර්මාන්තය 9.65% ක මධ්‍යස්ථ වර්ධන අනුපාතයක් පෙන්නුම් කරමින් වත්කම් වර්ධනයට ඉවහල් වූ අතර සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය තුළ වත්කම් වර්ධන අනුපාතයේ 2.43% ක අඩු වීමක් පෙන්නුම් කළේය (2017 : 6.67%). 2018 දී ජීවිත හා සාමාන්‍ය රක්ෂණකරුවන් විසින් වාර්තා කරන ලද මුළු වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු.මි. 429,706 ක් හා රු.මි. 190,088 ක් විය (2017: රු.මි. 391,890 හා රු.මි. 185,583).

සෙලින්කෝ ලයිෆ්, ඒඅයිඒ ලයිෆ් හා යූනියන් ලයිෆ් යන දිගුකාලීන රක්ෂණකරුවන් විසින් අනුගමනය කරනු ලබන වත්කම් කළඹ කෙරෙහි ප්‍රධාන දායකත්වය දරණ ලද්දේ සංයුක්ත රක්ෂණකරුවකු වන ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසිනි. අලියාන්ස් ජෙනරල් හා සෙලින්කෝ ජෙනරල් යන සාමාන්‍ය රක්ෂණකරුවන් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි වත්කම් කළඹ කෙරෙහි සාධනීය දායකත්වයක් දැක්වීය.

ජාතික ප්‍රතිරක්ෂණකරු වන එන්අයිටීඑෆ් විසින් සිය ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාළව රු.මි. 3,683 ක වත්කම් වාර්තා කරන ලද අතර පසුගිය වසරට සාපේක්ෂව 12.54% ක අඩු වීමක් වාර්තා කරන ලදී. තවද එන්අයිටීඑෆ් හි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාළ මූල්‍ය ආයෝජනවල කැපී පෙනෙන අඩු වීමක් දක්නට ලැබිණි.

**රූප සටහන 02**
**රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් සහ වත්කම්වල වර්ධන අනුපාතය**




## ප්‍රධාන මූල්‍ය අංශයන්හි මුළු වත්කම් ව්‍යාප්තිය

බැංකු, මූල්‍ය සමාගම්, රක්ෂණකරුවන්, කල්බදු සමාගම්, විශ්‍රාම වැටුප් අරමුදල් ආදී මූල්‍ය අතරමැදියන් අතර වන අන්තර් ක්‍රියාවන් කාලයත් සමග සැලකිය යුතු අන්දමින් වර්ධනය වී ඇත. 3 වන වගුව හා 3 වන රූප සටහන මගින් ප්‍රධාන මූල්‍ය අංශ අතර වන මුළු වත්කම් ව්‍යාප්තිය පෙන්නුම් කෙරේ. 2018 වසර අවසානයේ දී මෙම ක්ෂේත්‍රයෙහි සමස්ථ වත්කම් කළඹ 10.8% ක වර්ධනයක් වාර්තා කරන ලදී.

ප්‍රධාන ව්‍යවහාර මුදල් වලට සාපේක්ෂව රුපියලේ අගය දැඩි ලෙස ක්ෂය වුවද 2018 දී මූල්‍ය අංශයේ, විශේෂයෙන් බැංකු ක්ෂේත්‍රයේ මධ්‍යස්ථ කාර්යසාධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, 2018 මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව අක්‍රීය ණය සහ අත්තිකාරම් ඉහළ යාම මගින් බැංකුකරණය, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් කෙරෙහි අහිතර බලපෑම් එල්ල කරන ලදී. තවද අඩු ණය වර්ධනය, ඉහළ මෙහෙයුම් හා පරිපාලන පිරිවැය සහ බදු වැනි අනෙකුත් සාධක හේතුවෙන් වසර තුළ මූල්‍ය අංශයේ ලාභදායීතාව පහළ බසින ලදී.

**වගුව 02**
**රක්ෂණ සමාගම්වල වත්කම්**

| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
|---|---|---|---|---|---|
| දිගුකාලීන රක්ෂණය (රුපියල් මිලියන) | 247,061 | 312,713 | 345,589 | 391,890 | 429,706 |
| සාමාන්‍ය රක්ෂණය (රුපියල් මිලියන) | 174,588 | 151,177 | 173,985 | 185,583 | 190,088 |
| ප්‍රතිරක්ෂණය (රුපියල් මිලියන) | 3,065 | 3,417 | 5,755 | 4,212 | 3,683 |
| **එකතුව (රුපියල් මිලියන)** | ***422,031** | ***466,519** | **525,329** | **581,685** | **623,477** |

* අන්තර් කොටස් ගණුදෙනු ඉවත් කර ඇත


බලපත්‍රලාභී බැංකු 33 කින් සමන්විත බැංකු ක්ෂේත්‍රය තුළ 2018 වසරේ දී ද වත්කම් කළඹෙහි ව්‍යාප්තියක් සිදු විය. 2018 දී බැංකුවල මුළු වත්කම් කළඹ 15.22% කින් එනම් රු.බි. 13,708 දක්වා ඉහළ ගිය අතර ඊට රු.බි. 1,914.3 ක වටිනාකමින් යුතු මහ බැංකුවේ වත්කම් ද ඇතුළත් වේ. ඒ අනුව 2018 වසරේ ප්‍රධාන මූල්‍ය අංශයේ වත්කම් කළඹින් 72.4% ක් බැංකු ක්ෂේත්‍රය මගින් නියෝජනය කෙරිණි.

ප්‍රධාන වශයෙන් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වලින් සමන්විත තැන්පතු භාර ගන්නා වෙනත් මූල්‍ය ආයතන ද 2017 දී රු.බි. 1,370.4 සිට 2018 වන විට රු.බි. 1,542.7 දක්වා වත්කම් කළඹ ව්‍යාප්ත කිරීම මගින් ආර්ථිකය කෙරෙහි ධනාත්මක බලපෑම් එල්ල කර ඇත. ඒ අනුව 2018 දී තැන්පතු භාර ගන්නා වෙනත් මූල්‍ය ආයතනවල වත්කම් පදනම 12.57% කින් ඉහළ ගොස් ඇත.

විශේෂිත මූල්‍ය ආයතන 2017 දී රු.මි. 388.9 සිට 2018 දී රු.මි. 240 දක්වා වත්කම්වල පහළ බැසීමක් වාර්තා කළේය. මෙම කාණ්ඩයේ වත්කම් අඩු වීම කෙරෙහි විශේෂිත කල්බදු සමාගම් සහ ඒකක භාර/ ඒකක භාර කළමනාකරණ සමාගම් දායක වී ඇත.

වෙනත් ගිවිසුම්ගත ඉතුරුම් ආයතන සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලින් සමන්විත වන අතර අනුමත විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල්වලට අමතරව 2018 වත්කම් කළඹ රු.බි. 2,808 ක් පෙන්නුම් කළේය (2017: 2,838). සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලෙහි වත්කම් කළඹ ඉහළ යාමක් පෙන්නුම් කළ ද අනුමත

**රූප සටහන 03**
**2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම**




විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් වත්කම් කළඹෙහි අඩු වීමක් පෙන්නුම් කළේය.

2017 රු.බි. 581.7 ට සාපේක්ෂව 2018 රු.බි. 623.5 ක් වටිනා වත්කම් වාර්තා කරමින් රක්ෂණ ක්ෂේත්‍රය මූල්‍ය සේවා ක්ෂේත්‍රයෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පසුගිය වසරවලට සමානව මූල්‍ය අංශයේ මුළු වත්කම් අතුරින් 3.3% ක් රක්ෂණ සමාගම් සතු විය.

## ලාභදායීත්වය

පොළී අනුපාතයට අදාළ වාෂ්පශීලීතාව (volatility) හා වසර තුළ පැවති අනෙකුත් ආර්ථික බාධාවන් රක්ෂණ කර්මාන්තයේ ලාභදායීතාවය කෙරෙහි බලපෑම් එල්ල කළ අතර බදු පෙර මුළු ලාභය රු.මි. 37,017 ක් ලෙස වාර්තා කළේය (2017: රු.මි.49,084). එකෝචිත අතිරික්තය ඉවත් කිරීමෙන් පසුව රක්ෂණ කර්මාන්තයේ මුළු ලාභය 2017 වාර්තා වූ රු.මි. 33,217 ට සාපේක්ෂව 2018 දී රු.මි. 36,636 ක් විය.

එකෝචිත අතිරික්තය හඳුනා ගැනීම හා පිළියම් ලබා දීම සඳහා 2017 දී කොමිෂන් සභාව විසින් 16 වැනි විධානය නිකුත් කරන ලදී. ඒ අනුව, දිගු කාලීන ප්‍රධාන රක්ෂණ සමාගම් කිහිපයක් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා සහභාගිත්ව ව්‍යාපාර නොවන එකෝචිත අතිරික්තය කොටස්කරුවන්ගේ අරමුදල වෙත මාරු කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස 4 වන වගුවෙන් දැක්වෙන පරිදි 2017 දී දිගුකාලීන රක්ෂණකරුවන්ගේ ලාභදායීත්වය කැපී පෙනෙන ලෙස 67.57% න් රු.මි. 39,349 දක්වා වර්ධනය

**වගුව 03**
**ප්‍රධාන මූල්‍ය අංශයන් හී මුළු වත්කම් බෙදීයාම**

| මූල්‍ය අංශ | වත්කම් බෙදීයාම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | | 2015 | | 2016 | | 2017 | | 2018 | |
| | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % |
| බැංකු ක්ෂේත්‍රය | 8,442.0 | 70.3 | 9,503.7 | 68.7 | 10,575.8 | 69.5 | 11,897.4 | 69.7 | 13,708.3 | 72.4 |
| තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන | 857.0 | 7.1 | 1,044.2 | 7.6 | 1,246.7 | 8.2 | 1,370.4 | 8.0 | 1,542.7 | 8.2 |
| විශේෂිත මූල්‍ය ආයතන | 441.0 | 3.7 | 557.8 | 4.0 | 335.4 | 2.2 | 388.9 | 2.3 | 240.0 | 1.3 |
| ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන | 1,853.6 | 15.4 | 2,257.5 | 16.3 | 2,536.6 | 16.7 | 2,838.0 | 16.6 | 2,807.7 | 14.8 |
| රක්ෂණ සමාගම් | 422.0 | 3.5 | 466.5 | 3.4 | 525.3 | 3.5 | 581.7 (a) | 3.4 | 623.5 (b) | 3.3 |
| **එකතුව** | **12,015.6** | **100.0** | **13,829.6** | **100.0** | **15,219.8** | **100.0** | **17,076.4** | **100.0** | **18,922.2** | **100.0** |

මූලාශය : ශ්‍රී ලංකා මහ බැංකුව

විය. 2018 දී එච්එන්බී ලයිෆ් පමණක් රු.මි. 381 ක් වූ එකෝච්ත අතිරික්තයට මාරු කර ඇත (2017 - රු.මි. 15, 867).

2018 දී ප්‍රධාන වශයෙන් ජනශක්ති ලයිෆ් මගින් එහි අනුබද්ධ ආයතනයක් වන ජනශක්ති ජෙනරල් බැහැර කිරීමෙන් ලබා ගත් කැපී පෙනෙන ලාභය තුළින් බලපෑමට ලක් වූ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය රු.මි. 24,127 ක් බදු පෙර ලාභයක් වාර්තා කෙරිණි. එකෝච්ත අතිරික්තය හැර සංචිත නිදහස් කිරීම හේතුවෙන් පසුගිය වසර දෙක තුළ ජීවිත රක්ෂණකරුවන්ගේ සමස්ථ ලාභදායී බවෙහි වර්ධනයක් පෙන්නුම් කෙරිණි. 2018 වසර අවසානයේ දී ඒඅයිඒ ලයිෆ්, සෙලින්කෝ ලයිෆ්, එච්එන්බී ලයිෆ්, ජනශක්ති ලයිෆ්, සොෆ්ට්ලොජික් ලයිෆ්, එස්එල්අයිසී, යූනියන් ලයිෆ් යන ඇතැම් ජීවිත රක්ෂණකරුවන් තමන්ගේ පත් කරන ලද ජීවගණකඥයන්ගේ (Appointed Actuaries) නිර්දේශ සහිතව සහභාගිත්ව ව්‍යාපාර නොවන එකෝච්ත අතිරික්තයන් කොටස්කරුවන් වෙත මාරු කරන ලදී.

කර්මාන්තය තුළ පැවති දැඩි තරඟකාරීත්වය සහ මිළ කෙරෙහි වූ පීඩනය මධ්‍යයේ වුව ද සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය 2017 රු.මි. 9,469 ට සාපේක්ෂව 2018 දී ලද බදු පෙර ලාභය රු.මි. 11,318 ක් ලෙස වාර්තා විය. ඒ අනුව පසුගිය වසරට සාපේක්ෂව සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය තුළ 19.52% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2018 දී සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය වර්තා කළ මුළු බදු පෙර ලාභයෙන් 54.19% ක් කෙරෙහි එස්එල්අයිසී හා සෙලින්කෝ ජෙනරල් දායක වී ඇත.

**වගුව 04**
**රක්ෂණ සමාගම්වල ලාභදායිත්වය**

| රක්ෂකයා | 2017 (අ) | | | | 2018 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | දිගුකාලීන රක්ෂණය (රු.'000) | | සාමාන්‍ය රක්ෂණය (රු.'000) | එකතුව (රු.'000) | දිගුකාලීන රක්ෂණය එකෝච්ත අතිරික්තය මාරු කිරීමෙන් පසු (රු. '000) | සාමාන්‍ය රක්ෂණය (රු.'000) | එකතුව (රු.'000) |
| | එකෝච්ත අතිරික්තය මාරු කිරීමට පෙර | එකෝච්ත අතිරික්තය මාරු කිරීමෙන් පසු | | | | | |
| ඒඅයිඒ ලයිෆ් | 7,597,097 | 13,677,945 | | 13,677,945 | 1,616,851 | | 1,616,851 |
| අලියාන්ස් ජෙනරල් | | | 184,346 | 184,346 | | 573,717 | 573,717 |
| අලියාන්ස් ලයිෆ් | 104,026 | 104,026 | | 104,026 | 95,177 | | 95,177 |
| අමානා ජෙනරල් | | | 62,722 | 62,722 | | 22,987 | 22,987 |
| අමානා ලයිෆ් | 50,592 | 50,592 | | 50,592 | (61,520) | | (61,520) |
| ආර්පිකෝ | 206,013 | 206,013 | | 206,013 | 65,694 | - | 65,694 |
| සෙලින්කෝ ජෙනරල් | | | 1,702,653 | 1,702,653 | | 2,335,822 | 2,335,822 |
| සෙලින්කෝ ලයිෆ් | 6,351,351 | 9,807,535 | | 9,807,535 | 7,157,389 | | 7,157,389 |
| කොන්ටිනෙන්ටල් | | | 275,529 | 275,529 | | 436,349 | 436,349 |
| කෝපරේටිව් ජෙනරල් | | | 399,111 | 399,111 | | 417,169 | 417,169 |
| කෝප්ලයිෆ් | 54,880 | 54,880 | | 54,880 | 42,678 | | 42,678 |
| ෆෙයාෆස්ට් | | | 720,450 | 720,450 | | 724,809 | 724,809 |
| එච්එන්බී ලයිෆ්* | 725,665 | 725,665 | | 725,665 | 1,297,848 | | 1,297,848 |
| එච්එන්බී ජෙනරල් | | | 201,361 | 201,361 | | 282,805 | 282,805 |
| ජනශක්ති ලයිෆ් | (104,193) | 1,691,635 | | 1,691,635 | 9,378,738 | | 9,378,738 |
| ජනශක්ති ජෙනරල් | | | 1,361,882 | 1,361,882 | | - | - |
| එල්අයිසී | 24,643 | 24,643 | | 24,643 | (68,290) | | (68,290) |
| එල්ඕඑල්සී ජෙනරල් | | | 272,157 | 272,157 | | 205,466 | 205,466 |
| එල්ඕඑල්සී ලයිෆ් | 144,595 | 400,730 | | 400,730 | (263,142) | | (263,142) |
| එම්බීඑස්එල් | - | - | (46,437) | (46,437) | - | (149,232) | (149,232) |
| එන්අයිටීඑෆ්** | | | 812,150 | 1,077,186 | | 1,717,284 | 3,288,840 |
| ඔරියන්ට් | | | 65,874 | 65,874 | | 94,740 | 94,740 |
| පීපල්ස් | | | 866,691 | 866,691 | | 847,016 | 847,016 |
| සණස | 2,384 | 2,384 | 15,313 | 17,697 | (20,636) | 12,280 | (8,356) |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 1,106,517 | 1,904,521 | | 1,904,521 | 1,094,762 | | 1,094,762 |
| එස්එල්අයිසී | 3,216,447 | 3,314,683 | 2,575,519 | 5,890,202 | 1,658,851 | 3,796,991 | 5,455,843 |
| යූනියන් ලයිෆ් | 4,002,194 | 7,384,128 | | 7,384,128 | 2,132,392 | | 2,132,392 |
| **එකතුව** | **23,482,211** | **39,349,380** | **9,469,323** | **49,083,739** | **24,126,794** | **11,318,204** | **37,016,554** |

* 2018 වසර සඳහා රු.මි. 381 ක් වන එකෝච්ත අතිරික්ත මාරු කිරීම ඇතුළත් වේ.
** එලදාව හා ප්‍රතිරක්ෂණයට අදාළ බදු පෙර ලාභය පිළිවෙලින් රු.මි. 229 ( 2017 : රු.මි 128) හා රු.මි. 1342 ( 2017 : රු.මි. 136) මුළු ලාභයට ඇතුළත් වේ.

## රක්ෂණ සමාගම්වල කොටස්කරුවන්ගේ අරමුදල

5 වන වගුවෙහි දක්වා ඇති ආකාරයට රක්ෂණ සමාගම් විසින් වාර්තා කරන ලද සමස්ථ කොටස්කරුවන්ගේ අරමුදල් ප්‍රමාණය රු.මි. 191,273 ක් වූ අතර පසුගිය වසරට සාපේක්ෂව 8.19% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2018 දෙසැම්බර් 31 දිනට කර්මාන්තය මගින් වාර්තා කරන ලද මුළු සංචිත ප්‍රමාණය රු.මි. 150,390 ක් විය. මෙමගින් රු.මි. 16,248 ක් එකෝචිත අතිරික්තයක් පෙන්නුම් කෙරෙන අතර එය 16 වැනි විධානය අනුව ඇතැම් ජීවිත රක්ෂණකරුවන් විසින් කොටස්කරුවන්ගේ අරමුදල තුළ "සීමිත නියාමන සංචිතය" ලෙස පවත්වාගෙන යනු ලැබේ. වසර තුළ ජීවිත හා සාමාන්‍ය රක්ෂණකරුවන් කිහිප දෙනෙක් විසින් අලාභ වාර්තා කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස වසර අවසානයේ දී සංචිත තත්වයෙහි පසුබෑමක් වාර්තා කෙරිණි.

ලාභාංශ ගෙවීම හේතුවෙන් කොටස්කරුවන්ගේ අරමුදලෙහි සුළු පහළ බැසීමක් තිබියදී වුවද එසඑල්අයිසී මගින් කොටස්කරුවන්ගේ අරමුදලට අදාළව රු.මි. 58,806 ක් වර්තා කරමින් ඉතා ශක්තිමත් තත්වයක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, එස්එල්අයිසී තවමත් සාමාන්‍ය හා ජීවිත රක්ෂණ ව්‍යාපාරයන් වෙන් කර නොමැත. සෙලින්කෝ ලයිෆ් මගින් ද රු.මි. 26,426 ක් වූ කොටස්කරුවන්ගේ අරමුදලක් වාර්තා කරමින් යහපත් සංචිත තත්වයක් පෙන්නුම් කරන ලද අතර ඒ.අයි.ඒ ලයිෆ් හා යූනියන් ලයිෆ් පිළිවෙලින් දෙවන හා තුන්වන ස්ථාන ලබා ගන්නා ලදී.

සාමාන්‍ය රක්ෂණ සමාගම් සම්බන්ධයෙන් ගත් කල වසර තුළ ජනශක්ති ජෙනරල් සමාගම අත්පත් කර ගැනීම හේතුවෙන් අලියාන්ස් ජෙනරල් සමාගමෙහි ප්‍රකාශිත ප්‍රාග්ධන හා සංචිත තත්වය කැපී පෙනෙන අයුරින් වර්ධනය වී ඇත. වසර ගණනාවක් පුරා වෙළඳපළ තුළ ක්‍රියාකාරීව පැවති සෙලින්කෝ ජෙනරල් සමාගම විසින් 2018 දෙසැම්බර් 31 දිනට කොටස්කරුවන්ගේ අරමුදල් රු.මි. 11,145 ක් වාර්තා කරමින් ඉතා යහපත් සංචිත තත්වයක් පවත්වා ගන්නා ලදී.

## රක්ෂණ සමාගම්වල ශාඛා, සේවකයින් හා නියෝජිතයින් පිළිබඳ විශ්ලේෂණය

6 වන වගුවෙන් හා 4 වන රූප සටහනෙන් දක්වා ඇති පරිදි 2018 දී පුද්ගලයන් 19,437 දෙනෙකුහට රැකියා අවස්ථා නිර්මාණය කිරීම මගින් රක්ෂණ අංශය මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. ඒ අනුව, පසුගිය වසරට සාපේක්ෂව මෙම වසර තුළ රක්ෂණ කර්මාන්තය නව

**වගුව 05**

**රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල්**

| රක්ෂකයා | 2017 (අ) | | 2018 (ආ) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සමස්ථ කොටස් හිමියන්ගේ අරමුදල් (රු. 000) | % | ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු. 000) | සීමිත නියාමක සංචිතය (රු. 000) | මුළු වෙනත් සංචිතය (රු. 000) | සමස්ථ කොටස්කරුවන්ගේ මුළු අරමුදල් (රු. 000) | % |
| ඒඅයිඒ ලයිෆ් | 17,358,916 | 9.82 | 511,922 | 6,080,848 | 12,106,094 | 18,698,864 | 9.78 |
| අලියාන්ස් ජෙනරල් | 1,574,375 | 0.89 | 8,079,529 | | 3,315,595 | 11,395,124 | 5.96 |
| අලියාන්ස් ලයිෆ් | 883,746 | 0.50 | 739,624 | - | (21,563) | 718,060 | 0.38 |
| අමානා ජෙනරල් | 1,816,088 | 1.03 | 1,950,165 | | (22,600) | 1,927,565 | 1.01 |
| අමානා ලයිෆ් | 573,788 | 0.32 | 532,051 | - | 14,694 | 546,745 | 0.29 |
| ආර්පිකෝ | 933,197 | 0.53 | 675,565 | - | 323,327 | 998,891 | 0.52 |
| සෙලින්කෝ ජෙනරල් | 9,774,455 | 5.53 | 500,200 | | 10,645,123 | 11,145,323 | 5.83 |
| සෙලින්කෝ ලයිෆ් | 20,646,897 | 11.68 | 500,001 | 3,456,184 | 22,469,397 | 26,425,582 | 13.82 |
| කොන්ටිනෙන්ටල් | 1,436,494 | 0.81 | 750,000 | | 983,311 | 1,733,311 | 0.91 |
| කෝපරේටිව් ජෙනරල් | 2,080,131 | 1.18 | 1,430,195 | | 979,527 | 2,409,721 | 1.26 |
| කෝප්ලයිෆ් | 618,715 | 0.35 | 544,260 | - | 97,780 | 642,040 | 0.34 |
| ෆෙයාෆස්ට් | 4,530,086 | 2.56 | 3,131,949 | | 2,006,139 | 5,138,088 | 2.69 |
| එච්එන්බී ලයිෆ් | 3,776,277 | 2.14 | 1,171,875 | 381,156 | 3,962,849 | 5,515,880 | 2.88 |
| එච්එන්බී ජෙනරල් | 1,170,220 | 0.66 | 1,150,000 | | 228,434 | 1,378,434 | 0.72 |
| ජනශක්ති ලයිෆ් | 9,460,877 | 5.35 | 4,853,752 | 1,795,829 | 2,176,715 | 8,826,295 | 4.61 |
| ජනශක්ති ජෙනරල් | 7,878,355 | 4.46 | - | | - | - | - |
| එල්අයිසී | 652,425 | 0.37 | 500,000 | - | (5,321) | 494,679 | 0.26 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,251,828 | 0.71 | 700,000 | | 641,080 | 1,341,080 | 0.70 |
| එල්ඕඑල්සී ලයිෆ් | 984,033 | 0.56 | 800,000 | 256,134 | (336,112) | 720,022 | 0.38 |
| එම්බීඑස්එල් | 26,673 | 0.02 | 1,080,022 | - | (1,202,514) | (122,492) | (0.06) |
| එන්අයිටීඑෆ් | 7,354,525 | 4.16 | - | | 6,956,088 | 6,956,088 | 3.64 |
| ඔරියන්ට් | 668,831 | 0.38 | 825,000 | | (56,857) | 768,143 | 0.40 |
| පීපල්ස් | 3,057,239 | 1.73 | 1,350,000 | | 2,025,147 | 3,375,147 | 1.76 |
| සණස | 789,445 | 0.45 | 1,044,979 | - | 46,748 | 1,091,726 | 0.57 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 3,886,129 | 2.20 | 1,062,500 | 798,004 | 4,810,459 | 6,670,963 | 3.49 |
| එස්එල්අයිසී | 61,642,746 | 34.87 | 6,000,000 | 98,237 | 52,707,979 | 58,806,216 | 30.74 |
| යූනියන් ලයිෆ් | 11,964,714 | 6.77 | 1,000,000 | 3,381,934 | 9,289,754 | 13,671,688 | 7.15 |
| **එකතුව** | **176,791,205** | **100.00** | **40,883,587** | **16,248,326** | **134,141,272** | **191,273,185** | **100.00** |

**වගුව 06**

**2017 හා 2018 දෙසැම්බර් 31 දිනට ශාඛා, සේවකයින් හා නියෝජිතයින් සංඛ්‍යාව**


| Province | ශාඛා සංඛ්‍යාව | | සේවකයින් සංඛ්‍යාව | | නියෝජිතයින් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| මධ්‍යම පළාත | 177 | 204 | 1,018 | 1,070 | 4,418 | 3,768 |
| නැගෙනහිර පළාත | 153 | 166 | 652 | 682 | 2,286 | 2,272 |
| උතුරු මැද පළාත | 139 | 144 | 724 | 753 | 2,468 | 2,257 |
| වයඹ පළාත | 224 | 233 | 1,116 | 1,151 | 4,238 | 4,497 |
| උතුරු පළාත | 161 | 162 | 547 | 622 | 3,171 | 2,683 |
| සබරගමුව පළාත | 161 | 160 | 822 | 866 | 3,117 | 3,166 |
| දකුණු පළාත | 266 | 274 | 1,470 | 1,554 | 5,000 | 5,015 |
| ඌව පළාත | 121 | 124 | 583 | 632 | 2,435 | 2,204 |
| බස්නාහිර පළාත | 677 | 680 | 11,535 | 12,107 | 17,733 | 19,042 |
| **එකතුව** | **2,079** | **2,147** | **18,467** | **19,437** | **44,866** | **44,904** |

රැකියා අවස්ථා 1000 ක් පමණ නිර්මාණය කර ඇත. සාමාන්‍ය රක්ෂණය හා දිගු කාලීන රක්ෂණය මගින් පිළිවෙලින් නව රැකියා අවස්ථා 9,819 හා 6,248 ක් නිර්මාණය කරන ලද අතර සංයුක්ත සමාගම් මගින් ඇති කරන ලද රැකියා අවස්ථා ගණන 3,370 ක් විය. පසුගිය වසරවලට සමානව මුළු සේවක සංඛ්‍යාවෙන් 60% ක් බස්නාහිර පළාත තුළ සේවය කරයි.

තවද ක්ෂේත්‍රය තුළ නියෝජිතයින් 44,904 ක් සේවය කරන අතර සමාගමක සාර්ථකත්වයට සහ දිගුකාලීන තරඟකාරිත්වයට ඉවහල් වන ප්‍රධාන සාධකයක් ලෙස සැලකෙන පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඔවුන් විසින් ඉටු කරනු ලැබේ. නියෝජිතයින් සංඛ්‍යාව 2018 දී 7.38% කින් එනම් 19,042 දක්වා ඉහළ යාම හේතුවෙන් අලෙවි නියෝජිතයින් විසින් බස්නාහිර පළාත තුළ වටිනා කාර්ය භාරයක් ඉටු කරනු ලැබේ. තවද වයඹ පළාත තුළ සේවය කරන නියෝජිතයින් සංඛ්‍යාව ද 259 සිට 4,497 දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වුවද, 2018 දී නියෝජිතයින් සංඛ්‍යාව අඩු වීම ප්‍රධාන වශයෙන් මධ්‍යම හා උතුරු පළාත්වල දක්නට ලැබිණි. නියෝජිතයින්ගෙන් 90% කට වැඩි ප්‍රමාණයක් දිගු කාලීන හා සංයුක්ත සමාගම්වල සේවයේ නිරත වේ.

දිවයින පුරා පැතිරුණු ශාඛා ජාලය හරහා ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය තම සේවාවන් ව්‍යාප්ත කර ඇත. වසරින් වසර නව ශාඛා ස්ථාපිත කරන ලදී. 2018 දී වාර්තා වූ මුළු ශාඛා සංඛ්‍යාව 2,147 ක් වූ අතර 2017 දී වාර්තා වූ ශාඛා සංඛ්‍යාව 2,079 ක් විය. දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ සමාගම් වලට අදාළව වාර්තා වූ මුළු ශාඛා සංඛ්‍යාව පිළිවෙලින් 1,159 ක් හා 782 ක් විය. ඉතිරි ශාඛාවන් සංයුක්ත රක්ෂණ සමාගම් සතු වේ. වසර තුළ මධ්‍යම පළාත තුළ වන ශාඛා සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා ප්‍රධාන වශයෙන් වයඹ, උතුරු මැද, නැගෙනහිර, දකුණු හා බස්නාහිර පළාත්හි ශාඛා ස්ථාපිත කර ඇත.


**රූප සටහන 04**
**2018 දෙසැම්බර් 31 දිනට ශාඛා, සේවකයන් හා නියෝජිතයින් සංඛ්‍යාව**




## රක්ෂණ සමාගම්හි බෙදාහැරීමේ මාර්ග

නියෝජිතයින්, අලෙවිකරණ නිලධාරීන්, බැංකු හා වෙනත් මූල්‍ය ආයතන ඒකාබද්ධ කරන බහු විධ බෙදාහැරීමේ රාමු වර්තමානයේ රක්ෂණකරුවන් සතු වේ. තවද ඩිජිටල්කරණයේ සහාය ඇතිව පාරිභෝගික සබඳතාවන් තවදුරටත් ශක්තිමත් කෙරෙන විචේචනාත්මක උපදෙස් ලබා දීම, වෙනත් සේවාවක් තම පාරිභෝගියන් වෙත අලෙවි කිරීම හා අමතර සේවාවක් ලබා ගැනීමට පාරිභෝගිකයින් පෙළඹවීම මගින් අගය එකතු කිරීම් දක්නට ලැබිණි. ගෙවීම්, අලෙවිකරණය හා ප්‍රතිලාභ සැපයීම වැනි ඇතැම් ඒකාබද්ධ කාර්යයන් වලට අදාළ අගය එකතු කිරීම් සිදු කෙරුණ ද රක්ෂණ කර්මාන්තය තුළ බෙදාහැරීමේ මාර්ගයක් ලෙස මාර්ගගත අවකාශයේ වාසි උපරිම අයුරින් ලබා ගත යුතුව ඇත.

**රූප සටහන 05**
**රක්ෂණ සමාගම්වල බෙදාහැරීමේ මාර්ග**




| | 2017 දිගු කාලීන | 2017 සාමාන්‍ය | 2018 දිගු කාලීන | 2018 සාමාන්‍ය |
|---|---|---|---|---|
| නියෝජිතයින් | 87.41 | 33.19 | 86.93 | 34.76 |
| තැරැව්කරුවන් | 0.63 | 17.05 | 1.01 | 17.57 |
| විශේෂිත විකුණුම් බලකාය (රක්ෂණ නියෝජිතයන් නොවූ) | 3.69 | 43.72 | 3.02 | 41.67 |
| සෘජු | 1.69 | 2.84 | 1.55 | 2.85 |
| බැංකුරක්ෂණය | 5.92 | 2.85 | 7.14 | 2.87 |
| වෙනත් | 0.65 | 0.34 | 0.35 | 0.29 |

මුළු දළ ලිඛිත වාරික ප්‍රමාණයෙන් 86.93% ක් උත්පාදනය කිරීම මගින් ජීවිත රක්ෂණ වෙළඳපළ තුළ අඛණ්ඩව ප්‍රමුඛස්ථානයේ රැඳී සිටීමට නියෝජිතයින්ට හැකි වී තිබේ. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ප්‍රමාණය කෙරෙහි බැංකු රක්ෂණ සේවාවෙහි දායකත්වය 2017 දී 5.92% සිට 2018 දී 7.14% දක්වා වන සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇත. වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ විකුණුම් හා අලෙවි නිලධාරීන්ගේ වැදගත්කම පෙන්නුම් කෙරිණි. මන්දයත් මෙම කාණ්ඩය මගින් උත්පාදනය කරන ලද මුළු දළ ලිඛිත වාරික ප්‍රමාණය 41.67% (2017 : 43.72%) ක් වූ බැවිනි. ආයතනික නියෝජිතවරුන්, මූල්‍ය හා කල් බදු රක්ෂණ සමාගම් සහ කණ්ඩායම් ව්‍යාපාර ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ වාරික ආදායම් උත්පාදනය කරන වැදගත් මූලාශ්‍ර වන අතර මීට අදාළ මුළු දළ ලිඛිත වාරික ප්‍රමාණය 34.76% ක් ලෙස සැලකේ. වාරික ආදායමෙන් 17.57% ක් උත්පාදනය කරන තැරැව්කාර සමාගම් ද බෙදාහැරීමේ මාර්ගයක් ලෙස වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සෘජු රක්ෂණ ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් ජාතික රක්ෂණ භාර අරමුල හරහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රම නියෝජනය කරයි.

5 ප්‍රස්තාරය මගින් රක්ෂණ සමාගම්වල දළ ලිඛිත වාරිකය කෙරෙහි විවිධ බෙදාහැරීමේ මාර්ගවල දායකත්වය පෙන්නුම් කෙරේ.

## දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

### දළ ලිඛිත වාරිකය

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය තුළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාමට පමණක් ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් දොළහක් සහ සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් කටයුතු කරන සංයුක්ත රක්ෂණ සමාගම් තුනක් අතර දැඩි තරඟකාරීත්වයක් පෙන්නුම් කරයි.

2018 වර්ෂය සාපේක්ෂව අපේක්ෂිත මට්ටමට වඩා අඩු ආර්ථික වර්ධනය, සමාජ ආර්ථික ප්‍රතිපත්ති අස්ථාවරත්වය අඛණ්ඩව පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස ගෙවීම් තුලිතතාවට බලපෑම් එල්ල කරමින් තවදුරටත් මුදලේ අගය ක්ෂය වීම සහ උපයෝජ්‍ය ආදායම අඩු වීම සහ සෘජු හා වක්‍ර බදු ඉහළ යාම වැනි අභියෝගාත්මක ගෝලීය හා දේශීය ආර්ථික තත්වයන් සහිත වසරක් වී ඇත.

උක්ත අභියෝග තිබිය දී වුවද ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ කර්මාන්තය පසුගිය වසරට සාපේක්ෂව 12.20% (2017 : 12.75%) ක කැපී පෙනෙන වර්ධනයක් සහිතව රු.මි. 80,303 ක වාරික ආදායමක් (2017 : රු.මි. 71,571) වාර්තා කරමින් අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළේය.

ජීවිත රක්ෂණ වෙළඳපළ එහි වර්ධන වේගය පවත්වාගෙන ඇත්තේ පාරිභෝගිකයින්ගේ වෙනස් වන අවශ්‍යතාවන් සපුරාලීම සඳහා නව්‍ය ජීවිත රක්ෂණ නිපැයුම් හඳුන්වා දෙමින් දැනට පවතින නිපැයුම් යළි සකස් කිරීම මගින් පාරිභෝගිකයින් සඳහා ගුණාත්මකභාවයෙන් යුතු සේවාවක් තහවුරු කිරීම, ජීවිත රක්ෂණ නිපැයුම් සඳහා වන ඉල්ලුම ඉහළ නංවන ලද රටේ සමාජ ආර්ථික තත්වයන් කෙරෙහි රක්ෂණය හා සංවර්ධනය කළ නිපැයුම් බලපාන ආකාරය පිළිබඳ පාරිභෝගිකයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා වන මෙහෙයුම් ක්‍රියාවලිය වර්ධනය කිරීමට රක්ෂණකරුවන් විසින් දරණ ප්‍රයත්නය හේතුවෙනි.

තවද, රක්ෂණ සමාගම් පසුව කාණ්ඩගත කිරීම හේතුවෙන් රක්ෂණ සමාගම්වලට තම ව්‍යාපාර ක්ෂේත්‍රය පිළිබඳ දැඩි අවධානයක් යොමු කිරීමට සිදු වූ අතර සීඝ්‍ර නාගරීකරණය, පාරිභෝගික අවබෝධතා මට්ටම් හා මෙරට සාර්ව ආර්ථික ලක්ෂණ ආදිය 2018 වසර තුළ ජීවිත රක්ෂණ ව්‍යාපාරය තුළ වර්ධනයක් ඇති වීම සඳහා ධනාත්මකව බලපෑ සාධක විය.

ඒ අනුව, 2014 සිට 2018 දක්වා වූ කාල සීමාව තුළ වාර්තා වූ අඩු ව්‍යාප්ති මට්ටම් තිබියදී වුවද දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකයෙහි 80.07% ක් වර්ධනයක් දක්නට ලැබිණි. පහත දක්වා ඇති පරිදි මෙම කර්මාන්තය තුළ අවසන් වසර හතර තුළ දළ ලිඛිත වාරිකයේ 10% ට වැඩි වර්ධනයක් පෙන්නුම් කළ ද 2015 වසරේ සිට වාර්තා වී ඇති වර්ධන අනුපාතයෙහි අඩු වීමේ ප්‍රවණතාවක් විය. වගුව 7 මගින් දිගුකාලීන රක්ෂණ සමාගම්වල සමාගම් අනුව දළ ලිඛිත වාරිකය හා වෙළඳපළ කොටස දක්වනු ලැබේ.

සෙලින්කෝ ලයිෆ් සමාගම විසින් 2018 දී රු.මි. 17,813 ක දළ ලිඛිත වාරිකයක් (2017 : රු.මි. 15,765) උත්පාදනය කිරීම තුළින් දිගුකාලීන රක්ෂණ වෙළඳපළ තුළ ප්‍රමුඛස්ථානය පවත්වාගෙන යන ලද අතර මුළු දළ ලිඛිත වාරිකයෙන් 22.18% ක් සඳහා දායක වී ඇත. එච්එන්බිඒ අයිසී හා ඒඅයිඒ ලයිෆ් සමාගම විසින් රු.මි. 13,206 (2017 : රු.මි. 12,517) හා රු.මි.12,739 (2017 : රු.මි. 11,511) වන දළ ලිඛිත වාරික ප්‍රමාණයක් සහ පිළිවෙලින් වෙළඳපළ කොටස් 16.45% ක් හා 15.86% ක් වාර්තා කරමින් 2018 දී වෙළඳපළ තුළ දෙවන හා තෙවන ස්ථාන ලබා ගන්නා ලදී. මෙම සමාගම් තුන මුළු දළ ලිඛිත වාරිකය කෙරෙහි දැක්වූ දායකත්වය 2018 දී 55.60% ට සාපේක්ෂව 2018 දී 54.49% ක් දක්වා සුළු වශයෙන් අඩු වී ඇත.

**වගුව 07**


**සමාගම අනුව දළ ලිඛිත වාරික ආදායම සහ වෙළඳපොළ කොටස - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2014 | | 2015 | | 2016 | | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ ලිඛිත වාරිකය (රු. '000) | වෙළඳපොළ කොටස % | දළ ලිඛිත වාරිකය (රු. '000) | වෙළඳපොළ කොටස % | දළ ලිඛිත වාරිකය (රු.'000) | වෙළඳපොළ කොටස % | දළ ලිඛිත වාරිකය (රු.'000) | වෙළඳපොළ කොටස % | දළ ලිඛිත වාරිකය (රු.'000) | වෙළඳපොළ කොටස % |
| ඒඅයිඒ ලයිෆ් | 7,266,574 | 16.29 | 8,433,333 | 15.71 | 10,103,915 | 15.92 | 11,510,581 | 16.08 | 12,739,351 | 15.86 |
| අලියාන්ස් ලයිෆ් | 823,456 | 1.85 | 919,144 | 1.71 | 1,040,269 | 1.64 | 1,178,817 | 1.65 | 1,301,254 | 1.62 |
| අමානා ලයිෆ් | 679,029 | 1.52 | 928,294 | 1.73 | 820,727 | 1.29 | 792,174 | 1.11 | 822,261 | 1.02 |
| ආර්පිකෝ | 297,439 | 0.67 | 482,447 | 0.90 | 745,386 | 1.17 | 1,038,085 | 1.45 | 1,391,241 | 1.73 |
| සෙලින්කෝ ලයිෆ් | 12,002,524 | 26.91 | 13,456,828 | 25.06 | 15,027,600 | 23.67 | 15,765,484 | 22.03 | 17,812,774 | 22.18 |
| කෝප්ලයිෆ් | 402,046 | 0.90 | 494,598 | 0.92 | 466,997 | 0.73 | 626,972 | 0.88 | 624,600 | 0.78 |
| එච්එන්බී ලයිෆ් | 2,342,867 | 5.25 | 2,788,715 | 5.19 | 3,554,078 | 5.60 | 3,963,642 | 5.54 | 4,420,513 | 5.50 |
| ජනශක්ති ලයිෆ් | 2,170,419 | 4.87 | 2,550,782 | 4.75 | 2,943,963 | 4.64 | 2,902,873 | 4.06 | 3,008,842 | 3.75 |
| එල්අයිසී | 348,767 | 0.78 | 386,885 | 0.72 | 473,867 | 0.75 | 582,114 | 0.81 | 522,698 | 0.65 |
| එල්ඕඑල්සී ලයිෆ් | 592,422 | 1.33 | 1,209,578 | 2.25 | 1,896,558 | 2.99 | 2,467,166 | 3.45 | 2,610,785 | 3.25 |
| එම්බීඑස්එල් | 294,299 | 0.66 | 203,235 | 0.38 | 235,533 | 0.37 | 123,732 | 0.17 | 65,839 | 0.08 |
| සණස | 260,867 | 0.58 | 311,434 | 0.58 | 367,637 | 0.58 | 454,056 | 0.62 | 526,938 | 0.67 |
| එස්එල්අයිසී | 8,121,159 | 18.21 | 10,470,079 | 19.50 | 11,893,640 | 18.74 | 12,517,119 | 17.49 | 13,205,802 | 16.45 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 3,048,148 | 6.84 | 4,091,042 | 7.62 | 5,635,701 | 8.88 | 7,530,935 | 10.52 | 10,005,733 | 12.46 |
| යූනියන් ලයිෆ් | 5,945,499 | 13.33 | 6,964,390 | 12.97 | 8,270,751 | 13.03 | 10,117,630 | 14.14 | 11,243,915 | 14.00 |
| **එකතුව** | 44,595,516 | 100 | 53,690,783 | 100 | 63,476,622 | 100 | 71,571,380 | 100 | 80,302,546 | 100 |
| **වර්ධන අනුපාතය** (%) | 7.01 | | 20.40 | | 18.23 | | 12.75 | | 12.20 | |

යූනියන් ලයිෆ් සමාගම හා සොෆ්ට්ලොජික් ලයිෆ් සමාගම විසින් පසුගිය වසරට සමානව පිළිවෙළින් 14% ක් හා 12.46% ක් වෙලඳපල කොටස් ලබා ගැනීම තුළින් දිගුකාලීන රක්ෂණ අංශය තුළ සිව්වන හා පස්වන වැඩිම දළ ලිඛිත වාරික උත්පාදකයන් බවට පත් වීම සඳහා පිළිවෙලින් රු.මි. 11,244 (2017 : රු.මි. 10,118) හා රු.මි. 10,006 (2017 : රු.මි. 7,531) ක දළ ලිඛිත වාරික ප්‍රමාණයක් උපයාගෙන ඇත. සෙලින්කෝ ලයිෆ්, ආර්පිකෝ, සණස හා සොෆ්ට්ලොජික් ලයිෆ් හැර සියලු දිගුකාලීන රක්ෂණකරුවන් විසින් තම වෙළඳපළ කොටස්වල සුළු අඩු වීමක් වාර්තා කරන ලදී. තවද, 2017 ට සාපේක්ෂව 2018 දී වාර්තා කරන ලද 30% ට වැඩි වර්ධන අනුපාතයන්ට අදාළව ආර්පිකෝ හා සොෆ්ට්ලොජික් ලයිෆ් හි දළ ලිඛිත වාරිකයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කෙරිණි. එල්ඕඑල්සී ලයිෆ් සමාගමෙහි 2017 වාර්තා වූ 30% ක් වූ වර්ධන අනුපාතයට සාපේක්ෂව 2018 දී වර්ධන අනුපාතය 5% ක් දක්වා විශාල පහත වැටීමක් සිදු විය. තවද, කෝප්ලයිෆ් හා එල්අයිසී (2017 ජූනි 28 සිට 2019 අප්‍රේල් 2 දක්වා අත්හිටුවන ලද එම්බීඑස්එල් හැර) ඍණාත්මක වර්ධන අනුපාතයන් හා 2017 ට සාපේක්ෂව 2018 දී දළ ලිඛිත වාරිකයේ අඩු වීමක් වාර්තා කළේය. 6 ප්‍රස්තාරය මගින් 2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වන දළ ලිඛිත වාරිකයට අදාළව එක් එක් ජීවිත රක්ෂණකරුවාගේ කාර්යසාධනය දැක්වේ.

**රූප සටහන 06**

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා සමාගම් වශයෙන් දළ ලිඛිත වාරිකයන්හි වෙළඳපොල කොටස - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




## දළ ලිඛිත වාරිකය කෙරෙහි ඉහළම දායකත්වයක් සපයන රක්ෂණ ආයතන පහ - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

7 ප්‍රස්තාරය මගින් පසුගිය වසර 05 තුළ වෙළඳපළ කොටස්වලට අදාළ ඉහළම දායකයන් 05 සහ අනෙකුත් රක්ෂණකරුවන්ගේ විස්තර දැක්වේ. පසුගිය වසර වලට සමානව 2018 දී දිගුකාලීන රක්ෂණ වෙළඳපළ තුළ ඉහළම කොටස් 05 ලබා ගැනීමට සෙලින්කෝ ලයිෆ්, එස්එල්අයිසී, ඒඅයිඒ ලයිෆ්, යුනියන් ලයිෆ් හා සොෆ්ට්ලොජික් ලයිෆ් හැකි විය. මෙම සමාගම් එක්ව ගත් කල රු.මි. 65,008 ක දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කර ඇති අතර එය දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි 2018 මුළු දළ ලිඛිත වාරිකයෙන් 80.95% ක් (2017: 80.26%) විය. දිගුකාලීන රක්ෂණ අංශයේ ප්‍රමුඛයා ලෙස සෙලින්කෝ ලයිෆ් සමාගමෙහි වෙළඳපළ කොටස 2017 ට සාපේක්ෂව 2018 දී සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි ප්‍රධාන දායකයන් වනම් එස්එල්අයිසී, ඒඅයිඒ ලයිෆ් හා යුනියන් ලයිෆ් සමාගම් වෙළඳපළ කොටස් 2017 ට සාපේක්ෂව 2018 දී ක්‍රමයෙන් අඩු වී ඇත. 05 වන දායකයා ලෙස සොෆ්ට්ලොජික් ලයිෆ් සමාගම වෙළඳපළ කොටස් අතුරින් 12.46% ක් (2017: 10.52%) අත්පත් කරගෙන ඇති අතර පසුගිය වසර 05 තුළ තම වෙළඳපළ කොටස්වල අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළේය. දිගුකාලීන රක්ෂණ වෙළඳපළෙහි අනෙකුත් රක්ෂණකරුවන්ගේ වෙළඳපළ කොටස්වල සුළු අඩු වීමක් වාර්තා කළ අතර 2018 දී දිගුකාලීන රක්ෂණයට අදාළව උත්පාදනය කළ දළ ලිඛිත වාරිකය 19.05% කි. (2017 : 19.74)

**රූප සටහන 07**

**2014 සිට 2018 දක්වා වූ වසර සඳහා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | සෙලින්කෝ ලයිෆ් | එස්එල්අයිසී | ඒඅයිඒ ලයිෆ් | යුනියන් ලයිෆ් | සොෆ්ට් ලොජික් ලයිෆ් | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 2014 | 26.92 | 18.21 | 16.29 | 13.33 | 6.84 | 18.41 |
| 2015 | 25.06 | 19.50 | 15.71 | 12.97 | 7.62 | 19.14 |
| 2016 | 23.67 | 18.74 | 15.92 | 13.03 | 8.88 | 19.76 |
| 2017(අ) | 22.03 | 17.49 | 16.08 | 14.14 | 10.52 | 19.74 |
| 2018(ආ) | 22.18 | 16.45 | 15.86 | 14.00 | 12.46 | 19.05 |

## කාණ්ඩ අනුව දළ ලිඛිත වාරිකය, ප්‍රතිරක්ෂකයන් වෙත පවරන ලද වාරිකය සහ රඳවාගැනීමේ අනුපාතය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

8 වගුව මගින් දක්වා ඇති පරිදි 2018 දී සහභාග හා සහභාග නොවන ව්‍යාපාර පිළිවෙලින් 25.64% කින් (2017 : 26.81%) හා 71.80% කින් (2017 : 70.32%) දළ ලිඛිත වාරිකය කෙරෙහි දායක වී ඇත. ඇතැම් රක්ෂණකරුවන් සහභාග ව්‍යාපාරයෙන් ඈත් වී ඇති බැවින් සහභාග ලක්ෂණ පෙන්නුම් කරන නිපැයුම් සැපයුම අවම වී ඇත. කෙසේ වුවද, 2018 දී වාර්තා වූ මුළු දළ ලිඛිත වාරිකයෙන් 45% ක් වටිනා සහභාග ව්‍යාපාර කළඹක් එස්එල්අයිසී සතු විය. තවද, සහභාග ව්‍යාපාරය තුළ වාර්තා වූ දළ ලිඛිත වාරිකයෙන් හතරෙන් තුනක් එස්එල්අයිසී හා සෙලින්කෝ ලයිෆ් යන ප්‍රමුඛ පෙළේ රක්ෂණකරුවන් විසින් නියෝජනය කරන ලදී.

සහභාග නොවන ව්‍යාපාර කළඹෙහි දායකත්වය 2018 වසරේ දී 14.57% කින් ඉහළ ගොස් ඇති අතර එය රු.මි. 57,660 ක් ලෙස වාර්තා වී ඇත. වෙළඳපළ තුළ පවතින දිගුකාලීන බැඳි නිපැයුම් (linked long term) සඳහා වන ඉල්ලුමට හේතුව අඩු ආයෝජක විශ්වාසය වන අතර 2018 කොටස් වෙළඳපළ පැවති මන්දගාමී කාර්යසාධනය හේතුවෙන් රු.මි. 2054 ක දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කෙරිණි.

8 වගුවෙහි දක්වා ඇති පරිදි 2018 වසරේ ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි සමස්ථ රැඳවුම් අනුපාතය 95.81% ක් (2017 : 95.99%) විය. එහෙත් 2018 දී සහභාග

**වගුව 08**

**දළ ලිඛිත වාරික ආදායම ප්‍රතිරක්ෂකයන්ට පවරන ලද වාරික සහ රඳවාගැනීමේ අනුපාතය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| පන්තිය | 2016 | | | 2017 (අ) | | | 2018 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ ලිඛිත වාරිකය (රු. '000) | ප්‍රතිරක්ෂණකරුවන්ට පවරන ලද වාරිකය (රු. '000) | රඳවා ගැනීමේ අනුපාතය % | දළ ලිඛිත වාරිකය (රු. '000) | ප්‍රතිරක්ෂණ කරුවන් වෙත පවරන ලද වාරිකය (රු. '000 ) | රඳවා ගැනීමේ අනුපාතය % | දළ ලිඛිත වාරිකය (රු. '000) | ප්‍රතිරක්ෂණ කරුවන් වෙත පවරන ලද වාරිකය (රු. '000 ) | රඳවා ගැනීමේ අනුපාතය % |
| සහභාගි | 18,056,530 | 178,699 | 99.01 | 19,187,271 | 148,134 | 99.23 | 20,588,173 | 153,520 | 99.25 |
| සහභාගි නොවන | 43,393,219 | 2,271,917 | 94.76 | 50,327,490 | 2,661,364 | 94.71 | 57,660,445 | 3,115,590 | 94.60 |
| ඒකක සබැඳි | 2,026,873 | 30,069 | 98.52 | 2,056,618 | 59,872 | 97.09 | 2,053,927 | 98,672 | 95.20 |
| **එකතුව** | **63,476,622** | **2,480,685** | **96.09** | **71,571,380** | **2,869,370** | **95.99** | **80,302,546** | **3,367,781** | **95.81** |


නොවන ව්‍යාපාරයට අදාළව පසුගිය වසරට සාපේක්ෂව ප්‍රතිරක්ෂකයන්හට පවරන ලද වාරිකයෙහි 17% ක ඉහළ යාමක් පෙන්නුම් කළ අතර එය වාර්තා වූ දළ ලිඛිත වාරිකයේ වර්ධනයට සමව පවතියි. දිගුකාලීන බැඳි ව්‍යාපාරයට අදාළව ප්‍රතිරක්ෂණකරුවන්ට පවරන ලද වාරිකයේ වාර්තා වූ වර්ධනයට හේතුව රක්ෂණකරුවකුගේ ප්‍රතිරක්ෂණ කටයුතුවල වැඩි දියුණු වීමයි.

## දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්

ඵලදායී වත්කම්,වගකීම් කළමනාකරණය විශේෂයෙන් දිගුකාලීන රක්ෂණකරුවන් හට ඉතා වැදගත්වේ. 9 වගුව හා 8 ප්‍රස්තාරය මගින් 2017 දෙසැම්බර් 31 දිනට හා 2018 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව මුළු වත්කම් ප්‍රමාණය දැක්වේ. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් ප්‍රමාණය 2018 දෙසැම්බර් 31 දිනට රු.මි. 429,706 ක් (2017: රු.මි. 391,890) වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව මුළු වත්කම් ප්‍රමාණයෙහි 9.65% ක වර්ධනයක් වාර්තා විය.

පසුගිය වසර වලට සාපේක්ෂව වැඩිම කොටසක් එස්එල්අයිසී සතු වූ අතර එය රු.මි. 128,642 ක වටිනාකමින් යුතු වූ අතර එමගින් මුළු

**රූප සටහන 08**
**සමාගම් අනුව 2018 හා 2017 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් විශ්ලේෂණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




වත්කම් වලින් 29.94% ක් නියෝජනය කෙරිණි. වෙළඳපළ වත්කම් වලින් 27.47% ක් (රු.මි. 118,059) හා 12.66% ක් (රු.මි. 54,405) පිළිවෙලින් සෙලින්කෝ ලයිෆ් හා ඒඅයිඒ ලයිෆ් සතු වූ අතර දෙවන හා තෙවන ස්ථානයේ තහවුරු කර ගැනිනි. ඒ අනුව, එස්එල්අයිසී, සෙලින්කෝ ලයිෆ් හා ඒඅයිඒ ලයිෆ් යන සමාගම් සාමූහිකව දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් අතුරින් 70% ට වැඩි ප්‍රමාණයක් නියෝජනය කළේය.

තම වත්කම් පදනම ඉහළ නංවා ගැනීමට සහ පිළිවෙලින් සිව්වන, පස්වන හා හය වන ස්ථාන තහවුරු කර ගැනීමට යුනියන් ලයිෆ්, ජනශක්ති ලයිෆ් හා එච්එන්බී ලයිෆ් යන සමාගම්වලට හැකි විය. පසුගිය වසරට සමානව, 2018 දෙසැම්බර් 31 දිනට තම මුළු වත්කම් ප්‍රමාණය ඉහළ නංවා ගැනීමට සණස හැර සියළු සමාගම් වලට හැකි විය.

**වගුව 09**
**සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|
| | රු. '000 | % | රු. '000 | % |
| ඒඅයිඒ ලයිෆ් | 52,576,947 | 13.42 | 54,405,489 | 12.66 |
| අලියාන්ස් ලයිෆ් | 4,015,838 | 1.02 | 4,648,594 | 1.08 |
| අමානා ලයිෆ් | 2,809,627 | 0.72 | 2,844,544 | 0.66 |
| ආර්පිකෝ | 2,104,045 | 0.54 | 2,717,868 | 0.63 |
| සෙලින්කෝ ලයිෆ් | 106,094,508 | 27.07 | 118,059,390 | 27.47 |
| කෝප්ලයිෆ් | 2,214,565 | 0.57 | 2,369,515 | 0.55 |
| එච්එන්බී ලයිෆ් | 15,419,280 | 3.93 | 18,678,274 | 4.35 |
| ජනශක්ති ලයිෆ් | 20,020,952 | 5.11 | 20,919,453 | 4.87 |
| එල්අයිසී | 2,667,267 | 0.68 | 2,795,737 | 0.65 |
| එල්ඕඑල්සී ලයිෆ් | 4,102,317 | 1.05 | 4,683,738 | 1.09 |
| එම්බීඑස්එල් | 634,896 | 0.16 | 661,822 | 0.15 |
| සණස | 1,944,909 | 0.50 | 1,828,952 | 0.43 |
| එස්එල්අයිසී | 121,739,739 | 31.06 | 128,642,499 | 29.94 |
| සොෆ්ට්ලොජික් | 12,478,446 | 3.18 | 17,332,967 | 4.03 |
| යුනියන් ලයිෆ් | 43,067,007 | 10.99 | 49,116,729 | 11.43 |
| **එකතුව** | **391,890,345** | **100.00** | **429,705,570** | **100.00** |

## 2017 හා 2018 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

2018 දෙසැම්බර් 31 දිනට හා 2017 දෙසැම්බර් 31 දිනට විවිධ වත්කම් කාණ්ඩ අතර දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රණය 10 වගුවෙන් හා 9 ප්‍රස්තාරයෙන් දැක්වේ.

නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වීම සහ ආයෝජන අවදානම අවම කර ගැනීම සඳහා පසුගිය වසරට සමානව ජීවිත රක්ෂණකරුවන් විසින් රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබා දෙන ලදී. ඒ අනුව, මුළු වත්කම් අතුරින් 2018

**වගුව 10**

**2017 සහ 2018 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| වත්කම් වර්ගය | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|
| | (රු. '000) | % | (රු. '000) | % |
| රාජ්‍ය ණය සුරැකුම්පත් | 183,349,981 | 46.79 | 176,436,676 | 41.06 |
| ස්කන්ධ | 44,382,861 | 11.33 | 35,109,870 | 8.17 |
| සංස්ථා ණය | 72,939,391 | 18.61 | 80,776,780 | 18.80 |
| ඉඩම් හා ගොඩනැගිලි | 11,077,650 | 2.83 | 13,625,448 | 3.17 |
| තැන්පතු | 41,048,688 | 10.47 | 66,962,746 | 15.58 |
| ඒකක භාර | 6,881,290 | 1.76 | 6,884,885 | 1.60 |
| රක්ෂණ ඔප්පු ණය | 6,130,590 | 1.56 | 5,833,641 | 1.36 |
| වෙනත් වත්කම් | 22,587,408 | 5.76 | 40,617,878 | 9.46 |
| මුදල් හා මුදල් සමාන දෑ | 3,492,486 | 0.89 | 3,457,646 | 0.80 |
| **එකතුව** | **391,890,345** | **100** | **429,705,570** | **100** |

දෙසැම්බර් 31 දිනට පැවති රජයේ ණය සුරැකුම්පත්වල වටිනාකම රු.මි. 176,437 ක් වූ අතර එය 41.06% ක (2017: රු.මි. 183,350, 46.79%) නියෝජනයක් විය. එසේම පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේදී ව්‍යාපාර කොටස්වල ආයෝජනයේ සුළු අඩු වීමක් වාර්තා විය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ සාංගමික ණය, බැංකු තැන්පතු හා ස්කන්ධයන් මගින් අනෙක් ප්‍රධාන වත්කම් කාණ්ඩ නියෝජනය කෙරුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම්වලින් පිළිවෙලින් 18.80%, 15.58% හා 8.17% ක් නියෝජනය කෙරිණි. 2018 දෙසැම්බර් 31 දිනට සාංගමික ණය රු.මි. 80,777 දක්වා ඉහළ ගිය අතර එය 10.75% ක (2017: රු.මි. 72,939) වර්ධනයක් විය.


2018 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ ස්කන්ධයන් මත ආයෝජනයන් ප්‍රමාණය රු.මි. 35,110 ක් වූ අතර මෙය 2017 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රු.මි. 44,383 ට සාපේක්ෂව 20.89% ක අඩු වීමකි. මෙමගින් දේශපාලන අස්ථාවරත්වය, අස්ථිර ආර්ථික ප්‍රතිපත්ති හා සමාගම්හි ස්කන්ධයන් ආයෝජන කළඹ කෙරෙහි අයහපත් බලපෑම් එල්ල කළ නැගී එන වෙළඳපළ සඳහා හානිකර ගෝලීය සංවර්ධනයන් හේතුවෙන් දේශීය ස්කන්ධයන් වෙළඳපළ තුළ වූ ඍණාත්මක ක්‍රියාකාරීත්වය පිළිබිඹු කෙරේ. සාංගමික ණය ආයෝජනයන්හි සමානව වර්ධනයට බැංකු තැන්පතු වල වර්ධනය කෙරෙහි ඉහළ යන පොළී අනුපාතයන් හේතු වූ අතර, 2018 දෙසැම්බර් 31 දිනට බැංකු තැන්පතු ආයෝජනයන්හි අගය රු.මි. 66,963 ක් විය. එය 2017 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රු.මි. 41,049 ට සාපේක්ෂව 63.13% ක කැපී පෙනෙන වර්ධනයකි.

තවද, 2018 දෙසැම්බර් 31 දිනට අනෙකුත් වත්කම්වල කැපී පෙනෙන වැඩි වීමක් ද පෙන්නුම් කළේය. එසේම එය රු.මි. 40,618 ක් වූ අතර මුළු වත්කම් කළඹින් 9.46% ක් නියෝජනය කළේය. පසුගිය වසරට සාපේක්ෂව මෙම කාණ්ඩය 79.83% ක වර්ධනයක් වාර්තා කළ අතර එය ප්‍රධාන වශයෙන් විලම්බිත බදු වත්කම්, උපචිත ආයෝජන ආදායම, පාර්තෝෂිත ප්‍රතිලාභ වත්කම් සහ විවිධ ණයකරුවන් ආදියෙන් සමන්විත විය. සංශෝධිත බදු නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2018 දී ජීවිත රක්ෂණකරුවන් විසින් රු.මි. 9,156 ක වටිනාකමින් යුතු විලම්බිත බදු වත්කම් හඳුනා ගන්නා ලද අතර එය අනාගත බදු ගෙවීම් හිලව් කර ගැනීම සඳහා භාවිතා කළ හැකිය.

කෙසේ වුවද, 2018 දිගුකාලීන රක්ෂණකරුවන් සතු වූ මුළු වත්කම්වලින් 75.44% ක් (2017: 75.87%) රාජ්‍ය ණය සුරැකුම්පත්, සාංගමික ණය හා තැන්පතු වූ අතර ඉතිරි 24.56% (2017:24.13%) ස්කන්ධ, ඉඩම් හා ගොඩනැගිලි, අනෙකුත් වත්කම්, ඔප්පු ණය ආදියට අදාළ විය.

**රූප සටහන 09**

**2017 හා 2018 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




## ආයෝජන ආදායම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

2018 දී පොළී අනුපාතයන්ගේ ඉහළ යාමක් පෙන්නුම් කළ ද ආයෝජනයන් මගින් උත්පාදනය වූ මුළු ආදායම ඉහළ ගොස් ඇත්තේ 2017 දී වාර්තා වූ රු.මි. 34,183 ට සාපේක්ෂව 8.65% ක් වැනි සුළු ප්‍රමාණයකින් වන අතර එය රු.මි. 37,141 ක් විය. 11 වගුවෙන් දක්වා ඇති ආකාරයට රජයේ භාණ්ඩාගාර බැඳුම්කර, සාංගමික ණයකර හා බැංකු තැන්පතු වඩාත් ආකර්ෂණීය ආයෝජන විකල්පයන් වූ අතර එය මුළු ආයෝජන ආදායමෙන් 95.84% ක් විය.

**වගුව 11**

**සවිස්තරාත්මක සාමාන්‍ය ආයෝජනය සහ ආයෝජන ආදායම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| වර්ගීකරණය | 2017 (a) | | | 2018 (b) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම් (රු.'000) | සාමාන්‍ය ආයෝජනය (රු.'000) | ආයෝජන ඵලදා අනුපාතිකය (රු.'000) | ආයෝජන ආදායම් (රු.'000) | සාමාන්‍ය ආයෝජනය (රු.'000) | ආයෝජන ඵලදා අනුපාතිකය (රු.'000) |
| **රාජ්‍ය ණය සුරැකුම්පත්** | 19,677,088 | 172,823,351 | 11.39 | 19,509,213 | 179,893,329 | 10.84 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 18,321,109 | | | 17,876,498 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 108,711 | | | 296,332 | | |
| - වෙනත් (රිපෝ) | 1,247,268 | | | 1,336,382 | | |
| **ස්කන්ධ** | 1,013,995 | 33,899,535 | 2.99 | 1,071,240 | 31,041,750 | 3.45 |
| - ප්‍රාග්ධන ලාභ/අලාභ | (294,173) | | | (173,346) | | |
| - ලාභාංශ | 1,308,167 | | | 1,244,586 | | |
| **සංස්ථා ණය** | 8,417,610 | 72,160,137 | 11.67 | 9,528,146 | 76,858,085 | 12.40 |
| - ණයකර | 8,324,681 | | | 9,450,032 | | |
| - වාණිජමය පත්‍රිකා සහ වෙනත් | 92,929 | | | 78,114 | | |
| - වෙනත් සමාන මූල්‍ය උපකරණ | - | | | - | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 88,147 | 10,541,592 | 0.84 | 80,109 | 12,351,549 | 0.65 |
| **තැන්පතු** | 4,535,278 | 34,667,120 | 13.08 | 6,558,766 | 54,005,717 | 12.14 |
| - බැංකු | 4,080,779 | | | 6,013,545 | | |
| - මූල්‍ය ආයතන | 454,499 | | | 545,221 | | |
| **ඒකක භාර** | 104,828 | 4,410,341 | 2.38 | 235,590 | 6,883,088 | 3.42 |
| **ජීවිත රක්ෂණ ඔප්පු මත ණය** | 288,435 | 5,927,562 | 4.87 | 106,230 | 5,982,116 | 1.78 |
| **වෙනත්** | 57,868 | 721,486 | 8.02 | 52,091 | 1,135,697 | 4.59 |
| **එකතු** | **34,183,249** | **335,151,124** | **10.20** | **37,141,384** | **368,151,330** | **10.09** |

රු.මි. 179,893 ක් වන සාමාන්‍ය ආයෝජනවල සාපේක්ෂව 2018 දී රාජ්‍ය සුරැකුම්පත් මගින් උත්පාදනය වූ මුළු ආයෝජන ආදායම රු.මි. 19,509 ක් විය. ඒ අනුව, 2018 වසර සඳහා රාජ්‍ය ණය සුරැකුම්පත් මගින් වාර්තා වූ ආයෝජන ඉපයීම 10.84% ක් විය.

තවද, පසුගිය වසරට සාපේක්ෂව තැන්පතුවලින් ලද අයෝජන ආදායම 44.62% කින් ඉහළ ගොස් ඇත. ආයෝජන කළඹෙහි සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කළ සාංගමික ණය මගින් රු.මි. 9,528 ක ආයෝජන ආදායමක් (2017: රු.මි. 8,418) උත්පාදනය කරන ලදී. තවද සාංගමික ණයවලට අදාළ ආයෝජන ඉපයීම 2017 දී වාර්තා වූ 11.67% ට සාපේක්ෂව 2018 දී 12.40% ක් විය. ඒ අනුව, සියළු මූල්‍ය ආයෝජන අතුරින් ඉහළම ආයෝජන ඉපයීම් අනුපාතයක් වාර්තා වූයේ සාංගමික ණය මගිනි.

2017 ට සාපේක්ෂව 2018 දී සමස්ථ ආයෝජන ඉපයීම් 10.09% ක් විය.

## රක්ෂණ සමාගම්හි නුබුන්වත්භාවය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

12 වගුව මගින් 2017 හා 2018 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි පවත්නා මුළු ප්‍රාග්ධනය හා අවදානම් පාදක ප්‍රාග්ධනය හා ප්‍රාමාණවත් ප්‍රාග්ධන අනුපාතය දැක්වේ. 2018 හා 2017 වසර සඳහා වාර්තා වූ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි සාමාන්‍ය ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය පිළිවෙලින් 314% හා 355% ක් විය. 2018 දෙසැම්බර් 31 දිනට සියළු රක්ෂණ සමාගම් 120% ක් වන අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය සපුරා ඇති අතර එල්ඕඑල්සී ලයිෆ් සමාගම හැර සියළු සමාගම් කොමිෂන් සභාව මගින් නියම කර ඇති බලාත්මක මට්ටම වන 160% ඉක්මවූ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයක් වාර්තා කර ඇත. තවද, ප්‍රාග්ධන ප්‍රමාණත්ව අවශ්‍යතාවට අනුකූල වනු පිණිස රක්ෂණකරුවන් විසින් අවම වශයෙන් පූර්ණ පවත්නා ප්‍රාග්ධනය රු.මි. 500 ක් පවත්වා ගත යුතුය. එම්බීඑස්එල්, අමානා ලයිෆ් හා එල්අයිසී හැර සියළු ජීවිත රක්ෂණකරුවන් 2018 දෙසැම්බර් 31 දිනට පූර්ණ පවත්නා ප්‍රාග්ධනය රු.මි. 500 අවම අවශ්‍යතාවයට වඩා පවත්වා ගෙන ඇත. ඒ අනුව, අවම ප්‍රාග්ධන ප්‍රමාණත්ව අවශ්‍යතාවට අනුකූල නොවූ සියල්ලන් පිළිබඳ 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව කටයුතු කරන ලදී.

සියළු ජීවිත රක්ෂණ ගිවිසුම් එකවර පවාරණය කෙරෙන්නේ නම් පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු මගින් ඇතිවිය හැකි බරපතල අහිතකර තත්වයක අවදානම සම්බන්ධයෙන් කටයුතු කෙරෙන අතර ඇතැම් සමාගම්වලට අදාළ මෙම අගය සෘණ හෝ ශූන්‍ය වේ. ඒ අනුව, 2018 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තුව රු.මි. 4,895 ක් වූ අතර 2017 ට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු වූ අගයක් පෙන්නුම් කළේය.

## රක්ෂණ සමාගම් හි පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

13 වගුව මගින් 2018 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණරුවන්ට අදාළ පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාව දැක්වේ. 2018 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ සමාගම්වල පූර්ණ පවත්නා ප්‍රාග්ධන ප්‍රමාණයේ එකතුව රු.මි. 197,995 ක් වූ අතර පසුගිය වසරට සාපේක්ෂව 3.71% ක ඉතා අඩු වර්ධනයක් පෙන්නුම් කළේය. 2017 ට සාපේක්ෂව ජනශක්ති ලයිෆ් මගින් වාර්තා කළ පූර්ණ පවත්නා ප්‍රාග්ධන ප්‍රමාණයෙහි විශාල වර්ධනයක් පෙන්නුම් කළ අතර එයට ප්‍රධාන හේතුව

**වගුව 12**

**2017 හා 2018 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව නුබුන්වත්භාවය පිළිබඳ විශ්ලේෂණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2017 දෙසැම්බර් 31 දිනට (අ) | | | | 2018 දෙසැම්බර් 31 දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු. '000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු. '000) | පවාරණ වටිනාකමේ ප්‍රාග්ධන ගාස්තුව (රු. '000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු. '000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු. '000) | පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තුව (රු. '000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) (රු. '000) |
| ඒඅයිඒ ලයිෆ් | 23,866,513 | 3,853,018 | 4,010,591 | 595 | 19,221,556 | 2,934,346 | 974,079 | 655 |
| අලියාන්ස් ලයිෆ් | 1,208,658 | 172,560 | 79,873 | 700 | 1,214,542 | 293,397 | 100,329 | 414 |
| අමානා ලයිෆ් | 555,105 | 312,338 | - | 178 | 493,210 | 278,560 | - | 177 |
| ආර්පිකෝ | 1,417,242 | 163,944 | - | 864 | 1,618,804 | 413,912 | 406,492 | 391 |
| සෙලින්කෝ ලයිෆ් | 52,476,848 | 13,984,914 | - | 375 | 53,627,152 | 14,983,052 | 8,129 | 358 |
| කෝප්ලයිෆ් | 644,898 | 421,572 | - | 153 | 776,624 | 318,802 | - | 244 |
| එච්එන්බී ලයිෆ් | 6,038,377 | 1,689,029 | 483,048 | 358 | 6,636,693 | 2,082,131 | 451,835 | 319 |
| ජනශක්ති ලයිෆ් | 5,178,103 | 2,151,085 | 717,405 | 241 | 9,663,465 | 2,915,036 | 728,421 | 332 |
| එල්අයිසී | 665,053 | 253,998 | - | 262 | 476,371 | 248,126 | - | 192 |
| එල්ඕඑල්සී ලයිෆ් | 1,008,325 | 442,673 | - | 228 | 634,156 | 455,978 | - | 139 |
| එම්බීඑස්එල් | 155,065 | 78,956 | - | 196 | 219,364 | 57,412 | - | 382 |
| සණස | 522,525 | 289,799 | 54,773 | 180 | 594,237 | 290,923 | 2,953 | 204 |
| එස්එල්අයිසී | 74,563,589 | 17,278,458 | - | 432 | 80,502,789 | 18,308,338 | 608,221 | 440 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 6,084,461 | 2,921,106 | 826,001 | 208 | 7,933,517 | 3,961,403 | 1,450,442 | 200 |
| යූනියන් ලයිෆ් | 16,532,023 | 4,701,641 | - | 352 | 14,382,478 | 5,495,855 | 164,406 | 262 |
| **එකතුව/මුළු එකතුව** | **190,916,785** | **48,715,089** | **6,171,691** | **355** | **197,994,959** | **53,037,271** | **4,895,307** | **314** |

වූයේ සාපේක්ෂ පාර්ශවයන්හි පැවති ආවේශ්‍ය කල නොහැකි වත්කම් මෙම වර්ෂය තුළදී බැහැර කිරීමයි. පූර්ණ පවත්නා ප්‍රාග්ධන ප්‍රමාණය තීරණය කිරීමේ දී එම වත්කම් අඩු වීමක් ලෙස සැලකීය. තවද, සමාලෝචිත වසර තුළ පිළිගත නොහැකි වත්කම්වල ඉහළ යාම හා එල්ඕඑල්සී ලයිෆ් සමාගම් විසින් වාර්තා කරන ලද සැලකිය යුතු අලාභයන්ගේ ප්‍රතිඵලයක් ලෙස 2017 ට සාපේක්ෂව 2018 දී යූනියන් ලයිෆ්, ඒඅයිඒ ලයිෆ් හා එල්ඕඑල්සී ලයිෆ්

**වගුව 13**

**රක්ෂණ සමාගම්වල පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2017 දෙසැම්බර් 31 දිනට (අ) | 2018 දෙසැම්බර් 31 දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|
| | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු. '000) | පළමු ස්ථරය (රු. '000) | දෙවන ස්ථරය (රු. '000 ) | අඩු කිරීම් (රු. '000) | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු. '000) |
| ඒඅයිඒ ලයිෆ් | 23,866,513 | 18,475,920 | 6,548,764 | 5,803,128 | 19,221,556 |
| අලියාන්ස් ලයිෆ් | 1,208,658 | 1,457,677 | - | 243,135 | 1,214,542 |
| අමානා ලයිෆ් | 555,105 | 516,058 | 35,482 | 58,330 | 493,210 |
| ආර්පිකෝ | 1,417,242 | 1,883,431 | - | 264,627 | 1,618,804 |
| සෙලින්කෝ ලයිෆ් | 52,476,848 | 58,007,149 | 3,624,280 | 8,004,277 | 53,627,152 |
| කෝප්ලයිෆ් | 644,898 | 876,538 | 58,245 | 158,159 | 776,624 |
| එච්එන්බී ලයිෆ් | 6,038,377 | 9,339,704 | 381,156 | 3,084,166 | 6,636,693 |
| ජනශක්ති ලයිෆ් | 5,178,103 | 9,897,367 | 1,795,829 | 2,029,730 | 9,663,465 |
| එල්අයිසී | 665,053 | 572,026 | 9,050 | 104,704 | 476,371 |
| එල්ඕඑල්සී ලයිෆ් | 1,008,325 | 686,896 | 256,134 | 308,875 | 634,156 |
| එම්බීඑස්එල් | 155,065 | 220,695 | - | 1,331 | 219,364 |
| සණස | 522,525 | 849,357 | 1,221 | 256,341 | 594,237 |
| එස්එල්අයිසී | 74,563,589 | 82,938,158 | 31,128 | 2,466,497 | 80,502,789 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 6,084,461 | 10,575,915 | 846,440 | 3,488,838 | 7,933,517 |
| යූනියන් ලයිෆ් | 16,532,023 | 15,304,859 | 5,072,672 | 5,995,053 | 14,382,478 |
| **එකතුව** | **190,916,785** | **211,601,749** | **18,660,402** | **32,267,190** | **197,994,959** |

සමාගම් විසින් වාර්තා කරන ලද පූර්ණ පවත්නා ප්‍රාග්ධනය පිළිවෙලින් 13%, 19.46% හා 37% ක් ලෙස විශාල පහත බැසීමක් සිදු වී ඇත.

පූර්ණ පවත්නා ප්‍රාග්ධනය පළමුවන ස්ථරයේ හා දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය සහ අඩු කිරීම් වලින් සමන්විත වේ. පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනය යනු අලාභ සහ රඳවාගත් ඉපයීම් හා රඳවාගත් ඉපයීම් සඳහා වූ ගැලපීම් ආවරණය කිරීම සඳහා පූර්ණ වශයෙන් පවතින ප්‍රාග්ධනය වේ. 2017 දෙසැම්බර් 31 දිනට වූ රු.මි. 209,252 ට සාපේක්ෂව 2018 දෙසැම්බර් 31 දිනට වූ පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනය රු.මි. 211,602 ක් විය. අඛණ්ඩභාවය මත යම් ප්‍රමාණයකට අලාභ අවශෝෂණය කිරීමට ඉවහල් වන දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය 2018 දෙසැම්බර් 31 දිනට රු.මි. 18,660 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රු.මි. 6,947 ට සාපේක්ෂව කැපී පෙනෙන අන්දමින් ඉහළ ගොස් ඇත. එක් වරක් පමණක් පවතින අතිරික්තය හඳුනා ගැනීම හා ඒ සඳහා විසඳුම් ලබා දීම සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 16 නියමය ප්‍රකාරව, සහභාග ව්‍යාපාර හැර එක් වරක් පමණක් පවතින අතිරික්තය කොටස්කරුවන්ගේ අරමුදල් වෙත මාරු කිරීමට දිගුකාලීන රක්ෂණකරුවන්ට අවසර ලැබෙන අතර එමගින් මෙම අතිරික්තය "සීමිත නියාමන සංචිතය" ලෙස කොටස්කරුවන්ගේ අරමුදල් තුළ පවත්වාගෙන යාමට රක්ෂණකරුවන්ට මග පෙන්වන ලදී. නියමයේ දක්වා ඇති අවශ්‍යතාවන් ප්‍රකාරව "සීමිත නියාමන සංචිතය" දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය යටතේ වාර්තා කළ යුතු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසරට

**වගුව 14**

**2017 හා 2018 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව නියමිත අවදානම් ප්‍රාග්ධනය පිළිබඳ විශ්ලේෂණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2017 දෙසැම්බර් 31 දිනට (අ) (රු.'000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම | සංකේන්ද්‍රණ අවදානම | වෙළඳපොළ අවදානම | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගීකරණයට පෙර අවදානම් ප්‍රාග්ධන අයකිරීම් | විවිධාංගීකරණයට පසු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් |
| ඒඅයිඒ ලයිෆ් | 544,451 | 474,348 | 2,267,270 | - | 1,941,588 | 527,000 | 5,754,658 | 3,853,018 |
| අලියාන්ස් ලයිෆ් | 2,774 | 25,188 | 66,840 | 470 | 139,893 | 33,617 | 268,782 | 172,560 |
| අමානා ලයිෆ් | 28,721 | 214,431 | 63,375 | 529 | 49,814 | 28,114 | 384,984 | 312,338 |
| ආර්පිකෝ | 23,827 | 54,087 | 61,596 | - | 83,571 | 20,747 | 243,828 | 163,944 |
| සෙලින්කෝ ලයිෆ් | 1,068,870 | 567,911 | 12,088,853 | 4,653 | 2,430,953 | 1,071,222 | 17,232,461 | 13,984,914 |
| කෝප්ලයිෆ් | 50,641 | 12,837 | 300,411 | - | 211,709 | 22,063 | 597,662 | 421,572 |
| එච්එන්බී ලයිෆ් | 194,403 | 362,576 | 1,030,356 | 1,759 | 551,798 | 152,059 | 2,292,949 | 1,689,029 |
| ජනශක්ති ලයිෆ් | 247,394 | 53,919 | 1,700,189 | 1,082 | 760,967 | 194,302 | 2,957,852 | 2,151,085 |
| එල්අයිසී | 25,835 | 44,139 | 174,420 | 82 | 63,257 | 27,289 | 335,022 | 253,998 |
| එල්ඕඑල්සී ලයිෆ් | 1,072 | 16,189 | 240,874 | 4,457 | 354,006 | 41,041 | 657,639 | 442,673 |
| එම්බීඑස්එල් | 4,428 | 14,432 | 47,136 | 5 | 42,863 | 6,357 | 115,223 | 78,956 |
| සණස | 27,824 | 166,080 | 84,412 | 307 | 77,346 | 19,275 | 375,241 | 289,799 |
| එස්එල්අයිසී | 1,042,994 | 1,972,474 | 13,709,970 | - | 4,149,374 | 1,259,957 | 22,134,770 | 17,278,458 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 92,124 | 348,759 | 1,481,824 | - | 2,195,653 | 123,141 | 4,241,501 | 2,921,106 |
| යුනියන් ලයිෆ් | 196,407 | 471,272 | 3,837,662 | 276 | 1,270,902 | 435,499 | 6,212,016 | 4,701,641 |
| **එකතුව** | **3,551,764** | **4,798,642** | **37,155,187** | **13,620** | **14,323,694** | **3,961,683** | **63,804,590** | **48,715,089** |

| රක්ෂකයා | 2018 දෙසැම්බර් 31 දිනට (ආ) (රු. '000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම | සංකේන්ද්‍රණ අවදානම | වෙළෙඳපොළ අවදානම | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගීකරණයට පෙර අවදානම් ප්‍රාග්ධන අයකිරීම් | විවිධාංගීකරණයට පසු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් |
| ඒඅයිඒ ලයිෆ් | 420,637 | 574,443 | 1,007,142 | - | 2,074,536 | 545,703 | 4,622,461 | 2,934,346 |
| අලියාන්ස් ලයිෆ් | 2,380 | 7,035 | 215,230 | 779 | 184,040 | 37,356 | 446,819 | 293,397 |
| අමානා ලයිෆ් | 18,882 | 153,823 | 102,350 | 512 | 28,509 | 29,076 | 333,153 | 278,560 |
| ආර්පිකෝ | 33,831 | 121,978 | 135,120 | 264 | 292,926 | 26,911 | 611,030 | 413,912 |
| සෙලින්කෝ ලයිෆ් | 1,426,249 | 733,458 | 12,532,563 | 4,393 | 2,679,805 | 1,148,284 | 18,524,753 | 14,983,052 |
| කෝප්ලයිෆ් | 54,053 | 41,797 | 190,285 | - | 138,573 | 23,635 | 448,344 | 318,802 |
| එච්එන්බී ලයිෆ් | 239,892 | 405,478 | 1,352,803 | 2,235 | 547,326 | 184,588 | 2,732,322 | 2,082,131 |
| ජනශක්ති ලයිෆ් | 247,969 | 65,840 | 2,461,137 | 2,397 | 863,013 | 197,503 | 3,837,859 | 2,915,036 |
| එල්අයිසී | 27,673 | 67,415 | 143,172 | 117 | 63,359 | 26,978 | 328,715 | 248,126 |
| එල්ඕඑල්සී ලයිෆ් | 15,260 | 26,772 | 202,240 | - | 382,183 | 46,723 | 673,179 | 455,978 |
| එම්බීඑස්එල් | 2,342 | 4,692 | 43,457 | - | 26,513 | 6,622 | 83,626 | 57,412 |
| සණස | 26,723 | 175,162 | 85,285 | 341 | 40,565 | 18,103 | 346,179 | 290,923 |
| එස්එල්අයිසී | 1,264,435 | 2,185,672 | 14,278,384 | - | 4,391,860 | 1,267,836 | 23,388,188 | 18,308,338 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 167,517 | 608,112 | 2,027,729 | - | 2,793,684 | 170,954 | 5,767,996 | 3,961,403 |
| යුනියන් ලයිෆ් | 218,989 | 603,863 | 4,542,621 | - | 1,089,026 | 479,743 | 6,934,241 | 5,495,855 |
| **එකතුව** | **4,166,833** | **5,775,542** | **39,319,520** | **11,038** | **15,595,920** | **4,210,013** | **69,078,865** | **53,037,271** |

සාපේක්ෂව දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය 168.61% කින් ඉහළ යන ලදී.

අඩුකිරීම්, ප්‍රධාන වශයෙන් අස්පෘශ්‍ය හා ද්‍රවශීල නොවන වත්කම් වලින් සමන්විත අතර, පූර්ණ පවත්නා ප්‍රාග්ධනයෙන් 16.30% ක් නියෝජනය කරන ලදී. තවද, එය 2017 දී පැවති රු.මි. 25,283 ට සාපේක්ෂව 2018 දී රු.මි. 32,267 ක් දක්වා වන 27.63% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙයට ප්‍රධාන හේතුව වන්නේ 2018 වසර තුළ ජීවිත රක්ෂණකරුවන්ගේ විලම්බිත බදු වත්කම් හඳුනා ගැනීමයි.


## රක්ෂණ සමාගම් අනුව නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) සැසඳීම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

14 වගුව මගින් 2017 හා 2018 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව නියමිත අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාවට අදාළව විවිධ ප්‍රාග්ධන අයකිරීම් සංයුතිය දැක්වේ. නියමිත අවදානම් ප්‍රාග්ධනය යනු විවිධාංගීකරණය පිණිස යෝග්‍ය දීමනා සහිතව ප්‍රධාන අවදානම් කාණ්ඩ සඳහා තීරණය කරනු ලබන ප්‍රාග්ධන අයකිරීම් වල එකතුවයි. ණය අවදානම, සම්බන්ධතා අවදානම, වෙළඳපළ අවදානම, ප්‍රතිරක්ෂණ අවදානම, වගකීම් අවදානම හා මෙහෙයුම් අවදානම මේ සඳහා ප්‍රධාන අවදානම් කාණ්ඩ ලෙස සලකනු ලැබේ. 2018 දී දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සඳහා විවිධාංගීකරණයෙන් පසු මුළු නියමිත අවදානම් ප්‍රාග්ධන ගාස්තු ප්‍රමාණය රු.මි. 53,037 ක් (2017 : රු.මි. 48,715) විය. 2018 දී විවිධාංගීකරණයට පෙර එම අගය රු.මි. 69,079 ක් විය. පසුගිය වසරට සමානව රු.මි. 39,320 ක් වූ වෙළෙඳපළ අවදානම ප්‍රධාන ස්ථානයක් ගත් අතර පිළිවෙලින් වගකීම් අවදානම හා සම්බන්ධතා අවදානම මීළඟට වැදගත් විය. ඒ අනුව, මෙම අවදානම් කාණ්ඩ තුන විවිධාංගීකරණයට පෙර මුළු නියමිත අවදානම් ප්‍රාග්ධන ගාස්තු වලින් 87.86% ක් නියෝජනය කළේය.

## නිකුත් කරන ලද හා බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

2017 දී නිකුත් කරන ලද 643,483 ක් වූ නව රක්ෂණ ඔප්පු වලට සාපේක්ෂව 2018 වසර තුළ දිගුකාලීන රක්ෂණ සමාගම් විසින් නව ජීවිත රක්ෂණ ඔප්පු 712,013 ක් නිකුත් කර ඇති අතර එය 10.65% ක වැඩි වීමකි. මෙයට හේතුව ජීවිත රක්ෂණකරුවන් විසින් සිදු කරන ලද ජීවිත රක්ෂණය ජංගම දුරකථන යෙදුම් හරහා පිරිණැමීම, දින ප්‍රතිලාභ පියවීම් ආදී ඇතැම් නිර්මාණශීලී හා නව්‍ය කාර්යයන්ය. ඒ අනුව, 2018 වසර අවසානය වන විට බලාත්මකව පවතින මුළු ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 3,215,911 ක් (2017: 3,068,866) විය. 10 වැනි රූපසටහනේ දක්වා ඇති පරිදි පසුගිය වසර 05 තුළ බලාත්මකව පවතින මුළු ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති අතර එමගින් මෙරට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය අඛණ්ඩව ව්‍යාප්ත වන බව පෙනී යයි. ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2017 වාර්තා වූ 14.31% ට සාපේක්ෂව 2018 දී 14.84% ක් විය. තවද, ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2017 වාර්තා වූ 35.51% ට සාපේක්ෂව 2018 දී 37.93% ක් විය.

**රූප සටහන 10**
**නිකුත් කරන ලද සහ බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
|---|---|---|---|---|---|
| නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 545,303 | 740,511 | 668,714 | 643,483 | 712,013 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 2,604,667 | 2,889,763 | 3,009,427 | 3,068,866 | 3,215,911 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස* | 12.5 | 13.8 | 14.19 | 14.31 | 14.84 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙහ ප්‍රතිශතයක් ලෙස* | 29.6 | 33.6 | 37.62 | 35.51 | 37.93 |

*මූලාශ්‍රය: මධ්‍ය වාර්ෂික ශ්‍රම බලකාය හා ජනගහනය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## නිපැයුම් අනුව බලාත්මකව පවතින ඔප්පු හා රක්ෂිත මුදල - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය


15 වැනි වගුව මගින් 2017 හා 2018 වසර සඳහා වන නිපැයුම් වර්ගය මත පදනම්ව බලාත්මකව පවතින ඔප්පු සංඛ්‍යාව සහ රක්ෂිත මුදල පිළිබඳ විස්තර දැක්වේ. ප්‍රධාන වශයෙන් අනුරක්ෂණ, සාමාන්‍ය රක්ෂණය, සර්වත්‍ර ආයුකාලය, කාලීන, සම්පූර්ණ ජීවිත රක්ෂණය, පූර්ණ හා වෙනත් ලෙස ජීවිත රක්ෂණ කාණ්ඩගත කෙරිණි. 2018 දී මුළු රක්ෂිත මුදල රු.මි. 2,850,115 ක් වූ අතර වාර්ෂිකව 23.62% කින් වර්ධනය වී ඇත.

දැනට බලපවත්වන ඔප්පු අතුරින් බහුතරයක් මගින් අනුරක්ෂණය නියෝජනය කෙරුණු අතර එයට

**වගුව 15**
**2017 හා 2018 සඳහා නිෂ්පාදන අනුව බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සහ රක්ෂණය කළ මුදල - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| නිෂ්පාදන වර්ගය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | බලපවත්නා රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | රක්ෂිත මුදල (රු. '000) | බලපවත්නා රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | රක්ෂිත මුදල (රු. '000) |
| කාලීන රක්ෂණය | 446,307 | 835,316,103 | 530,885 | 922,955,498 |
| යුනිවර්සල් ජීවිත රක්ෂණය | 868,702 | 281,070,589 | 893,710 | 393,408,191 |
| යාවජීව ජීවිත රක්ෂණ | 23,835 | 1,525,598 | 24,435 | 1,635,183 |
| උප්පාදන රක්ෂණය | 1,439,456 | 372,435,760 | 1,270,693 | 417,939,398 |
| වෙනත් | 290,566 | 842,829,068 | 496,188 | 1,114,176,834 |
| **එකතුව** | **3,068,866** | **2,333,177,117** | **3,215,911** | **2,850,115,104** |

**රූප සටහන 11**
**2017 හා 2018 සඳහා නිෂ්පාදන අනුව බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




ආවේණික ලක්ෂණය වන එකවර ගෙවීම හේතුවෙන් මුළු වටිනාකම 1,270,693 ක් විය. කෙසේ වුවද, පාරිභෝගික ඉල්ලුමත් සමග 2017 දී වාර්තා වූ අනුරක්ෂණ ඔප්පු සංඛ්‍යාව වන 1,439,456 ට සාපේක්ෂව 2018 දී සුළු අඩු වීමක් දක්නට ලැබිණි. “වෙනත්” යන කාණ්ඩය සඳහා වන ඉල්ලුමට සෞඛ්‍ය සැලසුම්, සබැඳි ඒකක (Unit linked), වාර්ෂිකය සහ සමූහ ජීවිත රක්ෂණ ඇතුළත් වන අතර සෞඛ්‍යාරක්ෂණ ප්‍රතිලාභ, ආයෝජන ඉතුරුම් අංගය, නම්‍යශීලි බව මෙන්ම ඔප්පු හිමියාහට සැපයෙන විශ්‍රාම විකල්ප ආදී ඇතැම් ලක්ෂණ හේතුවෙන් වාර්ෂිකව 71% කින් වර්ධනයක් පෙන්නුම් කරයි.

තවද, 2017 ට සාපේක්ෂව 2018 දී කාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි ව්‍යාපාර පරිමාව තුළ ඉතා සුළු වැඩි වීමක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2017 සිට 2018 දක්වා බලපවත්වන ඔප්පු සංඛ්‍යාව 446,307 සිට 530,885 දක්වා ඉහළ ගොස් ඇත. ඒ අනුව මුළු රක්ෂිත මුදල රු.මි. 922,955 ක් (2017: රු.මි. 835,316) වූ අතර එය බලපවත්වන මුළු ඔප්පු සංඛ්‍යාවෙන් 16.51% ක් විය.

## රක්ෂණ ඔප්පු අවලංගුවීම් - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය


12 ප්‍රස්තාරයේ දක්වා ඇති පරිදි 2018 දී අවලංගුවූ මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2017 දී වාර්තා වූ 275,039 සිට 272,547 දක්වා අඩු විය. ඒ අනුව අවලංගුවූ ඔප්පු සංඛ්‍යාවේ 2,492 ක අඩු වීමක් පෙන්නුම් කෙරේ. එබැවින් අවලංගුවූ ඔප්පු සංඛ්‍යාවේ ප්‍රතිශතය බලාත්මකව පවතින මුළු ඔප්පු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2017 වාර්තා වූ 8.96% ට සාපේක්ෂව 2018 දී එම අගය 8.47% ක් දක්වා පහළ බැස ඇත. 2018 වසර තුළ අවලංගුවූ නව දිගුකාලීන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 85,253 ක් වූ අතර එය 2017 දී වාර්තාගත අවලංගුවූ 90,350 ක ඔප්පු සංඛ්‍යාවට සාපේක්ෂව 5.64% ක අඩු වීමකි. එබැවින් අවලංගුවූ නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාව නිකුත් කළ නව ඔප්පුවල ප්‍රතිශතයක් ලෙස ගත් කල 2017 දී වාර්තාගත 14.04% ට සාපේක්ෂව 2018 දී 11.97% දක්වා අඩු වී ඇත.

## රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම් පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

ජීවිත රක්ෂකයන් විසින් දරන ලද මුළු හිමිකම් පෑම් 2018 වසරේදී පැහැදිලි ලෙස ඉහළ ගිය අතර රුපියල් මිලියන 34,337 ක් වූ එම අගය (2017: රුපියල් මිලියන 26,371) වාර්ෂිකව 30.21% ක වර්ධනයකි. පසුගිය 05 වසර තුළ ජීවිත රක්ෂකයන් විසින් වටිනාකම අතින් දරන ලද ඉහළම හිමිකම් පෑම් වූයේ මෙයයි. 13 වැනි රූපසටහන මගින් දැක්වෙන පරිදි, දරන ලද මුළු හිමිකම්පෑම්ල අකර්මන්‍යතා ප්‍රතිලාභ, මරණ ප්‍රතිලාභ, පවාරණ ප්‍රතිලාභ කල්පිරීම් ප්‍රතිලාභ සහ ඔප්පු හිමියන් වෙත ගෙවනු ලබන අනෙකුත් ප්‍රතිලාභවලින් සමන්විත විය.


දරන ලද මුළු හිමිකම්පෑම් අතරින් කල්පිරීම් මත ප්‍රතිලාභ 2018 වසරේදී 53.24% ක් නියෝජනය කළේය (2017:54.58%). කෙසේවුවද, 2017 වසරට සාපේක්ෂව කල්පිරීම් ප්‍රතිලාභ 2018 වසරේදී 27% කින් ඉහළ ගොස් ඇති අතර විශාල සමාගම් කිහිපයක් විසින් පියවන ලද කල්පිරීම් මත ප්‍රතිලාභ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. දරන ලද හිමිකම්පෑම් වලින්

**රූප සටහන 12**
**අවලංගු වූ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සහ රක්ෂණ ඔප්පු අවලංගු වූ අනුපාතය – දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
|---|---|---|---|---|---|
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු | 103,500 | 93,008 | 102,697 | 90,350 | 85,253 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු | 278,061 | 264,473 | 271,586 | 275,039 | 272,547 |
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 18.98 | 12.56 | 15.36 | 14.04 | 11.97 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලපවත්නා මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 10.68 | 9.15 | 9.02 | 8.96 | 8.47 |

රූප සටහන 13
රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම්පෑම් – දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය




| | 2014 | 2015 | 2016(අ) | 2017(අ) | 2018(ආ) |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 436,518 | 430,617 | 488,818 | 636,472 | 965,313 |
| මරණ | 1,889,289 | 1,640,801 | 1,616,565 | 2,106,087 | 2,800,576 |
| පවාරණ | 7,184,611 | 5,267,864 | 5,121,636 | 5,530,517 | 6,994,574 |
| කල්පිරීමේ ප්‍රතිලාභ | 9,754,751 | 11,687,811 | 12,370,659 | 14,393,605 | 18,279,240 |
| වෙනත් ප්‍රතිලාභ | 1,378,929 | 1,906,560 | 2,887,039 | 3,704,469 | 5,297,039 |

සැලකිය යුතු කොටසක් පවාරණයන් විසින්ද නියෝජනය කරනු ලැබුවේ රුපියල් මිලියන 6,995 ක් ලෙස වාර්තා කරමිනි. එය මුළු හිමිකම් පෑම්වලින් 20.37% ක් නියෝජනය කළ අතර වාර්ෂිකව 26.47% කින් වර්ධනය වී තිබේ.

2017 වසරට සාපේක්ෂව 2018 වසර තුළදී අකර්මන්‍යතා ප්‍රතිලාභ සහ මරණ ප්‍රතිලාභ පිළිවෙලින් 51.67% ක් හා 32.98% ක් වශයෙන් ඉහළ ගොස් ඇත. සෞඛ්‍ය ප්‍රතිලාභ, අත්තිකාරම් ගෙවීම්, ප්‍රසාද මුදල්, අවලංගු කිරීම් සහ ආපසු ගෙවීම් යනාදිය ඇතුළත් අනෙකුත් ප්‍රතිලාභ රුපියල් මිලියන 5,297 ක් වූ අතර මුළු හිමිකම් පෑම්වලින් 15.43% ක් විය. මෙලෙස එය වාර්ෂිකව සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

## රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර

2018 වසරේදී හිමිකම්පෑම් වටිනාකමේ දක්නට ලද 30.21% ක වර්ධනය සමග මුළු හිමිකම් පෑම් සංඛ්‍යාව 394,434 දක්වා 15.03% කින් වර්ධනය වී තිබේ. කල්පිරීම් ප්‍රතිලාභ හිමිකම් පෑම් සංඛ්‍යාව 153,856 (2017: 128,266) ක් වූ අතර මුළු හිමිකම් පෑම්වලින් 39.01% ක් නියෝජනය කළේය. සෞඛ්‍ය ප්‍රතිලාභ, අවලංගුකිරීම්, ආපසු ගෙවීම්, කොටස් වශයෙන් ආපසු ගැනීම් යනාදිය මත විවිධ හිමිකම්පෑම්වල සංයෝගයක් වන "වෙනත්" හිමිකම් පෑම් 166,665 ක් දක්වා වාර්ෂිකව 14.58% කින් වර්ධනය වී තිබුණි. වෙනත් ප්‍රතිලාභ හිමිකම්පෑම් සහ කල්පිරීම් මත හිමිකම්පෑම් මුළු හිමිකම්පෑම් වලින් 81.26% ක් විය. පවාරණයන්, මුළු හිමිකම්පෑම් සංඛ්‍යාවෙන් 14.84% ක් නියෝජනය කළ අතර රක්ෂකයන් විසින් එය අවම කිරීම සඳහා අවධානය යොමු කළ යුතු වේ. 2017 වසරට වඩා ගෙවන ලද මරණ ප්‍රතිලාභ සංඛ්‍යාව 2018 වසරේදී 6.12% කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. කෙසේවුවද, අකර්මන්‍යතා හිමිකම්පෑම් හැර සියලු වර්ගයේ හිමිකම්පෑම් 2018 වසරේදී සැලකිය යුත් අන්දමින් ඉහළ ගොස් තිබේ. අකර්මන්‍යතා හිමිකම්පෑම් 2018 වසරේදී සැලකිය යුතු මට්ටමකින් පහත ගොස් තිබූ අතර මෙම අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් එක් ජීවිත රක්ෂකයෙකුගේ කටයුතු බලපෑවේය. 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව පිළිබඳ දත්ත 16 වැනි වගුව මගින් ඉදිරිපත් කෙරේ.

වගුව 16
රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 8,120 | 14,081 | 9,521 | 10,749 | 3,441 |
| මරණ | 5,795 | 6,747 | 8,418 | 11,247 | 11,935 |
| පවාරණ | 46,312 | 42,814 | 46,484 | 47,191 | 58,537 |
| කල්පිරීම් මත ප්‍රතිලාභ | 107,353 | 120,661 | 108,680 | 128,266 | 153,856 |
| වෙනත් ප්‍රතිලාභ | 84,835 | 112,337 | 143,336 | 145,452 | 166,665 |
| **එකතුව** | **252,415** | **296,640** | **316,439** | **342,905** | **394,434** |

# සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

## දළ ලිඛිත වාරික ආදායම

2018 වසරේදී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය රක්ෂණ සමාගම් පහළොවකින් සමන්විත විය. ඒ, සාමාන්‍ය රක්ෂණ කටයුතුවල පමණක් නියැලි රක්ෂකයන් එකොළහක්ද, සාමාන්‍ය හා දීර්ඝ කාලීන යන දෙවර්ගයේම රක්ෂණ ව්‍යාපාර කටයුතු හසුරුවන සංයුක්ත රක්ෂකයන් තුනක්ද, සාමාන්‍ය රක්ෂණ හා ප්‍රතිරක්ෂණ යන දෙවර්ග යේම ව්‍යාපාර කටයුතු හසුරුවන එක් රක්ෂකයෙක්ද වශයෙනි. ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සඳහා තරඟකාරී, සංගත, පාරදෘශ්‍ය හා ක්‍රමවත් පරිසරයක් නිර්මාණය කිරීම මෙම වෙළඳපොළ සමාගමිකයන් වෙතින් අපේක්ෂා කෙරිණි.

සාමාන්‍යයෙන් සිදුවන පරිදිම, ඉදිකිරීම් ව්‍යාපාර කටයුතු පහත යාම හා වාහන ලියාපදිංචිය ඉහළ යාම වැනි කර්මාන්තය තුළ මතුවූ අවස්ථා සහ අභියෝග හේතුවෙන් මෙම වර්ෂයේදී සාමාන්‍ය රක්ෂකයන් අතර වඩාත් තරඟකාරීත්වයක් දැකිය හැකි විය. වාහන ලියාපදිංචිය ඉහළ යාම විශාල වශයෙන් සිදු වූයේ මෝටර් රථ සම්බන්ධයෙනි. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2018 අයවැය තුළින් කුඩා එන්ජින් ධාරිතාවක් සහිත වාහන සඳහා අදාළ වූ හිතකර බදු ව්‍යුහයයි.

කෙසේවුවද පෙර වසරට සාපේක්ෂව 2018 වසරේදී අයහපත් කාලගුණික තත්වයන් මත කර්මාන්තයට අහිතකර බලපෑම් ඇත්විදීමට සිදු වූයේ අඩුවෙනි. අලියාන්ස් ලයිෆ් සහ ජනශක්ති ජෙනරල් යන සමාගම් ඒකාබද්ධ වීම හේතුවෙන් කර්මාන්තය තුළ තරගකාරීත්වය තවදුරටත් වර්ධනය වූ අතර ඉහළ මට්ටමේ වෙළඳපොල කොටස් හිමියන් අතර සැලකිය යුතු වෙනස්කම් ඇති විය.

2017 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 93,389 ක අගයට සාපේක්ෂව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් 2018 වසරේදී රුපියල් මිලියන 101,204 ක දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කළ අතර 19 වගුවේ දැක්වෙන පරිදි 8.37% ක තනි සංඛ්‍යාංක වර්ධනයක් වාර්තා කළේය. සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ අභිවෘද්ධියට උපකාරී වූ තාක්ෂණය, නව අලෙවිකරණ බෙදාහැරීම් උපක්‍රම සහ ගෙවීම් වැනි කර්මාන්තය විසින් මෙහෙයවන ලද සාධක මෙම වර්ධනය ඇති කිරීමට හේතු වශයෙන් සඳහන් කළ හැකිය. කෙසේ වුවද, පෙර වසරේ 17.34% ක් වූ වර්ධන අනුපාතය හා සැසඳීමේදී මෙම වසරේ දළ ලිඛිත වාරිකයේ දැකිය හැකි වූයේ මන්දගාමී වර්ධන අනුපාතයකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ගිනි, මෝටර් රථ වාහන හා විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතුවල දළ ලිඛිත වාරිකයේ පැවති අඩු වර්ධන අනුපාතය සහ සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු තුළ සිදු වූ ඍණාත්මක වර්ධනයයි.

ජනශක්ති ජෙනරල් සමාගම සමග ඒකාබද්ධ වීමත් සමග එස්එල්අයිසී අභිබවා යමින් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොල තුළ පෙරමුණ ගැනීමට අලියාන්ස් ජෙනරල් සමාගම සමත්ව ඇත. 16 ප්‍රස්තාරයෙන් හා 19 වගුවෙන් ඉදිරිපත් කෙරෙන පරිදි 2018 වසරේදී අලියාන්ස් ජෙනරල් සමාගම විසින් 18.39% ක වෙළඳපොල කොටසක් හිමිකර ගත් අතර රුපියල් මිලියන 18,610 ක වාරික ආදායමක් වාර්තා කළේය. 17.92% ක වෙළඳපොළ කොටසක් සහිතව (2017:18.22%) රුපියල් මිලියන 18,138 ක වාරික ආදායමක් (2017: රුපියල් මිලියන 17,012) වාර්තා කරමින් සෙලින්කෝ ජෙනරල් සමාගම රක්ෂණ වෙළඳපොළ තුළ දෙවන ස්ථානයේ පසුවිය.


රුපියල් මිලියන 17,905 ක වාරික ආදායමක් (2017: රුපියල් මිලියන 18,355) වාර්තා කරමින් එස්එල්අයිසී සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළ තුළ තෙවන ස්ථානය අත් කර ගත්තේය. එස්එල්අයිසී වෙළඳපොළ කොටස 2018 වසරේදී 17.69% ක් වශයෙන් වාර්තා වූ අතර (2017: 19.65%) 2017 වසර හා සැසඳීමේදී එය 1.96% ක පහත බැස්මක් පෙන්නුම් කරයි. 2018 වසරේදී රුපියල් මිලියන 10,947 ක වාරික ආදායමක් වාර්තා කරමින් (2017:රුපියල් මිලියන 9,611) 10.82% ක වෙළඳපොළ කොටසක් සහිතව (2017:10.29%) ෆෙයාෆර්ස්ට් සමාගම සිවු වන ස්ථානයේ පසුවිය.

**වගුව 17**

**සමාගම් අනුව දළ ලිඛිත වාරික සහ වෙළඳ පොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2014 | | 2015 | | 2016 | | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරිකය (රු. '000) | වෙළඳපොළ කොටස (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ කොටස (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ කොටස (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ කොටස (%) | දළ ලිඛිත වාරිකය (රු. '000) | වෙළඳපොළ කොටස (%) |
| ඒඅයිඒ ජෙනරල් | 2,655,577 | 4.34 | 3,297,840 | 4.76 | | | | | | |
| ඒඅයිජී | 414,805 | 0.68 | 3,141 | 0.00 | | | | | | |
| අලියාන්ස් ජෙනරල් | 2,723,406 | 4.45 | 3,244,844 | 4.68 | 4,247,691 | 5.34 | 5,956,142 | 6.38 | 18,610,471 | 18.39 |
| අමානා ජෙනරල් | 1,285,418 | 2.10 | 1,438,732 | 2.08 | 1,474,186 | 1.85 | 1,686,270 | 1.81 | 1,841,067 | 1.82 |
| සෙලින්කෝ ජෙනරල් | 11,431,680 | 18.68 | 12,921,561 | 18.65 | 15,265,433 | 19.18 | 17,012,087 | 18.22 | 18,137,933 | 17.92 |
| කොන්ටිනෙන්ටල් | 1,761,747 | 2.88 | 2,309,413 | 3.33 | 3,088,064 | 3.88 | 3,892,780 | 4.17 | 4,545,405 | 4.49 |
| කෝපරේටිව් ජෙනරල් | 1,358,932 | 2.22 | 1,691,705 | 2.44 | 2,420,130 | 3.04 | 2,966,679 | 3.18 | 3,692,397 | 3.65 |
| ෆෙයාෆස්ට් | 1,638,126 | 2.68 | 1,908,901 | 2.76 | 2,361,614 | 2.97 | 9,610,990 | 10.29 | 10,946,602 | 10.82 |
| එච්එන්බී ජෙනරල් | 2,182,915 | 3.57 | 2,577,224 | 3.72 | 2,982,385 | 3.75 | 3,662,008 | 3.92 | 4,062,172 | 4.01 |
| ජනශක්ති ජෙනරල් | 6,491,556 | 10.61 | 7,406,160 | 10.69 | 10,137,864 | 12.74 | 11,740,185 | 12.57 | - | 0.00 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,815,486 | 2.97 | 2,476,961 | 3.58 | 3,096,834 | 3.89 | 3,795,106 | 4.06 | 4,318,721 | 4.27 |
| එම්බීඑස්එල් | 961,225 | 1.57 | 1,159,208 | 1.67 | 972,976 | 1.22 | 260,806 | 0.28 | (512) | 0.00 |
| එන්අයිටීඑෆ් | 5,295,759 | 8.65 | 4,961,413 | 7.16 | 6,420,822 | 8.07 | 8,114,412 | 8.69 | 9,644,901 | 9.53 |
| ඔරියන්ට් | 491,127 | 0.80 | 746,935 | 1.08 | 810,728 | 1.02 | 1,179,000 | 1.26 | 1,376,398 | 1.36 |
| පීපල්ස් | 3,286,063 | 5.37 | 3,637,404 | 5.25 | 4,166,727 | 5.24 | 4,587,432 | 4.91 | 5,354,367 | 5.29 |
| සණස | 344,041 | 0.56 | 349,527 | 0.50 | 384,481 | 0.48 | 569,509 | 0.61 | 768,120 | 0.76 |
| එස්එල්අයිසී | 12,113,994 | 19.79 | 13,583,222 | 19.61 | 15,198,381 | 19.10 | 18,355,361 | 19.65 | 17,905,523 | 17.69 |
| යුනියන් ජෙනරල් | 4,950,741 | 8.09 | 5,557,189 | 8.02 | 6,561,571 | 8.23 | | | | |
| **එකතුව** | **61,202,599** | **100** | **69,271,380** | **100** | **79,589,887** | **100** | **93,388,766** | **100** | **101,203,564** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **5.01** | | **13.18** | | **14.90** | | **17.34** | | **8.37** | |

**රූප සටහන 14**
**2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ සමාගම් අනුව දළ ලිඛිත වාරිකවල වෙළඳපොළ කොටස**




2018 වසරේදී රුපියල් මිලියන 9,645 ක වාරික ආදායමක් උත්පාදනය කරමින් (2017: රුපියල් මිලියන 8,114) එන්අයිටීඑෆ් තම කාර්ය සාධනය වර්ධනය කරගත් අතර 9.53% ක් වශයෙන් පස්වන විශාලතම වෙළඳපොළ කොටස අත් කර ගත්තේය (2017: 8.69%). ඒ අනුවල එන්අයිටීඑෆ් වාරික ආදායම පෙර වසරට වඩා 18.87% කින් වර්ධනය වී ඇත.

2017 වසරේ වාර්තා වූ දළ ලිඛිත වාරිකය හා සැසඳීමේදී, ජනශක්ති ජෙනරල් සමාගම සමග ඒකාබද්ධ වීම හේතුවෙන් අලියාන්ස් ජෙනරල් සමාගම විසින් වාර්තා කරන ලද වර්ධනය හැරුණු විට, 20% කට වැඩි වර්ධන අනුපාතයක් වාර්තා කර ඇත්තේ සණස සහ කෝපරේටිව් ජෙනරල් පමණි. එස්එල්අයිසී, සෙලින්කෝ ජෙනරල් සහ එම්බීඑස්එල් හැර සියලු සාමාන්‍ය රක්ෂණ සමාගම් සඳහා වෙළඳපොළ තුළ හිමි ස්ථානය 2018 වසරේදී සුළු වශයෙන් ඉහළ ගොස් ඇත.


## දළ ලිඛිත වාරිකය සහ අනෙකුත් රක්ෂණ සඳහා ඉහළම දායකත්වය සපයන සමාගම් පහෙහි වෙළඳපොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

පසුගිය පස් වසර තුළ ප්‍රධාන දායකත්වය සපයන සමාගම් පහෙහි සහ අනෙකුත් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස පිළිබඳ දත්ත 15 ප්‍රස්තාරය මගින් ඉදිරිපත් කෙරේ. සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළ සමාගම්කයන් අතර පවතින තරගය අතරේදී අලියාන්ස් ජෙනරල් සමාගම, සෙලින්කෝ ජෙනරල් සමාගම සහ එස්එල්අයිසී 54% ක සමස්ත වෙළඳපොළ කොටසක් සහිතව 2018 වසරේදී වෙළඳපොළේ පෙරමුණ ගත්තේය (2017:50.44%).

ජනශක්ති ජෙනරල් සමාගම සමග ඒකාබද්ධ වීම මගින් අලියාන්ස් ජෙනරල් සමාගම තම වෙළඳපොළ කොටස පුළුල් කරගෙන ඇති අතර ඒකාබද්ධව ඔවුන් ඇති කරගත් ශක්තිය හේතුවෙන් 2018 වසරේදී 18.39% ක වෙළඳපොළ කොටසක් වාර්තා කරමින් වෙළඳපොළේ පෙරමුණ ගැනීමට ඔවුන් සමත්ව තිබේ. වාරික ආදායම 6.62% කින් ඉහළ ගොස් තිබුණද, සෙලින්කෝ ජෙනරල් සමාගමේ වෙළඳපොළ කොටස 2017 වසරේ වාර්තා වූ 18.22% අගයේ සිට 17.92% දක්වා 2018 වසරේදී පහළ ගොස් තිබේ. එස්එල්අයිසී 2018 වසරේදී 17.69% ක වෙළඳපොළ කොටසක් (2017: 19.65%) හිමිකර ගනිමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල තෙවන ස්ථානය අත් කරගෙන තිබේ. කෙසේවුවද, එස්එල්අයිසී වාරික ආදායම 2017 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 18,355 සිට 2018 වසරේදී රුපියල් මිලියන 17,905 දක්වා අඩු වී තිබේ. ෆෙයාෆස්ට් සහ එන්අයිටීඑෆ් පිළිවෙලින් 10.82% ක (2017:10.29%) සහ 9.53% ක (2017:8.69%) වෙළඳපොළ කොටස් අත්කර ගනිමින් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළ තුළ සිවුවන හා පස්වන ස්ථානයන්හි පසුවිය. මෙම සමාගම්කයන් පහ එක්ව මුළු දළ ලිඛිත වාරිකයෙන් 74.35% කට (2017: 69.42%) දායක වූ අතර පෙර වසරට වඩා 4.93% ක වර්ධනයක් වාර්තා කළේය.

පෙර වසරවලදී මෙන්ම, ඉතිරි සමාගම්වල වෙළඳපොළ කොටස්වල එකතුව 2017 වසරේ වාර්තා වූ 30.58% අගයේ සිට 2018 වසරේදී 25.65% දක්වා පහත බැස තිබේ. මෙම අඩුවීමටද හේතු වූයේ ජනශක්ති ජෙනරල් සමාගම, අලියාන්ස් ජෙනරල් සමාගම සමග 2018 සැප්තැම්බර් 28 වනදා සිට ඒකාබද්ධ වීමයි.

**රූප සටහන 15**
**2014 වසරේ සිට 2018 වසර දක්වා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




| | ජනශක්ති ජෙනරල්/ අලියාන්ස් ජෙනරල් | සෙලින්කෝ | එස්එල්අයිසී | යුනියන් ජෙනරල්/ ෆෙයාෆස්ට් | එන්අයිටීඑෆ් | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 2014 | 10.61 | 18.68 | 19.79 | 8.09 | 8.65 | 34.18 |
| 2015 | 10.69 | 18.65 | 19.61 | 8.02 | 7.16 | 35.86 |
| 2016 | 12.74 | 19.18 | 19.10 | 8.24 | 8.07 | 32.67 |
| 2017 (අ) | 12.57 | 18.22 | 19.65 | 10.29 | 8.69 | 30.58 |
| 2018 (ආ) | 18.39 | 17.92 | 17.69 | 10.82 | 9.53 | 25.65 |

## පන්ති වශයෙන් දළ ලිඛිත වාරිකය පිළිබඳ විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2014 සිට 2018 දක්වා වර්ෂ සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල ප්‍රධාන උප පන්ති මගින් උත්පාදනය කෙරුණු දළ ලිඛිත වාරිකය ඒවායේ වර්ධන අනුපාතයන් සහ මුළු දළ ලිඛිත වාරිකයෙන් ප්‍රතිශතයක් වශයෙන් හිමිකර ගන්නා කොටස සමග 18 වගුවෙන් සහ 16 ප්‍රස්තාරය මගින් දැක්වේ. වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්වලට අදාළ වාරික ඇතුළත්ව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල ප්‍රධාන උප පන්ති ගිනි, මුහුදු, මෝටර් රථ වාහන, සෞඛ්‍ය හා විවිධ රක්ෂණ ව්‍යාපාර විය.

18 වගුවේ දැක්වෙන පරිදි මෝටර් රථ වාහන රක්ෂණ 2018 වසරේදී මුළු දළ ලිඛිත වාරිකයෙන් 61.74% ක් නියෝජනය කළ (2017: 60.02%) රුපියල් මිලියන 62,479 ක දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කරමින් (2017: රුපියල් මිලියන 56,048) සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළ තුළ ප්‍රමුඛත්වය ගෙන තිබුණි. පෙර වසරවලදී මෙන්ම, මෝටර් රථ වාහන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වර්ධන අනුපාතය 11.47% දක්වා තවදුරටත් පහත බැස ඇත. 2017 වසරේදී වාර්තා වූ වර්ධන අනුපාතය 13.61% කි. එය වනා හී 2018 වසර තුළදී පනවනු ලැබූ පවතින දැඩි මූල්‍ය තත්වයන්හි ප්‍රතිඵලයකි.

රුපියල් මිලියන 14,185 ක දළ ලිඛිත වාරිකයක් (2017: රුපියල් මිලියන 14,649) තිබූ සෞඛ්‍ය රක්ෂණ මුළු දළ ලිඛිත වාරිකයෙන් 14.02% ක කොටසක් නියෝජනය කළ අතර 2017 වසර හා සන්සන්දනය කිරීමේදී 3.17% ක ඍණ වර්ධනයක් වාර්තා කළේය (2017: 45.96%). මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2017 ඔක්තෝම්බර් මාසයේදී අධ්‍යාපන අමාත්‍යංශය විසින් ශ්‍රී ලංකාවේ සියලු පාසල් දරුවන් සඳහා හඳුන්වා දෙනු ලැබූ නොමිලේ පිදෙන සුරක්ෂා වෛද්‍ය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය 2018 ඔක්තෝම්බර් මාසයේදී කල් ඉකුත් වීමත් 2018 /2019 සඳහා එය නැවත නිකුත් කිරීමේදී ඇති වූ ප්‍රමාදයත්ය.

2018 වසරේදී ගිනි රක්ෂණ ව්‍යාපාර කටයුතුවල දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 9,275 ක් වූ අතර (2017: රුපියල් මිලියන 8,597) මුළු දළ ලිඛිත වාරිකයෙන් 9.16% ක කොටසක් (2017: 9.21%) වාර්තා කළේ 7.88% ක වර්ධනයක් පෙන්නුම් කරමිනි (2017: 14.94%). 2017 වසරට සාපේක්ෂව 2018 වසරේදී ඉදිකිරීම් පරිමාවේ දක්නට ලැබූ පහළ අගය ගිනි රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වර්ධන අනුපාතය පහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය.

සෞඛ්‍ය රක්ෂණ හැර විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතු රුපියල් මිලියන 8,280 ක වාරික ආදායමක් උත්පාදනය කළ අතර (2017: රුපියල් මිලියන 7,866) මුළු දළ ලිඛිත වාරිකයෙන් 8.18% ක් නියෝජනය කළේය. විවිධ

**වගුව 18**


**දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| උප වර්ගය | දළ ලිඛිත වාරික ආදායම (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
| ගිනි | 6,353,292 | 6,604,074 | 7,479,910 | 8,597,489 | 9,274,723 |
| මුහුදු | 1,911,944 | 1,996,862 | 2,086,394 | 2,191,654 | 2,403,187 |
| මෝටර් රථවාහන | 35,786,941 | 42,622,205 | 49,333,000 | 56,047,640 | 62,478,575 |
| සෞඛ්‍ය | 7,593,386 | 8,534,364 | 10,036,518 | 14,649,440 | 14,185,167 |
| විවිධ | 6,721,836 | 6,495,454 | 7,120,742 | 7,866,260 | 8,280,272 |
| **උප එකතුව** | **58,367,399** | **66,252,959** | **76,056,564** | **89,352,484** | **96,621,924** |
| SRCC හා T | 2,835,200 | 3,018,421 | 3,533,324 | 4,036,283 | 4,581,641 |
| **එකතුව** | **61,202,599** | **69,271,380** | **79,589,888** | **93,388,766** | **101,203,564** |

| උප වර්ගය | වර්ධනය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
| ගිනි | 0.79 | 3.95 | 13.26 | 14.94 | 7.88 |
| මුහුදු | 6.40 | 4.44 | 4.48 | 5.05 | 9.65 |
| මෝටර් රථවාහන | 7.37 | 19.10 | 15.74 | 13.61 | 11.47 |
| සෞඛ්‍ය | 4.13 | 12.39 | 17.60 | 45.96 | (3.17) |
| විවිධ | (4.19) | (3.37) | 9.63 | 10.47 | 5.26 |
| උප එකතුව | **4.71** | **13.51** | **14.80** | **17.48** | **8.14** |
| SRCC හා T | 11.46 | 6.46 | 17.06 | 14.23 | 13.51 |
| **එකතුව** | **5.01** | **13.18** | **14.90** | **17.34** | **8.37** |

| උප වර්ගය | ප්‍රතිශත කොටස (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
| ගිනි | 10.38 | 9.53 | 9.40 | 9.21 | 9.16 |
| මුහුදු | 3.12 | 2.88 | 2.62 | 2.35 | 2.37 |
| මෝටර් රථවාහන | 58.47 | 61.53 | 61.98 | 60.02 | 61.74 |
| සෞඛ්‍ය | 12.41 | 12.32 | 12.61 | 15.69 | 14.02 |
| විවිධ | 10.98 | 9.38 | 8.95 | 8.42 | 8.18 |
| **උප එකතුව** | **95.37** | **95.64** | **95.56** | **95.68** | **95.47** |
| SRCC හා T | 4.63 | 4.36 | 4.44 | 4.32 | 4.53 |
| **එකතුව** | **100.00** | **100.00** | **100.00** | **100.00** | **100.00** |

**රූප සටහන 16**
**2014 සිට 2018 දක්වා දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප වර්ග අනුව විශ්ලේෂණය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




| | 2014 | 2015 | 2016 | 2017 (ඇ) | 2018 (ආ) |
|---|---|---|---|---|---|
| SRCC හා T | 4.63 | 4.36 | 4.44 | 4.32 | 4.53 |
| විවිධ | 10.98 | 9.38 | 8.95 | 8.42 | 8.18 |
| සෞඛ්‍ය | 12.41 | 12.32 | 12.61 | 15.69 | 14.02 |
| මෝටර් | 58.47 | 61.53 | 61.98 | 60.02 | 61.74 |
| මුහුදු | 3.12 | 2.88 | 2.62 | 2.35 | 2.37 |
| ගිනි | 10.38 | 9.53 | 9.40 | 9.21 | 9.16 |
| කර්මාන්ත වර්ධනය | 5.01 | 13.18 | 14.90 | 17.34 | 8.37 |

රක්ෂණයන්හි වර්ධන අනුපාතය 2017 වසරේදී වාර්තා වූ 10.47% අගයට සාපේක්ෂව 5.26% දක්වා පහළ ගොස් ඇත. මුහුදු රක්ෂණ වෙතින් වාර්තා වන ලද රුපියල් මිලියන 2,403 ක දළ ලිඛිත වාරිකය (2017: රුපියල් මිලියන 2,192) මුළු දළ ලිඛිත වාරිකයෙන් 2.37% ක් වූ අතර (2017: 2.35%) 2017 වසරට සාපේක්ෂව එය 9.65% ක වර්ධන අනුපාතයක් පෙන්වීය (2017: 5.05%). එන්අයිටීඑෆ් විසින් වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් වෙතින් ඇතිවන අවදානම් ආවරණය කිරීම සඳහා එකතු කරන ලද වාරික රුපියල් මිලියන 4,582 ක් වූ අතර (2017: රුපියල් මිලියන 4,036) 2018 වසරේදී 13.51% ක වර්ධන අනුපාතයක් වාර්තා කරමින් (2017: 14.23%) මුළු දළ ලිඛිත වාරිකයෙන් 4.53% ක් නියෝජනය කළේය.

## විවිධ රක්ෂණ ව්‍යාපාරයේ කටයුතුවල දළ ලිඛිත වාරික වර්ග අනුව විශ්ලේෂණය

2017 හා 2018 වර්ෂ තුළදී විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතු යටතේ වර්ග කරන ලද විවිධ රක්ෂණ අංශ වෙතින් උත්පාදනය කෙරුණු දළ ලිඛිත වාරික 19 වගුව මගින් දැක්වේ. විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතුවල ප්‍රධාන කාණ්ඩවලට පුද්ගලික අනතුරු, ගුවන් යානා බඳ, වෙනත් හා කම්කරු වන්දි හිමිකම් අයිතිය යනාදිය ඇතුළත් වේ. වර්ජන කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් සහ සහභාග හැර විවිධ රක්ෂණ වෙතින් උත්පාදනය කෙරුණු මුළු දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 8,280 ක් විය (2017: රුපියල් මිලියන 7,866). එය පෙර වසරට සාපේක්ෂව 5.26% ක වර්ධනයකි (2017: 10.47%).

හිමිකම් අයිතිය මාර්ගස්ථ භාණ්ඩ, කම්කරු වන්දි රක්ෂණ සහ වෙනත් යනාදී කාණ්ඩ හැර විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතුවල සියලු කාණ්ඩ 2018 වසර තුළදී ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතු යටතේ ඉහළම දළ ලිඛිත වාරික උත්පාදනය කරන ලද්දේ පුද්ගලික අනතුරු සහ ගුවන් යානා බඳ යන අංශ වන අතර ඒ, පිළිවෙලින් රුපියල් මිලියන 1,667 ක් (2017: රුපියල් මිලියන 1,435) හා රුපියල් මිලියන 1,051 ක් (2017: රුපියල් මිලියන 850) වශයෙනි.

විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වෙනත් කාණ්ඩය තෙවන විශාලතම ව්‍යාපාර කාණ්ඩය වූ අතර 2018 වසරේදී රුපියල් මිලියන 903 ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කළේය. එය 2017 වසරේදී උත්පාදනය කෙරුණු රුපියල් මිලියන 1,176 ක් වටිනා දළ ලිඛිත වාරිකයට සාපේක්ෂව 23.21 % ක පහත යාමක් පෙන්නුම් කළ අතර කාර්යසාධන බැඳුම්කර, ලංසු බැඳුම්කර යනාදියෙන් ප්‍රධාන වශයෙන් සමන්විත විය.

**වගුව 19**
**2017 හා 2018 සඳහා රක්ෂණ ව්‍යාපාරයේ විවිධ රක්ෂණ උප-පන්තියේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය**

| කාණ්ඩය | දළ ලිඛිත වාරික ආදායම රු.'000 | |
|---|---|---|
| | 2017 (ඇ) | 2018 (ආ) |
| හිමිකම් අයිතිය | 502,357 | 487,470 |
| පුද්ගලික අනතුරු | 1,434,805 | 1,666,986 |
| කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවදානම් | 281,601 | 467,916 |
| වෘත්තීය හානිරක්ෂණය | 275,178 | 334,498 |
| වාරිකා රක්ෂණය | 497,729 | 531,208 |
| විශ්වාසතා ඇපය | 100,207 | 117,688 |
| සොර බිය | 374,946 | 407,106 |
| සේප්පුවේ ඇති මුදල් ඇතුළු මාර්ගස්ථ මුදල් | 411,776 | 436,336 |
| මාර්ගස්ථ භාණ්ඩ | 133,885 | 125,159 |
| නිෂ්පාදන වගකීම | 141,741 | 149,555 |
| මහජන වගකීම් | 395,893 | 447,877 |
| බැංකුකරුවන්ගේ හානිරක්ෂණය | 396,087 | 397,635 |
| ගුවන්යානා බඳ | 849,838 | 1,051,199 |
| කම්කරු වන්දි | 734,274 | 717,806 |
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) | 500,000 | 500,000 |
| වෙනත් | 1,176,498 | 903,390 |
| **උප එකතුව** | **8,206,814** | **8,741,830** |
| අඩුකළා: ජාතික රක්ෂණ භාර අරමුදල හේතුවෙන් වර්ජන කැරලි කෝලාහල සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය මුළු වාරික ආදායම | (320,564) | (433,731) |
| සහභාග - රක්ෂකයින්ගේ වාරික ආදායම | (19,990) | (27,827) |
| **මුළු විවිධ රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම** | **7,866,260** | **8,280,271** |

## දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරිකය සහ රක්ෂකයන් විසින් රඳවාගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

20 වගුව සහ 17 ප්‍රස්තාරය මගින් 2014 වසරේ සිට 2018 දක්වා රක්ෂණ සමාගම් විසින් උත්පාදනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂකයන් වෙත පවරා දෙන ලද ප්‍රතිරක්ෂණ වාරිකය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල ප්‍රධාන පන්තිවල රඳවාගැනීම් මට්ටම් විදහා දැක්වේ. 20 වගුවේ දැක්වෙන පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් 2018 වසරේදී උපයන ලද රුපියල් මිලියන 96,622 ක මුළු දළ ලිඛිත වාරිකයෙන් වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්වලට අදාළ අගය හැර රුපියල් මිලියන 18,497 ක ප්‍රතිරක්ෂණ වාරිකයක් (2017: රුපියල් මිලියන 16,801) පවරා දී ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 80.86% ක (වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර) සමස්ත රඳවාගැනීම් අනුපාතයක් ඇතිව තිබේ (2017: 81.20%).

පෙර වසර වලදී හා සමානවම 93.20% ක ඉහළම රඳවාගැනීම් අනුපාතය (2017: 96.16%) වාර්තා කර ඇත්තේ මෝටර් රක්ෂණ ව්‍යාපාර කටයුතුය. කෙසේවුවද, 97.53%. ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කරමින් ප්‍රතිරක්ෂකයන් වෙත පවරන ලද වාරිකය රුපියල් මිලියන 2,152 සිට 2018 වසරේදී රුපියල් මිලියන 4,251 දක්වා ඉහළ ගොස් ඇති බැවින් පසුගිය වසරට සාපේක්ෂව රඳවාගැනීම් අනුපාතයේ සුළු අඩුවීමක් පෙන්නුම් කරයි. රට තුළ පසුගිය වසර කිහිපයකම පැවති අයහපත් කාලගුණික තත්වයන් හා ආශ්‍රිතව පැන නැගි අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිරක්ෂණ වැඩසටහන් වැඩි දියුණු කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**වගුව 20**

**දළ ලිඛිත වාරික ආදායම ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවාගනු ලැබීම් - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර**


| උප වර්ගය | දළ ලිඛිත වාරික ආදායම (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
| Fire | 6,353,292 | 6,604,074 | 7,479,910 | 8,597,489 | 9,274,723 |
| Marine | 1,911,944 | 1,996,862 | 2,086,394 | 2,191,654 | 2,403,187 |
| Motor | 35,786,941 | 42,622,205 | 49,333,000 | 56,047,640 | 62,478,575 |
| Health | 7,593,386 | 8,534,364 | 10,036,518 | 14,649,440 | 14,185,167 |
| Miscellaneous | 6,721,836 | 6,495,454 | 7,120,742 | 7,866,260 | 8,280,272 |
| **Sub Total** | **58,367,399** | **66,252,959** | **76,056,563** | **89,352,484** | **96,621,924** |
| SRCC & T | 2,835,200 | 3,018,421 | 3,533,324 | 4,036,283 | 4,581,641 |
| **Total** | **61,202,599** | **69,271,380** | **79,589,888** | **93,388,766** | **101,203,564** |

| උප වර්ගය | ප්‍රතිරක්ෂණ වාරික ආදායම (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
| Fire | 5,075,545 | 5,137,042 | 5,959,242 | 6,947,675 | 6,581,382 |
| Marine | 1,171,768 | 1,154,511 | 1,174,266 | 1,177,400 | 1,258,650 |
| Motor | 636,603 | 1,115,036 | 1,233,466 | 2,152,508 | 4,250,943 |
| Health | 2,634,795 | 3,012,362 | 486,984 | 2,682,617 | 1,676,719 |
| Miscellaneous | | | 3,213,645 | 3,840,459 | 4,728,932 |
| **Sub Total** | **9,518,711** | **10,418,951** | **12,067,604** | **16,800,660** | **18,496,626** |
| SRCC & T | - | - | - | 108,750 | 81,656 |
| **Total Reinsurance Premium** | **9,518,711** | **10,418,951** | **12,067,604** | **16,909,410** | **18,578,282** |

| උප වර්ගය | රඳවාගැනීම් (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
| Fire | 1,277,747 | 1,467,033 | 1,520,667 | 1,649,814 | 2,693,341 |
| Marine | 740,176 | 842,351 | 912,129 | 1,014,254 | 1,144,536 |
| Motor | 35,150,338 | 41,507,169 | 48,099,534 | 53,895,132 | 58,227,632 |
| Health | 11,680,427 | 12,017,456 | 9,549,533 | 11,966,823 | 12,508,448 |
| Miscellaneous | | | 3,907,097 | 4,025,800 | 3,551,340 |
| **Sub Total** | **48,848,688** | **55,834,008** | **63,988,960** | **72,551,823** | **78,125,298** |
| SRCC & T | 2,835,200 | 3,018,421 | 3,533,324 | 3,927,533 | 4,499,984 |
| **Total Net Written Premium** | **51,683,888** | **58,852,429** | **67,522,284** | **76,479,356** | **82,625,282** |

| උප වර්ගය | දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස රඳවා ගැනීම් (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
| Fire | 20.11 | 22.21 | 20.33 | 19.19 | 29.04 |
| Marine | 38.71 | 42.18 | 43.72 | 46.28 | 47.63 |
| Motor | 98.22 | 97.38 | 97.50 | 96.16 | 93.20 |
| Health | 81.59 | 79.96 | 95.15 | 81.69 | 88.18 |
| Miscellaneous | | | 54.87 | 51.18 | 42.89 |
| **Sub Total** | **83.69** | **84.27** | **84.13** | **81.20** | **80.86** |
| SRCC & T | 100.00 | 100.00 | 100.00 | 97.31 | 98.22 |
| **Overall Retention Ratio** | **84.45** | **84.96** | **84.84** | **81.89** | **81.64** |

**රූප සටහන 17**
**ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම් – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




2018 වසරේදී 88.18% ක (2017: 81.69%) දෙවන ඉහළම රඳවාගැනීම් අනුපාතය වාර්තා කරන ලද්දේ සෞඛ්‍ය රක්ෂණ වන අතර එය 6.49% ක වර්ධනයකි. ඒ අනුව, සෞඛ්‍ය රක්ෂණ සඳහා ප්‍රතිරක්ෂණය වෙත පවරන ලද වාරිකය 2017 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 2,683 ක අගයේ සිට 2018 වසරේදී රුපියල් මිලියන 1,677 දක්වා 37.50% කින් පහළ ගොස් තිබේ.

2018 වසරේදී ප්‍රතිරක්ෂකයන් වෙත පවරා දෙන ලද වාරිකය රුපියල් මිලියන 1,259 ක් (2017: රුපියල් මිලියන 1,177) වශයෙන් වාර්තා කළ මුහුදු රක්ෂණ අංශයේ රඳවාගැනීම් අනුපාතය 2017 වසරේ වාර්තා වූ 46.28% ක අගයට සාපේක්ෂව 1.35% කින් සුළු වශයෙන් ඉහළ ගොස් තිබේ.

විවිධ රක්ෂණ 42.89% ක රඳවාගැනීම් අනුපාතයක් පෙන්නුම් කළ අතර 2017 වසරේ එය වාර්තා කළ 51.18% අගයට සාපේක්ෂව 8.29% කින් පහළ ගොස් තිබේ. පෙර වසර වලදී හා සමානවම, 2018 වසරේ අඩුම රඳවාගැනීම් අනුපාතය ගිනි රක්ෂණ වෙතින් 29.04 % ක් ලෙස වාර්තා වුණු අතර 2017 වසරේ වාර්තා වූ 19.19% ක රඳවාගැනීම් අනුපාතයට සාපේක්ෂව එය ඉහළ යාමකි.

**වගුව 21**
**සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|
| | (රු. '000) | % | (රු. '000) | % |
| අලියාන්ස් ජෙනරල් | 6,954,152 | 3.75 | 31,203,197 | 16.42 |
| අමානා ජෙනරල් | 3,201,348 | 1.73 | 3,309,045 | 1.74 |
| සෙලින්කෝ ජෙනරල් | 25,551,645 | 13.77 | 27,899,029 | 14.68 |
| කොන්ටිනෙන්ටල් | 4,262,314 | 2.30 | 5,381,550 | 2.83 |
| කෝපරේටිව් ජෙනරල් | 4,667,558 | 2.52 | 5,510,538 | 2.90 |
| ෆෙයාෆස්ට් | 15,975,791 | 8.61 | 14,917,948 | 7.85 |
| එච්එන්බී ජෙනරල් | 4,385,775 | 2.36 | 4,773,910 | 2.51 |
| ජනශක්ති ජෙනරල් | 22,457,907 | 12.10 | - | 0.00 |
| එල්ඕඑල්සී ජෙනරල් | 5,077,102 | 2.74 | 5,531,511 | 2.91 |
| එම්බීඑස්එල් | 618,234 | 0.33 | 550,469 | 0.29 |
| එන්අයිටීඑෆ් | 13,165,645 | 7.09 | 11,909,582 | 6.27 |
| ඔරියන්ට් | 1,731,256 | 0.93 | 1,943,480 | 1.02 |
| පීපල්ස් | 7,745,115 | 4.17 | 8,417,568 | 4.43 |
| සණස | 633,678 | 0.34 | 715,143 | 0.38 |
| එස්එල්අයිසී | 69,155,434 | 37.26 | 68,024,988 | 35.79 |
| **එකතුව** | **185,582,954** | **100** | **190,087,958** | **100** |

## සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය


2018 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ සමාගම් අතර වත්කම් ව්‍යාප්තිය 21 වගුව සහ 18 ප්‍රස්තාරය මගින් දැක්වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 190,088 ක් ලෙස වාර්තා වුණු අතර 2017 වසර අවසානයේදී රුපියල් මිලියන 185,583 ක් වූ මුළු වත්කම් ප්‍රමාණය හා සැසඳීමේදී එය 2.43% කින් සුළු වශයෙන් සිදු වූ වර්ධනයකි.

පෙර වසරට සාපේක්ෂව එස්එල්අයිසී වත්කම් කොටස 1.47% කින් පහළ ගොස් තිබුණද පෙර වසර වලදී මෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි විශාලතම වත්කම් කොටස එස්එල්අයිසී සතු විය. එය රුපියල් මිලියන 68,025 ක් වූ අතර (2017: රුපියල් මිලියන 69,155) මුළු කර්මාන්ත වත්කම්වලින් 35.79% ක් නියෝජනය කරයි.

2018 දෙසැම්බර් 31 වන දිනට අලියාන්ස් ජෙනරල් සමාගම විසින් රුපියල් මිලියන 31,203 ක වටිනාකමින් යුත් වත්කම් (2017: රුපියල් මිලියන 6,954) වාර්තා කරන ලද අතර 2018 වසරේදී ජනශක්ති ජෙනරල් සමාගම සමග ඒකාබද්ධ වීම හේතුවෙන් එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 24,249 කින් සිදු වූ වර්ධනයකි. මේ අනුව එම සමාගම මෙම කර්මාන්තයේ වත්කම් කොටස අනුව දෙවන ස්ථානය අත් කරගැනීමට සමත් විය.

සෙලින්කෝ ජෙනරල් සමාගම, ෆෙයාෆස්ට් සමාගම සහ එන්අයිටීඑෆ් යන ආයතන 2018 වසරේදී මුළු වත්කම් වලින් 14.68% (2017: 13.77%), 7.85% (2017: 8.61%) සහ 6.27% (2017: 7.09%) යන ප්‍රමාණ නියෝජනය කළ අතර පිළිවෙලින් තෙවන, සිවුවන හා පස්වන ස්ථාන හිමි කර ගන්නා ලදී. කෙසේවුවද, 2017 වසර සමග සැසඳීමේදී එන්අයිටීඑෆ් වත්කම් පහළ යාමක් 2018 වසරේදී දක්නට ලැබේ. 21 වගුවේ දැක්වෙන පරිදි සාමාන්‍ය රක්ෂණ

**රූප සටහන 18**
**සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




සමාගම්වල මුළු වත්කම් ප්‍රමාණයෙන් 81.01% ක්ම ඉහළම මට්ටමේ සමාගම් පහක් අතර සංකේන්ද්‍රණය වී ඇති බවත් ඉතිරි 18.99% ක ප්‍රමාණය අනෙකුත් රක්ෂණ සමාගම් දහය විසින් හිමි කරගෙන ඇති බවත් පෙනේ.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් සංකේන්ද්‍රණය


2017 සහ 2018 වසරවල දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් සංකේන්ද්‍රණය වී ඇති ආකාරය 22 වගුව සහ 19 ප්‍රස්තාරය මගින් දැක්වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 190,088 ක් වූ අතර (2017: රුපියල් මිලියන 185,583) එය 2017 දෙසැම්බර් 31 වන දිනට මුළු වත්කම් ප්‍රමාණය හා සැසඳීමේදී 2.43% ක වර්ධනයකි. වත්කම් වලින් වැඩිම ප්‍රමාණයක් සාමාන්‍ය රක්ෂණ අංශයේ ප්‍රධාන ආයෝජන කාණ්ඩය වශයෙන් රජයේ ණය සුරැකුම්පත් වල ආයෝජනය කෙරුණු අතර එය මුළු වත්කම්වලින් 27.98% ක ප්‍රමාණයක් නියෝජනය කරන රුපියල් මිලියන 53,188 ක (2017: රුපියල් මිලියන 41,880) ආයෝජන ප්‍රමාණයක් විය. රජයේ ණය සුරැකුම්පත් ආශ්‍රිතව අවම අවදානමක් පැවතීම සහ නියාමන අවශ්‍යතා සමග අනුගත වීම සඳහා යන කාරණා මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. පනතේ 25(1) වගන්තියෙහි සඳහන් වන පරිදි, සෑම රක්ෂකයෙකු විසින්ම තාක්ෂණික සංචිතවලින් අවම වශයෙන් 20% ක ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. ඒ අනුව, රක්ෂණ සමාගම් එයට අනුගතව කටයුතු කරන බවත් ඉතිරි වත්කම් නිර්ණය අංක 1 හා අනුකූලව ආයෝජනය කෙරෙන බවත් කොමිෂන් සභාව විසින් සහතික කරනු ලබයි.

අස්ථාවර දේශපාලන තත්වය අසංගත ආර්ථික ප්‍රතිපත්ති සහ අහිතකර ගෝලීය සංවර්ධනයන් යනාදී විවිධ සාධක හේතු කොට 2018 වසරේ දී කොටස් වෙළඳපොළ කාර්යසාධනයක් පෙන්නුම් කර නොමැත. කෙසේවුවද, කොටස්වල කෙරුණු ආයෝජනයන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි දෙවැනි විශාලතම වත්කම් කාණ්ඩය නියෝජනය කළ අතර එය 2018 දෙසැම්බර් 31 වන දිනට මුළු වත්කම්වලින් 18.02% ක ප්‍රමාණයක් විය (2017: 20.67%). එම අගය 2017 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 38,556 සිට 2018 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 34,250 දක්වා සිදුවූ 10.7% ක සෘණාත්මක වර්ධනයකි. මේ අතර කොටස් ආයෝජනවලින් 58% ක ප්‍රමාණයකින් නියෝජනය වනුයේ එස්එල්අයිසී විසින් අනුබද්ධ ආයතනවල කරන ලද ආයෝජන වේ.

**වගුව 22**
**2017 සහ 2018 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| වත්කම් වර්ගය | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|
| | රු '000 | % | රු '000 | % |
| රජයේ ණය සුරැකුම්පත් | 41,879,803 | 22.57 | 53,188,206 | 27.98 |
| ස්කන්ධ | 38,355,540 | 20.67 | 34,249,739 | 18.02 |
| සංස්ථා ණය | 12,755,297 | 6.87 | 13,506,161 | 7.11 |
| ඉඩම් හා ගොඩනැගිලි | 11,369,560 | 6.13 | 11,206,996 | 5.90 |
| තැන්පතු | 18,322,254 | 9.87 | 20,491,247 | 10.78 |
| ඒකක භාර | 1,528,271 | 0.82 | 1,228,957 | 0.65 |
| ප්‍රතිරක්ෂණ ලැබීම් | 16,840,965 | 9.07 | 12,982,985 | 6.83 |
| ඔප්පුහිමියන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබිය යුතු වාරික | 21,129,985 | 11.39 | 23,256,352 | 12.23 |
| දේපල පිරියත හා උපකරණ | 6,907,186 | 3.72 | 5,693,812 | 3.00 |
| වෙනත් වත්කම් | 14,069,946 | 7.58 | 11,672,189 | 6.14 |
| මුදල් හා මුදල් සමාන දෑ | 2,424,146 | 1.31 | 2,611,312 | 1.37 |
| **එකතුව** | **185,582,953** | **100** | **190,087,956** | **100** |

**රූප සටහන 19**
**2017 හා 2018 දෙසැම්බර් 31 වන දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




ඔප්පු හිමියන් සහ අතරමැදියන් වෙතින් ලැබිය යුතු වාරික 2018 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 23,256 ක් වූ අතර (2017: රුපියල් මිලියන 21,130) එය තෙවන විශාලතම වත්කම් කාණ්ඩය විය. එය 2017 වසරට සාපේක්ෂව 10.06% කින් ඉහළ යාමකි. බැංකු සහ මූල්‍ය සමාගම්වල කරන ලද තැන්පතු මුළු වත්කම්වලින් 10.78% ක් නියෝජනය කළේය. එය රුපියල් මිලියන 20,491 ක අගයක් වූ අතර (2017: රුපියල් මිලියන 18,322) පැවති හිතකර පොලී අනුපාතයන් හේතුවෙන් 2017 වසරට සාපේක්ෂව සිදු වූ 11.84% ක වර්ධනයකි. 2018 වසරේ මුළු වත්කම්වලින් 7.11% ක් (2017: 6.87%) නියෝජනය කළ සංස්ථා ණය වනාහී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල අනෙක් ප්‍රධාන වත්කම් කාණ්ඩය විය. පෙර වසරට සාපේක්ෂව ලැබිය යුතු ප්‍රතිරක්ෂණවල 23% ක පමණ සැලකිය යුතු මට්ටමේ පහළ යාමක් දක්නට ලැබිණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රට තුළ පැවති අහිතකර කාලගුණික තත්වයන් මත පදනම්ව පෙර වර්ෂය තුළ ලැබිය යුතු ප්‍රතිරක්ෂණ අය කර ගැනීමයි.

## ආයෝජන ආදායම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

2017 හා 2018 වසර සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල විවිධ වත්කම් කාණ්ඩයන්හි ආයෝජන ආදායම, සාමාන්‍ය ආයෝජනය සහ ආයෝජන ඉපැයීම් අනුපාතය 23 වගුව මගින් දැක්වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල සාමාන්‍ය ආයෝජනය රුපියල් මිලියන 129,464 ක් වූ අතර එය 2017 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 119,633 අගයට සාපේක්ෂව 8.22% ක වර්ධනයකි. 2018 වසරේදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් උත්පාදනය කෙරුණු මුළු ආයෝජන

**වගුව 23**
**සවිස්තරාත්මක ආයෝජන ආදායම සහ සාමාන්‍ය ආයෝජන - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| වර්ගය | 2017 (අ) | | | 2018 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජන (රු. '000) | ආයෝජන ඉපැයීම් අනුපාතය (%) | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජන (රු. '000) | ආයෝජන ඉපැයීම් අනුපාතය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 4,226,868 | 40,990,441 | 10.31 | 4,817,017 | 47,534,004 | 10.13 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 2,749,548 | | | 2,714,401 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 634,201 | | | 1,322,853 | | |
| - වෙනත් (රිපෝ) | 843,119 | | | 779,763 | | |
| **සකන්ධ** | 659,143 | 38,075,279 | 1.73 | 868,543 | 36,302,639 | 2.39 |
| - ප්‍රාග්ධන ලාභ / අලාභ | 104,187 | | | 312,784 | | |
| - ලාභාංශ | 554,956 | | | 555,759 | | |
| **සංස්ථා ණය** | 1,328,170 | 12,207,157 | 10.88 | 1,542,497 | 13,130,729 | 11.75 |
| - ණයකර | 1,267,731 | | | 1,484,651 | | |
| - වාණිජ පත්‍රිකා හා වෙනත් | 60,439 | | | 57,846 | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 1,425 | 11,471,351 | 0.01 | (4,425) | 11,288,278 | (0.04) |
| **තැන්පතු** | 1,604,995 | 14,863,562 | 10.80 | 2,186,962 | 19,406,751 | 11.27 |
| - බැංකු | 1,193,953 | | | 1,579,012 | | |
| - මූල්‍ය ආයතන | 411,041 | | | 607,950 | | |
| **ඒකක භාර** | 97,978 | 1,335,332 | 7.34 | 63,388 | 1,378,614 | 4.60 |
| **රත්‍රන්** | - | 1,353 | - | - | - | - |
| **වෙනත්** | 463,315 | 688,493 | | 604,227 | 422,698 | |
| **එකතුව** | **8,381,895** | **119,632,968** | **7.01** | **10,078,210** | **129,463,713** | **7.78** |

ආදායම රුපියල් මිලියන 10,078 ක් විය (2017: රුපියල් මිලියන 8,382). එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත ආයෝජන ඵලදාව 7.78% ක් වූ අතර එය 2017 වසරේ වාර්තා වූ 7.01% අගයට වඩා සුළු වශයෙන් ඉහළ අගයකි.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල විශාලතම ආයෝජන කාණ්ඩය වූ රජයේ සුරැකුම්පත්වල කෙරුණු ආයෝජනයන්හි සාමාන්‍ය ආයෝජනය රුපියල් මිලියන 47,534 ක් වූ අතර (2017: රුපියල් මිලියන 40,990) 2017 වසරේ වාර්තා වූ 10.31% අගයට වඩා සුළු වශයෙන් පහළ යාමක් පෙන්නුම් කරමින් 10.13% ක ආයෝජන ඉපැයීම් එමගින් උත්පාදනය කරන ලදී.

බැංකු හා මූල්‍ය සමාගම්වල තැන්පතුවල කෙරුණු සාමාන්‍ය ආයෝජන රුපියල් මිලියන 19,407 ක් වූ අතර 2017 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 14,863 අගයට සාපේක්ෂව එය සැලකිය යුතු මට්ටමින් ඉහළ ගොස් තිබේ. තැන්පතු මගින් පෙර වසරට වඩා 36.26% ක වර්ධනයක් වාර්තා කරමින් 2018 වසරේදී රුපියල් මිලියන 2,187 ක (2017: රුපියල් මිලියන 1,605) ආයෝජන ආදායමක් උත්පාදනය කරන ලද අතර 11.27% ක ආයෝජන ඉපැයීම් වාර්තා කරන ලදී (2017:10.80%).

2018 වසරේදී ආයෝජන කළඹෙහි සැලකිය යුතු කොටසක් නියෝජනය කළ සහ රුපියල් මිලියන 13,131 ක සාමාන්‍ය ආයෝජනයක් (2017: රුපියල් මිලියන 12,207) වාර්තා කළ සංස්ථා ණය 11.75% ක ආයෝජන ඉපැයීම් අනුපාතයක් වාර්තා කරමින් (2017:10.88%) පෙර වසරට වඩා 7.57% කින් වර්ධනයක් අත් කරගැනීමට සමත් විය.

තවද 2018 වසර තුළදී කොටස් සහ ඒකකභාර පිළිවෙලින් 2.39% ක සහ 4.60% ක ආයෝජන ඉපැයීම් අනුපාත වාර්තා කර ඇත.

## රක්ෂණ සමාගම්වල ණය ගෙවීමේ හැකියාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

2017 හා 2018 යන වර්ෂවල දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC) නියමිත අවදානම් පාදක ප්‍රාග්ධනය (RBC) සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (CAR) යනාදිය පිළිබඳ දත්ත 24 වගුව මගින් දැක්වේ. 2018 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය 171% ක් ලෙස වාර්තා වූ අතර එය 2017 වසරේදී වාර්තා වූ 175% අගයට සාපේක්ෂව 4% කින් සුළු වශයෙන් පහළ ගොස් ඇත. කෙසේවුවද, 2018 දෙසැම්බර් 31 වන දිනට රක්ෂකයන් දෙදෙනෙකු හැර සියලු රක්ෂණ සමාගම් ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයේ තිබිය යුතු අවම අගය වන 120% සහ පවත්නා මුළු ප්‍රාග්ධනයේ තිබිය යුතු අවම අගය වන රුපියල් මිලියන 500 හා අනුගතව පැවතී ඇත. ඒ අනුව, 2015 නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) නීති හා අනුගතව කටයුතු නොකළ සමාගම්වලට එරෙහිව කොමිෂන් සභාව සුදුසු පියවර ගෙන තිබේ. තවද, 160% වන බලාත්මක කිරීමේ මට්ටමට වඩා පහළ ප්‍රාග්ධන ප්‍රාමාණ අනුපාතයක් වාර්තා කර තිබූ සමාගම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අවදානම් පාදක ප්‍රාග්ධනය පිළිබඳ බලාත්මක කිරීමේ උපායමාර්ගයට අනුව සමීපව අධීක්ෂණය කරන ලදී.

**වගුව 24**

**2017 සහ 2018 දෙසැම්බර් 31 වන දිනට රක්ෂණ සමාගම්වල ණය ගෙවීමේ හැකියාව අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2017 දෙසැම්බර් 31 වන දිනට (අ) | | | 2018 දෙසැම්බර් 31 වන දිනට (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | පූර්ණ පවතින ප්‍රාග්ධනය (රු. '000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු. '000) | ප්‍රාමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) | පූර්ණ පවතින ප්‍රාග්ධනය (රු. '000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු. '000) | ප්‍රාමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) |
| අලියාන්ස් ජෙනරල් | 1,263,160 | 883,784 | 143 | 9,608,042 | 4,086,855 | 235 |
| අමානා ජෙනරල් | 686,816 | 366,596 | 187 | 514,583 | 276,025 | 186 |
| සෙලින්කෝ ජෙනරල් | 5,131,721 | 2,703,494 | 190 | 5,896,112 | 3,026,609 | 195 |
| කොන්ටිනෙන්ටල් | 1,232,481 | 481,157 | 256 | 1,559,089 | 623,990 | 250 |
| කෝපරේටිව් ජෙනරල් | 1,299,737 | 720,873 | 180 | 1,385,751 | 768,938 | 180 |
| ෆෙයාෆස්ට් | 2,785,001 | 1,714,025 | 162 | 3,188,311 | 1,723,550 | 185 |
| එච්එන්බී ජෙනරල් | 945,419 | 530,948 | 178 | 1,171,520 | 585,201 | 200 |
| ජනශක්ති ජෙනරල් | 7,018,573 | 2,878,464 | 244 | | | |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,129,774 | 538,281 | 210 | 1,109,301 | 628,555 | 176 |
| එම්බීඑස්එල් | (186,561) | 148,193 | -126 | (249,255) | 132,371 | -188 |
| ඔරියන්ට් | 565,891 | 311,104 | 182 | 627,959 | 241,239 | 260 |
| පීපල්ස් | 2,825,709 | 884,552 | 319 | 3,151,752 | 1,230,620 | 256 |
| සණස | 134,330 | 108,377 | 124 | 119,535 | 150,344 | 80 |
| එස්එල්අයිසී | 27,050,916 | 13,501,434 | 200 | 24,404,446 | 11,733,987 | 208 |
| **එකතුව** | **51,882,966** | **25,771,281** | **175** | **52,487,146** | **25,208,285** | **171** |

## රක්ෂණ සමාගම්වල පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

2018 දෙසැම්බර් 31 වන දිනට එක් එක් සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් වාර්තා කරන ලද පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය, දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය, අඩුකිරීම් සහ පවත්නා මුළු ප්‍රාග්ධනය 25 වගුව මගින් ඉදිරිපත් කෙරේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල පවත්නා මුළු ප්‍රාග්ධනය 2018 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 52,487 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 වන දිනට එම අගයේ වාර්තා වූ රුපියල් මිලියන 51,883 ට සාපේක්ෂව 1.16% කින් සුළු වශයෙන් ඉහළ යාමක් සිදුවී ඇත. සමාගමේ නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවීම් සිදු කළ සාමාන්‍ය කොටස්, ප්‍රාග්ධන සංචිත සහ රඳවාගත් ඉපැයුම් සඳහා කළ අනෙකුත් ගැළපුම් නියෝජනය කරන ලද පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය රුපියල් මිලියන 77,217 ක් විය. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) නීති අනුව, දෙවන ස්ථරයේ ප්‍රාග්ධන අගයට 2018 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 8,604 ක් වූ පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනයෙන් 50% ක ප්‍රමාණයක් ඉක්මවිය නොහැකි වේ. පවත්නා මුළු ප්‍රාග්ධනයෙන් කළ අඩුකිරීම් රුපියල් මිලියන 33,334 ක් වූ අතර එය ණය හා අත්තිකාරම්, පූර්ව ගෙවීම්, භාණ්ඩ ලේඛන, ඇපයට තබන ලද වත්කම්, විලම්භිත ආදායම් බදු යනාදී වත්කම් වලින් සමන්විත විය.

## රක්ෂණ සමාගම් සඳහා නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) පිළිබඳ සන්සන්දනය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2017 හා 2018 වර්ෂවල දෙසැම්බර් 31 වන දිනට අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවට අදාළ විවිධ අවදානම් ගාස්තුවල සමාගම් වශයෙන් පැවති සංයුතිය 26 වගුව මගින් දැක්වේ. විවිධාංගකරණයෙන් අනතුරුව සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් වාර්තා කරන ලද මුළු නියමිත අවදානම් ප්‍රාග්ධනය 2018 වසරේදී රුපියල් මිලියන 27,051 ක් වූ අතර එම අගය 2017 වසරේ දී වාර්තා වූ රුපියල් මිලියන 25,771 ක අගයට සාපේක්ෂව 4.97% කින් ඉහළ ගොස් තිබේ. වාරික සහ හිමිකම්පෑම් වගකීම් වලින් සමන්විත වගකීම් අවදානම් 2018 වසරේ ප්‍රධාන අවදානම් කාණ්ඩය වූ අතර විවිධාංගිකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් වලින් 31.39% ක ප්‍රමාණයක් (2017:29.94%) නියෝජනය කළේය. රක්ෂණ කර්මාන්තය තුළ දෙවන විශාලතම අවදානම් කාණ්ඩය වූ සම්බන්ධතා අවදානම් අයකිරීම් 2018 වසරේදී රුපියල් මිලියන 10,774 ක් වූ අතර 2017 වසරේ දී වාර්තා වූ රුපියල් මිලියන 10,087 ක අගයට සාපේක්ෂව එය 6.81% කින් ඉහළ ගොස් තිබේ. විවිධාංගිකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් වලින් 27.87% ක් (2017:31.83%) නියෝජනය කළ වෙළඳපල අවදානම තෙවන විශාලතම අවදානම් කාණ්ඩය බවට පත් විය. කෙසේවුවද, 2017 වසරට සාපේක්ෂව වෙළඳපල අවදානම 12.33% කින් පහළ ගියේය.

මෙහෙයුම් අවදානම්, ණය අවදානම් සහ ප්‍රතිරක්ෂණ අවදානම් ගාස්තු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු තුළ සාපේක්ෂව පහළ අගයක් ගත් අතර 2018 දෙසැම්බර් 31 වන දිනට විවිධාංගිකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන ගාස්තුවෙන් පිළිවෙලින් 4.73%, 3.09% සහ 1.73% වශයෙන් වාර්තා විය..

**වගුව 25**

**2017 සහ 2018 දෙසැම්බර් 31 වන දිනට පූර්ණ පවතින ප්‍රාග්ධනය සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2017 දෙසැම්බර් 31 වන දිනට (අ) පූර්ණ පවතින ප්‍රාග්ධනය (රු. '000) | 2018 දෙසැම්බර් 31 වන දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|
| | | පළමු ස්ථරය (රු. '000) | දෙවන ස්ථරය (රු. '000) | අඩු කිරීම් (%) | පූර්ණ පවතින ප්‍රාග්ධනය (රු. '000) |
| අලියාන්ස් ජෙනරල් | 1,263,160 | 10,803,392 | - | 1,195,350 | 9,608,042 |
| අමානා ජෙනරල් | 686,816 | 1,768,692 | 120,495 | 1,374,603 | 514,583 |
| සෙලින්කෝ ජෙනරල් | 5,131,721 | 11,126,093 | - | 5,229,981 | 5,896,112 |
| කොන්ටිනෙන්ටල් | 1,232,481 | 1,668,558 | - | 109,469 | 1,559,089 |
| කෝපරේටිව් ජෙනරල් | 1,299,737 | 2,039,863 | 348,510 | 1,002,622 | 1,385,751 |
| ෆෙයාෆස්ට් | 2,785,001 | 5,068,134 | - | 1,879,823 | 3,188,311 |
| එච්එන්බී ජෙනරල් | 945,419 | 1,323,636 | - | 152,115 | 1,171,520 |
| ජනශක්ති ජෙනරල් | 7,018,573 | | | | |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,129,774 | 1,507,285 | - | 397,984 | 1,109,301 |
| එම්බීඑස්එල් | (186,561) | (156,494) | (8,058) | 84,704 | (249,255) |
| ඔරියන්ට් | 565,891 | 747,926 | - | 119,967 | 627,959 |
| පීපල්ස් | 2,825,709 | 3,382,020 | - | 230,267 | 3,151,752 |
| සණස | 134,330 | 232,948 | 2,839 | 116,252 | 119,535 |
| එස්එල්අයිසී | 27,050,916 | 37,704,829 | 8,140,049 | 21,440,431 | 24,404,446 |
| **එකතුව** | **51,882,966** | **77,216,881** | **8,603,835** | **33,333,568** | **52,487,146** |

## ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

27 වැනි වගුවේ සහ 20 ප්‍රස්තාරයේ දැක්වෙන පරිදි වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල ප්‍රධාන උප පන්තිවල මුළු ශුද්ධ ඉපැයූ වාරික රුපියල් මිලියන 80,549 ක් වූ අතර එහි 2017 වසරේදී වාර්තා වූ රුපියල්

වගුව 26

**2017 සහ 2018 දෙසැම්බර් 31 වන දිනට නියමිත අවදානම් පාදක ප්‍රාග්ධනය සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2017 දෙසැම්බර් 31 වන දිනට (අ) (රු. '000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම් | සම්බන්ධතා අවදානම් | වෙළඳපොළ අවදානම් | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගිකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් | විවිධාංගිකරණයට පසු මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් |
| අලියාන්ස් ජෙනරල් | 3,424 | 482,833 | 118,166 | 21,050 | 621,642 | 58,455 | 1,305,571 | 883,784 |
| අමානා ජෙනරල් | 24,375 | 266,822 | 43,262 | 5,366 | 134,244 | 29,837 | 503,906 | 366,596 |
| සෙලින්කෝ ජෙනරල් | 132,556 | 1,042,265 | 783,950 | 156,653 | 1,669,237 | 217,977 | 4,002,637 | 2,703,494 |
| කොන්ටිනෙන්ටල් | 51,046 | 79,230 | 180,917 | 21,024 | 345,945 | 38,281 | 716,443 | 481,157 |
| කෝපරේටිව් ජෙනරල් | 81,205 | 241,016 | 281,280 | 9,477 | 376,738 | 44,537 | 1,034,253 | 720,873 |
| ෆෙයාෆර්ස්ට් | 36,803 | 799,580 | 413,767 | 102,860 | 1,046,642 | 108,549 | 2,508,202 | 1,714,025 |
| එච්එන්බී ජෙනරල් | 42,774 | 198,031 | 73,910 | 18,212 | 411,933 | 37,108 | 781,968 | 530,948 |
| ජනශක්ති ජෙනරල් | 263,078 | 600,783 | 1,577,542 | 77,880 | 1,379,390 | 189,864 | 4,088,538 | 2,878,464 |
| එල්ඕඑල්සී ජෙනරල් | 2,519 | 94,195 | 124,446 | 24,104 | 476,997 | 45,443 | 767,705 | 538,281 |
| එම්බීඑස්එල් | 3,255 | 84,309 | 24,758 | 6,259 | 88,705 | 5,573 | 212,860 | 148,193 |
| ඔරියන්ට් | 24,077 | 217,405 | 27,829 | 2,783 | 149,976 | 16,047 | 438,118 | 311,104 |
| පීපල්ස් | 118,529 | 139,463 | 215,990 | 8,342 | 738,073 | 71,025 | 1,291,421 | 884,552 |
| සණස | 3,170 | 43,930 | 53,022 | 1,718 | 36,620 | 5,755 | 144,216 | 108,377 |
| එස්එල්අයිසී | 172,360 | 5,796,802 | 7,069,453 | 138,351 | 2,860,164 | 689,716 | 16,726,847 | 13,501,434 |
| **එකතුව** | **959,172** | **10,086,665** | **10,988,293** | **594,078** | **10,336,306** | **1,558,168** | **34,522,685** | **25,771,281** |

| රක්ෂකයා | 2018 දෙසැම්බර් 31 වන දිනට (ආ) (රු. '000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම් | සම්බන්ධතා අවදානම් | වෙළඳපොළ අවදානම් | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගිකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් | විවිධාංගිකරණයට පසු මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් |
| අලියාන්ස් ජෙනරල් | 173,595 | 2,307,441 | 875,598 | 58,380 | 2,226,419 | 288,308 | 5,929,741 | 4,086,855 |
| අමානා ජෙනරල් | 19,073 | 156,677 | 35,724 | 11,204 | 160,367 | 29,784 | 412,829 | 276,025 |
| සෙලින්කෝ ජෙනරල් | 235,220 | 1,268,380 | 763,755 | 168,351 | 1,780,155 | 242,373 | 4,458,234 | 3,026,609 |
| කොන්ටිනෙන්ටල් | 111,429 | 70,679 | 240,595 | 23,111 | 434,004 | 47,477 | 927,295 | 623,990 |
| කෝපරේටිව් ජෙනරල් | 102,980 | 216,716 | 296,849 | 19,332 | 429,092 | 52,975 | 1,117,944 | 768,938 |
| ෆෙයාෆස්ට් | 44,858 | 736,958 | 542,124 | 172,824 | 847,586 | 109,183 | 2,453,533 | 1,723,550 |
| එච්එන්බී ජෙනරල් | 49,594 | 201,164 | 103,698 | 13,447 | 453,106 | 42,457 | 863,466 | 585,201 |
| එල්ඕඑල්සී ජෙනරල් | 12,200 | 120,281 | 185,426 | 21,123 | 526,920 | 49,947 | 915,898 | 628,555 |
| එම්බීඑස්එල් | 4,814 | 76,751 | 26,363 | 4,666 | 69,387 | 5,472 | 187,454 | 132,371 |
| ඔරියන්ට් | 24,016 | 122,900 | 32,290 | 3,758 | 156,201 | 17,944 | 357,108 | 241,239 |
| පීපල්ස් | 139,493 | 498,126 | 285,793 | 6,239 | 802,455 | 79,001 | 1,811,106 | 1,230,620 |
| සණස | 5,969 | 90,275 | 42,690 | 1,855 | 52,300 | 6,839 | 199,927 | 150,344 |
| එස්එල්අයිසී | 144,615 | 4,907,392 | 6,202,261 | 93,748 | 2,910,140 | 663,389 | 14,921,544 | 11,733,987 |
| **එකතුව** | **1,067,856** | **10,773,739** | **9,633,167** | **598,038** | **10,848,133** | **1,635,149** | **34,556,079** | **25,208,285** |

මිලියන 72,354 ක අගයට සාපේක්ෂව 11.33% ක වර්ධනයක් වාර්තා කොට තිබේ. දළ ලිඛිත වාරිකයේ වර්ධන අනුපාතය ශුද්ධ ඉපැයූ වාරිකයේ වාර්තා වූ වර්ධන අනුපාතයට හිතකර අන්දමින් බලපෑවේය.

2018 වර්ෂය තුළ දී දරන ලද මුළු ශුද්ධ හිමිකම්පෑම්, වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර රුපියල් මිලියන 52,390 ක් වූ අතර 2017 වර්ෂයේදී වාර්තා වූ රුපියල් මිලියන 47,818 ක අගයට සාපේක්ෂව 9.56% කින් වර්ධනය වී තිබේ. පෙර වසර හා සැසඳීමේදී මිශ්‍ර හා ගිනි රක්ෂණ ව්‍යාපාර කටයුතු හැරුණු විට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල සියලු උප පන්ති මගින් දරන ලද ශුද්ධ හිමිකම් පෑම් 2018 වසරේදී ඉහළ ගොස් තිබේ.

පෙර වසරවල් හා සමානවම, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල ගාමක බලවේගය වශයෙන් පවතින මෝටර් රථ වාහන රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර ඉහළම ශුද්ධ ඉපැයූ වාරිකය වාර්තා කොට ඇති අතර එම අගය රුපියල් මිලියන 56,541 කි. එය ශුද්ධ ඉපැයූ වාරික මුළු එකතුවෙන් 73.89% ක් නියෝජනය කළ අතර (2017:73.71%) 2017 වසරේ රුපියල් මිලියන 50,580 ක් වශයෙන් වාර්තා වූ එම අගයට වඩා 11.79% ක වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, රුපියල් මිලියන 34,652 ක (2017: රුපියල් මිලියන 31,134) ඉහළම අගයක් දරන ලද ශුද්ධ හිමිකම්

**වගුව 27**

**ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| උප වර්ගය | ශුද්ධ ඉපැයූ වාරික ආදායම (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017(අ) | 2018(ආ) |
| ගිනි | 1,241,985 | 1,283,463 | 1,213,542 | 1,721,159 | 1,926,656 |
| මුහුදු | 753,643 | 797,026 | 903,170 | 991,573 | 1,127,969 |
| මෝටර් රථවාහන | 33,826,829 | 37,958,834 | 44,593,900 | 50,580,010 | 56,540,998 |
| සෞඛ්‍ය | 7,079,162 | 8,071,777 | 9,349,093 | 11,435,476 | 12,683,442 |
| විවිධ | 4,402,900 | 3,270,599 | 3,306,901 | 3,891,564 | 4,238,484 |
| **උප එකතුව** | **47,304,518** | **51,381,699** | **59,366,606** | **68,619,783** | **76,517,549** |
| SRCC හා T | 2,692,730 | 2,914,630 | 3,274,297 | 3,734,321 | 4,031,846 |
| **එකතුව** | **49,997,248** | **54,296,329** | **62,640,903** | **72,354,104** | **80,549,396** |

| උප වර්ගය | දරන ලද ශුද්ධ හිමිකම්පෑම් (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017(අ) | 2018(ආ) |
| ගිනි | 717,626 | 645,231 | 1,024,290 | 1,640,062 | 1,561,223 |
| මුහුදු | 266,560 | 295,624 | 266,057 | 345,331 | 418,810 |
| මෝටර් රථවාහන | 20,281,109 | 24,274,415 | 28,966,019 | 31,134,209 | 34,651,820 |
| සෞඛ්‍ය | 6,252,704 | 6,958,816 | 8,065,476 | 10,511,212 | 12,098,234 |
| විවිධ | 1,522,689 | 1,677,736 | 2,121,221 | 4,186,860 | 3,659,804 |
| **උප එකතුව** | **29,040,687** | **33,851,822** | **40,443,063** | **47,817,674** | **52,389,891** |
| SRCC හා T | 56,897 | 780 | 33,677 | (10,519) | 76,068 |
| **එකතුව** | **29,097,585** | **33,852,602** | **40,476,740** | **47,807,154** | **52,465,959** |

| උප වර්ගය | ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017(අ) | 2018(ආ) |
| ගිනි | 57.78 | 50.27 | 84.40 | 95.28 | 81.03 |
| මුහුදු | 35.37 | 37.09 | 29.46 | 34.83 | 37.13 |
| මෝටර් රථවාහන | 59.96 | 63.95 | 64.96 | 61.55 | 61.29 |
| සෞඛ්‍ය | 88.33 | 86.21 | 86.27 | 91.92 | 95.39 |
| විවිධ | 34.58 | 51.30 | 64.15 | 107.59 | 86.35 |
| **උප එකතුව** | **61.39** | **65.88** | **68.12** | **69.68** | **68.47** |
| SRCC හා T | 2.11 | 0.03 | 1.03 | (0.28) | 1.89 |
| **එකතුව** | **58.20** | **62.35** | **64.62** | **66.07** | **65.14** |

| විස්තරය | ශුද්ධ වියදම් (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017(අ) | 2018(ආ) |
| SRCC සහ T හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ වියදම් | 19,524,543 | 19,134,713 | 21,421,928 | 24,491,746 | 28,328,017 |
| SRCC හා T | 466,435 | 486,985 | 653,706 | 732,786 | 842,515 |
| **එකතුව** | **19,990,978** | **19,621,698** | **22,075,634** | **25,224,532** | **29,170,531** |

| විස්තරය | ශුද්ධ වියදම් අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017(අ) | 2018(ආ) |
| SRCC සහ T හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ වියදම් අනුපාතය | 41.27 | 37.24 | 36.08 | 35.69 | 37.02 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ වියදම් අනුපාතය | 39.98 | 36.14 | 35.24 | 34.86 | 36.21 |


| විස්තරය | ශුද්ධ ඒකාබද්ධ අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017(අ) | 2018(ආ) |
| SRCC සහ T හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ ඒකාබද්ධ අනුපාතය | 102.67 | 103.12 | 104.21 | 105.38 | 105.49 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ශුද්ධ ඒකාබද්ධ අනුපාතය | 98.18 | 98.49 | 99.86 | 100.94 | 101.35 |

පෑම් මෝටර් රථ වාහන රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් වාර්තා වුණු අතර 2018 වසරේ වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළුව මුළු දරන ලද හිමිකම්පෑම් වලින් 66.05% ක ප්‍රමාණයක්ද (2017: 65.12%) නියෝජනය කෙරිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 61.29% ක ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයක් ඇති විය (2017: 61.55%).

සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර රුපියල් මිලියන 12,683 ක් වශයෙන් (2017: රුපියල් මිලියන 11,435) දෙවන ස්ථානයට ඉහළම ශුද්ධ ඉපැයූ වාරිකය වාර්තා කෙරුණු අතර පෙර වර්ෂයට සාපේක්ෂව 10.91% ක වර්ධනයක්ද එය වාර්තා කළේය. තවදුරටත්, සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින්, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්හි දෙවන ස්ථානයට ඉහළම අගය වන රුපියල් මිලියන 12,098 වාර්තා කර තිබෙන අතර (2017:රුපියල් මිලියන 10,511) එම වටිනාකම වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළත් මුළු දරන ලද ශුද්ධ හිමිකම් පෑම්වලින් 23.06% ක් නියෝජනය විය. (2017: 21.99%). සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල ඉහළ පිරිවැයද සියලු රක්ෂණ සමාගම් වෙත අභියෝග යක් වන අතර 2018 වසරේදී ඉහළම ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය වන 95.39% වාර්තා කළේය (2017:91.92%).

විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතු රුපියල් මිලියන 4,238 ක ශුද්ධ ඉපැයූ වාරික වාර්තා කළ අතර 2017 වර්ෂයේදී වාර්තා වූ රුපියල් මිලියන 3,892 ක අගයට වඩා 8.92% ක වර්ධනයක් අත්කර ගත්තේය. මෙම ව්‍යාපාර පන්තිය 2018 වර්ෂයේ දී 86.35% ක ශුද්ධ හිමිකම් පෑම් අනුපාතයක් වාර්තා කර තිබෙන අතර 2017 වර්ෂයේ දී වාර්තා වූ හිමිකම්පෑම් අනුපාතය වන 107.59% හා සැසඳීමේදී එය 21.24% කින් පහළ ගොස් තිබේ. ශ්‍රී ලංකා රජය විසින් නියඟ හැර සුළි සුළං, කුණාටු, දැඩි සුළං තත්වයන්, ගං වතුර, නායයෑම්, සැඩ කුණාටු, භූ කම්පන, සුනාමි සහ වෙනත් එවැනි ස්වභාවික

**රූප සටහන 20**
**ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




උවදුරු හේතුවෙන් රක්ෂණය නොකළ ජීවිත හා දේපළ, ගෘහයන් සහ කුඩා ව්‍යාපාරික ආයතනවලට සිදුවන හානි ආවරණය කිරීම සඳහා වන ආරක්ෂණ යෝජනා ක්‍රමයක් වශයෙන් 2016 අප්‍රේල් 01 වන දින සිට හඳුන්වා දෙනු ලැබූ ජාතික ස්වභාවික විපත් රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2017 වසරේ දී එන්අයිටීඑෆ් විසින් රුපියල් මිලියන 2,368 ක සැලකිය යුතු හිමිකම්පෑම් ප්‍රමාණයක් වාර්තා කළේය. මෙම සංඛ්‍යාව 2018 වසරේදී රුපියල් මිලියන 1,358 ක් දක්වා අඩු වී තිබෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2018 වසරේදී විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතුවල හිමිකම් පෑම් අනුපාතය පහත ගොස් තිබේ.

ගිනි රක්ෂණ ව්‍යාපාර කටයුතුවල ශුද්ධ ඉපැයූ වාරික 2017 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 1,721 සිට රුපියල් මිලියන 1,927 දක්වා 11.93% කින් 2018 වසරේදී ඉහළ ගොස් තිබේ. ගිනි රක්ෂණ ව්‍යාපාර කටයුතු සඳහා දරන ලද ශුද්ධ හිමිකම්පෑම් රුපියල් මිලියන 1,561 ක් වූ අතර 2017 වසරේදී රුපියල් මිලියන 1,640 ක් ලෙස වාර්තා වූ එම අගයට වඩා 4.81% කින් අඩු වීමක් පෙන්නුම් කරයි. එමෙන්ම එය වාර්තා කළ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය 81.03% ක් විය (2017:95.28%).

පෙර වසරවල දී හා සමානවම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්වල පහළම අගය මුහුදු රක්ෂණ වෙතින් රුපියල් මිලියන 419 ක් ලෙස වාර්තා වුණු අතර (2017: රුපියල් මිලියන 345) පහළම හිමිකම්පෑම් අනුපාතයද 37.13% ක් ලෙස වාර්තා වූයේ (2017:34.83%) 2017 වසරට සාපේක්ෂව 2.3% කින් සුළු වශයෙන් ඉහළ යමිනි.

27 වගුව සහ 20 ප්‍රස්තාරය මගින් පිළිබිඹු කෙරෙන පරිදි, පසුගිය වසර පහ සමග සන්සන්දනය කරන විට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු ඉහළම වියදම් ප්‍රමාණය (වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළුව) වාර්තා කර ඇත්තේ 2018 වසරේදීය. එය රුපියල් මිලියන 29,170 ක් වූ අතර 2017 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 25,225 ක ප්‍රමාණය සමග සැසඳීමේදී 15.64% ක වර්ධනයක් පෙන්නුම් කරයි. එන්අයිටීඑෆ් මගින් වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් සඳහා සැලකිල්ලට ගනු ලැබූ ශුද්ධ වියදම් 2017 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 733 සිට 2018 වසරේදී රුපියල් මිලියන 843 දක්වා ඉහළ ගොස් තිබේ.

ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයේ සහ ශුද්ධ වියදම් අනුපාතයේ එකතුව පිළිබිඹු

වගුව 28

දළ ලිඛිත වාරික ආදායම නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

| | ඔප්පු සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
| ගිනි | 188,578 | 227,800 | 246,058 | 241,884 | 245,027 |
| මුහුදු | 186,447 | 190,720 | 191,966 | 172,733 | 187,338 |
| මෝටර් රථ වාහන | 4,004,162 | 4,531,187 | 5,075,622 | 5,390,222 | 5,614,901 |
| තුන්වැනි පාර්ශ්ව පමණක් | 2,229,153 | 2,460,596 | 2,628,255 | 2,784,920 | 3,190,988 |
| විස්තීර්ණ | 1,775,009 | 2,070,591 | 2,447,367 | 2,605,302 | 2,423,913 |
| සෞඛ්‍ය | 13,716 | 15,053 | 16,040 | 11,893 | 17,267 |
| විවිධ | 204,285 | 202,038 | 238,921 | 311,084 | 427,470 |
| **එකතුව** | **4,597,188** | **5,166,798** | **5,768,607** | **6,127,816** | **6,492,003** |

කරන ශුද්ධ ඒකාබද්ධ අනුපාතය 2017 වසරේදී 100.94% සිට 2018 වසරේදී 101.35% දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් තිබේ. කෙසේවුවද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් දරන ලද මුළු වියදම් හා හිමිකම්පෑම් පිළිබිඹු කරන ඒකාබද්ධ අනුපාතය 2017 හා 2018 වසරවලදී 100%ට වඩා ඉහළ අගයක් වාර්තා කළේය.

## දළ ලිඛිත වාරිකය නියෝජනය කරන ඔප්පු සංඛ්‍යාව – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

2014 සිට 2018 දක්වා කාලපරිච්ඡේදය තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල විවිධ උප පන්තිවල දළ ලිඛිත වාරිකය උත්පාදනය කිරීම සඳහා දායක වී තිබෙන මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 28 වගුව මගින් ඉදිරිපත් කෙරේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල සියලු උප පන්තිවලට අදාළ රක්ෂණ ඔප්පුවල මුළු සංඛ්‍යාව 2017 දී වාර්තා වූ 6,127,816 ප්‍රමාණයේ සිට 2018 දී 6,492,003 දක්වා 5.94% කින් ඉහළ ගොස් තිබේ. පසුගිය පස් වසර තුළදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල මුළු ඔප්පු සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගොස් තිබේ. පෙර වසරවල දී හා සමානවම මෝටර් රථ රක්ෂණ ව්‍යාපාර කටයුතු 86.49% ක ප්‍රමාණයක් (2017:87.96%) නියෝජනය කරමින් විශාලතම ඔප්පු සංඛ්‍යාවට හිමිකම් කී අතර එය 3,190,988 (2017: 2,784,920) ක තෙවන පාර්ශව රක්ෂණ ඔප්පු සහ 2,423,913 (2017: 2,605,302) ක විස්තීර්ණ රක්ෂණ ඔප්පුවලින් සමන්විත විය. තුන්වන පාර්ශව ඔප්පුවල සැලකිය යුතු සංඛ්‍යාව මගින් පෙන්නුම් කෙරෙනුයේ රක්ෂණ ලබාගනුයේ මුළු අවදානම් ආවරණය කිරීමට වඩා හුදෙක් එම අනිවාර්ය අවශ්‍යතාව සැපිරීමට වන බවයි. තවද 2017 වසර හා සැසඳීමේදී විස්තීර්ණ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 6.96% කින් පහළ ගොස් ඇත.

2017 වර්ෂයේදී වාර්තා වූ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා සැසඳීමේදී විවිධ සහ සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සඳහා රක්ෂණ ඔප්පු 2018 වර්ෂයේ දී පිළිවෙලින් 37.41% කින් හා 45.19% කින් වශයෙන් සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් තිබේ. තවද, මුහුදු හා ගිනි රක්ෂණ ව්‍යාපාර කටයුතු වැනි අනෙකුත් උප පන්තිද 2017 වසරට වඩා 2018 වසරේදී සුළු වශයෙන් ඉහළ ගියේය.

## නව, අලුත් කරන ලද සහ බල පවත්නා ඔප්පු පිළිබඳ දත්ත - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු


සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල සියලු උප පන්තිවල 2017 හා 2018 වර්ෂ සඳහා නව රක්ෂණ ඔප්පු, අලුත් කරන ලද ඔප්පු සහ බල පවත්නා ඔප්පු පිළිබඳ දත්ත 29 වගුව සහ 21 ප්‍රස්තාරය මගින් දැක්වේ. සාමාන්‍ය රක්ෂණවල බල පවත්නා මුළු ඔප්පු සංඛ්‍යාව 2018 වසරේ දී 6,324,587 ක් වූ අතර 2017 වසරේදී 6,056,474 ක් ලෙස වාර්තා වූ රක්ෂණ ඔප්පු සංඛ්‍යාවට වඩා එය 4.43% ක වර්ධනයකි. 2018 වර්ෂයේදී මෝටර් රථ රක්ෂණ ඔප්පු

වගුව 29

නව, අලුත් කළ සහ ක්‍රියාත්මකව ඇති රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

| | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | නව ඔප්පු | අලුත් කළ ඔප්පු | වසර අවසානයට ක්‍රියාත්මක ඔප්පු | නව ඔප්පු | අලුත් කළ ඔප්පු | වසර අවසානයට ක්‍රියාත්මක ඔප්පු |
| ගිනි | 87,600 | 154,895 | 242,495 | 87,735 | 157,142 | 241,794 |
| මුහුදු | 169,993 | 4,176 | 170,321 | 183,594 | 4,256 | 177,671 |
| මෝටර් රථ වාහන | 2,373,578 | 3,025,591 | 5,346,721 | 2,523,101 | 3,100,420 | 5,509,012 |
| තුන් වැනි පාර්ශ්වය පමණක් | 1,289,174 | 1,484,083 | 2,775,671 | 1,483,047 | 1,708,415 | 3,188,605 |
| විස්තීර්ණ | 1,084,404 | 1,541,508 | 2,571,050 | 1,040,054 | 1,392,005 | 2,320,407 |
| සෞඛ්‍ය | 4,589 | 6,211 | 10,300 | 9,790 | 7,465 | 16,554 |
| විවිධ | 230,571 | 62,810 | 286,637 | 262,811 | 125,492 | 379,556 |
| **එකතුව** | **2,866,331** | **3,253,683** | **6,056,474** | **3,067,031** | **3,394,775** | **6,324,587** |

**රූප සටහන 21**
**නව, අලුත් කළ සහ ක්‍රියාත්මකව ඇති රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර**
**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




බල පවත්නා මුළු ඔප්පු සංඛ්‍යාවෙන් 87.10% (2017:88.28%) ක් නියෝජනය කළ අතර 3,188,605 ක තෙවන පාර්ශව ඔප්පු (2017: 2,775,671) සහ 2,320,407 ක විස්තීර්ණ ඔප්පුවලින් (2017:2,571,050) සමන්විත විය. වර්ෂය තුළ දී, විස්තීර්ණ මෝටර් රථ රක්ෂණ ඔප්පු සහ ගිනි රක්ෂණ ඔප්පු හැර, සියලු උප පන්තිවල බල පවත්නා ඔප්පු 2017 වසරට වඩා සුළු වශයෙන් ඉහළ ගොස් තිබුණි. 2018 වසරේ දී රක්ෂණ සමාගම් විසින් පෙර වසරට සාපේක්ෂව 7% ක වර්ධනයක් පෙන්නුම් කරමින් නව ඔප්පු 3,067,031 ක් ප්‍රාරක්ෂණය කර තිබුණි. අලුත් කරන ලද මුළු ඔප්පු සංඛ්‍යාව 3,394,775 ක් වූ අතර එය 2017 වසරේ 3,253,683 ක් වූ අලුත් කරන ලද ඔප්පු ප්‍රමාණය හා සසඳන විට 4% ක පමණ වර්ධනයකි.

## ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුතු

එන්අයිටීඑෆ් හි ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුතු ස්ථාපනය කරන ලද්දේ "ජාතික ප්‍රතිරක්ෂකයෙකු" ඇති කිරීමේ අරමුණ ඇතිවය. ඒ අනුව අංක 1791/4 වන 2012 දෙසැම්බර් 31 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව සියලු ප්‍රාථමික රක්ෂකයින් විසින් සාමාන්‍ය ප්‍රතිරක්ෂණ කටයුතු සියල්ලෙන් පැනනගින ඔවුන්ගේ මුළු වගකීම් වලින් සියයට 30 ක් 2013 වසරේ සිට එන්අයිටීඑෆ් වෙත පවරා දිය යුතු වේ.

2018 වසරේ දී එන්අයිටීඑෆ් විසින් උත්පාදනය කරන ලද ප්‍රතිරක්ෂණ වාරික ආදායම පෙර වසරට වඩා 10.13% කින් ඉහළ ගොස් රුපියල් මිලියන 4,056 ක් විය. ප්‍රතිපවරාදීමේ වැඩපිළිවෙල අනුව, එන්අයිටීඑෆ් විසින් මෙම වසර තුළ දී රුපියල් මිලියන 578 ක වාරික ආදායම පවරා දී ඇති අතර 2017 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 175 ට සාපේක්ෂව එය සැලකිය යුතු මට්ටමේ වර්ධනයකි.

එන්අයිටීඑෆ් 2018 වර්ෂයේදී දරන ලද හිමිකම්පෑම් රුපියල් මිලියන 1,505 ක් වූ අතර 2017 වර්ෂයේදී එම අගය රුපියල් මිලියන 2,326 ක් විය. කෙසේවුවද 2018 වසරේදී හිමිකම්පෑම් කිසිවක් ප්‍රතිරක්ෂකයින් වෙත පවරා නොතිබූ බැවින් එන්අයිටීඑෆ් හි ප්‍රතිපවරාදීමේ ගණුදෙනුවල ඵලදායී බව සම්බන්ධයෙන් යළි සලකා බැලිය යුතු වේ.

2017 වර්ෂයට සාපේක්ෂව ප්‍රතිරක්ෂණ මෙහෙයුම් තුළ මුළු වත්කම් රුපියල් මිලියන 3,683 දක්වා 12.54% කින් අඩුවීමක් පෙන්නුම් කළේය. එයින් දිගුකලක් තිස්සේ ලැබිය යුතු ප්‍රතිරක්ෂණ 2018 වසරේදී 35.87% ක් නියෝජනය කළේය. තවද එන්අයිටීඑෆ් හි ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුතුවලට සහාය වීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ආයෝජනද නොමැත.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

2018 වර්ෂය තුළ දී රක්ෂණ තැරැව්කාර සමාගම් හැට පහක් වෙළඳපොල තුළ ක්‍රියාත්මක වූ අතර රුපියල් මිලියන 25,063 ක දළ ලිඛිත වාරික උත්පාදනය කළේය. ඒ අනුව රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර තුළින් උත්පාදනය කරන ලද මුළු දළ ලිඛිත වාරික 2017 වසරේදී රුපියල් මිලියන 21,479 ක් වූ අගයට සාපේක්ෂව 2018 වසරේදී 16.69% ක වර්ධනයක් වාර්තා කළේය. තවද, මුළු දළ ලිඛිත වාරික, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර තුළින් උත්පාදනය කරන ලද වාරික ආදායමෙන් සමන්විත වූ අතර ඒ, පිළිවෙලින් රුපියල් මිලියන 655 ක් හා රුපියල් මිලියන 24,408 ක් වශයෙනි.

පෙර වසරවලදී මෙන්ම, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් වෙතින් සැලකිය යුතු තරමේ දායකත්වයක් ලැබී නැත. තැරැව්කාර සමාගම් විසින් සපයන ලද දත්ත අනුව දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයන්හි (රුපියල් මිලියන 80,303) මුළු දළ ලිඛිත වාරිකයෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් තුළින් උත්පාදනය කර ඇත්තේ 0.82% ක් පමණි. කෙසේවුවද, රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි මුළු දළ ලිඛිත වාරිකයෙන් 24.12% ක් එනම් රුපියල් මිලියන 101,204 ක් (වර්ජන කැරලි කෝලාහල ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් වාරික ඇතුළුව) උත්පාදනය කෙරී ඇත.


2018 වසරේදී, රක්ෂණ තැරැව්කාර සමාගම් විසි අටක් විසින් රුපියල් මිලියන 100 ඉක්මවන දළ ලිඛිත වාරික එක් එක් සමාගම වෙතින් සපයන ලද අතර මෙම රක්ෂණ තැරැව්කාර සමාගම් සියල්ල එක්ව රුපියල් මිලියන 23,566 ක දළ ලිඛිත වාරික උත්පාදනය කරන ලදී. ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් හත විසින් 30 වන වගුවේ දැක්වෙන පරිදි රුපියල් මිලියන 1,497 ක් වූ දළ ලිඛිත වාරික උත්පාදනය කරන ලදී.

**වගුව 30**

**රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා ජනනය කළ දළ ලිඛිත වාරික - 2018**

| | රක්ෂණ තැරැව්කාර සමාගමේ නම | දළ ලිඛිත වාරික ආදායම 2018 | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය | | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | | එකතුව | |
| | | රු.('000) | වෙළඳපොළ කොටස (%) | රු.('000) | වෙළඳපොළ කොටස (%) | රු.('000) | වෙළඳපොළ කොටස (%) |
| 1 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 21,514 | 3.28 | 775,992 | 3.18 | 797,506 | 3.18 |
| 2 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 4,388 | 0.67 | 645,412 | 2.64 | 649,800 | 2.59 |
| 3 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,158 | 0.18 | 935,254 | 3.83 | 936,411 | 3.74 |
| 4 | ඇලියොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 31,637 | 4.83 | 96,121 | 0.39 | 127,758 | 0.51 |
| 5 | ඇම්ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,585 | 0.24 | 150,183 | 0.62 | 151,768 | 0.61 |
| 6 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 24,829 | 3.79 | 2,078,907 | 8.52 | 2,103,735 | 8.39 |
| 7 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 6,265 | 0.96 | 137,744 | 0.56 | 144,009 | 0.57 |
| 8 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,246 | 0.34 | 3,112,256 | 12.75 | 3,114,502 | 12.43 |
| 9 | කළම්බුර් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 6,333 | 0.97 | 285,613 | 1.17 | 291,946 | 1.16 |
| 10 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 20,621 | 3.15 | 2,725,715 | 11.17 | 2,746,337 | 10.96 |
| 11 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 135,901 | 20.75 | 1,270,081 | 5.20 | 1,405,982 | 5.61 |
| 12 | ඉක්විටි ඉන්ෂුවරන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 54 | 0.01 | 126,929 | 0.52 | 126,983 | 0.51 |
| 13 | එසාපි කර්මිජී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 11,148 | 1.70 | 564,448 | 2.31 | 575,596 | 2.30 |
| 14 | ෆයින්ඩ් මයි ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 17,390 | 2.65 | 134,625 | 0.55 | 152,015 | 0.61 |
| 15 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 13,082 | 2.00 | 1,092,635 | 4.48 | 1,105,717 | 4.41 |
| 16 | ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 7,951 | 1.21 | 244,469 | 1.00 | 252,421 | 1.01 |
| 17 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 14,556 | 2.22 | 169,576 | 0.69 | 184,132 | 0.73 |
| 18 | ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 72,556 | 11.08 | 214,194 | 0.88 | 286,749 | 1.14 |
| 19 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5,488 | 0.84 | 156,305 | 0.64 | 161,794 | 0.65 |
| 20 | මර්කන්ටයිල් ෆෝචූන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,292 | 0.20 | 540,628 | 2.21 | 541,920 | 2.16 |
| 21 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 4,466 | 0.68 | 345,266 | 1.41 | 349,732 | 1.40 |
| 22 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 97,467 | 14.88 | 1,963,049 | 8.04 | 2,060,516 | 8.22 |
| 23 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 7,025 | 1.07 | 361,978 | 1.48 | 369,003 | 1.47 |
| 24 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 885 | 0.14 | 1,296,616 | 5.31 | 1,297,501 | 5.18 |
| 25 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 33,836 | 5.17 | 868,568 | 3.56 | 902,404 | 3.60 |
| 26 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 33,248 | 5.08 | 1,298,179 | 5.32 | 1,331,427 | 5.31 |
| 27 | සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | - | 1,147,463 | 4.70 | 1,147,463 | 4.58 |
| 28 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 960 | 0.15 | 249,765 | 1.02 | 250,724 | 1.00 |
| | **උප එකතුව** | **577,880** | **88.23** | **22,987,971** | **94.18** | **23,565,851** | **94.03** |
| | **වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් (37)** | **77,124** | **11.77** | **1,419,672** | **5.82** | **1,496,797** | **5.97** |
| | **මුළු එකතුව** | **655,005** | **100.00** | **24,407,643** | **100.00** | **25,062,648** | **100.00** |

**රූප සටහන 22**
**2008 සිට 2018 දක්වා රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා ජනනය කළ දළ ලිඛිත වාරික ආදායම**




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දීර්ඝ කාලීන රක්ෂණය ද.ලි.වා.ආ. (රු.මිලියන) | 195 | 188 | 243 | 296 | 195 | 191 | 158 | 206 | 263 | 341 | 655 |
| සාමාන්‍ය රක්ෂණය ද.ලි.වා.ආ. (රු.මිලියන) | 8,781 | 8,698 | 9,317 | 10,193 | 12,532 | 14,189 | 14,559 | 16,124 | 17,518 | 21,138 | 24,408 |
| මුළු ද.ලි.වා.ආ.(%) තැරැව්කාර සමාගම්වල දායකත්වය | 15.43 | 15.44 | 14.43 | 12.78 | 14.03 | 14.39 | 13.91 | 13.28 | 12.43 | 13.02 | 13.81 |

තවද 2018 වසරේදී රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් උත්පාදනය කරන ලද ප්‍රතිරක්ෂණ වාරික ආදායම රුපියල් මිලියන 2,025 ක් ලෙස වාර්තා විය. රක්ෂණ තැරැව්කාර සමාගම්වල ප්‍රතිරක්ෂණ ව්‍යාපාර සඳහා ප්‍රධාන වශයෙන් දායක වනුයේ ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් වන අතර ෆයින්ඩ් මයි ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රී-ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සහ ඒඑක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් පිළිගු ස්ථානයන්හි පසු වේ.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## අධීක්ෂණ සමාලෝචනය

### රක්ෂණ සමාගම්

### 1. වාර්තා පිළිබඳ සමාලෝචනය

#### අ) වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ජීවගණකගද වාර්තා

සියළු රක්ෂණ සමාගම් ඔවුන්ගේ වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාල මූල්‍ය වර්ෂය අවසන් වී සිව් මසක් ඇතුළත සංශෝධිත නිර්ණය අංක 140 සහ 150 අනුකූල වන පරිදි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. මීට අමතරව දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ නිරතව සිටින රක්ෂණ සමාගම් ජීවගණකගද වාර්තා සහ එහි සංක්ෂිප්තයන් වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සමග ඉදිරිපත් කළ යුතු වේ.

2018 මාර්තු මාසයේ නිකුත් කරන ලද අංක 16 දරන නියමයට අදාල කොන්දේසි ආවරණය කිරීම සඳහා බාහිර විගණකවරුන්ගේ සහතික කිරීම් (නිර්ණය අංක 14 සහ 15) කොමිෂන් සභාව මගින් සංශෝධනය කරන ලදී.

තවද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නිලධාරීන්ගේ සහාය ද ඇතිව චක්‍රලේඛ අංක 29හි බාහිර විගණකවරුන්ගේ සහතික කිරීම්, නීති රෙගුලාසි සංශෝධනය කිරීම් සහ අවදානම් මත ප්‍රාග්ධන 2015 ආකෘතියට අනුකූල වන ආකාරයෙන් සංශෝධනය කරන ලදී.

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් වාර්තා නියමිත දිනට පනතේ විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කර ඇතිදැයි විශ්ලේෂණය කර, තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කරනු ලැබීය. එම වාර්තාවන් සමාලෝචනය කිරීමේ දී හඳුනාගත් ව්‍යවස්ථානුකූල අවශ්‍යතා වලින් බැහැර වීම්, වෙනත් විෂමතාවයන් හා හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා අදාල රක්ෂණ සමාගම් වෙත දැනුවත් කිරීම කරන ලදී. එමෙන්ම අවශ්‍ය අවස්ථාවල දී පසුවිපරම් කටයුතු නිසියාකාරව සිදු කරන ලදී. තවද, ඉදිරිපත් කරන ලද වාර්තා සමාලෝචනය කිරීමේ දී නිරීක්ෂණය කරන ලද ඇතැම් කරුණු ක්ෂේත්‍රගත විමර්ශන අතරතුර දී අවධානයට ලක් කරන ලදී.

#### ආ) රක්ෂණ සමාගම් සහ සමූහයේ මූල්‍ය අවදානම තක්සේරු කිරීම

සෑම රක්ෂණ සමාගමක්ම එක් එක් සමාගමේ අවදානම් තක්සේරු කිරීමේ වාර්තා වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තාවන්හි කොටසක් ලෙස කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව අදාල වර්ෂයේදී එක් එක් සමාගමෙහි මෙහෙයුම් කටයුතුවල සමාලෝචනයන් ලබා ගැනීම උදෙසා ආයතනික ව්‍යුහය හා හිමිකාරත්වය, ව්‍යාපාර පැතිකඩ, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය, අලෙවිකරණය සහ බෙදාහැරීම් කටයුතු, හිමිකම් පරිපාලනය, අවදානම් කළමනාකරණය ආදී අංශ පිළිබඳව තොරතුරු පරීක්ෂා කර බලන ලදී.

#### ඇ) ප්‍රතිරක්ෂණ ගිවිසුම්

පනතේ 31(1) වගන්තිය ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ ප්‍රතිරක්ෂක ගිවිසුම්, වාර්ෂිකව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. කොමිෂන් සභාව විසින් නියම කරන ලද ශ්‍රේණිගත කිරීම් අවශ්‍යතා සපුරන ලද ප්‍රතිරක්ෂණ ආයතන වෙතින් ප්‍රතිරක්ෂණ ගිවිසුම් ලබාගෙන ඇතිදැයි සහ සියළුම රක්ෂණ උප පන්ති සඳහා ප්‍රතිරක්ෂණ ආවරණ ලබාගෙන ඇතිදැයි තහවුරු කර ගැනීම සඳහා එහි ලේඛන සමාලෝචනය කරන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ භාර අරමුදල වෙත අනිවාර්යයෙන් යොමු කළ යුතු ප්‍රතිරක්ෂණ ප්‍රතිශතයන් නිසියාකාරව සපුරා ඇති ද යන්න පිළිබඳව ද අවධානය යොමු කරන ලදී. කොමිෂන් සභාව මගින් නිරීක්ෂණය කරන ලද කොන්දේසි වලින් බැහැරවීම් සහ විචලනයන් නියම කරන ලද කාලයන් තුළ නිවැරදි කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස අදාල සමාගම් වෙත උපදෙස් ලබා දෙන ලදී. තවද, සියළු රක්ෂණ සමාගම් විසින් එලැඹුණු අතිරේක (Facultative) ප්‍රතිරක්ෂණ ආවරණ සෑම කාර්තුවක් සඳහා ම ඉදිරිපත් කළ යුතු වේ. එසේ ඉදිරිපත් කරනු ලැබූ වාර්තා කොමිෂන් සභාව මගින් සමාලෝචනය කර හඳුනාගත් කොන්දේසි වලින් බැහැරවීම් සහ විචලනයන් නියමිත කාලයන් තුළ නිවැරදි කර ඉදිරිපත් කරන ලෙස අදාල සමාගම් වෙත දන්වන ලදී.

#### ඈ) කාර්තුමය වාර්තා

පනතේ විධිවිධාන ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් එක් එක් කාර්තුවක් අවසන්වී දින 45ක් ඇතුළත සිය කාර්තුමය වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. 2018 වර්ෂය තුළ දී කාර්තුමය සහ මාසික වාර්තා පිළිබඳ නිර්ණය අංක 120 අදාල ආකෘති පත්‍රයන් නියෝග අංක 160 අදාල කරුණු ද ඇතුළත් කර සංශෝධනය කරන ලදී.

2018 වර්ෂය තුළ දී ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තා එක් එක් සමාගමේ කාර්ය සාධනය නිර්ණය කිරීම උදෙසාත් පනතේ අදාල නීති රීති රෙගුලාසිවලට අනුකූල වන ලෙස ඉදිරිපත් කර ඇති ද යන්න පරීක්ෂාකර බැලීම සඳහාත් සමාලෝචනය කරන ලදී.

එක් එක් සමාගමෙහි මූල්‍ය තත්ත්වය කාර්තුමය වාර්තා පදනම් කර ගනිමින් නිරන්තරව නිරීක්ෂණය කරනු ලැබූ අතර මෙහි දී වත්කම් හා බැරකම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය, ද්‍රවශීල තාවය සහ අනෙකුත් අවදානම් සහිත අංශ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී.

එකී කාර්තුමය වාර්තාවන් සමාලෝචනය කිරීමේදී නිරීක්ෂණය කරන ලද විෂමතාවයන් නීති රීති රෙගුලාසි වලින් බැහැරවීම් සහ අනෙකුත් වෙනස්කම්

නියමිත කාලයන් තුළ නිවැරදි කිරීමට අදාල සමාගම් වෙත උපදෙස් ලබා දුනි.

එක් එක් රක්ෂණකරුවන්ගේ කාර්තුමය කාර්ය සාධනය ඇගයීමේදී වාරික ආදායම, දළ ලාභය සහ ශුද්ධ ලාභය පදනම් කරගන්නා ලදී. තවද, රක්ෂණකරුවන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා ලාභදායීත්වය, වත්කම් සහ හිමිකම් පදනම් කරගනිමින් අනුපාත විශ්ලේෂණය ආදිය සිදු කරන ලදී. එක් එක් සමාගමෙහි අනුපාතයන් රක්ෂණ කර්මාන්තයේ සාමාන්‍යයන් සමග සැසඳීම පූර්ව අනතුරු ඇගයීමේ දර්ශකයක් ලෙස යොදා ගන්නා ලදී.

සෑම රක්ෂණ සමාගමක්ම පනතේ විධිවිධාන සහ රීති සපුරාලන බවටත් 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු විධිවිධාන පනතට අනුකූලවී ඇති බවටත් සහතික කිරීමේ වාර්තා දෙකක් සෑම කාර්තුවකටම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

### ඉ) මාසික වාර්තා

අවදානම් පාදක ප්‍රාග්ධන රාමුව යටතේ සමාගම් 4ක් 2018 වර්ෂය තුළදී මාසික වාර්තාවන් සැපයිය යුතු විය. ඒ අනුව සමාගම් 03ක් එක් එක් මාසය අවසන්වී දින 21ක් ඇතුළතත්, එක් සමාගමක් දින 30ක් ඇතුලතත් ලෙස ඔවුන්ගේ මාසික වාර්තා ඉදිරිපත් කළ යුතු විය. එක් එක් සමාගමෙහි වාර්තා වූ නියාමන අවශ්‍යතා වලින් බැහැරවීම් නිරන්තරයෙන් පරීක්ෂා කිරීම උදෙසාත් ඔවුන්ගේ මූල්‍ය ස්ථාවරත්වය සහ අනුකූලතාවය පරීක්ෂා කිරීම උදෙසාත් කොමිෂන් සභාව විසින් මෙම තීරණය ගනු ලැබීය.

## 2. ණය ගෙවීමේ හැකියාවේ සීමා, රීති ප්‍රකාර අනුකූලතාවය අධීක්ෂණය කිරීම

අවදානම් පාදක ප්‍රාග්ධන නියමය -2015ට අනුව සෑම සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ සමාගමක්ම අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලිය යුතු අතර එම ගණනය කිරීම් මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි. එසේ ඉදිරිපත් කරනු ලබන වාර්තා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබන අතර අවදානම් පාදක ප්‍රාග්ධන නියමයට දක්වන අනුකූලතාවය විශ්ලේෂණය කරනු ලබයි. අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා නොමැති අවස්ථාවල දී සහ ගණනය කිරීම් සාවද්‍ය වන අවස්ථාවල දී නියම කරන ලද කාලයන් ඇතුළත නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස අදාල රක්ෂණ සමාගම් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් සපයනු ලැබීය.

## 3. ආයෝජන පිරිවිතරයන්ට අනුකූලවීම නිරීක්ෂණය කිරීම

### අ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

පනතේ 25වන වගන්තිය ප්‍රකාරව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා වූ තාක්ෂණික සංචිතවලින් 20%ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ වත්කම්වලින් 30%ට නොඅඩු ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය.

එකී ආයෝජන පනතේ විධිවිධාන ප්‍රකාරව සිදුකර ඇති ද යන වග රක්ෂණ සමාගම් විසින් යොමු කරනු ලබන මාසික, ත්‍රෛමාසික සහ වාර්ෂික වාර්තා විශ්ලේෂණය තුළින් නිරීක්ෂණය කරනු ලබයි. කොමිෂන් සභාව මගින් නිරීක්ෂණය කරනු ලබන දෝෂ සහ නියාමන අවශ්‍යතාවයන්ගෙන් බැහැර වීම්, නියම කරනු ලබන කාලසීමාවන් තුළ නිවැරදි කරන ලෙස අදාල ආයතන වෙත දැනුම් දෙනු ලැබීය.

### ආ) නිර්ණය අංක 01ට අනුව කෙරෙන අනෙකුත් ආයෝජන

2011 මාර්තු පළමුවන දින දරන නිර්ණය අංක 01 සහ පසුව කළ සංශෝධන වලට අනුව සියළුම රක්ෂණ සමාගම් ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව පවතින වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලේ ශේෂව පවතින වත්කම් ආයෝජනය කළ යුතුය. එසේ කරනු ලබන ආයෝජන කොමිෂන් සභාව මගින් මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව විශ්ලේෂණය කරනු ලබන අතර හඳුනාගත් දෝෂයන් සහ නියාමන අවශ්‍යතාවයන්ගෙන් බැහැරවීම් නියමිත කාලසීමාවන් තුළ නිවැරදි කරන ලෙස අදාල සමාගම් වෙත දැනුම් දෙන ලදී.

අදාල ගිණුම් වර්ෂය තුළ කොමිෂන් සභාව මගින් රක්ෂණ නියාමන පනතට අනුව නිර්ණය අංක 01න් බැහැරවීම් සහ දෝෂ හඳුනාගත් අතර ආයතනවලට මෙම දෝෂ නිවැරදි කර නිර්ණය අංක 01 සමග වහාම අනුකූල වන ලෙස දැනුම් දෙන ලදී.

## 4. අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපායමාර්ග

අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතා අනුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය පවත්වාගැනීමට අපොහොසත් වූ රක්ෂණ සමාගම්වලට එම රීතිවලට අනුකූල වීම සඳහා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලද අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපාය මාර්ග අනුව සම්පාදනය කරන ලෙස රක්ෂණ සමාගම් වෙත දැනුම් දී ඇත. මෙහි මූලික අරමුණ වනුයේ ගැටළු සහගත රක්ෂණ සමාගම් මුල් අවදියේදීම හඳුනාගැනීම සහ එම තත්ත්වය පාලනය කිරීමට ප්‍රායෝගික හා ඵලදායී පිළියම් යෙදීමයි. තවද මෙමගින් අදාල රක්ෂණ සමාගම්වල කාර්ය සාධනය සමීපව අධීක්ෂණය කිරීමට ඉඩ සැලසෙන අතර අර්බුදකාරී තත්ත්වයන් හටගැනීමට පාදක විය හැකි මූල්‍ය තත්ත්වය හෝ ණය ගෙවීමේ හැකියාව සැලකිය යුතු ලෙස අඩුවීම වැලැක්වීමට ද ඉඩ සැලසේ. අදාල මූල්‍ය වර්ෂය තුළ දී රක්ෂණ ආයතන 3ක් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 120% - 160% අතර වාර්තා කළ අතර කොමිෂන් සභාව මගින් අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපාය මාර්ග අනුව අදාල පියවර ගනු ලැබීය.

## 5. ක්ෂේත්‍රගත විමර්ශන

2018 වර්ෂයේදී අවදානම් පාදක අධීක්ෂණ ක්‍රමවේදය යටතේ රක්ෂණ සමාගම් 3ක ක්ෂේත්‍රගත විමර්ශන පවත්වන ලදී. මෙම පරීක්ෂා කිරීම් වලදී

ප්‍රධාන වශයෙන් රක්ෂකයන්ගේ මූල්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම, ආයෝජන, ප්‍රතිරක්ෂණ සහ වෙනත් මෙහෙයුම් කාර්යයන්, අවදානම් කළමනාකරණය ආදී ඉහළ මට්ටමේ අවදානම් සහිත ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීම සිදු විය.

ඒ අනුව කොමිෂන් සභාව විසින් එක් එක් රක්ෂණ සමාගමෙහි මෙහෙයුම් කාර්යසාධනය, තොරතුරු තාක්ෂණය, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි කොමිෂන් සභාව විසින් පනවන ලද විධිවිධාන වලට අනුකූලව සිදුවන්නේදැයි සමාලෝචනය කරන ලදී. මෙමගින් පවත්නා අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායයන්, පද්ධති පාලන ක්‍රම සහ ක්‍රියාපටිපාටීන් පිළිබඳ වැඩිදුරටත් පරීක්ෂා කරනු ලැබීය. තවද, එම රක්ෂණ සමාගම්වල මෙහෙයුම් පද්ධති, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් පිළිබඳ වැඩිදුර අවබෝධයන් ලබා ගැනීම පිණිස සමාගම්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අභ්‍යන්තර/ බාහිර විගණකයින් සහ ජීවගණකඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. තවද මුදල් විශුද්ධිකරණ පනතේ මාර්ගෝපදේශ වලට අනුගතවීම් ද පරීක්ෂා කරන ලදී.

ක්ෂේත්‍රගත විමර්ශන අතරතුරදී කරන ලද නිරීක්ෂණයන් වැඩිදියුණු කිරීම සඳහා කොමිෂන් සභාවේ නිර්දේශයන් අදාල සමාගම් වෙත දැනුම් දෙන ලදී.

## 6. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

කාර්තුමය වාර්තා මගින් එක්රැස් කරගත් සංඛ්‍යානමය සහ අනෙකුත් තොරතුරු පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳව මූල්‍ය තොරතුරු කාර්තුමය පදනමකින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය.

## 7. රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2017

කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වන වර්ෂය සඳහා එක් රැස් කරගත් දත්ත සහ සංඛ්‍යා ලේඛන පදනම් කරගෙන රක්ෂණ කර්මාන්තයේ අත්පොත, රක්ෂණ කර්මාන්තයේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ ප්‍රයෝජනය උදෙසා ප්‍රකාශයට පත්කරනු ලැබීය.

එක් එක් රක්ෂණ සමාගමෙහි මුළු වත්කම්, එක් එක් පන්තින්හි දළ ලිඛිත වාරික ආදායම, වෙළඳපල කොටස, ආදායම් ප්‍රකාශන සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සහ හිමිකම් අනුපාතය ද ඇතුළත්කොට මෙම අත්පොත සකස් කරන ලදී.

## 8. රක්ෂණ අරමුදල් කළමනාකරණය පිළිබඳ ක්‍රියාපටිපාටි - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය (විධාන අංක 15)

දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් නිසියාකාරව අනුමත ආයෝජන වෙත සහ නිසි ප්‍රතිලාභ ඇති ආයෝජන වෙත යොමු කිරීම, අදාල රක්ෂණ අරමුදල් වෙත වගකීම් හා වියදම් බෙදාහැරීම සහ රක්ෂණ අරමුදල් වලින් ආපසු මුදල් ලබා ගැනීම යන අරමුණු පෙරදැරිව කොමිෂන් සභාව විසින් විධාන අංක 15 නිකුත් කරන ලදී. ඒ අනුව සියළු දිගුකාලීන රක්ෂණ සමාගම් විධාන අංක 15හි ඇති නිර්දේශවලට අනුකූල විය යුතුය. රක්ෂණ සමාගම් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ වාර්තා පදනම් කරගනිමින් අනුකූලතාවයන් සමාලෝචනය කළ අතර අදාල ක්‍රියාපටිපාටි පිළිබඳ වැඩිදුර විමසීම් එක් එක් සමාගම වෙත යොමු කරන ලදී.

## 9. විධාන අංක 16 - සමුච්චිත අතිරික්තය හඳුනාගැනීම හා පිළියම්

රක්ෂණ සමාගම් සමග පැවති සාකච්ඡා සහ විලිස් ටවර් වොට්සන් ජීවගණකඥ විශේෂඥයින්ගේ උපදෙස් මත 2018 මාර්තු මාසයේ විධාන අංක 16 නිකුත් කරන ලදී. මෙහි මූලික අරමුණ වනුයේ එක් වරක් ඇතිවන සමුච්චිත අතිරික්තය හඳුනාගැනීම සහ ඒ සඳහා වූ පිළියම් වෙනුවෙන් මාර්ගෝපදේශ නිකුත් කිරීමයි. මෙම විධානයෙහි රක්ෂණ සමාගම් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අනාවරණයන් අන්තර්ගත කර ඇත.

එක් එක් සමාගම විසින් ප්‍රකාශයට පත්කරන ලද සමුච්චිත අතිරික්තයන් අනුමත කිරීමට ප්‍රථම අනාවරණයන් කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලදී. තවද, එක් එක් රක්ෂණ සමාගම තමන් ප්‍රකාශයට පත්කළ අතිරික්තයන්ට සමානුපාතික ලෙස ප්‍රමාණවත් වත්කම් පවත්වාගෙන යා යුතු විය.

## 10. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම සම්බන්ධව රක්ෂණ ක්ෂේත්‍රයේ අවදානම තක්සේරු කිරීම සඳහා එක් එක් සමාගම් වෙතින් තොරතුරු හා දත්ත රැස් කර ගන්නා ලදී. එසේ එක්රැස් කළ දත්ත රක්ෂණ ක්ෂේත්‍රයේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය වෙත යොමු කරන ලදී.

තවද, රක්ෂණ අංශය තුළ අවදානම් පදනම් වූ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා අධීක්ෂණයන් ක්‍රියාත්මක කිරීමට අවදානම් ඇගයීමේ ප්‍රශ්නාවලි සැකසීම සහ රක්ෂණ කර්මාන්තයට අනුකූලවන ආකාරයට අවදානම් මෙවලම් යාවත්කාලීන කරන ලදී. එමෙන් ම ඉදිරිපත් කිරීමට නියමිත ගනුදෙනුකරුවන්ගේ පරීක්ෂාකාරී රීති පිළිබඳව කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන ලදී.

## 11. IFRS 17 ක්‍රියාත්මක කිරීම සඳහා වූ පෙර සූදානම තක්සේරු කිරීම

රක්ෂණ ගිවිසුම් පිළිබඳ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය (IFRS 17) 2021 ජනවාරි මස හෝ ඊට පසුව රක්ෂණ සමාගම් සඳහා අනුගත

කිරීමට මේ වන විට සැලසුම් සකස් කොට ඇත. එමෙන්ම මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව වසරකින් දීර්ඝ කරන ලදී. IFRS 17 ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි සැලකිය යුතු වෙනස්කම් සැලකිල්ලට ගනිමින් එක් එක් සමාගමෙහි මෙම ගිණුම්කරණ ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ සූදානම අන්තරාංශ විශ්ලේෂණ අයවැය ඇස්තමේන්තු සහ අභියෝග ඇතුළු අනෙකුත් තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

### 1. කාර්තුමය වාර්තා, අතුරු මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

2010 පෙබරවාරි 25වන දින අංක1642/16 ගැසට් නිවේදනය (පළමු උපලේඛනය) ප්‍රකාරව සියළු රක්ෂණ තැරැව්කාර සමාගම් ඔවුන්ගේ කාර්තුමය වාර්තා එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය, වසර තුළදී ප්‍රතිරක්ෂණ තැරැව්කාර ව්‍යාපාර සහ විදේශවල කරනු ලබන රක්ෂණ ආවරණ ඇතුළත්කර තොරතුරු ප්‍රමාණයන් ලබාගැනීමට හැකිවන අයුරින් සංශෝධනය කරන ලදී.

2018 වර්ෂය තුළදී බොහෝ රක්ෂණ තැරැව්කාර සමාගම් නියමිත දිනට හෝ ඊට ප්‍රථම ඔවුන්ගේ කාර්තුමය වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. එසේ එවන ලද කාර්තුමය වාර්තා එක් එක් සමාගමේ කාර්යසාධනය, මූල්‍ය තත්ත්වය හා නියාමන අවශ්‍යතාවන් සපුරාලීම ආදී කරුණු මුල්කොට ගෙන සමාලෝචනය කරන ලදී. එහිදී හඳුනාගත් දෝෂ හෝ නියාමන අවශ්‍යතාවයන්ගෙන් බැහැර වීම්, අදාල සමාගම් වෙත වැඩිදුර නිරීක්ෂණය සඳහා යොමු කරන ලදී. එක් එක් සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 06 ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ යොමු කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාව මගින් සමාලෝචනය කර අවශ්‍ය අවස්ථාවල දී වැඩිදුර විමර්ශනය සඳහා අදාල සමාගම් වෙත යොමු කරන ලදී.

### 2. වාරික එකතු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම

පනතේ 89 වන වගන්තිය ප්‍රකාරව තැරැව්කාර සමාගම් මගින් එකතු කරන ලද රක්ෂණ වාරික සති දෙකක් ඇතුළත අදාල රක්ෂණ ආයතනය වෙත යොමු කළ යුතු වේ. කාර්තුමය වාර්තා සමාලෝචනය කිරීමේදී සහ ක්ෂේත්‍රගත විමර්ශන අතරතුරදී මේ පිළිබඳව සියුම්ව අධීක්ෂණය කරන ලදී.

### 3. ක්ෂේත්‍රගත විමර්ශන

2018 වසර තුළ දී කොමිෂන් සභාව මගින් රක්ෂණ තැරැව්කාර සමාගම් 08ක ක්ෂේත්‍රගත විමර්ශන පවත්වන ලදී. මෙහිදී අදාල නීති රෙගුලාසිවලට අනුකූල වන සේ රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පවත්වාගෙන යන්නේදැයි විමර්ශනය කරන ලදී. මෙහිදී නිරීක්ෂණය කරනු ලැබූ වැරදි හෝ නියාමන අවශ්‍යතාවලින් බැහැර වීම්, නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස අදාල සමාගම් වෙත දැනුම් දෙන ලදී. තවද, නීති හා රෙගුලාසි උල්ලංගණය කළ අවස්ථාවලදී නිසි නියාමන ක්‍රියාමාර්ග ගනු ලැබීය.

### 4. ලියාපදිංචිය අළුත් කිරීම

2019 වර්ෂය සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම සඳහා එක් එක් සමාගමෙන් ලද ඉල්ලුම් පත් කොමිෂන් සභාව මගින් සමාලෝචනය කරන ලදී. මෙහිදී විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය වාර්තා උපයෝගී කරගනිමින් එක් එක් සමාගමේ මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය කරනු ලැබීය.

### 5. නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම

වසර තුළ දී නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලෙස ලියාපදිංචි වීම සඳහා අයදුම් පත් කොමිෂන් සභාව වෙත ලැබුණු අතර එම ආයතන ලියාපදිංචි කිරීමට ප්‍රථම ඔවුන්ගේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ව්‍යාපාර සැලැස්ම, සංවිධාන ව්‍යුහය, යටිතල පහසුකම් සපුරා ගැනීම වැනි කරුණු නිරීක්ෂණය කරන ලදී.

# නියාමන සමාලෝචනය

## රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

මෙම වසර තුලදී, රක්ෂණ සමාගම් ලෙස ක්‍රියාකිරීම සඳහා නව ලියාපදිංචි කිරීම් ප්‍රදානය කර නොමැත. එබැවින්, ලියාපදිංචි රක්ෂණ සමාගම් ගණන 27 කි. ඒ අතරින්, ඒ.අයි.ජී.ඉන්ෂුවරන්ස් ලිමිටඩ්, තවදුරටත් රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නිරත වීම නවත්වා ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයෙන් ඉවත්වීම අරඹා ඇත. තවද, එම්.බී.එස්.එල්. ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් 2017 ජුනි 28 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා ඇත.

**ඇමුණුම I :** කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින රක්ෂණ සමාගම්වල නාම ලේඛණය, ඔවුන්ට කරගෙන යාමට අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය / පන්ති දැක්වේ.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ සමාගම්

#### අත්හිටුවීම්

කොමිෂන් සභාව විසින් එක් රක්ෂණ සමාගමක පහල යන මූල්‍යමය තත්වය සලකා බලා (සමාගමේ මූල්‍ය ස්වශක්තතාව සංකීර්ණ ගැටළුවකට පත්ව තිබීම හා ඒ හේතුවෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් වලට අගතිදැයි බලපෑමක් ඇති වීමට හැකි අවස්ථාවක) එම සමාගමේ සාමාන්‍ය හා ජීවිත රක්ෂණය පවත්වා ගෙන යාමට ලබාදී තිබූ ලියාපදිංචිය 2017 ජුනි 28 දින සිට අත්හිටුවන ලදී. ඒ අනුව අදාල සමාගම විසින් ලිඛිතව කොමිෂන් සභාව වෙත අදාල අත්හිටුවීම ඉවත් කල යුත්තේ ඇයිදැයි හේතු දැක්වීමක් සහ ප්‍රාග්ධන සැලස්මක් වහාම කොමිෂන් සභාවේ සලකා බැලීම සඳහා පනතේ ප්‍රතිපාදන වලට අනුකූල නියමිත ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අදාල ඉදිරිපත් කල යුතු විය. කෙසේ වුවද එසේ සිදු කිරීමට සමාගම අපොහොසත් වීම නිසා අදාල අත්හිටුවීම 2017 ජූලි 20 දින සිට පනත ප්‍රකාර නියාමක ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලන තෙක් දීර්ඝ කරන ලදී. කෙසේ වුවද, අදාළ සමාගම සිය අනාගත ආයෝජන මගින් නියමිත ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ ක්‍රියාවලියක නිරතවන බවට කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.

2009 වසරේ දී සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සම්බන්ධයෙන් පනවන ලද අත්හිටුවීම අඛණ්ඩව ක්‍රියාත්මක වේ. සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් විසින් අව්‍යාජ බවට කොමිෂන් සභාව විසින් හඳුනාගත් සියළු හිමිකම් පෑම් නිරවුල් කර තිබුණද, සමාගමට එරෙහිව තවමත් විභාග වෙමින් පවතින නඩුකරයන් නිසා අදාල හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නොලැබුණි.

පනතේ 18 (1) වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම, වෙනත් කරුණු අතර කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව පවත්වා ගෙනයාමට අසමත් වීම සහ පනතේ යම් විධි විධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ පනත යටතේ කොමිෂන් සභාව විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද යම් විධානයක් කඩ කර තිබීම හේතුවෙන්, සම්පූර්ණයෙන්ම හෝ රක්ෂණ ව්‍යාපාරයේ එක්තරා පන්තියක් සම්බන්ධයෙන් අවලංගු කරනු ලැබිය හැකිය.

#### අවවාද කිරීම්

පනතේ 57 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් එක් රක්ෂණ සමාගමකට, වර්ෂ 2015 දී, එම සමාගමට ආශ්‍රිත, පාලිත, පාලක හෝ සමාගම් සමූහයක සාමාජික සමාගමක් සමග හෝ කොමිෂන් සභාවේ අනුමැතිය නොමැතිව සේවාවක් ලබාගැනීම තහනම් කරමින් විධානයක් නිකුත් කරන ලදී. කෙසේ වුවද, අදාල සමාගම එලෙස අනුමැතිය ලබාගැනීමෙන් තොරව එම සේවාවන් ලබා ගෙන තිබීම නිසා, එම සමාගමේ අධ්‍යක්ෂකවරුන්ට හා ප්‍රධාන නිලධරයාට කොමිෂන් සභාව විසින් අවවාද කරන ලදී.

#### නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම හා රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම.

මෙම වසර තුළදී, රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා නව ව්‍යාපාර යෝජනා පත්‍ර 4 කොමිෂන් සභාව වෙත ලැබී ඇත. කොමිෂන් සභාව විසින් මෙම වසරේදී ව්‍යාපාර නාම සඳහා අනුමැතිය 7 දෙනෙකුට ලබාදී ඇත. එමෙන්ම හතරදෙනෙකුට හට රක්ෂණ තැරැව්කරුවන් ලෙස නව ලියාපදිංචි කිරීම් ලබා දී ඇත.

2019 වසර සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේ අපෙක්ෂාවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 59 කින් ඉල්ලුම් පත්‍ර කොමිෂන් සභාව වෙත ලැබී තිබෙන අතර එම සමාගම් අතරින් සමාගම් 58 ක් පනත යටතේ අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති බැවින් 2019 වසර සඳහා සිය ලියාපදිංචිය අළුත් කිරීම් ප්‍රදානය කර ඇත. එක් රක්ෂණ තැරැව්කාර සමාගමක ශුද්ධ ප්‍රාග්ධනය, කොමිෂන් සභාව විසින් නියම කරන ලද අවම අගයට වඩා පහළ යාම නිසා, එකී සමාගමේ, ලියාපදිංචිය අළුත් කිරීම 2018 දෙසැම්බර් 31 වන විට නියමිතව තිබුණි. කෙසේ නමුත්, එකී සමාගම පසුව පනත යටතේ අවශ්‍ය නියමයන් සම්පූර්ණ කිරීම හේතුවෙන් 2019 සඳහා ලියාපදිංචිය අළුත් කරන ලදී. ෆෝසයිට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2019 සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකී සමාග මේ ලියාපදිංචිය 2018 දෙසැම්බර් 31 වන දිනට අවසන් වන ලදී.

**ඇමුණුම II :** කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛණය, ඔවුන්ට

කරගෙන යාමට අවසර ලබාදී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/පන්ති සහ ලියාපදිංචි කාල පරිච්ඡේදය දැක් වේ.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ තැරැව්කාර සමාගම්

#### අවවාද කිරීම්

වසර තුලදී කොමිෂන් සභාව මගින් රක්ෂණ තැරැව්කාර සමාගම්වලට අවවාද කිරීම් නිකුත් කර නොමැත.

#### විධාන

1. රක්ෂණකරුවන් හා රක්ෂණ තැරැව්කරුවන් විසින්, මුදල් අවභාවිතය හේතුවෙන් පෙර සේවාවන් අත්හිටුවන ලද පුද්ගලයින් බඳවා ගන්නා බවට කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් වුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් පනතේ 96(අ) වගන්තිය යටතේ සියලුම රක්ෂණකරුවන් හා රක්ෂණ තැරැ ව්කාර සමාගම් වෙත විධානයක් නිකුත් කරමින්, මුදල් අවභාවිතය හෝ වංචාකිරීම් හේතුවෙන් පෙර සේවාවන් අත්හිටුවන ලද පුද්ගලයින්, කවර හෝ තත්වයෙන් රැකියාව සඳහා බඳවා නොගන්නා ලෙසට විධාන කරන ලදී.
2. රක්ෂණ තැරැව්කාර සමාගම් 4 ක ශුද්ධ ප්‍රාග්ධනය නියමිත අගය වන රුපියල් මිලියන 2.5 ට වඩා අඩුවීම හේතුවෙන්, කොමිෂන් සභාව විසින් වහාම ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා අවශ්‍ය මුදල් යොදවන ලෙසට සහ මාසික වාර්තා ඉදිරිපත් කරන ලෙසටත් ඔවුන්ට විධානය කරන ලදී. මෙම මාසික වාර්තා ඉදිරිපත් කළ යුතු වන්නේ කාර්තුමය වාර්තා වලට අමතරවය.

#### නියාමන / උපදේශන ක්‍රියාමාර්ග

1. පනතේ 102 වගන්තිය ප්‍රකාරව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන රක්ෂණ සමාගම් 2 ඒකාබද්ධ කිරීම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා සිටින ලදි. එම යෝජනාව සලකා බැලීමෙන් පසු නියම කරන ලද කොන්දේසි ඉටු කිරීමට යටත්ව කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදි.
2. චක්‍රලේඛ අංක 36 යටතේ, විදේශ සෞඛ්‍ය රක්ෂණාවරණයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන රක්ෂණ තැරැව්කාර සමාගම් කිපයකටම අවසර ලබා දෙන ලදි.

   චක්‍රලේඛ අංක 36 යටතේ විදේශීය සෞඛ්‍ය රක්ෂණාවරණයන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන රකෂණ තැරැව්කාර සමාගම් ඒ සඳහා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතුවේ.

   විදේශීය සෞඛ්‍ය රක්ෂණාවරණයන් ලබා ගැනීම සඳහා අවසර ලබා ගෙන සිටි රක්ෂණ තැරැව්කාර සමාගම් කිපයක් විසින් තවත් වසරක් සඳහා ලබා දුන් අවසර නැවත අළුත් කරන ලදී.
3. රක්ෂණ නියෝජිතයන් ලෙස ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන පුද්ගලයින් විසින් ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ පවත්වනු ලබන පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා තම සුදුසුකම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ ඉල්ලීම් සලකා බලා 2010 ඔක්තෝබර් 5 දිනැති අංක 1674/4 මගින් සංශෝධිත 2002 සැප්තැම්බර් 23 දිනැති 1255/3 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 2 (ඇ) (11) රීතිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් අනුමැතිය ප්‍රදානය කර ඇත.

   රක්ෂණ නියෝජිත සුදුසුකම් රීති 2 (ඇ) (1) (2010 ඔක්තෝබර් 5 දිනැති අංක 1674/4 මගින් සංශෝධිත 2002 සැප්තැම්බර් 23 දිනැති අංක 1255/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) ප්‍රකාරව, ගණිතය සහ සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව යන විෂයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වී තිබීම රක්ෂණ නියෝජිතයෙකු ලෙස ලියාපදිංචි වීමට සපුරාලිය යුතු එක් අවම සුදුසුකමක් ලෙස සඳහන් කර ඇත. එසේ වුවද, එම රීති 2 (ආ) (11) ප්‍රකාර, යම් තැනැත්තෙකු රීති 2 (ඇ) (1) හි සඳහන් කර ඇති මට්ටමට සමාන හෝ ඉහල වෙනත් යම් අදාල ක්ෂේත්‍රයකින් සුදුසුකම් ලබා ඇත්තේ නම්, එම සුදුසුකම් රීති වල සඳහන් කර ඇති මට්ටමට සමාන බවට, කොමිෂන් සභාව විසින්, එක් එක් සිද්ධිය අනුව, සලකා බලනු ලැබිය හැකිය.
4. එක්තරා නෞකා ආයතනයක් විසින් ඔවුන්ගේ නැව් පන්තියක් සඳහා 2018 ජූනි 01 දා සිට අවුරුද්දක කාලසීමාවක් සඳහා විදේශීය රක්ෂණකරුවකුගෙන් ලබාගත් hull, machinery and war risk රක්ෂණාවරණය තව දුරටත් පවත්වා ගෙන යාමට කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා සිටින ලදි. ඉහත සඳහන් රක්ෂණාවරණය සඳහා කොමිෂන් සභාව විසින් පනතේ 101 වගන්තිය ප්‍රකාරව තවත් වසරක් සඳහා 2018 අනුමැතිය ලබා දෙන ලදී.

   පනතේ 101 වගන්ති ප්‍රකාරව ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාලව හැර, කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, ශ්‍රී ලංකාවේ කිසිම තැනැත්තෙකු විසින් පනත යටතේ ලියාපදිංචි කර නොමැති රක්ෂණකරුවෙකු සමග කෙළින් හෝ අන්‍යකාරයෙන් රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කටයුතු කළ නොහැකි අතර, රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රතිපත්තිය සහ ජාතික යහපත සැලකිල්ලට ගැනීමෙන් පමණක් ඉහත සඳහන් ආකාරයට ලිඛිත අනුමැතිය ලබා දීමට සලකා බලනු ලැබේ.
5. කොමිෂන් සභාව විසින්, රක්ෂණ තැරැව්කාර සමාගම් කීපයක් වෙත විධාන අංක 10 යටතේ රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය හැර වෙනත් ආකාරයක අනුයාත සේවා කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදි. විධාන අංක 10 අනුව රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් පනතේ අර්ථ රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය හැර වෙනත් ආකාරයෙන් අනුයාත සේවා කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වේ.

6. 2011 අංක 3 දරන සංශෝධිත පනතින් හඳුන්වා දුන් විධි විධාන ප්‍රකාරව, රක්ෂණ සමාගම් වල අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ඉල්ලුම් පත්‍ර රාශියකට අනුමැතිය ප්‍රදානය කර ඇත.

7. පනතේ විධි විධාන ප්‍රකාරව රක්ෂණ සමාගම් වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම් වල ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ඉල්ලුම්පත්‍ර රාශියකට අනුමැතිය ප්‍රදානය කර ඇත.

8. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර රාශියකට කොමිෂන් සභාව ප්‍රතිචාර දක්වන ලදී.

9. කොමිෂන් සභාව විසින් රක්ෂණ නිමැවුම් රැසක් විශ්ලේෂණය කර අදාල රක්ෂණ ආයතන වෙත නිරීක්ෂණයන් සපයන ලදි. චක්‍රලේඛ අංක 39 අනුව සියළුම රක්ෂණ ආයතන, නව රක්ෂණ නිමැවුම් නිකුත් කිරීමට පෙර අදාල ලිය කියවිලි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

10. රක්ෂණකරුවන් කීපදෙනෙකුගේ ඉල්ලීම් සලකා බැලීමෙන් පසු, පනතේ විධි විධාන ප්‍රකාරව ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයෙන් කොමිෂන් සභාව විසින් නිදහස් කරන ලදි.

2011 අංක 03 දරන සංශෝධිත පනතේ ප්‍රතිපාදන අනුව ලියාපදිංචිය ලබා ඇති සියලු රක්ෂණ ආයතන, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ලැයිස්තුගත යුතුව ඇත.

පහත දැක්වෙන කාණ්ඩයන් අයත් රක්ෂණ සමාගම් වලට පනතේ ප්‍රතිපාදන ප්‍රකාර අනිවාර්ය ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කිරීම සඳහා අයදුම් කළ හැකිය.

i. දේශීය පාලිත රක්ෂණ සමාගමේ කොටස්වලින් අවම වශයෙන් සියයට අසූපහක් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටියා වූ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති හා එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය, විනිමය ස්ථාන පිළිබඳ ලෝක සම්මේලනයේ හෝ කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් යම් සංවිධානයක සාමාජිකයකු වන්නා වූ විදේශීය පාලක සමාගමක් විසින් දරනු ලබන විට

තවද, එවැනි දේශීය පාලිත රක්ෂණ සමාගමක ගිණුම් විදේශීය පාලක සමාගමේ සමූහ ව්‍යාපාර ඒකාබද්ධ ගිණුම්වලට ඇතුළත් කර ඇති විට දේශීය පාලිත රක්ෂණ සමාගමේ ගිණුම්වලට අදාළ නියමයන් ඇතුළු එම විදේශීය පාලක සමාගම ලැයිස්තුගත කර ඇති විදේශීය ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සිය විධිමත් කිරීමේ නියමයන්ට සමූහ ව්‍යාපාර මට්ටමින් අනුකූල වන බවට සහතික විය යුතු බවට එම විදේශීය ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය මගින් එම විදේශීය පාලක සමාගමට නීත්‍යනුකූලව නියම කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත් කිරීමෙන් පසු, එම දේශීය පාලිත රක්ෂණ සමාගම 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලබාදෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කරනු ලැබිය හැකිය.

වර්ෂ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (පනතේ 15 ආ (1) වගන්තිය)

ii. යම් දේශීය පාලිත රක්ෂණ සමාගමක් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලබා ඇති ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති සමාගමක් විසින් දරනු ලබන බවට සෑහීමට පත්වීමෙන් පසුව එම දේශීය පාලිත රක්ෂණ සමාගම ඉහත කී පනතේ විධිවිධාන යටතේ බලපත්‍ර ලබාදෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කළ යුතු ය.

(පනතේ 15 ඇ (2) වගන්තිය)

ඉහත සඳහන් කල කාණ්ඩ දෙක හැරුණු විට ජාතික රක්ෂණ භාර අරමුදල, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හෝ සමාගම් දෙකක් බවට වෙන් කරනු ලැබීමෙන් පසු පිහිටුවන ලද යම් රක්ෂණ සමාගම් එකී අනිවාර්ය ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කරනු ලැබේ.එනමුත් එම නිදහස් කිරීම වලංගු වන්නේ එකී ආයතන වල හිමිකාරීත්වය ශ්‍රී ලංකා ආණ්ඩුව දරණ තාක් පමණි.

(පනතේ 15 ඈ (1) සහ (3) වගන්ති)

11. පනත යටතේ ආලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීමට අදාළ අවශ්‍යතා සපුරා තිබීම හේතුවෙන්.

අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කළ අයදුම්පත්‍ර විමර්ශනය කිරීමෙන් අනතුරුව ලියාපදිංචි වීමට අදාළ අවශ්‍යතා සපුරා තිබු දස දෙනෙකුට කොමිෂන් සභාව විසින් අනුමැතිය ප්‍රදානය කරන ලදී.

පනතේ 89 ඈ (1) වගන්තිය ප්‍රකාරව අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා කොමිෂන් සභාව විසින් තත්කාර්යය සඳහා සලසනු ලබන පරිදි වූ යම් ආකෘතියන් වූ ඉල්ලුම්පත්‍රයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් තත්කාර්යය සඳහා සාදන ලද රීති මගින් නිශ්චිත යම් ලේඛන, තොරතුරු සහ ගාස්තුවක් ද සමග එය ඉදිරිපත් කළ යුතු වේ.

**ඇමුණුම III :** කොමිෂන් සභාව සමග ලියාපදිංචි වී සිටින අලාභ ගැලපුම්කරුවන්ගේ නාම ලේඛණය සහ ඔවුන් කොමිෂන් සභාවේ ලියාපදිංචිත දිනය දැක්වේ.

පනතේ 114 වගන්තිය ප්‍රකාරව "අලාභ ගැලපුම්කරු" යන්නෙන් රක්ෂණ හිමිකම් පෑමකදී උද්ගත වන අලාභ විමර්ශනය කිරීමේ සහ තක්සේරු කිරීමේ විශේෂිත දැනුම ඇති සහ මේ පනතේ විධි විධාන යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු අදහස් වේ.

# විමර්ශන සමාලෝචනය


රක්ෂණ ඔප්පුහිමියන්ගේ සුභසිද්ධිය සුරැකීමේ සමස්ථ පරමාර්ථය පෙරදැරිව, රක්ෂණ හිමිකම්පාන්නන් විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන රක්ෂණ වන්දි ගෙවීම් සම්බන්ධයෙන් රක්ෂකයන් හා හිමිකම්පාන්නන් අතර හටගන්නා ආරවුල් විමර්ශනය කිරීමට හා ඒවා නිරාකරණය කිරීමට කොමිෂන් සභාවට බලතල ඇත. එමෙන්ම, කිසියම් රක්ෂකයකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයකුගේ විෂමාචාරයක් හෝ අක්‍රමිකතාවයක් පිළිබඳව ලැබෙන පැමිණිලි ද කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබේ.

යම් ආරවුලක් හෝ පැමිණිල්ලක් (රක්ෂකයකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයකුට එරෙහිව) කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබූ අවස්ථාවකදී කොමිෂන් සභාව විසින් තීරණයක් ගැනීමට පෙර අදාල සියළු පාර්ශවයන්ට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදෙනු ලැබේ. රක්ෂකයන් විසින් රක්ෂණ හිමිකම සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණයට පදනම් වූ කරුණු අදාල ලිපිලේඛන හා තොරතුරු මගින් තහවුරු කළ යුතු වේ. කොමිෂන් සභාව විසින් තීරණයන්ට එළැඹීමට පෙර අවශ්‍ය අවස්ථාවලදී තෙවන පාර්ශවයන් වෙතින් කරුණු තහවුරු කර ගැනීම් හා විශේෂඥ මතයන් ලබාගැනීමද සිදු කරනු ලැබේ.

## සමස්ථ පැමිණිලි පිළිබඳ සමාලෝචනය

සමාලෝචනයට පාත්‍ර වන වසර තුළ දී නව පැමිණිලි 247 ක් කොමිෂන් සභාව වෙත යොමු වූ අතර එම කාලය තුළ දී පැමිණිලි 295 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කෙරුණි. කොමිෂන් සභාවේ මැදිහත්වීම මත, රක්ෂණ වන්දි ආරවුල් 65 ක් රක්ෂණ හිමිකම්පාන්නන්ට වාසිදායක ලෙස නිරාකරණය විය. එසේ කොමිෂන් සභාවේ මැදිහත්වීම මත රක්ෂකයන් විසින් නිරාකරණය කරන ලද රක්ෂණ වන්දි වල ආසන්න මුළු වටිනාකම රුපියල් මිලියන 38 ක් පමණ වේ.


**රූප සටහන 1**
**පසුගිය වසර පහ (5) තුළ වාර්ෂිකව ලැබුණු පැමිණිලි**





පසුගිය වසර පහ (5) තුළදී කොමිෂන් සභාවට ලැබුණු මුළු පැමිණිලි වල එකතුව 1,498කි. කෙසේනමුත්, පළමු රූප සටහනේ දැක්වෙන පරිදි, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ලැබුණු පැමිණිලි සංඛ්‍යාව (247) පසුගිය වසරට (348) සාපේක්ෂව අඩු වී ඇත. රක්ෂණ සමාගම් විසින් පාරිභෝගික පැමිණිලි ඔවුන්ගේ පැමිණිලි මෙහෙයවීමේ ක්‍රියාපටිපාටීන් වලට අනුකූලව ඵලදායිව බේරුම්කිරීම, කොමිෂන් සභාවට පැමිණිලි ලැබීම අඩු වීමට හේතුවක් විය හැක.

සමාලෝචිත වසර තුළ දී කොමිෂන් සභාව වෙත මාසිකව ලැබුණු පැමිණිලි පිළිබඳ විස්තරයක් දෙවැනි රූප සටහන මගින් දැක් වේ. අගෝස්තු මාසයේ දී වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (33) ලැබී ඇති අතර අඩුම පැමිණිලි සංඛ්‍යාව (7) වාර්තා වී ඇත්තේ ජූනි මාසයේ දීය. මෙයට හේතුව ජූනි මාසයේ දී සති දෙකකට අධික කාලයක් පැවති තැපැල් වර්ජනය විය හැකිය. මාසිකව ලැබුණු පැමිණිලි වල සාමාන්‍ය අගය

**රූප සටහන 2**
**සමාලෝචිත වසර තුළදී මාසිකව ලැබුණු පැමිණිලි ප්‍රමාණය විශ්ලේෂණය**



**රූප සටහන 3**
**2018 වසරේදී ලැබුණු පැමිණිලි වර්ගීකරණය**




20.5 ක් වන අතර පෙබරවාරි, මැයි, ජූලි, අගෝස්තු හා ඔක්තෝබර් යන මාසයන්හි එකී සාමාන්‍ය අගය ඉක්මවා පැමිණිලි ලැබී ඇත.

තෙවන රූප සටහන මගින් 2018 වර්ෂය තුළ ලද සමස්ථ පැමිණිලි වල වර්ගීකරණයක් දක්වා ඇත. සමස්ථ පැමිණිලිවලින් බහුතරය, එනම්, 122 (49%) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ආශ්‍රිතව ද පැමිණිලි 76 (31%) ක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද වේ. විශේෂිතවූ රක්ෂණ ව්‍යාපාරයකට වර්ගීකරණය කළ නොහැකි වෙනත් පැමිණිලි 49 (20%) ක් ද වේ. සමාලෝචිත වර්ෂයේ දී කොමිෂන් සභාව වෙත ලැබුණු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිත පැමිණිලි වල ප්‍රතිශතය 60% (2017 වසරේ දී) සිට 49% දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇති අතර වෙනත් පැමිණිලි ඊට සමානුපාතිකව 11% (2017 වසරේ දී) සිට 20% දක්වා වැඩි වී ඇත.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාලව කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි ගැටළුවේ ස්වභාවය අනුව වර්ගීකරණය කර පළමුවන වගුවේ දක්වා ඇත.

පළමුවන වගුවෙහි දැක්වෙන පරිදි, සමස්ථ පැමිණිලි අතුරින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (122) යටතේ රක්ෂණ වන්දි ආරවුල් 113 (92.6%) වන අතර ඉතිරි පැමිණිලි 09 (7.4%) අර්ධකාලීනව රක්ෂණ ඔප්පු අවලංගු කිරීම්, අසන ලද ප්‍රශ්න වලට ප්‍රතිචාර නොදැක්වීම්, වාරික නැවත ලබාගැනීම පිළිබඳ ඉල්ලීම් හා රක්ෂණ ඔප්පු නොලැබීම ආදී වෙනත් පැමිණිලි වේ. රක්ෂණ වන්දි ආරවුල් යටතේ වන ප්‍රධානතම ගැටළුව වන්නේ වගකීම පිළිනොගැනීම (73.4) සඳහා වන පැමිණිලියි.

පැමිණිලි වල මූලසාධකයන් විශ්ලේෂණය කිරීමේ දී මෝටර් රථ වාහන හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ ප්‍රධාන හේතු ලෙසට අනාවරණය වන්නේ; අනතුර සම්බන්ධයෙන් වන වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම (රක්ෂණය ලබාගත් අරමුණට පරිබාහිර අරමුණු සඳහා වාහනය භාවිතා කිරීම, රියදුරු බීමත්ව සිටීම, වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති අයෙක් රිය පැදවීම හෝ හිමිකම්පාන්නාට වාහනය කෙරෙහි එය විකිණීමෙන් පසුව රක්ෂණීය බැඳියාවක් නොමැතිවීම) රියදුරු/ රක්ෂිතයා විසින් අනතුර පිළිබඳ ලබාදුන් විස්තරය සමග අනතුරෙන් සිදු වූ අලාභහානි නොසැසඳීම හෝ අනතුර සිදුවන දිනය වන විට මුළු රක්ෂණ වාරික මුදල නොගෙවීම මත රක්ෂණ ඔප්පුව අවලංගුවීමයි. අවශ්‍ය අවස්ථාවන්හිදී රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, පොලිස් ස්ථාන, රෝහල් හා සිද්ධිය පිළිබඳ ප්‍රකාශ ලබාදුන් අය වෙතින් අදාල තොරතුරු කැඳවීමෙන් හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක පරීක්ෂණයක් පවත්වන ලදී. හිමිකම උද්ගතවීමට හේතු වූ අලාභය රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය වන සහ කිසිදු ආකාරයක වංචාවක් හෝ හිතාමතා කරුණු වරදවා දැක්වීමක් සිදු ව නොමැති අවස්ථා වලදී හිමිකම්පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය.

රක්ෂණ වන්දි ආරවුල් යටතේ ප්‍රධාන වශයෙන් බලපෑ මීළඟ හේතුව (18.6%) වූයේ ගෙවන ලද/ යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීමයි. මෙම පැමිණිලි වලට මූලික හේතූන් වූයේ රක්ෂණ ඔප්පුවෙහි කරුණු වරදවා වටහා ගැනීම සහ රක්ෂකයන් විසින් ගෙවන ලද අලාභ ගැලපුම්/ අඩු කිරීම් පිළිබඳව ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ලබා නොදීමයි. ලිඛිත කරුණු පැහැදිලි කිරීම් තුළින් හෝ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡා වලදී හිමිකම්පාන්නන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදීම මගින් මෙවැනි බොහොමයක් ආරවුල් විසඳාගත හැකි විය. කොමිෂන් සභාවට යොමු කරන ලද ඉතිරි පැමිණිලි 09 හිමිකම් ගෙවීම ප්‍රමාද

**වගුව 1**
**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි : ගැටළුව අනුව**

| ගැටළුව | # | % |
|---|---|---|
| රක්ෂණ වන්දි ආරවුල් | **113** | **92.6** |
| වගකීම පිළිනොගැනීම | 83 | 73.4 |
| ගෙවන ලද/ යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 21 | 18.6 |
| හිමිකම් ගෙවීම ප්‍රමාදවීම | 9 | 8.0 |
| වෙනත් පැමිණිලි | **9** | **7.4** |
| එකතුව | **122** | **100.0** |

වීම සම්බන්ධවයි. රක්ෂිතයන්ගේ හෝ අළුත්වැඩියාකරුවන්ගේ පාර්ශවයෙන් හිමිකම් නිරාකරණය කිරීමට අවශ්‍ය තොරතුරු හා ලේඛන ඉදිරිපත්කිරීමේදී සිදුවන ප්‍රමාදයන් සහ හිමිකම් පිළිබඳව තවදුරටත් විමර්ශන කටයුතු සිදුකරගෙන යාම වැනි බොහොමයක් ප්‍රමාදයන් වලට හේතු වී ඇති බවට නිරීක්ෂණය කරන ලදී.

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය

දෙවන වගුවෙන් පෙන්නුම් කරනු ලබන්නේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාලව ලැබුණු පැමිණිලි ගැටළුවේ ස්වභාවය අනුව විශ්ලේෂණය පහත පරිදි වේ:

දෙවන වගුවට අනුව සමස්ථ දීර්ඝ කාලීන ව්‍යාපාරය යටතේ ලැබුණු පැමිණිලි (76), රක්ෂණ වන්දි ආරවුල් හා වෙනත් පැමිණිලි සමාන සමානුපාතිකත්වයකින් (50% බැගින්) යුක්ත වේ.

රක්ෂණ වන්දි ආරවුල් සඳහා මූලික හේතුව වන්නේ රක්ෂිතයා වගකීම පිළිනොගැනීමයි. බොහොමයක් හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප වීමට පාදක වී ඇත්තේ රක්ෂණ ඔප්පුව ලබාගැනීමේ දී හෝ පුනස්ථාපනය කිරීමේ දී වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ වරදවා දැක්වීම මතයි. රක්ෂණ ගිවිසුමක පදනම වන "උපරිම සද්භාවය" (*Uberrimae fidei*) නම් මූලික නෛතික මූලධර්මය ගිවිසුමේ දෙපාර්ශවය එනම්, රක්ෂකයා මෙන්ම රක්ෂිතයාට එකසේ ක්‍රියාකරයි. යෝජකයා විසින් රක්ෂණ යෝජනා පත්‍රය මගින් හෙළිදරව් කරන තොරතුරු මත පදනම්ව, යෝජකයාගේ ජීවිතය පිළිබඳ අවදානම පිළිගන්නේද යන වග සහ ඊට අදාල කොන්දේසි හා නියමයන් රක්ෂකයා විසින් තීරණය කරයි. එවන් අවස්ථාවක, රක්ෂිතයා විසින් කිසියම් වැදගත් කරුණක් හෙළිදරව් නොකළහොත් හෝ වරදවා දැක්වීමක් සිදුකළහොත්, උපරිම සද්භාවය මූලධර්මය උල්ලංඝනය වේ.

සමහර අවස්ථාවලදී, යෝජකයා විසින් වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හා වරදවා දැක්වීමට හේතු වී ඇත්තේ අදාල රක්ෂණ මූලධර්ම හා වැදගත් තොරතුරු හෙළිදරව් කිරීමේ වගකීම පිළිබඳ නොදැනුවත්භාවය බවට නිරීක්ෂණය විය. එබැවින්, අනාගත රක්ෂණ ඔප්පුහිමියා වෙත පැවරෙන වැදගත් කරුණු හෙළිදරව් කිරීමේ වගකීම හා එසේ කිරීමට අපොහොසත්වීමෙන් සිදුවන අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව ඔවුන්ව නිසි පරිදි දැනුවත් කළ බව තහවුරු කරගැනීමට අවශ්‍ය පියවර රක්ෂකයා විසින් ගත යුතුය. වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම හිතාමතා හෝ නොසැලකිල්ලෙන් නොවන අවස්ථාවන් කිහිපයකදී පමණක් අදාල රක්ෂණ හිමිකම්පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකිවිය.

රක්ෂණ ඔප්පුවේ දක්වා ඇති කාලවකවානුව තුළ හා නියමිත පරිදි වාරික ගෙවීම රක්ෂණ ඔප්පුහිමියාගේ ගිවිසුම්ගත යුතුකමක් වේ. අලාභය සිදුවන විට වාරික නොගෙවීම හේතුවෙන් රක්ෂණ ඔප්පුව අප්‍රාණිකව පැවති අවස්ථාවලදී රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප වී ඇත. නියමිත වේලාවට රක්ෂණ වාරික ගෙවා රක්ෂණ ඔප්පුව පවත්වාගෙනයාම රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීමක් වන අතර ආරවුලකදී ඉදිරිපත් කිරීමට සිදුවුවහොත් ගෙවීම් තහවුරු කිරීමට සාක්ෂි ඔවුන් සතුවීම අවශ්‍ය වේ. ඒ අනුව, නියමිත කාලසීමාව තුළ වාරික ගෙවන ලද බව තහවුරු කළ හැකි හෝ ගෙවීමේදී සිදු වූ ප්‍රමාදය සාධාරණීකරණය කළ හැකි අවස්ථා වලදී පමණක් කොමිෂන් සභාවට සහාය වීමට හැකි විය.

රක්ෂණ ආරවුල් වලට බලපෑ තවත් ප්‍රධාන හේතුවක් වන්නේ පූර්ණත්ව හා පවාරණ ප්‍රතිලාභ ලබාගැනීම (36.8%) සම්බන්ධවයි. මෙවැනි ආරවුල් සඳහා ප්‍රධාන හේතුව වන්නේ රක්ෂණ ඔප්පුවල වගන්ති පිළිබඳ අනවබෝධය සහ රක්ෂකයන් විසින් ලබාදෙන පැහැදිලි කිරීම් ප්‍රමාණවත් නොවීමයි. රක්ෂණ ඔප්පුහිමියන්ට ලිඛිතව සහ කොමිෂන් සභාවේ දී පවත්වන ලද සාකච්ඡාවන්හි දී අවශ්‍ය පැහැදිලි කිරීම් සැපයීමෙන් මෙවැනි බොහොමයක් ආරවුල් විසඳාගත හැකි විය. හිමිකම්පාන්නන්ට තමන්ගේ යෝජිත මුදල දැනුම් දීමේදී ප්‍රමාණවත් පැහැදිලි කිරීම් හෝ විස්තර ලබානොදීම් මෙවැනි යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවූ ආරවුල් (13.2%) සියල්ලෙහිම පාහේ හේතුව බවට නිරීක්ෂණය විය.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල වෙනත් පැමිණිලි (55.3%) සඳහා ප්‍රධාන හේතුව වූයේ රක්ෂණ ඔප්පු අවලංගු කිරීම සහ ගෙවන ලද වාරික මුදල් ආපසු ලබාගැනීම හෝ පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් වන පැමිණිලි වේ. අවලංගු කිරීමේ කාලසීමාව (එනම්, රක්ෂණ ඔප්පුව ලැබුණු දින සිට දින 21 ක් ඇතුළත) ඉකුත් වීමෙන් අනතුරුව රක්ෂණ

**වගුව 2**

**දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාලව පැමිණිලි : ගැටළුව අනුව**

| ගැටළුව | # | % |
|---|---|---|
| **රක්ෂණ වන්දි ආරවුල්** | **38** | **50.0** |
| වගකීම පිළිනොගැනීම | 19 | 50.0 |
| පූර්ණත්ව සහ පවාරණ ප්‍රතිලාභ | 14 | 36.8 |
| යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 5 | 13.2 |
| **වෙනත් පැමිණිලි** | **38** | **50.0** |
| ගෙවන ලද වාරික මුදල් ආපසු ලබාගැනීම/ ඔප්පු අවලංගු කිරීම හෝ පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම් | 21 | 55.3 |
| තොරතුරු ලබාදීම | 5 | 13.2 |
| වාරික ගෙවීම/ සාවද්‍ය පරිහරණය | 4 | 10.5 |
| වෙනත් | 8 | 21.0 |
| එකතුව | **76** | **100.0** |

ඔප්පුහිමියාට එවැනි අයිතියක් නොමැති වීම නිසා රක්ෂණ ඔප්පු අවලංගු කිරීම සහ ගෙවන ලද වාරික මුදල් ආපසු ලබාගැනීම සම්බන්ධයෙන් වන පැමිණිලි සඳහා සහාය වීමට හැකියාවක් නොලැබුණි. කෙසේවුවත්, රක්ෂණ ඔප්පුහිමියන් හෝ හිමිකම්පාන්නන් මුහුණ පෑ දුෂ්කරතා පිළිබඳ පැහැදිලි සාක්ෂි තිබෙන විටදී සහනයක් සැලසීමට රක්ෂකයන් එකඟ විය. රක්ෂණ ඔප්පුව පුනස්ථාපනය කිරීමට පියවර ගැනීමට ප්‍රමාද වූ කරුණු සාධාරණීකරණය කළ හැකි විටකදී පමණක් නියමිත කාලය ඉකුත්වීමෙන් පසුව සිදුකරන ලද පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම් වලට රක්ෂණ ඔප්පුහිමියන්ට සහාය වීමට හැකිවිය.

විමර්ශනයන්හි දී අනාවරණය වූ කරුණු මත පදනම්ව නිසි පියවර ගැනීමෙන් තොරතුරු ලබාදීම (13.2%) සම්බන්ධයෙන් වන පැමිණිලි නිරාකරණය කිරීමට හැකි විය. වාරික ගෙවීම සහ සාවද්‍ය පරිහරණය සම්බන්ධයෙන් වන පැමිණිලි 04 (10.5%) ක් පමණක් තිබුණි. සාවද්‍ය පරිහරණය පිළිගතහැකි සාක්ෂි මගින් තහවුරු කළහැකි අවස්ථා වලදී පමණක් රක්ෂණ ඔප්පුහිමියන්ට සහාය වීමට හැකියාව ලැබුණි. වෙනත් පැමිණිලි වල ඉතිරිය (21%) රක්ෂණ ඔප්පු වලින් ලබාගත් ණය, වාරික ගෙවන ආකාරය හා ශාඛා කාර්යාල වල කටයුතු සම්බන්ධයෙන් විමර්ශනයන්හි දී අනාවරණය වූ කරුණු මත පදනම්ව එකී සියළු පැමිණිලි සම්බන්ධයෙන් පියවර ගනු ලැබීය.

## වෙනත් පැමිණිලි

සමාලෝචිත වසර තුළදී මූලිකවම රක්ෂණ නියෝජිතයන්ව අසාධාරණ ලෙස සේවය අවසන් කිරීම/ අසාදුලේඛනගත කිරීම සහ අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් රක්ෂණ ව්‍යාපාරයට සෘජුවම අයත් නොවන වෙනත් පැමිණිලි (49) කොමිෂන් සභාවට ලැබුණි. පනතේ විධිවිධාන යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, පැමිණිලිකරුවන්ට සහාය වීමට හෝ පැමිණිලි නිරාකරණය කිරීමට හැකි අවස්ථා වලදී පියවර ගන්නා ලදී.

## රක්ෂණ ආරවුල් නිරාකරණය කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධනය කිරීමේ වැඩසටහන (CMDP) සඳහා ශ්‍රී ලංකා රජයට අදියර දෙකකින් සමන්විත ප්‍රතිපත්ති මත පදනම්වූ ණය මුදලක් අනුමත කර ඇත. මෙම වැඩසටහන (CMDP) මගින් ප්‍රාග්ධන වෙළඳපලෙහි මූල්‍යමය මැදිහත්වීමේ භූමිකාව වර්ධනය කිරීමට සහ ආයෝජක පදනම විවිධාංගීකරණය සහ ව්‍යාප්තිය තුළින් ඉතිරිකිරීම හා ආයෝජන අතර වෙන් කරන ලද කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම මගින් සම්පත් බලමුළුගැන්වීමට මූල්‍යමය සහාය සලසාදෙයි. කොමිෂන් සභාවද ඇතුළුව ක්‍රියාත්මකවන නියෝජිත ආයතන මගින් නියමිතව හඳුනාගත් ප්‍රතිපත්තිමය කටයුතු මුදුන්පමුණුවා ගැනීම මත අරමුදල් මුදාහැරීම රඳා පවතී. ප්‍රතිපත්තිමය කටයුතු මුදුන්පමුණුවා ගැනීම සඳහා බැංකුව (ADB) මගින් නියෝජිත ආයතනවලට තාක්ෂණික සහාය ලබාදෙයි.

දෙවන වාරිකය අනුව, කොමිෂන් සභාව වෙත සිය නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ ක්ෂේත්‍රයට අදාල ආරවුල් විසඳීමේ මණ්ඩලයක් සහ කාර්ය මණ්ඩලයක් පිහිටුවීමට කොමිෂන් සභාවට අවශ්‍ය වේ. 2018 ජූලි මාසයේදී අන්තර්ජාතික උපදේශක වරුන් විසින් දෙන ලද නිර්දේශයන් සලකා බැලීමේ දී කොමිෂන් සභාවේ බලය අභිනියෝජනය කිරීමට පනතේ 98 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පවත්නා රක්ෂණ ඔම්බුඩ්ස්මන් යෝජනා ක්‍රමය විධිමත් කිරීමට හා වැඩි දියුණු කිරීමට තීරණය කරන ලදී. 2018 නොවැම්බර් මාසයේ දී යෝජිත රක්ෂණ කර්මාන්තයේ ඔම්බුඩ්ස්මන් මධ්‍යස්ථානය සඳහා වූ මූලික රාමුවේ සහ ක්‍රියාවට නැංවීමේ සැලසුමේ කෙටුම්පත පිළිබඳව මූලික වටයේ සාකච්ඡාවක් කර්මාන්තයේ නියැලෙන්නන් සමග පවත්වන ලදී. 2018 වසර අවසානය වන විට කර්මාන්තයේ ප්‍රතිචාර ලැබුණු අතර කොමිෂන් සභාව යෝජනා ක්‍රමය විධිමත් කිරීමට කර්මාන්තය සමග දැනට සාකච්ඡා කරමින් සිටී.

# වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය

රක්ෂණ කර්මාන්තයේ දියුණුව තවදුරටත් පහසුකිරීමට රක්ෂණය පිළිබඳ මහජනතාවගේ දැනුම හා විශ්වාසය වැඩිදියුණු කිරීමට අවශ්‍ය වේ. රක්ෂණ කර්මාන්තයේ ප්‍රධාන කොටස්කරුවන් ලෙස දැනට සිටින රක්ෂණ ඔප්පුහිමියන් හා අනාගත රක්ෂණ ඔප්පුහිමියන් රක්ෂණ ගිවිසුමකට එළඹීමේදී දැනුවත් තීරණයක් ගතහැකි ස්ථානයක තැබීම හා ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට දැනුම වැඩිකිරීමට අවශ්‍ය වේ. දිවයින පුරා පවත්වන දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් මගින් මහජනතාවගේ රක්ෂණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමට කොමිෂන් සභාව උත්සහ දරයි.

මෙම අරමුණ ක්‍රියාවට නැංවීම සඳහා ඉලක්කගත කණ්ඩායම් වෙත යාමට කොමිෂන් සභාව විසින් විවිධ සන්නිවේදන මාධ්‍යයන් උපයෝගී කර ගනී. සමාලෝචිත වසර තුළ ක්‍රියාවට නංවන ලද ක්‍රියාකාරකම් හා සන්නිවේදන මාධ්‍යයන් පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත:

## දැනුවත්කිරීමේ වැඩසටහන්

### ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හිදී පවත්වන ලද වැඩසටහන්

මෙම වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහයෝගය ඇතිව සංවිධානය කරනු ලබයි. මෙවැනි වැඩසටහන්වල ඉලක්කය වූයේ මහජනතාව සමග නිතරම අන්‍යෝන්‍යව ක්‍රියාකරන අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සමග තම ප්‍රදේශයන්ට අදාළ ග්‍රාම නිලධාරීන්, පොලිස්, සුරාබදු, ක්ෂේත්‍ර, සමෘද්ධි, සංවර්ධන සහ කෘෂිකාර්මික වැනි රජයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීමයි. කොමිෂන් සභාවේ කාර්යභාරය (රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස) දේපල හෝ ජීවිතවලට වන අවදානම ආවරණය කෙරෙන රක්ෂණ ඔප්පුවක් තිබීමේ වැදගත්කම, රක්ෂණ ඔප්පුහිමියෙකුගේ යුතුකම් හා අයිතිවාසිකම්, රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීමේදී හා එය පවත්වාගෙන යාමේදී සළකා බැලිය යුතු වැදගත් කරුණු සහ රක්ෂණ ඔප්පුවක හිමිකම් ලබාගැනීම වැනි කරුණු පිළිබඳව සහභාගීවන්නන් දැනුවත් කරන ලදී.

ග්‍රාමසේවා වසම් 773ක් ආවරණය වන පරිදි සීතාවක, දිවුලපිටිය, තමන්කඩුව, බණ්ඩාරගම, මඩකලපුව, හබරාදුව, මාදම්පේ, රිදීගම, අරනායක, මන්නාරම, මුලටියන සහ පස්සර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල "කොට්ඨාශ දින" රැස්වීම්වලදී රක්ෂණය පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහන් 12ක් පවත්වන ලදී. මෙහිදී රජයේ නිලධාරීන් 1675ක් පමණ මෙම වැඩසටහන් වලට සහභාගී වී ඇත.



ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩ සටහනක්

### අනෙකුත් වැඩසටහන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වනු ලබන ප්‍රධාන වැඩසටහන්වලට අමතරව විවිධ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් කොමිෂන් සභාව විසින් පහත සඳහන් වැඩසටහන් වලට සහභාගී විය.

- අ. පො. ස. (උ. පෙළ) ළමුන් හා ගුරුවරුන් වෙනුවෙන් මැයි මාසයේදී කොළඹ 12, හමීඩ්-අල් හුසේනියා ජාතික පාසලේ සහ ජුනි මාසයේදී කඩවත විද්‍යාලෝක විද්‍යාලයේදී දැනුවත්කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
- "ආයෝජකයන්ගේ දිනය" වෙනුවෙන් සබරගමුව විශ්ව විද්‍යාලය සංවිධානය කරන ලද ප්‍රදර්ශනයට ජනවාරි මාසයේදී සහභාගී විය.
- කොළොන්නාව, සාලමුල්ල "ලක්සඳ" නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන්ට දැනුවත්කිරීමේ වැඩසටහනක් මාර්තු මාසයේදී පවත්වන ලදී.



පාසැල් වැඩසටහනක්

### විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීම

දැනුම බෙදාහැරීම මගින් මාධ්‍යයට සාමාන්‍ය මහජනතාව ශක්තිමත් කිරීමේ හැකියාවක් ඇත. ඒ අනුව සමාලෝචිත වසර තුළ රූපවාහිනී වැඩසටහන් දෙකක් හා ගුවන්විදුලි වැඩසටහන් දෙකක් කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. රක්ෂණයට අදාළ පහත සඳහන් දැනුවත්කිරීමේ වැඩසටහන්වලට කොමිෂන් සභාවේ නිලධාරීන් සහභාගී වී ඇත:

### රූපවාහිනී වැඩසටහන්

- ස්වාධීන රූපවාහිනී සේවයේ ප්‍රධාන පුවත් ඔස්සේ සිංහල මාධ්‍යයෙන් විකාශනය කරන ලද ප්‍රවෘත්තිමය වැඩසටහන.
- ශ්‍රී ලංකා රූපවාහිනී සේවයේ 'Eye' නාලිකාවේ 'Business Today' වැඩසටහන මගින් පටිගත කොට විකාශනය කරන ලද සාකච්ඡාව.

### ගුවන්විදුලි වැඩසටහන්

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 'City FM' නාලිකාව ඔස්සේ ප්‍රචාරය කරන ලද "සුභාරතී" සජීවී සාකච්ඡාමය වැඩසටහන.
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 'City FM' නාලිකාව ඔස්සේ "පැයෙන් පැය පුවත්" විකාශයෙන් පසුව ප්‍රචාරය වූ පටිගත කරන ලද කෙටි පණිවිඩ

### මුද්‍රිත මාධ්‍ය හරහා දැනුවත් කිරීම

සමාලෝචිත කාලය තුළ කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන පුවත්පත් නිවේදන හා පුවත්පත් දැන්වීම් ප්‍රකාශයට පත්කරන ලදී:


### පුවත්පත් නිවේදන

- 2017 වසර තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය
- 2018 වසරේ පළමුවන කාර්තුව තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය
- 2018 වසරේ පළමු අර්ධ වාර්ෂික කාලසීමාව තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය
- 2018 වසරේ තෙවන කාර්තුව තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

- නව සභාපතිවරයාගේ පත්වීම
- කොමිෂන් සභාවට නව සාමාජිකවරුන්ගේ පත්වීම

## පුවත්පත් දැන්වීම්

- "මහජනතාව වෙත කෙරෙන විශේෂ දැන්වීමයි" යන ශීර්ෂය යටතේ ලියාපදිංචි රක්ෂණ සමාගම් හා තැරැව්කාර සමාගම් පිළිබඳ වූ වාර්ෂික දැන්වීම.
- රක්ෂණ උපදේශකයින් සහ ඔවුන්ගේ භූමිකාව පිළිබඳව ඔබ දැනුවත් ද?




## අනෙකුත් ප්‍රකාශන

දැනට භාවිතා කරන "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව" "රක්ෂණ ඔප්පුහිමියෙකුගේ යුතුකම් හා අයිතිවාසිකම්" හා "සෞඛ්‍යය රක්ෂණය" යන මාතෘකා යටතේ අත්පත්‍රිකා සහ "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් පණිවිඩයක්" "රක්ෂණ ඔප්පුවක් මිළදී ගැනීමේදී සිහි තබා ගත යුතු කරුණු" යන මාතෘකාව යටතේ පෝස්ටරය නැවත මුද්‍රණය කර ප්‍රධාන වශයෙන් දැනුවත්කිරීමේ වැඩසටහන් වලදී සමාලෝචිත වසර තුළදී බෙදාහරින ලදී. තවද "ආයෝජන සම්බන්ධිත රක්ෂණ ඔප්පු" යනුවෙන් නව අත්පත්‍රිකාවක් මුද්‍රණය කර දැනුවත්කිරීමේ වැඩසටහන් වලදී බෙදාහරින ලදී.

## ජාතික රක්ෂණ දිනය

ජාතික රක්ෂණ දිනය ලෙස සැප්තැම්බර් මස 01 වන දිනය සහ රක්ෂණය පිළිබඳව දැනුවත්කිරීමේ මාසය ලෙස සැප්තැම්බර් මාසය සැමරීම පිණිස කොමිෂන් සභාව "රක්ෂණයේ වැදගත්කම" පිළිබඳව දැනුවත්කිරීමේ අරමුණින් ක්‍රියාකාරකම් කීපයක් සංවිධානය කරන ලදී.

### 1) රූපවාහිනී වැඩසටහන්

- ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ විකාශනය කරන ලද "මල්පාර" සජීවී සාකච්ඡාමය වැඩසටහන.
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඔස්සේ විකාශනය කරන ලද "සංහිඳ" සජීවී වැඩසටහන.

### 2) ගුවන්විදුලි වැඩසටහන්

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ "SLBC News Package Programme" සමග සියලුම නාලිකා වල ප්‍රධාන පුවත් විකාශනයෙන් පසුව ප්‍රචාරය වූ කලින් පටිගත කරන ලද කෙටි පණිවිඩ.
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වෙළඳ සේවය ඔස්සේ ප්‍රචාරය කරන ලද "සාර ප්‍රභාගිර" සජීවී සාකච්ඡාමය වැඩසටහන.

### 3) පුවත් ලිපි

- "ජාතික රක්ෂණ දිනය" වෙනුවෙන් පුවත්පත් ලිපියක් පලවිය.

## ආසියානුසංවර්ධනබැංකුවේ(ADB) ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වැඩසටහන

ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වැඩසටහන වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව ප්‍රතිපත්ති මත පදනම් වූ ණයක් කොටස් 2ක් යටතේ රජයට අනුමත කර ඇත. ආයෝජන හා ඉතිරිකිරීම් අතර කාර්යක්ෂම පැවරීම් හා වැඩිදියුණු කිරීම් ආයෝජක බලය විවිධාංගීකරණය හා වැඩිදියුණු කිරීම මගින් මූල්‍යමය මැදිහත්වීමකදී සහ සම්පත් මෙහෙයවීමකදී ප්‍රාග්ධන වෙළඳපොලේ කාර්ය භාරය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වැඩසටහනට මුදල් ප්‍රතිපාදන සපයා දෙනු ලැබේ. මෙහෙයවන ආයතන (කොමිෂන් සභාව ඇතුලුව) විසින් හඳුනාගන්නා ලද නිශ්චිත ක්‍රියාකාරකම් ඉටුකිරීම මත අරමුදල් ප්‍රතිපාදන නිකුත්කිරීම කරනු ලබයි. ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා අදාල මෙහෙයුම් ආයතන වෙත ආසියානු සංවර්ධන බැංකුව විසින් තාක්ෂණික ආධාර සපයනු ලබයි.

දෙවන කොටස යටතේ කොමිෂන් සභාව විසින් මූල්‍ය සාක්ෂරතාවය ශක්තිමත් කිරීමට සාමාන්‍ය අධ්‍යාපනය සඳහා පූර්ණ උපායමාර්ගයන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කොට ඇත.

උපදේශකවරයා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනික උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අධ්‍යයනය කිරීමේදී උපදේශකවරයාගේ වාර්තාව තවදුරටත් සමාලෝචනය කිරීමට හා යෝජිත ක්‍රියාකාරකම් එකඟ වූ ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් (වැදගත් අවස්ථාවන්) හා අනුකූලවීම සහතික කිරීමට අවශ්‍ය තොරතුරු / පැහැදිලිකිරීම් ලබාගැනීමට (උපදේශකවරයාට) දැනුම්දීමට කොමිෂන් සභාව විසින් උපදෙස් දෙන ලදී. ඊට පිළිතුරු ලෙස ආසියානු සංවර්ධන බැංකුව හා උපදේශකවරයා දේශීය තත්ත්වයන් හා සීමිත සම්පත් සලකා බලා අධ්‍යාපන උපාය මාර්ග ප්‍රතිශෝධන කිරීමට එකඟ වී ඇත.

## අනෙකුත් කටයුතු

### මහජන තොරතුරු විමසීම් වලට පිළිතුරු

සමාලෝචිත වසර තුලදී ජනතාවගෙන්, ඔප්පුහිමියන්ගෙන් සහ අනෙකුත් පාර්ශව වලින් රක්ෂණ කර්මාන්තය පිළිබඳව ඉදිරිපත් වූ තොරතුරු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම හා නිසි මග පෙන්වීම් කරන ලදී.

### Asian Insurance Review සඟරාව සමග සභාපතිතුමා පැවැත්වූ සාකච්ඡාව

කොමිෂන් සභාව විසින් සභාපතිතුමා සමග සාකච්ඡාවක් පැවැත්වීමට පහසුකම් සැලසීම කරන ලද අතර එය 2018 අගෝස්තු මාසයේ මෙම සඟරාව විසින් ප්‍රකාශයට පත්විය.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ රක්ෂණ නියෝජිතවරුන්ගේ පූර්ව අනුයුක්තතා විභාගයේ විෂයමාලා අත්පොත සමාලෝචනය කිරීම

දැනට භාවිතා කරන විෂයමාලා අත්පොත සහ ආදර්ශ විභාග ප්‍රශ්න පත්‍ර පරීක්ෂා කිරීමෙන් පසු තවදුරටත් කළ යුතු වැඩිදියුණු කිරීම් කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇත.

# පරිපාලනමය සමාලෝචනය

## මානව සම්පත්

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන්ම රැඳී තිබෙන්නේ එහි ක්‍රියාකාරිත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. කොමිෂන් සභාවේ සාර්ථක උපක්‍රමවල කශේරුව (කොඳුනාරටිය) වන්නේ අපගේ මානව සම්පත් බැවි අප විශ්වාස කරන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, රක්ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයෙන් කරගෙන යනු ලබන බවට වගබලා ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූලික කාර්යයන් හඳුනා ගනිමින් කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය සකස් කර ඇත.

අපේක්ෂිත වෘත්තිකයින් නිසි කලට බඳවා ගැනීම තුලින් මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර මේ වසර තුළදී කොමිෂන් සභාව විසින් ගන්නා ලදි. මෙම පියවර සාක්ෂාත් කර ගැනීම උදෙසා සමාලෝචිත වසර තුළ දී එක් අධ්‍යක්ෂකවරයෙක් සහ විධායක නිලධාරීන් 5 ක් ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදි. 2018 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලය 45 ක් විය.

කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

## පුහුණු කිරීම්

ආයතනික අරමුණු සහ කාර්යසාධනය වර්ධනය කර ගැනීම උදෙසා දැනුම සහ වෘත්තීයමය නිපුණතාවන් කෙරෙහි යොමුවීම ප්‍රධාන වේ. සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම උදෙසා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථාවන් ඔවුන් වෙත පහත වගුවේ දැක්වෙන පරිදි ලබා දෙන ලදී.

| වර්ගය | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| දේශීය පුහුණු | 1,264,144/- | 1,297,577/- |
| විදේශීය පුහුණු | 10,589,034/- | 4,741,449/- |

## කාර්ය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් කොමිෂන් සභාව විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත්ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තව ද, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සබැඳියාවන් වර්ධනය කිරීම උදෙසා නේවාසික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. සුභසාධන කටයුතු වර්ධනය කිරීම උදෙසා සුභසාධක සංගමයක් සමාලෝචිත වසර තුල පිහිටුවන ලදී. වාර්ෂික සුහද හමුව සුභසාධක සංගමය මගින් සංවිධානය කරන ලදී.

| නිලධාරීන් සංඛ්‍යාව | අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධිය ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය | ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| 45 | 09 | 03 | 06 | 04 | 09 | 03 |

# මූල්‍ය සමාලෝචනය

## රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (PPF)


රක්‍ෂණ පනතේ නියමයන්ට අනුව රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් එකතුවන මුදලින් (සෙස්), නියම කොට ඇති කටයුතු සඳහා ක්ෂණිකව යොදවන්නට අවශ්‍ය නොවන මුදල් විචක්ෂණ ලෙස උපරිම ප්‍රතිලාභ ලැබෙන අන්දමින් මෙම වසර තුළ දී ද කොමිෂන් සභාව විසින් ආයෝජනය කරන ලද අතර 1 වැනි රූපසටහනෙන් එම සෙස් බදු ආදායමත් ආයෝජන ආදායමත් විදහා දක්වයි.

වාසිදායක වෙළඳපල තත්වයන්ගේ බලපෑම හේතුවෙන් ආයෝජන ආදයමේ කැපී පෙනෙන වර්ධනයක් 2016 වසරට සාපේක්ෂව 2018 වසරේදි දැකිය හැක.

රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම පසුගිය වසර පහ තුළ වර්ධනය වී ඇති අන්දම 2 වැනි රූපසටහන මගින් පෙන්නුම් කරයි.


2018 දෙසැම්බර් 31 වැනි දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය පහත දක්වා ඇත. (රූප සටහන 03)

**රූප සටහන 1**
**2014-2018 කාලපරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම සහ ආයෝජන ආදායම**





| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| සෙස් ආදායම (රු. මිලියන) | 274 | 322 | 408 | 418 | 479 |
| ආයෝජන ආදායම (රු. මිලියන) | 158 | 145 | 229 | 372 | 455 |

**රූප සටහන 2**
**2014 - 2018 කාලපරිච්ඡේදය සඳහා රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය**




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 2,183 | 2,643 | 3,292 | 4,110 | 5,043 |

**රූප සටහන 3**
**2018 දෙසැම්බර් 31 වැනි දිනට රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය**



### කොමිෂන් සභාවේ ආදායම

කොමිෂන් සභාවේ සමස්ථ ආදායම ජනනය වන්නේ පහත දැක්වෙන ප්‍රභවයන්ගෙනි:

- රක්ෂකයින් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචිය සඳහා අයකරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තු
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් වලින් අය කරන ගාස්තු
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම

2014 සිට 2018 දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ සමස්ත ආදායම බෙදී ඇති ආකාරය 4 වැනි රූපසටහන මගින් දැක් වේ.


### කොමිෂන් සභාවේ වියදම

2017 වසරට සාපේක්ෂව 2018 වසරේදී වියදමේ 14.4% වර්ධනයක් දක්නට ලැබේ.

කොමිෂන් සභාවේ ආසන්න වශයෙන් රු මිලියන 41.3 ක අතිරික්තයක් 2018 වසරේදී වාර්තාකර ඇත. පනතේ විධි විධානවලට අනුකූලව අදායම හා වියදම අතර හිගය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂක අරමුදලින් පෙර වර්ෂවලදී පියවාගෙන ඇති බැවින්, ඉහත අතිරික්තය ආරක්ෂණ අරමුදලට බැර කිරීමට ඇත.


2014 සිට 2018 කාලපර්ච්ඡේදය දක්වා කොමිෂන් සභාවේ සමස්ථ වියදම 5 වන රූපසටහනෙන් දැක්වේ.

**රූප සටහන 4**
**2014 සිට 2018 දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ ආදායම**




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| වාර්ෂික ගාස්තු (රු. මිලි) | 73 | 104 | 126 | 142 | 168 |
| ලියාපදිංචි හා ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු (රු. මිලි) | 4 | 9 | 5 | 9 | 8 |
| වෙනත් ආදායම් (රු. මිලි) | 2 | 2 | 3 | 3 | 3 |
| ප්‍රදාන හඳුනා ගැනීම් (රු. මිලි) | 4 | 5 | 2 | 1 | 2 |
| මුළු ආදායම් (රු. මිලි) | 83 | 119 | 136 | 155 | 181 |

**රූප සටහන 5**
**2014 සිට 2018 කාලපරිච්ඡේදය තුල කොමිෂන් සභාවේ සමස්ථ වියදම**




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| මුළු වියදම (රු. මිලියන) | 107 | 123 | 124 | 125 | 143 |



# මූල්‍ය තොරතුරු

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**2018 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 2018<br>රු. | 2017<br>නැවත ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 1 | 15,689,425 | 7,324,758 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - කුළී සහ විද්‍යුත් තැන්පතු හා භාණ්ඩාගාර බැඳුම්කර | 2 | 1,086,252,949 | 1,086,252,949 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 3 | 522,620 | 347,299 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන හා වෙනත් | 2 | 3,956,513,320 | 3,023,706,256 |
| අනෙකුත් ජංගම වත්කම් | 4 | 16,007,020 | 12,194,049 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | 70,700,000 | 42,000,000 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 5 | 2,711,448 | 5,796,222 |
| **මුළු වත්කම්** | | 5,148,396,782 | 4,177,621,532 |
| **සංචිත හා වගකීම්** | | | |
| සංචිත හා අරමුදල් | | | |
| සමුච්චිත අරමුදල් | 16 | 41,337,937 | - |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 6 | 5,042,765,873 | 4,109,959,205 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 17,689,652 | 7,389,652 |
| මුළු සංචිත හා අරමුදල් | | 5,101,793,462 | 4,117,348,857 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදාන | 7 | 5,389,425 | 5,718,532 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 8 | 12,155,897 | 10,902,547 |
| | | 17,545,322 | 16,621,079 |
| **ජංගම වගකීම්** | | | |
| ලද අත්තිකාරම් | | 14,161,815 | 7,358,099 |
| අනෙකුත් ජංගම වගකීම් | 9 | 14,896,183 | 36,293,496 |
| | | 29,057,998 | 43,651,596 |
| **මුළු සංචිත හා වගකීම්** | | 5,148,396,782 | 4,177,621,532 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයින් වෙත පැවරේ.
ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිටු අංක 81 සිට 89 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් සමඟ සංයෝජිතව කියවිය යුතු වේ.

**මනෝ තිත්තවැල්ල**
සභාපති

**වයි. කනගසබේ**
කොමිෂන් සාමාජික

**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජනරාල්

**සතීෂ් කුමාර්**
අධ්‍යක්ෂක මූල්‍ය හා පරිපාලන

කොළඹ, ශ්‍රී ලංකාව
2019 පෙබරවාරි 26

# මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය

**2018 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 31.12.2018 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. | 31.12.2017 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අයභාරය | 10 | 176,168,849 | 150,783,219 |
| ප්‍රදාන හඳුනා ගැනීම් | 7 | 1,929,052 | 1,455,019 |
| පොලී ආදායම | | 7,439,303 | 4,486,296 |
| වෙනත් ආදායම් | 11 | 277,233 | 302,826 |
| **මුළු ආදායම** | | 185,814,437 | 157,027,360 |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 12 | (79,009,564) | (69,941,211) |
| වෘත්තීය ගාස්තු | 13 | (5,035,081) | (2,000,000) |
| මෙහෙයුම් වියදම් | 14 | (58,453,496) | (53,212,244) |
| මූල්‍ය සහ අනෙකුත් | 15 | (155,451) | (114,876) |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරුකිරීම් | 6 | - | (31,220,674) |
| **මුළු වියදම්** | | (142,653,592) | (156,489,005) |
| බදුවලට පෙර ශුද්ධ අතිරික්තය (ඌණතාවය) | | 43,160,845 | 538,355 |
| බදු | | (1,822,908) | (538,355) |
| බදුවලට පසු ශුද්ධ අතිරික්තය (ඌණතාවය) | | 41,337,937 | - |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | 41,337,937 | - |

පිටු අංක 81 සිට 89 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශනය

**2018 දෙසැම්බර් 31 දිනට**

| | ප්‍රත්‍යාගනිත සංචිත | සමුච්චිත අතිරික්ත/ (ඌනතාවය) | එකතුව |
|---|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 7,389,652 | - | 7,389,652 |
| ශුද්ධ වත්කම් වල වෙනස්වීම | | | |
| වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය | 10,300,000 | - | 10,300,000 |
| වර්ෂයේ අතිරික්තය | - | 41,337,937 | 41,337,937 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 17,689,652 | 41,337,937 | 59,027,589 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන් | 2018<br>රු. | 2017<br>නැවත ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | 16 | 41,337,937 | - |
| ක්ෂය සඳහා ගැලපීම් | | 3,535,279 | 3,955,019 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | | 2,014,024 | 1,893,706 |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් අලාභය | | - | (41,449) |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ගෙවීම් | | (760,674) | (833,784) |
| ප්‍රදාන හඳුනාගැනීම | | (1,929,052) | (1,455,019) |
| ආදායම් බදු | | 1,822,908 | 538,355 |
| පොලී ආදායම | | (7,439,303) | (4,486,296) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 38,581,119 | (429,467) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| තොගවල (වැඩිවීම) / අඩුවීම | | (175,322) | 45,735 |
| ලැබිය යුතු දෑ වල (වැඩිවීම) / අඩුවීම | | (4,482,480) | 1,289,668 |
| අත්තිකාරම් ලැබීම් වල (වැඩිවීම) / අඩුවීම | | 6,803,715 | (880,694) |
| ණය හිමියන් සහ උපචිතයන්හි (වැඩිවීම) / අඩුවීම | | (21,397,313) | 15,852,619 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහය | | (19,251,399) | 16,307,328 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය | | 19,329,720 | 15,877,861 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබු/(ක්‍රියාකාරකම් සඳහා යෙදු) මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්පත් වල ආයෝජනය | | (28,700,000) | (19,300,000) |
| පොලී ආදායම | | 6,285,506 | 3,969,678 |
| දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | - | 41,449 |
| දේපල පිරියත සහ උපකරණ මිලට ගැනීම් | | (1,599,945) | (3,650,319) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (24,014,439) | (18,939,191) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලැබු මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරුකිරීම් | | 1,599,945 | 3,650,319 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 1,599,945 | 3,650,319 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | (3,084,774) | 588,988 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 5,796,222 | 5,207,234 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 2,711,448 | 5,796,222 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 5 & 17 | 2,711,448 | 5,796,222 |

පිටු අංක 81 සිට 89 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල
# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වර්ධනය | | 932,807,064 | 818,093,839 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 932,807,064 | 818,093,839 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම** | | | |
| රජයේ සුරැකුම්පත් වලින් ලැබිය යුතු පොලියෙහි වැඩිවීම / (අඩුවීම) | | (53,659,167) | (68,356,404) |
| ලැබිය යුතු සෙස් බදුවල වැඩිවීම / (අඩුවීම) | | (2,372,466) | (15,572,411) |
| අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය වැඩිවීම / (අඩුවීම) | | - | 5,165,931 |
| සෙස් අරමුදලින් මාරු කළ යුතු අරමුදල්හි වැඩිවීම / (අඩුවීම) | | 29,810,751 | (16,376,099) |
| | | (26,220,882) | (95,138,983) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 906,586,182 | 722,954,856 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්හි ආයෝජනය | | - | 1,049,400,000 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | (906,097,000) | (1,772,300,000) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද/(යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (906,097,000) | (722,900) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම) | | 489,182 | 54,856 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 558,124 | 503,267 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,047,306 | 558,124 |
| බැංකුවේ ඇති මුදල් | 2 & 17 | 1,047,306 | 558,124 |

පිටු අංක 81 සිට 89 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත සකස් කර ඇති අතර ඒවා ඉදිරිපත් කිරීමේ දී අගයන් ආසන්නම ශ්‍රී ලංකා රුපියලට දක්වා ඇත.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේ දැක්වෙන සටහන් මගින් අනාවරණය කර ඇත.

### 1.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇති අතර, එම මූල්‍ය ප්‍රකාශන එම ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය දක්වනු ලැබේ.

### 1.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තහවුරු කර ඇත. රක්ෂණ නියාමන කොමිෂන් සභාව චිරස්ථායී අනාගතයක් උදෙසා අඛණ්ඩව මෙහෙයුම් පවත්වාගෙන යන බවටත්, එහි ව්‍යවස්ථාපිත වගකීම් සපුරාලන බවටත් කොමිෂන් සභාවේ සාමාජිකයන් හට සාධාරණ තක්සේරුවක් ඇත.

අනාගත සියලුම තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඈවර කිරීමේ හෝ එහි මෙහෙයුම් නවතාලීමේ අවශ්‍යතාවයක් හඳුනාගෙන නොමැත.

ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන ඇත.

### 1.4 වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සිදුවීම්

වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ දී සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

### 1.5 සංසන්දනාත්මක සංඛ්‍යාවන්

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුකූල විය යුතු ආකාරයට පෙර වර්ෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත.

### 1.6 බදුකරණය

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි ප්‍රතිපාදනයන් හා අනුකූලව ගණනය කර ඇත.

### 1.7 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවැති විනිමය අනුපාතිකයන් පාදකව, වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත.

## 2. වත්කම් සහ අගය කිරීමේ පදනම

### 2.1 දේපල, පිරියත හා උපකරණ ස්වසන්තක අයිතිය සහිත දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන්/ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ, අත්පත් කර ගැනීමේ පිරිවැය සමඟ එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

2018 සිට මෝටර් වාහන තෙවසරකට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

### ක්ෂය

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ.

| | වාර්ෂික (%) |
|---|---|
| මෝටර් වාහන | 25 |
| ලී බඩු, වැද්දුම් සහ සවි කිරීම් | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම් | 25 |
| පුහුණු උපකරණ | 25 |

ක්ෂය ප්‍රතිපාදන එම වත්කම් මිල දී ගත් දින සිට කරනු ලැබේ. ක්ෂය ප්‍රතිපාදනය වත්කම භාවිතයෙන් ඉවත් කරන තෙක් කරනු ලැබේ. වත්කම් විකුණුම් ලාභ/අලාභ වත්කම් විකුණුම් මුදල එකී වත්කමේ ලියා අඩුකල අගය සමඟ සංසන්දනය කිරීමෙන් නිශ්චය කෙරේ.

### 2.2 ආයෝජන

රජයේ සුරැකුම්පත්හි සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්හි කර ඇති ආයෝජන අගය කර ඇත්තේ ඒවායේ පිරිවැයට හෝ මුහුණත් අගය යන 2න් අඩු අගයට වන අතර, ඒවා සඳහා වර්ෂය අවසානය තෙක් පොලී උපචිත පදනම මත ගිණුම් ගත කර ඇත.

### 2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

### 2.4 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නිරූපණය කර ඇත්තේ, ඇස්තමේන්තුගත උපලබ්ධි අගයටයි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවලින් නියෝජනය වන්නේ බැංකුවේ මුදල් සහ අතැති මුදල්ය.

### 3. බැරකම් සහ ප්‍රතිපාදන

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

### 3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවකයන් සඳහා සේවක පාරිතෝෂිකය ප්‍රථම සේවා වර්ෂයේ සිට සම්පූර්ණ ප්‍රතිපාදනය කෙරෙන ආකාරයට ගිණුම් ගත කර ඇත.

කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත හා අනුකූලව ගෙවීම් පිළිබඳව වගකීම ඇති වන්නේ වර්ෂ 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද්දේ නම් පමණි.

වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ සියලුම සේවකයන් සඳහා මූල්‍ය වර්ෂය අවසානයේ දී අවසන් වරට ගන්නා ලද වැටුප මත පදනම්ව මාසික වැටුපෙන් අඩකට සමාන මුදලක් ප්‍රතිපාදනය කරනු ලැබේ.

### 3.1.2 නිශ්චිත සහභාග සැලසුම් - සේ.අ.අ. සහ සේ.නි.භා.අ.

නිශ්චිත ව්‍යවස්ථාවන් සහ නියාමන හා අනුකූලව කොමිෂන් සභාවේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට සහ සේවක භාරකාර අරමුදලට දායකවීමට සුදුසුකම් ලබති. කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙළින් 12% ක සහ 3% ක මුදලක් දායක කරයි.

### 3.2 බැරකම්

බැරකම් අතරින් වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළවිටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත. වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයකින් ඔබ්බට ගෙවිය යුතු සියළුම ගෙවීම් ජංගම නොවන බැරකම් ගණයට ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළුම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

### 3.3 ප්‍රදාන

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනා ගනු ලැබේ.

### 4. ආදායම් සහ වියදම්

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

### 4.2 වියදම් හඳුනා ගැනීම

කොමිෂන් සභාව පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියාහරිනු ලැබේ.

### 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1 දේපළ පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | ලී බඩු, වැද්දුම් හා සවිකිරීම් | කාර්යාල උපකරණ (විද්‍යුත් දත්ත සැකසුම් සහ වෙනත්) | පුහුණු උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | |
| 2018 ජනවාරි 01 දිනට ශේෂය | 10,000,000 | 14,152,432 | 25,035,591 | 141,450 | 49,329,474 |
| එකතු කිරීම් | - | - | 1,599,945 | - | 1,599,945 |
| බැහැර කිරීම් | - | - | - | - | - |
| ප්‍රත්‍යාගණන බලපෑම | 300,000 | | | | 300,000 |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | 10,300,000 | 14,152,432 | 26,635,537 | 141,450 | 51,229,419 |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2018 ජනවාරි 01 දිනට ශේෂය | 8,393,773 | 12,304,194 | 21,165,298 | 141,450 | 42,004,716 |
| වර්ෂය සඳහා අය කිරීම් | 1,606,227 | 371,687 | 1,557,365 | - | 3,535,279 |
| බැහැර කිරීම් | - | - | - | - | - |
| ප්‍රත්‍යාගණන බලපෑම | (10,000,000) | | | | (10,000,000) |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 12,675,881 | 22,722,663 | 141,450 | 35,539,995 |
| **ලියා අඩු කළ අගය** | | | | | |
| **2018 දෙසැම්බර් 31 දිනට** | 10,300,000 | 1,476,550 | 3,912,875 | - | 15,689,425 |
| ලියා අඩු කළ අගය | | | | | |
| 2018 දෙසැම්බර් 31 දිනට | 1,606,227 | 1,848,237 | 3,870,294 | - | 7,324,758 |

* සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් පහත පරිදි වේ.
** මෝටර් වාහන රු. 10,300,000 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර ඇත.

| | රු. |
|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | 4,632,587 |
| ලී බඩු සහ සවිකිරීම් | 6,279,005 |
| කාර්යාල උපකරණ - විද්‍යුත් දත්ත සැකසුම් | 17,377,553 |
| කාර්යාල උපකරණ - වෙනත් | 2,470,883 |
| පුහුණු උපකරණ | 141,450 |
| | 36,332,454 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2018 රු. | 2017 නැවත ප්‍රකාශිත රු. |
|---|---|---|---|
| **2 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ අනෙකුත් ජංගම නොවන වත්කම්** | | | |
| කුළී සහ විද්‍යුත් තැන්පතු | | 9,593,949 | 9,593,949 |
| භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජන | | 1,076,659,000 | 1,076,659,000 |
| | | 1,086,252,949 | 1,086,252,949 |
| **ජංගම වත්කම්** | | | |
| ස්ථාවර වත්කම්වල ආයෝජන | | 3,600,397,000 | 2,694,300,000 |
| රජයේ සුරැකුම්පත් හා ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොලිය | | 227,256,770 | 173,597,603 |
| ලැබිය යුතු සෙස් බදු | | 129,409,689 | 127,037,223 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය | 17 | 47,306 | - |
| බැංකුවේ ඇති ශේෂය | 17 | 1,000,000 | 558,124 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කළ යුතු අගය | | (1,597,445) | 28,213,306 |
| | | 3,956,513,320 | 3,023,706,256 |
| අඩු කළා | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු විය යුතු අගය | | - | - |
| | | 3,956,513,320 | 3,023,706,256 |
| මුළු වත්කම් | | 5,042,766,269 | 4,109,959,205 |
| **3 භාණ්ඩ තොග** | | | |
| මුද්‍රණ ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග | | 455,105 | 331,359 |
| මුද්දර | | 67,515 | 15,940 |
| | | 522,620 | 347,299 |
| **4 අනෙකුත් ජංගම වත්කම්** | | | |
| තැන්පතු | | 212,237 | 202,895 |
| ඉතිරි කිරීම් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | 500 | 500 |
| වෙනත් ලැබිය යුතු දෑ | | 820,886 | 79,420 |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | | 1,551,524 | 1,934,725 |
| එකතු කල අගය මත බදු පාලන ගිණුම | | 1,874,969 | 1,735,599 |
| පොලී ලැබීම් - භාණ්ඩාගාර බිල්පත් | | 1,076,391 | 211,727 |
| සේවක ණය | | 5,005,967 | 5,769,159 |
| අත්තිකාම් සහ පෙර ගෙවීම් | | 1,778,025 | 1,965,955 |
| ආර්ථික සේවා ගාස්තු | | - | 279,070 |
| සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් ලැබිය යුතු අගය | | - | 15,000 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු විය යුතු අගය | | 1,597,445 | - |
| අත්පත් කර ගැනීම් සඳහා ප්‍රතිපාදන | | 2,089,077 | - |
| | | 16,007,020 | 12,194,049 |
| *කාර්යය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය | | | |
| ජනවාරි 1 දිනට ශේෂය | | 5,769,159 | 5,769,159 |
| වර්ෂය තුළ දී ප්‍රදානය කළ ණය | | 3,236,700 | 3,319,000 |
| | | 9,005,859 | 9,088,159 |
| වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම් | | (3,999,892) | (3,314,383) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | 5,005,967 | 5,769,159 |
| **5 මුදල් සහ මුදල් හා සමාන දෑ** | | | |
| බැංකුවේ ඇති මුදල් | | | |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය | 17 | 4,248,455 | 9,373,734 |
| ලංකා බැංකුව - ලෙජරයට අනුව | 17 | (1,537,007) | (3,577,513) |
| අතැති මුදල් | | 2,711,448 | 5,796,222 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2018 රු. | 2017 නැවත ප්‍රකාශිත රු. |
|---|---|---|---|
| 6 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | | | |
| ආරම්භක ශේෂය | | 4,109,959,205 | 3,291,865,366 |
| වර්ෂය තුළදී ලද සෙස් බදු | | 479,088,491 | 418,234,960 |
| ප්‍රති මිල දී ගැනීම් සහ ඉල්ලුම් ගිණුම් මත පොළී | | 36,710 | 28,364,495 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත පොළී | | 95,120,708 | 95,120,708 |
| ස්ථාවර තැන්පතු මත පොළී | | 359,754,785 | 248,496,708 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය මත පොළිය | | 419,017 | 331,799 |
| කොමිෂන් සභාවේ ශුද්ධ අතිරික්තය | | - | 31,220,674 |
| | | 5,044,378,915 | 4,113,634,709 |
| අඩු කළා: | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | | 1,599,945 | 3,650,319 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම් | | 1,599,945 | 3,650,319 |
| බැංකු ගාස්තු | | 13,097 | 25,186 |
| | | 1,613,042 | 3,675,505 |
| අවසාන ශේෂය | | 5,042,765,873 | 4,109,959,205 |
| 7 ප්‍රදාන | | | |
| වසර ආරම්භයේ දී ශේෂය | | 5,718,532 | 3,523,232 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් | | 1,599,945 | 3,650,319 |
| අඩු කළා: වර්ෂය තුළ දී ක්‍රමක්ෂය කිරීම් | | (1,929,052) | (1,455,019) |
| වසර අවසානයේ දී ශේෂය | | 5,389,425 | 5,718,532 |
| සටහන - ප්‍රදාන හඳුනා ගැනීම | | | |
| ප්‍රදානයන්, මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත. | | | |
| මෝටර් රථ වාහන | | 25% | |
| කාර්යාල උපකරණ - වෙනත් සහ වි.ද.සැ. | | 25% | |
| ලී බඩු වැඩ්දුම් සහ සවි කිරීම් | | 12.5% | |
| පුහුණු උපකරණ | | 25% | |
| 8 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | | | |
| වසර ආරම්භයේ දී ශේෂය | | 10,902,547 | 9,842,625 |
| වසර තුළ ප්‍රතිපාදන | | 2,014,024 | 1,893,706 |
| අඩුකළා - වසර තුළ සිදු කරන ලද ගෙවීම් | | (760,674) | (833,784) |
| වසර අවසානයේ ශේෂය | | 12,155,897 | 10,902,547 |
| 9 අනෙකුත් ජංගම වගකීම් | | | |
| උපචිත වියදම් | | 13,188,945 | 6,403,725 |
| සේවක අර්ථසාධක අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | | 710,207 | 694,744 |
| සේවක භාරකාර අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | | 106,532 | 104,212 |
| උපයන විට බදු සඳහා කළ යුතු ගෙවීම් | | 74,014 | 193,832 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂන අරමුදලට මාරුකල යුතු අගය | | - | 28,213,306 |
| වෙනත් | | 816,486 | 683,677 |
| | | 14,896,183 | 36,293,496 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| **10 ආයභාරය** | | |
| රක්ෂණ සමාගම්වලින් වාර්ෂික ගාස්තු | 168,499,107 | 142,174,726 |
| ලියාපදංචි කිරීමේ සහ අළුත් කිරීමේ ගාස්තු | 7,669,742 | 8,608,493 |
| | 176,168,849 | 150,783,219 |
| **11 වෙනත් ආදායම්** | | |
| මෝටර් වාහන ණය මත පොළී | 31,406 | 38,235 |
| ආපදා ණය මත පොළී | 143,164 | 160,369 |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | - | 41,449 |
| වෙනත් ආදායම් | 102,664 | 62,773 |
| | 277,233 | 302,826 |
| **12 කාර්ය මණ්ඩල වියදම** | | |
| කාර්ය මණ්ඩල වැටුප | 41,676,378 | 40,561,287 |
| සේ.අ.අ. 12% | 4,987,246 | 4,867,354 |
| සේ.භා.අ. 3% | 1,246,812 | 1,216,839 |
| සභාපතිනියගේ වියදම් - දීමනා | 129,589 | 1,200,000 |
| සභාපතිනියගේ ඉන්ධන වියදම් | 25,775 | 238,680 |
| අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් ගාස්තු | 530,000 | 630,000 |
| පුහුණුවන නිළධාරි දීමනා | 342,600 | 25,000 |
| අතිකාල | 209,841 | 144,169 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් | 1,970,211 | 1,767,019 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය | 1,117,854 | 1,080,307 |
| ගිනි හා පුද්ගල රක්ෂණය | 239,222 | 254,026 |
| කාර්ය මණ්ඩල සුබසාධන | 1,163,529 | 946,202 |
| කාර්ය මණ්ඩල පුහුණු - දේශීය | 1,264,144 | 1,297,577 |
| විදේශ ගමන් හා පුහුණු - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් හා කාර්ය මණ්ඩලය | 10,589,034 | 4,741,449 |
| කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා | 4,561,556 | 2,093,426 |
| ප්‍රචාරණය - බඳවා ගැනීම් | 249,975 | 536,990 |
| අධ්‍යක්ෂක දුරකථන | 390,112 | 463,119 |
| නිවාඩු දීමනා | 687,638 | 714,347 |
| වාහන මෙහෙයුම් කල්බදු ගාස්තු | 1,455,048 | 970,032 |
| රියදුරු දීමනා | 26,786 | 111,290 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාහන දීමනා | 3,123,699 | 3,243,548 |
| අධ්‍යක්ෂකවරුන්ගේ ඉන්ධන දීමනා | 1,008,482 | 944,764 |
| සේවක පාරිතෝෂික | 2,014,024 | 1,893,706 |
| | 79,009,564 | 69,941,211 |
| **13 වෘත්තීමය ගාස්තු** | | |
| උපදේශක සේවා ගාස්තු | 5,035,081 | 2,000,000 |
| | 5,035,081 | 2,000,000 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| **14 මෙහෙයුම් වියදම්** | | |
| කාර්යාල කුලී | 36,423,747 | 32,175,621 |
| රථ ගාල් කිරීමේ ගාස්තු | 606,000 | 508,670 |
| දුරකථන හා අන්තර්ජාල වියදම් | 1,499,000 | 1,605,633 |
| විදුලිය | 1,503,455 | 1,324,406 |
| කාර්යාල නඩත්තු කිරීම් | 764,913 | 473,899 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 1,650,787 | 2,096,822 |
| මහජන දැනුවත් කිරීම් | 2,402,923 | 3,334,383 |
| සංග්‍රහ වියදම් | 4,000 | 32,515 |
| ගමන් වියදම් - දේශීය | 133,883 | 92,044 |
| කාර්යාල උපකරණ නඩත්තු වි.ද.සැ හා වෙනත් | 1,743,298 | 1,178,671 |
| සාමාජිකත්වය - IAIS | 3,147,964 | 2,784,043 |
| ප්‍රචාරණය - වෙනත් | 105,050 | 85,950 |
| රැස්වීම් ගාස්තු | 336,428 | 559,353 |
| පුවත්පත් හා පුස්තකාල පොත් | 121,387 | 135,959 |
| තැපැල් හා පණිවිඩ ගාස්තු | 242,488 | 990,554 |
| විගණන ගාස්තු - විගණකාධිපති | 485,000 | 227,100 |
| විගණන ගාස්තු - අභ්‍යන්තර | 1,440,000 | - |
| ක්ෂය | 3,535,279 | 3,955,019 |
| නම වෙනස් කිරීම සම්බන්ධ වියදම් | 416,496 | - |
| පොදු වියදම් | 80,855 | 98,343 |
| නීති වියදම් | 98,370 | 12,960 |
| විමර්ශන වියදම් | 26,202 | 4,492 |
| අධීක්ෂණ වියදම් | 1,775 | 2,000 |
| වාහන නඩත්තු | 409,483 | 422,040 |
| වාහන රක්ෂණ | 110,693 | 107,011 |
| වාහන ඉන්ධන වියදම් | 260,688 | 182,727 |
| ප්‍රමාද ගාස්තු හා දඩ මුදල් | 1,754 | - |
| සේප්පු ගාස්තු | - | 3,000 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 901,576 | 819,026 |
| | 58,453,496 | 53,212,244 |
| **15 මූල්‍ය හා වෙනත් වියදම්** | | |
| බැංකු ගාස්තු | 155,451 | 114,876 |
| | 155,451 | 114,876 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

16. **සමුච්චිත අරමුදල**

යෝජිත වැටුප් ව්‍යුහයට අනුව හිඟ වැටුප් හා අදාළ වියදම් ක්‍රියාත්මක කරන තුරු කොමිෂන් සභාවේ ලාභය සමුච්චිත අරමුදලට මාරු කර ඇත.

17. **අරමුදල් කළමණාකරණ ගිණුම්, ලෙජර් ශේෂයන් හා බැංකු ශේෂයන්**

කොමිෂන් සභාවේ ජංගම ගිණුම් 20 සම්බන්ධව අරමුදල් කලමණාකරණ ගිණුම් 2 ක් පවත්වාගෙන යන අතර ජංගම ගිණුමේ ශේෂය රු. 1,000,000/- ඉක්මවන විට එකී ඉක්මවූ අගය අරමුදල් කළමණාකරණ ගිණුමට මාරු කෙරේ. කොමිෂන් සභාව විසින් නිකුත් කරන චෙක් පත් සැම විටම, එසැනින්ම බැංකුවට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන බැවින්, ඉහත අරමුදල් කළමණාකරණ ගිණුම් හා සම්බන්ධිත ගණුදෙනු කොමිෂන් සභාවේ ගිණුම්වලට ඇතුලත් කළ පසු, ලෙජරයේ දැක්වෙන බැංකු ශේෂය සෘණ අගයක් ගත හැක.

2018 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| කොමිෂන් සභාව | - | රු. (1,537,007,05) |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | | රු. 4,248,455.40 |
| එකතුව | | රු. 2,711,448.35 |

18. **බදුකරණය**

බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලවයි.

19. **රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපල ගනුදෙනු වෙනුවෙන් රඳවාගත් බදු සඳහා ලැබෙන නාමික බැර**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 137 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත උපයන පොලී ආදායම අදාළ තක්සේරු වර්ෂයේ 2018 මාර්තු 31 දක්වා වන ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් සේ සලකන අතර එම පොලිය වෙනුවෙන් නාමික බදු බැර සඳහා හිමිකාරත්වය ලැබේ.

ඒ අනුව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනුවලින් කොමිෂන් සභාව විසින් උපයන ලද ශුද්ධ ආදායම දළ ආදායම බවට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නාමික බදු බැර වටිනාකම රුපියල් 72,740,42/- ක් 2018 ජනවාරි 01 සිට 2018 මාර්තු 31 දක්වා 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත කරනු ලැබූ ආයෝජනයන්ගෙන් උපයන ලද පොලී ආදායම ගිණුම්ගත කර හඳුනාගෙන ඇත්තේ ශුද්ධ අගයටය.

20. **ප්‍රාග්ධන බැඳියාව**

2018 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

21. **අසම්භාව්‍ය බැරකම්**

වත්කම් අත්පත් කරගැනීම සඳහා රු. 2,089,077.00 2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව විසින් වෙන් කර ඇත.

යෝජිත වැටුප් ව්‍යුහය ක්‍රියාත්මක වූ පසු ගෙවිය යුතු වැටුප් හා අදාල වියදම් සැලකිල්ලට ගනු ලැබේ.

22. **වාර්තා කරන දිනෙන් පසු හටගත් සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නොමැත.

23. **සම්බන්ධිත පාර්ශව අනාවරණ**

ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය (සභාපතිනිය) 2018 ජනවාරි 01 සිට 2018 පෙබරවාරි 09 දක්වා

මනෝ තිත්තවැල්ල මහතා (සභාපති) 2018 මාර්තු 29 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා

ඒ.ආර්. දේශප්‍රිය මහතා (සභාපති) 2018 නොවැම්බර් 14 සිට 2018 දෙසැම්බර් 31 දක්වා

ඒ.ආර්. දේශප්‍රිය මහතා 2018 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා

ඊ.ඒ.ඩී. පෙරේරා මහතා 2018 මැයි 03 සිට 2018 නොවැම්බර් 30 දක්වා

වයි. කනගසබේ මහතා 2018 මැයි 03 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා

උපුල් දේශප්‍රිය මහතා 2018 මැයි 03 සිට 2018 දෙසැම්බර් 31 දක්වා

එච්.ඒ. කරුණාරත්න මහතා 2018 ඔක්තෝබර් 30 සිට 2018 දෙසැම්බර් 31 දක්වා

සී.ජේ.කේ. පෙරේරා මහතා 2018 නොවැම්බර් 14 සිට 2018 දෙසැම්බර් 31 දක්වා

කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය 2018 නොවැම්බර් 14 සිට 2018 දෙසැම්බර් 31 දක්වා

ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා 2018 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා

සී.ජේ.පී. සිරිවර්ධන මහතා 2018 ජනවාරි 01 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| සාමාජිකයාගේ නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාව |
|---|---|---|
| ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය | කළුබොවිටියාන තේ කම්හල් සමාගම<br>එන් ඩී බී බැංකුව | අධ්‍යක්ෂිකා<br>අධ්‍යක්ෂිකා |
| මනෝ තිත්තවැල්ල මහතා | ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම<br>ශ්‍රී ලංකන් කේටරින් සමාගම<br>ඒ.වයි.එල්. වෙන්චර්ස් පුද්. සමාගම<br>ඒ.වයි.එල්. සබ්ස් පුද්. සමාගම<br>ඇපෙක්ස් කන්සල්ටන්සි සර්විසස් පුද්. සමාගම<br>ක්ලින්ච් පුද්. සමාගම<br>රිසෝස් ඒෂියා නෙට්වර්ක් පුද්. සමාගම | අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක |
| ටී.ඒ.ඩී. පෙරේරා මහතා | කාර්ගිල්ස් පී.එල්.සී<br>සී.ටී. ප්‍රොපටීස්<br>සිලෝන් තියෙටර්ස්<br>රාගම ප්‍රොපටීස් | අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>සභාපති |
| උපුල් දේශප්‍රිය මහතා | - | - |
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය<br>ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සාමාජික ( 2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා )<br>සාමාජික ( 2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ) |
| වයි. කනගසබේ මහතා | සිලෝන් ටොබැකෝ පී.එල්.සී.<br>යූනියන් බැංකු පී.එල්.සී.<br>හන්ටර්ස් පී.එල්.සී.<br>යූ.බී. ෆයිනෑන්ස් සමාගම<br>ලංකා කැනරීස් සමාගම<br>මිලේනියම් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි පුද්.සමාගම | විගණන කමිටු සභාපති<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක |
| එච්.ඒ. කරුණාරත්න මහතා | කොළඹ ඩොක්යාර්ඩ් පී.එල්.සී.<br>ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය<br>සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | අධ්‍යක්ෂක ( 2018 ඔක්තෝබර් 31 සිට දෙසැම්බර් 31 දක්වා )<br>සභාපති ( 2018 ඔක්තෝබර් 31 සිට දෙසැම්බර් 31 දක්වා )<br>කොමිෂන් සාමාජික |
| ඒ.ආර්. දේශප්‍රිය මහතා | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව<br>අර්ථසාධක අරමුදල් මණ්ඩලය<br>ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. | මණ්ඩල අධ්‍යක්ෂක<br>මණ්ඩල අධ්‍යක්ෂක<br>මණ්ඩල අධ්‍යක්ෂක ( 2017 ඔක්තෝබර් 03 සිට 2018 ජූනි 19 දක්වා ) |
| සී.ජේ.කේ. පෙරේරා මහතා | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>සිවිල් ගුවන් සේවා අධිකාරිය | කවුන්සිල් සාමාජික<br>මණ්ඩල සාමාජික |
| සී.ජේ.පී. සිරිවර්ධන මහතා | කොළඹ ඩොක්යාර්ඩ් පී.එල්.සී.<br>ණය තොරතුරු කාර්යංශය<br>සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | අධ්‍යක්ෂක<br>සභාපති<br>කොමසාරිස් |
| කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය | ලංකාපුත්‍ර සංවර්ධන බැංකු සමාගම | අධ්‍යක්ෂක |

වෙළඳපොළ වටිනාකම් මත සිදු කරන ලද සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මත සිදු කල ගනුදෙනු හැර උක්ත ආයතන සමඟ සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. TRE/C/IRCSL/2018/FA/07 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019 ජූලි 12 දින |

සභාපති,

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව.

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූල නොවීම.**

**(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01;**

- ඉහත ප්‍රමිතියෙහි 48 ඡේදය ප්‍රකාරව, ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් වියදම් හිලව් නොකළ යුතු වුවද රු. 1,537,007 ක් වූ මුදල් පොතෙහි අවාසිදායක ශේෂය, මුදල් හා ඒ හා සමාන වටිනාකමට එරෙහිව කපා හැර තිබුණි.
- 53 ඡේදය ප්‍රකාරව, ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. මඟින් වෙනස් ලෙස අවශ්‍ය කෙරේ නම් හෝ අවසර දී ඇත්නම් හැර මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය කාලපරිච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතු වුවද ආයතනය විසින් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය සංසන්දනාත්මක තොරතුරු ඇතුළත් කරමින් ඉදිරිපත් කර නොතිබුණි.
- ඉහත සඳහන් ප්‍රමිතියෙහි 128 ඡේදය ප්‍රකාරව, මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුහුණතෙහි එක් එක් අයිතමයට අදාලව සටහන්වල ඇති සම්බන්ධිත තොරතුරුවලට හරස් යොමු දැක්විය යුතු වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයෙහි හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සඳහන් රජයේ සුරකුම්පත්වල ආයෝජනයන්, ස්ථාවර තැන්පතු, අත්තිකාරම් ලැබීම්, පොලී ආදායම් සහ ආදායම් බදු සම්බන්ධයෙන් සම්බන්ධිත තොරතුරු සඳහා හරස් යොමු දක්වා නොතිබුණි.
- 129 (ඇ) (ii) ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන හෙළිදරව් කිරීම් යටතේ මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවද, ආයතනය විසින් මූල්‍ය අවදානම හා මූල්‍ය අවදානම් කළමනාකරණය පිළිබඳව තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.
- ඉහත ප්‍රමිතියෙහි 137 වගන්තිය ප්‍රකාරව අස්ථිත්වය විසින් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන් කෙරෙහි වඩාත් සැලකිය යුතු ප්‍රතිඵලයක් ඇති කරන ඇස්තමේන්තු හෝ කළමනාකරණය විසින් කරන ලද විනිශ්වයන්, ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයේ හෝ අනෙකුත් සටහන්වල හෙළිදරව් කර නොතිබුණි.

- 150 ඡේදය ප්‍රකාරව, අස්ථිත්වයේ නිත්‍ය පිහිටි තැන් , නෛතික ස්වභාවය සහ එහි ක්‍රියාකාරීත්වය, අස්ථිත්වයේ මෙහෙයුම්වල ස්වභාවය සහ එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක්

## විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සහ අස්ථිත්වයේ මෙහෙයුම් පාලනය කිරීමට අදාළ වන ව්‍යවස්ථාව පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කර නොතිබුණි.

**(ii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ;**

- ඉහත ප්‍රමිතියෙහි 56 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් මුදල් හා මුදල් හා සමාන දෑ වල සංරචක හෙළිදරව් කළ යුතු අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ඇති අයිතමයන්ගේ වටිනාකම් ඊට සමානව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කර ඇති අයිතමයන් සමඟ සැසඳීමක් ඉදිරිපත් කළ යුතු වුවද එලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අයිතමයන් සමඟ සැසඳීමක් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශණයන් කර ඉදිරිපත් කර නොතිබුණි.
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය අදාල ආයෝජන මාර්ගයන් අනුව වෙන් වෙන්ව දැක්විය යුතු වුවත් ස්ථාවර තැන්පත් වල ආයෝජනය තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය හා ප්‍රති මිලදී ගැනුම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුලින් වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.
- මුදල් ප්‍රවාහප්‍රකාශය සකස් කිරීමේදී බදු පෙර ලාභය මත මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කළයුත වූවත් බදු පසු ලාභය මත මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

**(iii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ;**

- ඉහත ප්‍රමිතියෙහි 40 වන ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ හඳුනාගැනීමෙන් පසු ගිණුම්කරණය සඳහා භාවිතා කරනු ලබන ප්‍රතිපත්තිය ආයතනය විසින් හෙළිදරව්වක් කර නොතිබුණි.

- තවද 90 ඡේදය ප්‍රකාරව දේපල හා පිරියත උපකරණ පන්තියක ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට අස්ථිත්වය ප්‍රත්‍යාගණිත අගයන්ට අදාලව හෙළිදරව් කිරීම් කල යුතු වුවත් හෙලිදරව් කර නොතිබුණි.

- ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව නැවත පරීක්ෂා කිරීම සිදුකර ඒ අනුව ඇතිවන ගැලපීම් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුව කල යුතු බව සඳහන් වේ. නමුත් පූර්ණ ලෙස ක්ෂය වී ඇති රු. 36,332,454 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

## විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**(iv) රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 10 -**

හුවමාරු ගණුදෙනු වලින් පැන නගින අයභාර අයභාරය හඳුනාගැනීමේ දී ඉහත ප්‍රමිතියේ 19 ඡේදය ප්‍රකාරව අදාල කොන්දේසි නිසි පරිදි සම්පූර්ණ කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

**(ආ)** ආයතනයට ලැබී තිබුණු එකතුව රු.1,569,187 ක් වටිනා ස්ථාවර වත්කම් 02 ක් අදාල ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත නොකර ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද 2019 වර්ෂයේ දී සභාව විසින් අත්පත්කර ගෙන තිබුණු රු.319,890 ක් වටිනා ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අත්පත් කරගැනීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ඇ)** වායු සමීකරණ පද්ධතිය සඳහා දරන ලද රු.200,000 ක උපදේශන ගාස්තු ප්‍රාග්ධනීත කිරීමකින් තොරව 2018 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**(ඈ)** ආදායම් බදු වියදම රු. 1,822,908 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් වුවද මෙකී බදු වියදම ගණනය කිරීම් විස්තර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

**(ඉ)** මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාරක ප්‍රාග්ධන වෙනසෙහි මුදල් ගලායාම රු. 4,482,480 ක් ලෙස දක්වා තිබුණ ද, එම වටිනාකම ගණනය කිරීමට අදාල විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහවංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාවඅඛණ්ඩවපවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාවඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු

## විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේඅඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේඅභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේඅඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද (අ) (1) (i) හා (අ) (5) (iii) ඡේදයන්හි දැක්වෙන කරුණු හැර නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති රීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|---|
| (i) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 6 (2) (ඇ) වගන්තිය | මණ්ඩලය (වත්මන් කොමිෂන් සභාව) විසින් එහි බලතල,කාර්ය,කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී , ඉටුකිරීමේ දී, කිරීමේ දී මණ්ඩලයට ලැබෙන සියලු මුදල් අරමුදලෙහි අරමුදල් ලෙස හඳුනාගත යුතු වුවද ශේෂ පිරික්සුමෙහි අදායම් ලෙස වර්ගීකරණය කර තිබුණු එකතුව රු.934,419,711 ක් වූ ආදායම් අයිතම 05 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් ලෙස නොදක්වා රක්ෂණ භාර දරන්නන්ගේ ආරක්ෂණ අරමුදල් ගිණුමට එකතු කර තිබුණි. |
| (ii) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 7(2) වගන්තිය | පොලී ආදායම වෙනම ආදායමක් ලෙස ගෙන බදු ගණනය කළ යුතු බව සඳහන් වුවද මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති රු. 462,770,523 ක පොළී ආදායම සඳහා බදු ගණනය කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 371 | ලබා ගන්නා තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිම කළ වහාම නැවත පියවිය යුතු වුවත් 2016, 2017, 2018 වර්ෂයන්හිදී නිකුත් කරන ලද රු. 554,497 ක් වූ අත්තිකාරම් 03 ක් 2019 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි. |

# විගණකාධිපති වාර්තාව



| | | |
|---|---|---|
| (iv) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබා ගත යුතු වුවද, 2019 අප්‍රේල් 30 දින වන විටත් කොමිෂන් සභාව භාවිතා කරනු ලබන අත්පොත සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලැබී නොතිබුණි. එසේ වුවද, අත්තිකාරම් ගෙවීම්, වාහන ණය ලබා දීම් ඇතුළු කටයුතු අනුමැතිය නොලත් පරිපාලන අත්පොත ප්‍රකාරවම සිදු කෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය. |
| (v) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 48(1) වගන්තිය | සෑම රක්ෂණකරුවකු විසින්ම, ඒ ව්‍යාපාරයේ රක්ෂණකරුගේ වත්කම් හා බැරකම් තක්සේරු කිරීමක්ද ඇතුළුව, එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ජීව ගණකයකු ලවා විමර්ශනයක් කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් සාදන ලද රීතිවලට අනුකූලව උද්ධෘතයක් පිළියෙල කිරීමටද මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතුය. එසේ වුවද, කොමිෂන් සභාවේ ජීවගණක තනතුර දිගින් දිගටම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් රක්ෂණකරුවන් විසින් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන ජීවගණක වාර්තා 2016 වර්ෂයේ සිට මේ දක්වා සමාලෝචනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. |
| (vi) | 2003 ජූනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය | (කොමිෂන් සභාවේ අනුමත තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවාගෙන නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස

## විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූල ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**03. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) කොමිෂන් සභාවේ කාර්යාල කටයුතු භාහිර ආයතනයක පවත්වාගෙන යනු ලබන අතර ගොඩනැගිල්ලෙහි කුලිය ලෙස 2018 වර්ෂයේ දී රු. 38,533,202 ක් ගෙවා තිබුණු අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 13 ක වර්ධනයක් බව නිරීක්ෂණය විය.

(ආ) ලියාපදිංචි මූල්‍ය සමාගම් කිහිපයක් ණය විසදීම් (loan disbursement) වලදී අභ්‍යන්තර රක්ෂණ අරමුදලක් පවත්වාගෙන යාම සඳහා ගාස්තු අය කරන බවට 2018 ජූලි 09 දින කොමිෂන් සභාවට ලැබී තිබුණ පැමිණිල්ලක් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට දන්වා තිබුණද මේ පිළිබඳව වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි..

(ඇ) කොමිෂන් සභාවේ ලියාපදිංචි වූ රක්ෂණ සමාගම් 26 ක් පවතින අතර ක්‍රියාකාරි සැලැස්ම අනුව එම සමාගම් වල මාසික වාර්තා, කාර්තු වාර්තා හා වාර්ෂික වාර්තා මණ්ඩල වෙත ලැබීමෙන් පසු මාස 2 ත් – 3 ත් ඇතුළත සමාලෝචනය කළයුතු වුවද ආයතන 04 ක වාර්ෂික වාර්තා සමාලෝචනය කිරීමේදී දින 38 සිට දින 84 දක්වා ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) කොමිෂන් සභාව 2016 වර්ෂයේ ආරම්භයේ සිට රක්ෂණ සමාගම්වල නුබුන්වත් නීති රාමුව වෙනුවට හඳුන්වාදුන් අවධානම් පාදක ප්‍රාග්ධනය මූලික කරගත් සුපරීක්ෂණ ක්‍රමයකට (RBC) යොමුවීම නිසා ජීවගණක ඒකකයක් ඇති කිරීමට ජීවගණක තනතුරක්, සහකාර ජීවගණක තනතුරක් හා ජ්‍යෙෂ්ඨ විධායක / විධායක තනතුරු 02 ක් 2016 ජූනි 09 හා දෙසැම්බර් 07 දෙදින අනුමත කරගෙන තිබුණි.කෙසේ වුවද එම තනතුරු 2019 අප්‍රේල් 30 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ඉ) කොමිෂන් සභාවේ මුල්ම වැටුප් පරිමාණයන් 2005 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතරඑම අනුමත වැටුප් පරිමාණ හා දැනට ගෙවනු ලබන තත්‍ය වැටුප් පරිමාණ අතර වෙනස්කම් නිරීක්ෂණය විය. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මඟින් මෙන්ම රේඛීය අමාත්‍යාංශය මඟින් වැටුප් වැඩි කිරීම නිර්දේශ කළ නොහැකි බව දන්වා තිබියදීත් 2012 වර්ෂයේ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත (Treasury Representative) විසින් නිකුත් කර තිබූ ලිපියක් මත මූලික වැටුපෙන් සියයට 25 ක වැටුප් පරිමාණය වැඩිකර ගෙන ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඊ) චෙක්පත් වලින් ගෙවීමට පෙර බැංකුවේ පවතින මුදල් ශේෂය තහවුරු කර ගැනීමකින් තොරව චෙක්පත් නිකුත් කිරීම හේතුවෙන් ගෙවීම් සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.එසේම කොමිෂන් සභාව විසින් භාවිතා කරනු ලබන ගිණුම් මෘදුකාංගය (DMS) මගින් ලබා ගත් ශේෂ පිරික්සුම (Trial Balance) තුළ ලාභාලාභ අවිනිශ්චිත ගිණුමක් (P&L Suspense Account) නිරීක්ෂණය වූ අතර, එහි රු.31,150 ක ආරම්භක හර ශේෂයක් හා රු.192,578,152 ක අවසාන හර ශේෂයක් පැවතීම හේතුවෙන් ගිණුම් තැබීමේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයට සෑහීමට පත්විය නොහැකි වූ අතර මෙම දෝෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබිණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# 2018 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **(අ)** | **ගිණුම්කරණ ප්‍රමිත සමග අනුකූල නොවීම.** | |
| (i) | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01**; | |
| | - ඉහත ප්‍රමිතියෙහි 48 ඡේදය ප්‍රකාරව, ශ්‍රි.ල.රා.අ.ගි.ප්‍ර. මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් වියදම් හිලව් නොකළ යුතු වුවද රු. 1,537,007 ක් වූ මුදල් පොතෙහි අවාසිදායක ශේෂය, මුදල් හා ඒ හා සමාන වටිනාකමට එරෙහිව කපා හැර තිබුණි. | ලංකා බැංකුවේ ජංගම ගිණුම හා ඉතිරි කිරීමේ ගිණුම යන ගිණුම් දෙකක් පවත්වා ගෙන යනු ලබන අතර ජංගම ගිණුම ලෙජරයට අනුව බැර ශේෂයක් පැවතුන ද බැංකු ප්‍රකාශනයේ කිසිදු විටක බැර ශේෂයක් පැවතී නොමැත. මිට හේතු වන්නේ දිනය අවසාන වන විට ජංගම ගිණුමේ පවතින ශේෂය ඉතිරි කිරීමේ ගිණුමට මාරු වීමයි. නමුත් ලෙජරයට අනුව මෘදුකාංගයට ඇතුලත් කර ඇති ගෙවීම් සියල්ල ලෙජරයේ ඇතුලත් වන නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත. ඒ අනුව කොමිෂන් සභාවේ කාර්යක්ෂම අරමුදල් කලමණාකරණයක් සිදු කිරීමේ අරමුණින් ගිණුම් දෙකක් පවත්වාගෙන යනු ලැබේ. ඒ ඇනුව ශේෂය ගලපා මූල්‍ය ප්‍රකාශවල සටහන් කිරීම නිවැරදි වේ. |
| | - 53 ඡේදය ප්‍රකාරව, ශ්‍රි.ල.රා.අ.ගි.ප්‍ර. මඟින් වෙනස් ලෙස අවශ්‍ය කෙරේ නම් හෝ අවසර දී ඇත්නම් හැර මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලූම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය කාලපරිච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු හෙලිදරව් කළ යුතු වුවද ආයතනය විසින් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය සංසන්දනාත්මක තොරතුරු ඇතුළත් කරමින් ඉදිරිපත් කර නොතිබුණි. | සංසන්දනාත්මක තොරතුරු 2019 වර්ෂයේදී ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| | - ඉහත සඳහන් ප්‍රමිතියෙහි 128 ඡේදය ප්‍රකාරව, මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුහුණතෙහි එක් එක් අයිතමයට අදාලව සටහන්වල ඇති සම්බන්ධිත තොරතුරුවලට හරස් යොමු දැක්විය යුතු වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයෙහි හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සඳහන් රජයේ සුරකුම්පත්වල ආයෝජනයන්, ස්ථාවර තැන්පතු, අත්තිකාරම් ලැබීම්, පොලී ආදායම් සහ ආදායම් බදු සම්බන්ධයෙන් සම්බන්ධිත තොරතුරු සඳහා හරස් යොමු දක්වා නොතිබුණි. | සටහන්වල ඇති සම්බන්ධිත තොරතුරු වලට අදාල සියලු හරස් යොමු දක්වා ඇත. ඉදිරියේදී වැඩිදුරටත් හරස් යොමු දැක්වීම අපේක්ෂා කරමු. |
| | - 129 (ඇ) (ii) ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන හෙලිදරව් කිරීම් යටතේ මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති හෙලිදරව් කළ යුතු වුවද, ආයතනය විසින් මූල්‍ය අවදානම හා මූල්‍ය අවදානම් කළමනාකරණය පිළිබඳව තොරතුරු හෙලිදරව් කර නොතිබුණි. | සටහන් කර ගතිමු. අතීතයේදී ආයතනයේ මූල්‍ය අවධානම් කළමනාකරණ අරමුණු වෙනමම හෙළිදරව් කර නොපෙන්වූ අතර ඒ පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් හෙළිදරව් කරන ලදී. 2019 මූල්‍ය වර්ෂයේදී අවධානම් තක්සේරුව වෙනමම කොටසක් ලෙස ඇතුළත් කිරීමට හා ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමට ඒ අනුව කටයුතු කරනු ලැබේ |

# 2018 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| | - ඉහත ප්‍රමිතියෙහි 137 වගන්තිය ප්‍රකාරව අස්ථිත්වය විසින් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන් කෙරෙහි වඩාත් සැලකිය යුතු ප්‍රතිඵලයක් ඇති කරන ඇස්තමේන්තු හෝ කළමනාකරණය විසින් කරන ලද විනිශ්චයන්, ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයේ හෝ අනෙකුත් සටහන්වල හෙළිදරව් කර නොතිබුණි. | සටහන් කර ගතිමු. |
| | - 150 ඡේදය ප්‍රකාරව, අස්ථිත්වයේ නිත්‍ය පිහිටි තැන්, නෛතික ස්වභාවය සහ එහි ක්‍රියාකාරීත්වය, අස්ථිත්වයේ මෙහෙයුම් වල ස්වභාවය සහ එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක් සහ අස්ථිත්වයේ මෙහෙයුම් පාලනය කිරීමට අදාළ වන ව්‍යවස්ථාව පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කර නොතිබුණි. | ඡේද අංක 150 අනුව කොමිෂන් සභාව අදාළ තොරතුරු සියල්ල වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කර ඇත. (2017 වාර්තාවේ පිටු අංක 22) 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකශන තුල අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමු. |
| (ii) | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 02**; | |
| | - ඉහත ප්‍රමිතියෙහි 56 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් මුදල් හා මුදල් හා සමාන දෑ වල සංරචක හෙළිදරව් කළ යුතු අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ඇති අයිතමයන්ගේ වටිනාකම් ඊට සමානව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කර ඇති අයිතමයන් සමඟ සැසඳීමක් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශණයන් කර ඉදිරිපත් කර නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල පිටු අංක 4හි අදාළ හෙළිදරව් කිරීම් කර ඇත. |
| | - මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය අදාල ආයෝජන මාර්ගයන් අනුව වෙන් වෙන්ව දැක්විය යුතු වුවත් ස්ථාවර තැන්පත් වල ආයෝජනය තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය හා ප්‍රති මිලදී ගැනුම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුලින් වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේදී සෘජු ක්‍රමය හා වක්‍ර ක්‍රමය යන ක්‍රම දෙකම භාවිතා කල හැක. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ප්‍රමිත අංක 2 (32) උප වගන්තිය යටතේ වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශුද්ධ අගයට ගලපා පිළියෙල කරනු ලැබේ. ආයෝජනය කිරීම තුළින් මුදල් ගලා ඒම සහ ගලා යෑමේ ශුද්ධ අගය (රු. 40,000,000/-) ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා ඇත.<br><br>ඉහත සඳහන් කල පරිදි වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේදී ප්‍රති මිලදී ගැනුම් වලද ශුද්ධ අගය ගලපනු ලැබේ. රජයේ සුරකුම්පත් වල ආයෝජනයේ ශුද්ධ අගය (රු. 28,700,000/-) අගය ලැබී ඇත්තේ ස්ථිර තැන්පතු වල අයෝජනයෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය වන (රු. 40,000,000/-) ක් හා ප්‍රති මිලදී ගැනීම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම (රු.11,300,000/-) එකතුවෙනි. ඒ අනුව, ස්ථාවර තැන්පතු සහ ප්‍රති මිලදී ගැනුම්වල වෙනස (රු. 28,700,000/-) ක් ලෙස ආයෝජනයෙන් ලද මුදල් ප්‍රවාහ යටතේ දක්වා තිබීම නිවැරදි වේ. |
| | - මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී බදු පෙර ලාභය මත මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කළයුතු වුවත් බදු පසු ලාභය මත මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | සටහන් කරන ලදි.<br>2019 වසරේදී නිවැරදි කිරීමට බලාපොරොත්තු වෙමු. |

# 2018 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| (iii) | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 07**; | |
| | - ඉහත ප්‍රමිතියෙහි 40 වන ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ හඳුනාගැනීමෙන් පසු ගිණුම්කරණය සඳහා භාවිතා කරනු ලබන ප්‍රතිපත්තිය ආයතනය විසින් හෙලිදරව්වක් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ගිණුම්කරණ ප්‍රතිපත්තිය යටතේ වූ තක්සේරුකරුගේ නම හැර සියළු විස්තර හෙළිදරව් කර ඇත. 2019 දෙසැම්බර් 31 දිනැති ගිණුම්වලින් වැඩි විස්තර හෙළිදරව් කිරීමට බලාපොරොත්තු වෙමු. |
| | - තවද 90 ඡේදය ප්‍රකාරව දේපල හා පිරියත උපකරණ පන්තියක ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට අස්ථිත්වය ප්‍රත්‍යාග ණිත අගයන්ට අදාලව හෙළිදරව් කිරීම් කල යුතු වුවත් හෙලිදරව් කර නොතිබුණි. | අදාල හෙලිදරව් කිරීම් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් හෙලිදරව් කිරීමට බලාපොරොත්තු වෙමු. |
| | - ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව නැවත පරීක්ෂා කිරීම සිදුකර ඒ අනුව ඇතිවන ගැලපීම් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුව කල යුතු බව සඳහන් වේ. නමුත් පූර්ණ ලෙස ක්ෂය වී ඇති රු. 36,332,454 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් යටතේ මෝටර් වාහන නැවත පරීක්ෂා කිරීම තුලින් ප්‍රත්‍යාගණනය සිදු කල අතර ඒ සඳහා විගණන කමිටුව මගින් අනුමැතිය ලැබී ඇත. එයින් ලද ප්‍රත්‍යාගණන ලාභය ගිණුම්වලට ගලපා ඇත. අනෙකුත් වත්කම් වලින් කොටසක් ඉවත් කිරීම සඳහා විගණන කමිටුව මගින් අනුමැතිය දී ඇති අතර ඒ සඳහා අදාල කටයුතු 2019 වසරේදී සිදු කර ඇත. |
| (iv) | **රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 10**; | |
| | (අ) හුවමාරු ගණුදෙනු වලින් පැන නගින අයභාර අයභාරය හඳුනාගැනීමේ දී ඉහත ප්‍රමිතියේ 19 ඡේදය ප්‍රකාරව අදාල කොන්දේසි නිසි පරිදි සම්පූර්ණ කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ විදේශ විනිමය ගණුදෙනු සිදු කර නොමැත. |
| | (ආ) ආයතනයට ලැබී තිබුණු එකතුව රු. 1,569,187ක් වටිනා ස්ථාවර වත්කම් 02 ක් අදාල ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත නොකර ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද 2019 වර්ෂයේ දී සභාව විසින් අත්පත්කර ගෙන තිබුණු රු. 319,890ක් වටිනා ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අත්පත් කරගැනීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2019 වසරේදී ආයතනයට මිලදී ගත් පුටු 25 ක් සඳහා අදාල ප්‍රතිපාදන වෙන් කිරීම හා ඇණවුම් කිරීම සිදු කර ඇත්තේ 2018 වසරේදීය. මේ සඳහා 2018 වර්ෂයට අදාල උපචිත වියදම් ලෙස සටහන් කර ඇති අතර 2019 වසරේදී අදාල වත්කම් ආයතනය වෙත ලැබුණු පසු වත්කම් ගිණුමට නිවැරදිව ගිණුම්ගත කර ඇත. |
| | (ඇ) වායු සමීකරණ පද්ධතිය සඳහා දරන ලද රු. 200,000 ක උපදේශන ගාස්තු ප්‍රාග්ධනිත කිරීමකින් තොරව 2018 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සිසිලන පද්ධතිය සඳහා උපදේශන ගාස්තුව 2018 වර්ෂය අවසාන වන විටත් ගෙවා නොතිබුණු බැවින් එය 2018 වසරට උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කරන ලදී. එමෙන්ම එම වසරේදී සිසිලන පද්ධතිය නියමිත ක්‍රියාකාරී මට්ටමේ නොතිබුනු බැවින් තවදුරටත් පරීක්ෂා කිරීමට අදාල ආයතනයට දැනුම් දෙන ලදී. ඒ අනුව, පද්ධතිය නියමිත මට්ටමක පවතින බව තහවුරු වන තුරු එය අදාල වත්කමක් ලෙස හඳුනාගත නොහැක. එම වත්කම් නිසියාකාර තත්වයේ පවතින බව තහවුරු වූයේ 2019 වසරේදීය. ඒ අනුව, එම තහවුරු කිරීමට පසු අදාල වත්කම 2019 දී වත්කම්, ගිණුමට මාරු කරන ලදී. |

# 2018 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| | (ඈ) ආදායම් බදු වියදම රු.1,822,908 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් වුවද මෙකී බදු වියදම ගණනය කිරීම් විස්තර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | අදාල විස්තර සටහන් මඟින් හෙළිදරව් කර තිබුණු අතර 2019 වසරේ මූල්‍ය ප්‍රකාශන වල තවදුරටත් හෙළිදරව් කිරීම් කිරීමට බලාපොරොත්තු වෙමු. |
| | (ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාරක ප්‍රාග්ධන වෙනසෙහි මුදල් ගලායාම රු. 4.482,480 ක් ලෙස දක්වා තිබුණ ද, එම වටිනාකම ගණනය කිරීමට අදාල විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කාරක ප්‍රාග්ධන වෙනස් වීම තුල ඇති ලැබිය යුතු ශේෂයන්ගේ අඩුවීම රු. 4,482,480/- ලෙස දක්වා ඇත්තේ සටහන් අංක 4 ට අදාලව ලැබිය යුතු ශේෂයන්ගේ 2017 හා 2018 වසර අතර වෙනසයි. මෙය ගණනය කිරීමේදී ලැබිය යුතු රඳවා ගැනීමේ බදු, ලැබිය යුතු පොළී ආදායම් හා වර්ෂයේ ආදායම් බදු ආදායම් මූල්‍යමය බලපෑමක් ඇති නොකරන බැවින් එම ශේෂයන් අඩු කිරීමෙන් පසු ලැබෙන ශුද්ධ වෙනස් වීම ගලපා ඇත. මේ අනුව ලැබිය යුතු ශේෂයන්ගේ අඩුවීම රු. 4,482,480/- නිවැරදි වේ. මීට අදාල මෘදු පිටපත් Excel ද විගණනය සඳහා අප විසින් ලබා දී ඇත. |
| **2.** | **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** | |
| | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව. | විශ්ලේෂණ සටහනකි. |
| | (i) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 6 (2) (ඈ) වගන්තිය<br><br>මණ්ඩලය (වත්මන් කොමිෂන් සභාව) විසින් එහි බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී, කිරීමේ දී මණ්ඩලයට ලැබෙන සියලු මුදල් අරමුදලෙහි අරමුදල් ලෙස හඳුනාගත යුතු වුවද ශේෂ පිරික්සුමෙහි අදායම් ලෙස වර්ගීකරණය කර තිබුණු එකතුව රු.934,419,711 ක් වූ ආදායම් අයිතම 05 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් ලෙස නොදක්වා රක්ෂණ භාර දරන්නන්ගේ ආරක්ෂණ අරමුදල් ගිණුමට එකතු කර තිබුණි. | 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 103 (1) වගන්තියට අනුව රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිට විය යුතු අතර ඒ අරමුදල සෙස් බද්දෙන් උපචිත වන මුදල් බැර කරනු ලැබිය යුතුය.<br><br>2018 වසරෙහි සෙස් ආදායම — රු.<br>සෙස් ආදායම — 479,088,491<br>ආයෝජිත ආදායම — 455,331,220<br>රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල — 934,419,711<br><br>එම අරමුදල ශේෂ පත්‍රයේ සංචිත යටතේ නිවැරදිව සටහන් කර ඇත. පනතෙහි 6 ට වගන්තියට අනුව වාර්ෂික ආදායම් නිවැරදිව ආදායම් හා වියදම් ගිණුමට ගිණුම්ගත කොට ඇත. ඒ අනුව රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි ලාභය කිසිදු අඩුවීමක් සිදු නොවී ඇති අතර පනතට අනුව නිවැරදි ලෙස ගිණුම්ගත කර ඇත. |
| | (ii) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 7(2) වගන්තිය<br><br>පොලී ආදායම වෙනම ආදායමක් ලෙස ගෙන බදු ගණනය කළ යුතු බව සඳහන් වුවද මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති රු.462,770,523 ක පොළී ආදායම සඳහා බදු ගණනය කර නොතිබුණි. | රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ආයෝජන ආදායම කොමිෂන් සභාවේ ආදායමක් ලෙස හඳුනාගෙන නොමැති අතර එය ආරක්ෂණ අරමුදලට බැර කර ඇත. කොමිෂන් සභාවේ පොලී ආදායම නිවැරදිව ගණනය කර ආදායම් බදු ගලපා ඇත. |

# 2018 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| | (iii) මුදල් රෙගුලාසි 371<br><br>ලබා ගන්නා තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිම කළ වහාම නැවත පියවිය යුතු වුවත් 2016, 2017, 2018 වර්ෂයන්හිදී නිකුත් කරන ලද රු.554,497 ක් වූ අත්තිකාරම් 03ක් 2019 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි. | 2016 වසරේදී රු.50,000/- ක මුදලක් සිසිලන පද්ධතියේ උපදේශන සේවා සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවා ඇති අතර තවදුරටත් එම කාර්යය අවසන් වී නොතිබෙන බැවින් ඉතිරි ගෙවීම එම කාර්යය අවසන් වූ පසුව සිදු කිරීමට බලාපොරොත්තු වේ.<br><br>සිසිලන පද්ධතිය සඳහා අදාල කාර්යයේ අවසාන ගෙවීම සහතික කිරීම මේ වන විටත් නිම වී නොමැත. අදාල සහතික කිරීම උපදේශන සේවාව මගින් ලැබුණු වහාම ගෙවීමට ඇති ශේෂයෙන් අත්තිකාරම් අඩු කොට ඉතිරි මුදල ගෙවා අත්තිකාරම් පියවීමට බලාපොරොත්තු වේ.<br><br>වෙබ් අඩවිය අලුත්වැඩියා කටයුතු කිරීම සඳහා රු.100,000/- ක අත්තිකාරම් මුදලක් අදාල ආයතනය වෙත ගෙවා ඇති අතර එම කටයුත්ත මේ වන විටත් සිදු කිරීම අවසන් කර නොමැති නිසා අත්තිකාරම් ගිණුමේ එම ශේෂය ඇත. අදාල කාර්යය නිම කිරීමෙන් පසු අත්තිකාරම් ගිණුමෙන් මාරු කිරීමට බලාපොරොත්තු වේ.<br><br>ඉහත සඳහන් කල ප්‍රාග්ධන වියදම් 3 සම්බන්ධයෙන් වෙබ් අඩවියේ කටයුතු අවසන් කර ඇති අතර සිසිලන පද්ධතියේ කටයුතු 2019 වසර අවසන් වීමට පෙර නිම කිරීමට බලාපොරොත්තු වෙමු. අදාල කාර්යයන් සම්පූර්ණයෙන් නිම වූ පසු 2019 වසරේදී ප්‍රාග්ධනිත කිරීමට බලාපොරොත්තු වෙමු. |
| | (iv) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය<br><br>පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබා ගත යුතු වුවද, 2019 අප්‍රෙල් 30 දින වන විටත් කොමිෂන් සභාව භාවිතා කරනු ලබන අත්පොත සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලැබී නොතිබුණි. එසේ වුවද, අත්තිකාරම් ගෙවීම්, වාහන ණය ලබා දීම් ඇතුළු කටයුතු අනුමැතිය නොලත් පරිපාලන අත්පොත ප්‍රකාරවම සිදු කෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය. | කොමිෂන් සභාව ආරම්භ කළ දින පටන් මේ දක්වා පරිපාලන අත්පොත ප්‍රකාරව කටයුතු කරන ලද අතර අනුමැතිය ලැබීම ප්‍රමාද වීම හේතු කොට ගෙන පවතින චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමට යාමේදී ප්‍රායෝගික ගැටළු ගණනාවකට මුහුණ දීමට සිදුවේ.<br><br>2018.05.18 දින පැවැති 182 වන කොමිෂන් සභා රැස්වීමේදී ද මෙම කරුණ පිළිබඳ අවධානය යොමු කරන ලද අතර පරිපාලන අත්පොතට පරිබාහිරව රාජ්‍ය චක්‍රලේඛ අනුගමනය කිරීමේදී ආයතනයේ කාර්ය නිසිලෙස පවත්වාගෙන යාම දුෂ්කර විය හැකි බවට එකඟ වන ලද අතර දැනට අනුමත පරිපාලන අත්පොත භාවිතා කිරීමට අනුමැතිය ලබාදෙන ලදී. |
| | (v) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 48(1) වගන්තිය<br><br>සෑම රක්ෂණකරුවකු විසින්ම, ඒ ව්‍යාපාරයේ රක්ෂණකරුගේ වත්කම් හා බැරකම් තක්සේරු කිරීමක්ද ඇතුළුව, එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ජීව ගණකයකු ලවා විමර්ශනයක් කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් සාදන ලද රීතිවලට අනුකූලව උද්ධෘතයක් පිළියෙල කිරීමටද මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතුය. එසේ වුවද, කොමිෂන් සභාවේ ජීවගණක තනතුර දිගින් දිගටම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් රක්ෂණකරුවන් විසින් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන ජීවගණක වාර්තා 2016 වර්ෂයේ සිට මේ දක්වා සමාලෝචනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ජීවගණකයෙකු නොමැතිවීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇත. නමුත් 2019 වසරේ සිට FSMP වැඩසටහන තුල ජීවගණකයකු ලබා ගැනීමට මේ වන විටත් කටයුතු සිදු කරමින් පවතී. ඔහුගේ හෝ ඇයගේ ප්‍රධාන කාර්ය වන්නේ ජීව ගණක අංශය ස්ථාපිත කිරීමයි. |

# 2018 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| | (vi) 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය කොමිෂන් සභාවේ අනුමත තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවාගෙන නොතිබුණි. | කොමිෂන් සභාවේ තනතුරු වලට අදාල බඳවා ගැනීමේ පටිපාටිය අදාල තනතුරු ඇති කරන අවස්ථාවල දී අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ඇත. |
| | • 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව. | විශ්ලේෂණ සටහනකි. |
| | • 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූල ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව. | |
| **3.** | **වෙනත් විගණන නිරීක්ෂණ** | |
| | (අ) කොමිෂන් සභාවේ කාර්යාල කටයුතු බාහිර ආයතනයක පවත්වාගෙන යනු ලබන අතර ගොඩනැගිල්ලෙහි කුලිය ලෙස 2018 වර්ෂයේ දී රු.38,533,202 ක් ගෙවා තිබුණු අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 13ක වර්ධනයක් බව නිරීක්ෂණය විය. | මෙම කරුණ මීට පෙර වතාවන් කිහිපයකදීම කොමිෂන් සභාවේ අවධානයට යොමු කර ඇති අතර ඒ සඳහා පිළිතුරුද යොමු කර ඇත. ආයතනය ස්ථාපිත කිරීමට විකල්ප ස්ථානයක් සෙවීම කෙරෙහි අවධානය යොමු කළද, නියාමන ආයතනයක් පවත්වා ගෙන යාමට සුදුසු පරිසරයකින් සමන්විත ස්ථානයක් වර්තමාන පිරිවැයට වඩා අඩු මුදලකට සොයා ගැනීමට දරන ලද සියලු උත්සාහයන් ව්‍යර්ථ විය.<br>එමෙන්ම ඉදිරි වසර 5 සඳහාද කාර්යාල ගොඩනැගිලි කුලිය සඳහා ගිවිසුම් අත්සන් කර ඇති අතර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත. |
| | (ආ) ලියාපදිංචි මූල්‍ය සමාගම් කිහිපයක් ණය විසඳීම් (loan disbursement) වලදී අභ්‍යන්තර රක්ෂණ අරමුදලක් පවත්වාගෙන යාම සඳහා ගාස්තු අය කරන බවට 2018 ජුලි 09 දින කොමිෂන් සභාවට ලැබී තිබුණු පැමිණිල්ලක් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට දන්වා තිබුණද මේ පිළිබඳව වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | අප විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට යවන ලද ලිපියට පිළිතුරක් 2018 අගෝස්තු මස 27 දින ලැබිණ. ඒ සම්බන්ධයෙන් වූ විමර්ශනවල සොයාගැනීම් අප වෙත දැනුම්දෙන ලෙස සඳහන් කළද, මහ බැංකුව විසින් ඒ බව දැනුම් දී නැත. මේ සම්බන්ධයෙන් මහ බැංකුව වෙත නැවත මතක් කිරීමක් යැවීමටද බලාපොරොත්තු වෙමු. |
| | (ඇ) කොමිෂන් සභාවේ ලියාපදිංචි වූ රක්ෂණ සමාගම් 26 ක් පවතින අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව එම සමාගම් වල මාසික වාර්තා, කාර්තු වාර්තා හා වාර්ෂික වාර්තා මණ්ඩල වෙත ලැබීමෙන් පසු මාස 2ත්-3ත් ඇතුළත සමාලෝචනය කළයුතු වුවද ආයතන 04ක වාර්ෂික වාර්තා සමාලෝචනය කිරීමේදී දින 38 සිට දින 84 දක්වා ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය. | සමාගම් 3 ක් සමාලෝචනයේදී සිදුවූ ප්‍රමාදයන් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අදාල නිලධාරීයාගෙන් කරුණු විමසීමක් සිදුකරනු ලැබූ අතර ඇතැම් ප්‍රමාදයන්වලට හේතු වූයේ විශ්ලේෂණයේදී මතු වූ සමහර නිරීක්ෂණ විස්තරාත්මක ලෙස විශ්ලේෂණය කිරීමට සිදු වීම බවට තහවුරු විය.<br>තවද ප්‍රමාදයන් වැලැක්වීම සඳහා අඛණ්ඩව සිහි කැඳවීම් කිරීමටද, සමාලෝචනයන් නිරීක්ෂණය කිරීමටද පියවර ගෙන ඇත. |

# 2018 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| | (ඈ) කොමිෂන් සභාව 2016 වර්ෂයේ ආරම්භයේ සිට රක්ෂණ සමාගම්වල නුබුන්වත් නීති රාමුව වෙනුවට හඳුන්වාදුන් අවධානම් පාදක ප්‍රාග්ධනය මූලික කර ගත් සුපරීක්ෂණ ක්‍රමයකට (RBC) යොමුවීම නිසා ජීවගණක ඒකකයක් ඇති කිරීමට ජීවගණක තනතුරක්, සහකාර ජීවගණක තනතුරක් හා ජ්‍යෙෂ්ඨ විධායක/ විධායක තනතුරු 02ක් 2016 ජුනි 09 හා දෙසැම්බර් 07 දෙදින අනුමත කරගෙන තිබුණි. කෙසේ වුවද එම තනතුරු 2019 අප්‍රේල් 30 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි. | දැනට පුරප්පාඩුපාඩුව පවතින ජීවගණක සහ සහකාර ජීවගණක තනතුරු සඳහා කොමිෂම මගින් ක්‍රියාත්මක කරන ලෝක බැංකු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමත් සමඟ බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| | (ඉ) කොමිෂන් සභාවේ මුල්ම වැටුප් පරිමාණයන් 2005 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර එම අනුමත වැටුප් පරිමාණ හා දැනට ගෙවනු ලබන තත්‍ය වැටුප් පරිමාණ අතර වෙනස්කම් නිරීක්ෂණය විය. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් මෙන්ම ජේඛීය අමාත්‍යාංශය මඟින් වැටුප් වැඩි කිරීම නිර්දේශ කළ නොහැකි බව දන්වා තිබියදීත් 2012 වර්ෂයේ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත (Treasury Representative) විසින් නිකුත් කර තිබූ ලිපියක් මත මූලික වැටුපෙන් සියයට 25 ක වැටුප් පරිමාණය වැඩිකර ගෙන ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | රක්ෂණ නියාමන කොමිෂන් සභාව ස්ථාපනය කරන ලද 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත මගින් ලැබී ඇති බලතල අනුව වැටුප් තීරණය කර ඇත. |
| | (ඊ) චෙක්පත් වලින් ගෙවීමට පෙර බැංකුවේ පවතින මුදල් ශේෂය තහවුරු කර ගැනීමකින් තොරව චෙක්පත් නිකුත් කිරීම හේතුවෙන් ගෙවීම් සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. එසේම කොමිෂන් සභාව විසින් භාවිතා කරනු ලබන ගිණුම් මෘදුකාංගය (DMS) මඟින් ලබා ගත් ශේෂ පිරික්සුම (Trial Balance) තුළ ලාභාලාභ අවිනිශ්චිත ගිණුමක් (P&L Suspense Account) නිරීක්ෂණය වූ අතර, එහි රු. 31,150 ක ආරම්භක හර ශේෂයක් හා රු.192,578,152 ක අවසාන හර ශේෂයක් පැවතීම හේතුවෙන් ගිණුම් තැබීමේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයට සෑහීමට පත්විය නොහැකි වූ අතර මෙම දෝෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබිණි. | රක්ෂණ නියාමන කොමිෂන් සභාව භාවිතා කරන මෘදුකාංගයේ 2018 වසරට අදාල ගිණුම් පියවා නොතිබුණු බැවින් ලාභ අලාභ අවිනිශ්චිත ගිණුමෙහි ශේෂයක් පැවතුණි. අවසාන ගිණුම් පියවීමෙන් පසු එම ගිණුම ශූන්‍ය අගයක් ගනු ලැබේ.<br><br>මේ වන විට ගිණුම් පියවා අවිනිශ්චිත ගිණුම ශූන්‍ය අගයක් ගෙන ඇත. |

# පරිශිෂ්ඨය I

2018 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

| අංකය | රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 2 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ්* | සාමාන්‍ය රක්ෂණය |
| 3 | ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 4 | ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 5 | අමානා තකාෆුල් පීඑල්සී | සාමාන්‍ය රක්ෂණය |
| 6 | අමානා තකාෆුල් ලයිෆ් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 7 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 8 | සොෆ්ට් ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 9 | ෆෙයාර් ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 11 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 12 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 13 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 14 | කෝප්ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 15 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 16 | එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 17 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 18 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 19 | එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 20 | එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 21 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 22 | ජාතික රක්ෂණ භාර අරමුදල | සාමාන්‍ය රක්ෂණය |
| 23 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 24 | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | සාමාන්‍ය රක්ෂණය |
| 25 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 26 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 27 | යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |

*මේ වන විට, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර කටයුතු වලින් ඉවත් වීම අරඹා ඇති අතර, තවදුරටත් නව රක්ෂණ ඔප්පු නිකුත් කරනු නොලැබේ.

**දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි යෙදී සඳහා එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් වෙත ලබාදුන් ලියාපදිංචිය 2017 ජුනි 28 වන දින සිට අත් හිටවන ලදී.

# පරිශිෂ්ඨය II

2018 දෙසැම්බර් 31 දිනට පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම්

| අංකය | රක්ෂණ තැරැව්කරු | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | 3 ඩී එච් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 2 | ඒඑම්ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 3 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 4 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 5 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 6 | ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 7 | ඇම්ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 8 | ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 9 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | ඇක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 11 | බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 12 | සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 13 | සීලෑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 14 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 15 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 16 | කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 17 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 18 | ඩී එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 19 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 20 | ඊගල් ඩී වී ආර් එස් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරනස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 21 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 22 | එස්නා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 23 | එසාජි කරිම්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 24 | ෆයින්ඩ් මයි ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරනස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 25 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 26 | ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 27 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 28 | ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 29 | ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 30 | අයිකොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 31 | ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 32 | ජේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 33 | ජේඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 34 | එල්එම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 35 | ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 36 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 37 | මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 38 | මර්කන්ටයිල් ෆෝර්චූන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 39 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 40 | එම් ආර්යු එස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 41 | මියුචුවල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |

# පරිශිෂ්ඨය II

| | | |
|---|---|---|
| 42 | මයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 43 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 44 | ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 45 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 46 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 47 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 48 | රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 49 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 50 | රින්කූන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 51 | ආර් එම් එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 52 | එස් වයි එම් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 53 | සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 54 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 55 | සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 56 | ස්ට්‍රැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 57 | ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 58 | යූඑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 59 | යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 60 | වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 61 | වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 62 | වොලන්කා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 63 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |

# පරිශිෂ්ඨය III

2018 දෙසැම්බර් 31 දිනට පනත යටතේ ලියාපදිංචි වී ඇති අලාභ ගැළපුම්කරුවන්

| අංකය | අලාභ ගැළපුම්කරු | බලපත්‍රය ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| 1 | උදිතමාලා පිනාදරී කුරුකුලසූරිය මිය | 2018 ජුනි 13 |
| 2 | රන් බණ්ඩා තෙන්නකෝන් මයා | 2018 ජුනි 25 |
| 3 | විපිතසේන ලීලාරත්න ප්‍රනාන්දු මයා | 2018 ජුනි 25 |
| 4 | ගාමිණී කීනිගම මයා | 2018 ජුනි 25 |
| 5 | අහමඩ් නසීම් නස්වි රහුමාන් | 2018 ජුනි 25 |
| 6 | ගුණවර්ධන මුදියන්සේලාගේ ආනන්ද උයද කුමාර ගුණවර්ධන | 2018 ජුනි 25 |
| 7 | මහබාලගේ දොන් සිසිර උපාලි පෙරේරා | 2018 ජුනි 26 |
| 8 | නිරෝෂ් සංජීව වතුකාරවත්ත | 2018 ජුනි 26 |
| 9 | සුසන්ත මහින්දරත්න වීරකෝන් | 2018 ජුනි 26 |
| 10 | රාජපක්ෂ පතිරගේ දොන් කාන්චන සුරංගික | 2018 සැප්තැම්බර් 10 |

# පාරිභාෂික ශබ්ද මාලාව

### සමුච්චිත වීම

එක් සමාගමක් සමග පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රතිරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්වයකි.

### අත්කර ගැනීමේ වියදම්

අභිනව රක්ෂණ ගිවිසුම් අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත්කිරීම (උදා:- කොමිස් මුදල්) යන අවස්ථාවල දී වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

### ජීවගණකඥ

ජීවගණකඥයෙක් යනු අවිනිශ්චිත අවස්ථාවන්හි මූල්‍යමය ප්‍රතියමාන්‍යයන් ඇගයීම සඳහා පුහුණුව ලබා ඇති වෘත්තියවේදියෙකි. රක්ෂණයේ සහ අනිකුත් මූල්‍ය සේවාවන්හි අනුමානික ස්වභාවය, වත්කම්වලට ආවේණික අවදානම් සහ සංඛ්‍යාලේඛන ආකෘතීන් පිළිබඳ අවබෝධයක් ජීවගණකඥයින් සතුවිය යුතුය. මේ අනුව උදාහරණයක් ලෙස වාරික, තාක්ෂණික ප්‍රතිපාදන සහ ප්‍රාග්ධන මට්ටම තහවුරු කිරීම සිදු කරනු ලැබෙයි.

### පරිපාලන වියදම්

දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේදී ආයෝජන කළමනාකරණ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

### ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්

ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය නිශ්චය කිරීමේ දී ඇතුලත් කරනු ලැබෙන වත්කම් වේ. මෙවැනි වත්කම් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි නිශ්චිතව දක්වා තිබේ.

### වාර්ෂිකය

යම් කිසි නිශ්චිත කාලසීමාවක් සඳහා වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්භිත හා ක්ෂණිකව ක්‍රියාත්මක වන යනුවෙන් මූලික වශයෙන් වර්ග දෙකකට අයත් වාර්ෂික පවතියි. ගෙවීම් සිදුකිරීම යම්කිසි අනාගත කාලයක දී ආරම්භ වන්නේ නම් එය විලම්භිත වාර්ෂිකය නම් වේ. ගිවිසුම ආරම්භ වන අවස්ථාවේදීම අදාළ ගෙවීම් සිදුකිරීම අරඹන්නේ නම් එය ක්ෂණික වාර්ෂිකය නම් වේ.

### බැංකු රක්ෂණ සේවාව

රක්ෂකයා විසින් රක්ෂණ නිෂ්පාදන බැංකු පාරිභෝගිකයින් වෙත අළෙවි කිරීමේ වැඩ පිළිවෙලකි.

### ප්‍රතිලාභියා

ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායකයා ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

### ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය (CAR)

අවශ්‍ය කරනු ලබන අවදානම් ප්‍රාග්ධනය (RCR) ට සහාය දැක්වීම පිණිස වූ සමස්ත උපයෝජ්‍යය ප්‍රාග්ධනය (TAC), ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය මගින් මනිනු ලබයි.

$$\text{ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය} = \frac{\text{පූර්ණ පවත්නා ප්‍රාග්ධනය}}{\text{නියමිත අවදානම් ප්‍රාග්ධනය}} \times 100$$

### ප්‍රතිරක්ෂිතයා

ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක් (ප්‍රාථමික රක්ෂණ සමාගම)

දායකය - රක්ෂණ සමාගම් විසින් ප්‍රතිරක්ෂකයින් වෙතට මාරුකරනු ලබන අවදානම් කොටස.

### හිමිකම් පෑම

දේපල විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය පිරිවැය දැරීම, රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිතවීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනා දී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේදී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

### දරන ලද හිමිකම් පෑම

වර්ෂය ආරම්භයේ දී සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම් පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂයක් තුළ හිමිකම් පෑම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

### දරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම් (IBNR)

දේපල, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදුවී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේදී ඇති කරනු ලබන සංචිතයකි.

### හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

කටයුතු සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේදී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

### සහභාග රක්ෂණය

නිශ්චිත වාර මුදල් එකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමග ඇති කර ගන්නා තනි ගිවිසුමක්.

### කොමිස්

රක්ෂකයාගේ නිෂ්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයෙකුට කරන ගෙවීමක්.

### සංකේන්ද්‍රණ අවදානම

නෛසර්ගික ණය අවදානම යෝග්‍ය ලෙසින් අවමකරලීම පිණිස රක්ෂණ හිමියන්ගේ වත්කම් ප්‍රමාණවත් ලෙස විවිධාංගීකරණය වී නොමැති නම්, පවතින අතිරේක ණය අවදානම.

### ණය අවදානම

ශ්‍රේණිගත සුරැකුම්පත් නිකුත් කරන්නන් (ආයෝජකයාගේ ආයෝජන කළඹෙහි), ණයගැතියන්, (උදා. උකස්කරුවන්) හෝ ප්‍රතිපාර්ශවකරුවන් (උදා. ප්‍රතිරක්ෂණ ගිවිසුම්, ව්‍යුත්පන්න ගිවිසුම් හෝ තැන්පතු මත) සහ මැදිහත්කරුවන්ගේ ණය ප්‍රමාණන පැවරීම්වල පැහැර හැරීම් හෝ සංචලනයන් නිසා ඇතිවන මූල්‍ය අලාභ අවදානම. ණය අවදානම තුළ පැහැර හැරීමේ අවදානම, අවශ්‍රේණිගතවීම් හෝ සංක්‍රමණික අවදානම, වක්‍ර ණය හෝ ව්‍යාප්තවීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම හා සහ සම්බන්ධ අවදානම අන්තර්ගත වේ. ණය අවදානම් මූලාශ්‍රයන්ට ආයෝජන ප්‍රතිපාර්ශවකරුවන් රක්ෂණ ඔප්පුහිමියන් (හිඟ වාරික හරහා) ප්‍රතිරක්ෂණකරුවන්, මැදිහත්කරුවන් සහ ව්‍යුත්පන්න ප්‍රතිපාර්ශවකරුවන් ඇතුළත් වේ.

# පාරිභාෂික ශබ්ද මාලාව

### විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

### අත්හිටවූ මෙහෙයුම්

සමාගමක සමස්ත අංශයක්, අනුබද්ධිත ආයතනයක් හෝ කොටසක්, සමාගමෙන් ඉවත්කරලීම සඳහා විධිමත් සැලසුමක් පවතින විට ඒවායේ මෙහෙයුම්.

### ඉපැයූ වාරික

ගිණුම් කාලපරිච්ඡේදයක ආරම්භයේ දී සහ අවසානයේ දී නොඉපයූ වාරික ප්‍රතිපාදන වෙනුවෙන් සැලසුම් කළ ලිඛිත වාරික මුදල්.

### අනුරක්ෂණ

අභාග්‍ය සම්පන්න අවස්ථාවක දී පුද්ගලයාගේ ජීවිතය පමණක් ආවරණය කෙරෙන, නමුත් කාලසීමාව අවසානයේ දී කල්පිරීමේ ප්‍රතිලාභයක් ලබාදෙන ජීවිත රක්ෂණ ගිවිසුමකි.

(නිශ්චිත කාලපරාසයකට (එහි කල්පිරීමේදී) පසු හෝ මරණයකදී එකවර ගෙවීම පිණිස සැලසුම් කරන ලද ජීවිත රක්ෂණ ගිවිසුමකි.)

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

ගිනි, මුහුදු උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ බද්දට පවත්වාගෙන යාම, ගිණුම් කාලපරිච්ඡේදයක් තුළදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව සියලු මූලාශ්‍ර වෙතින් ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරිකද සහිත අගය.

### දළ වාරිකය

වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිදාන අඩුකිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවෙකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩුකිරීමට පෙර වූ වාරිකය.

### රක්ෂකයා

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

### තාක්ෂණ රක්ෂණ විසඳුම්

වත්මන් රක්ෂණ කර්මාන්ත ආකෘතියෙන් ඉතුරුම් සහ කාර්යක්ෂමතාවය උකහා ගැනීම පිණිස සැලසුම් කර ඇති තාක්ෂණික නවෝත්පාදන භාවිතය තාක්ෂණික රක්ෂණය යනුවෙන් අදහස් වේ. ඉන්ෂුවරටෙක් (Insurtech) යනු ෆින්ටෙක් (fintech) යන වදනින් පෙළඹී රක්ෂණය සහ තාක්ෂණය යන්නෙහි සුසංයෝගයකි.

### අහෝසි වූ ඔප්පුව

වාරික මුදල් නොගෙවීම මත සහන කාලය අවසානයේදී අවලංගු වූ රක්ෂණාවරණ.

### වගකීම් ප්‍රාමාණිකතා පරීක්ෂණය (LAT)

අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්තමාන අගය ඒවායේ රක්ෂණ ගිවිසුම් යටතේ යොදාගනිමින් එහි හඳුනාගත් රක්ෂණ වගකීම් ප්‍රමාණවත්ද යන වග වාර්තා කරනු ලබන එක් එක් කාලසීමාව අවසානයේ ඇගයීම.

### වගකීම් අවදානම

රක්ෂකයා විසින් ස්ථාපනය කරනු ලබන තාක්ෂණික සංචිත සහ ඔප්පුහිමියාගේ වගකීම්, දැනට බලපවත්වන ඔප්පු සම්බන්ධ අනාගත හිමිකම් සහ වියදම් සඳහා ප්‍රමාණවත් වේවිද යන අවදානම.

### දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර

මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කෙරෙන ගිවිසුමද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

### වෙළඳපල අවදානම

රක්ෂකයාගේ වත්කම්වල වෙළඳපල වටිනාකම අඩුවීමේ අවදානම.

### කල්පිරීම

දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව.

### මරණ අනුපාතය

මුළු ජනගහනයට හෝ විශේෂිත වයස් කණ්ඩායමකට මරණ අනුපාතය. එය ගෝලීය වශයෙන් අනුපාත සංඛ්‍යාවන් ලෙසින් ප්‍රකාශිත අතර මරණ අනුපාත වගුව, දක්වා ඇත.

### ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය

රක්ෂකයන් විසින් ශුද්ධ ආදායම් (ශුද්ධ ඉපැයූ වාරික) (අදාළ ප්‍රතිරක්ෂණයෙන් අඩු කළ පසු) සම්බන්ධ ශුද්ධ අලාභ වියදම් නිරූපණය කිරීමට උපයෝගී කරගනු ලබන සූත්‍රයකි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \times 100$$

### ශුද්ධ ඒකාබද්ධ අනුපාතය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

ජීවිත නොවන ශුද්ධ අලාභ අනුපාතය සමග ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි. මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේදී ආයෝජන ආදායම් සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්}}{\text{ඉපැයූ ශුද්ධ වාරිකය}} \times 100 + \frac{\text{වියදම්}}{\text{ඉපැයූ ශුද්ධ වාරිකය}} \times 100$$

### ශුද්ධ වියදම් අනුපාතය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

ජීවිත නොවන ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා. කොමිස්, බදු, සේවක පිරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

### සහභාගීත්වය රහිත ඔප්පුව – දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර

ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතුවලදී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

### එක්වරක් පමණක් ලැබෙන අතිරික්තය

2016 ජනවාරි 01 දිනට අවදානම් පාදක ප්‍රාග්ධන රීතිය යටතේ දළ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු රක්ෂණ වගකීම් වලට වඩා 2015 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු ඔප්පු වගකීම් වල අතිරික්තය. (ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට දළ වාරික තක්සේරුවට වෙනස්වීම නිසා ඇති වූ අතිරික්තය)

### එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය මාරුකිරීම

ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට දළ වාරික

# පාරිභාෂික ශබ්ද මාලාව

තක්සේරුව වෙත කොටස්හිමියන්ගේ අරමුදලට වෙනස්වීම නිසා ඇති වූ අතිරික්තය කොටස්හිමියන්ගේ අරමුදලට මාරුකිරීම.

### මෙහෙයුම් ලාභය

ආයෝජන ආදායම, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය.

### මෙහෙයුම් අවදානම

මූල්‍යමය අලාභයන්ට හේතුවන අභ්‍යන්තර පද්ධතිවල, සේවක මණ්ඩලයේ කාර්ය පටිපාටි හෝ පාලනයන්හි ප්‍රමාණවත් නොවන බව හෝ අසාර්ථකවීම නිසා පැන නගින අවදානම.

මෙහෙයුම් අවදානමට භාරකාරිත්ව අවදානමද ඇතුළත් වේ.

### ඔප්පුව

රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියවිල්ලකි.

### ඔප්පු හිමියා

රක්ෂණකරු සමග අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරුවන තැනැත්තා.

### ඔප්පු ණය

ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරණ අගය ඇපයට තබමින් ඔප්පු හිමියකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොලී අය කරනු ලැබේ.

### ප්‍රාථමික රක්ෂකයා

රක්ෂණ වාරිකයක් වෙනුවෙන් අවදානම් බාර ගනු ලබන්නා වූද, රක්ෂණ ඔප්පු හිමියා සමග සෘජු ගිවිසුම්ගත සම්බන්ධතාවක් පවත්වාගනු ලබන්නා වූද රක්ෂණ සමාගම් (තනි පුද්ගලයන්ල ආයතන හෝ සංවිධාන).

### ප්‍රතිරක්ෂණය

එක් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිෂ්ඨාවක් සමග අනෙකුත් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු) එළඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝ මුළුමණින්ම හානිපූරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවකි.

### ප්‍රතිරක්ෂණ කොමිස්

ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

### භාර ගනු ලබන ප්‍රතිරක්ෂණ

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාර ගැනීම.

### භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම.

### ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්

ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ශුද්ධ ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කර ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂකයකුගෙන් ප්‍රාථමික රක්ෂිතයා ලද හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

### සීමිත නියාමන සංචිතය

16 වන විධානයට අනුව සහභාගිත්ව දිගුකාලීන ව්‍යාපාරය හැර කොටස් හිමියන්ගේ අරමුදලට මාරු කරන ලද එක්වරක් පමණක් ලැබෙන අතිරික්තය.

### රඳවා ගැනීම

භාරගනු ලැබූ අවදානමින් රක්ෂණකරු /ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන /පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම වෙනුවෙන් රඳවාගත් ආදායම.

### ප්‍රතිපවරාදීම

ප්‍රතිරක්ෂකයා එහි ඇති අවදානම වෙනත් ප්‍රතිරක්ෂකයෙකු වෙත පැවරීම සිදුකරන ගණුදෙනුවකි.

### නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR)

2015, ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව තක්සේරු කරනු ලබන සහ නිශ්චය කරනු ලබන අවදානම් ප්‍රාග්ධන ගාස්තුවේ මුළු මුදල.

නියමිත අවදානම් ප්‍රාග්ධනය සාමාන්‍ය සහ දීර්ඝකාලීන රක්ෂණය සඳහා වෙන් වෙන්ව ගණනය කරන අතර රක්ෂණය සහ කොටස් හිමියන්ගේ අරමුදල යන දෙකම ඇතුළත් වේ.

(අ) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා:

RCR = [√(ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + වෙළඳපල අවදානම් ප්‍රාග්ධන ගාස්තුව)$^2$+ වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව$^2$+ මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව$^2$]; සහ

(ආ) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා:

RCR = උපරිම {(SVCC,+[√(ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + වෙළඳපල අවදානම් ප්‍රාග්ධන ගාස්තුව)$^2$+ වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව$^2$+ මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව$^2$)

### ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය)

රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම් වලට අදාල තාක්ෂණික ප්‍රතිපාදන අවශ්‍යතාව සැපිරීමට රක්ෂණකරුවකු විසින් වෙන් කල යුතු නිර්බාධිය වත්කම් නිර්ණයට අමතරව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26(1) වගන්තිය යටතේ ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව අර්ථ දක්වා ඇති රක්ෂණකරුවකු විසින් සැපිරිය යුතු පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවමය සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාත අවමයෙහි අවශ්‍යතාවන්

### අතිරික්ත මාරුකිරීම

ජීවගණකඥගේ නිර්දේශය මත පදනම්ව ඔප්පු වගකීම් ඉක්මවා යන අතිරේක වත්කම් ප්‍රමාණය ජීවිත අරමුදලින් කොටස් හිමියන්ගේ අරමුදලට මාරුකිරීම.

### පවාරණ අගය

ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේදී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල. පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මකව පැවතිය යුතුය.

### පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (SVCC)

සියලු රක්ෂණ ගිවිසුම් සමගාමීව පවාරණය වී ඇතිවිට, අත්‍යන්ත හානිකර වාතාවරණයක් පිළිබඳ පවත්නා අවදානම.

### කාලීන රක්ෂණය

කිසියම් කාල පරිච්ඡේදයක් සඳහා හෝ නිශ්චිත වසර, කාලසීමාවකට, ආවරණය සපයා දෙන ජීවිත රක්ෂණ ඔප්පු වර්ගයයි. ඔප්පුවෙහි සඳහන් කර ඇති කාලසීමාව තුළ රක්ෂණකරු මියයාමකදී ඔප්පුව සක්‍රියව පවතින්නේ නම් හෝ

# පාරිභාෂික ශබ්ද මාලාව

බලාත්මකව පවතී නම් මරණ ප්‍රතිලාභය ගෙවනු ලැබේ.

### තාක්ෂණික විධිවිධාන

ස්වකීය රක්ෂණ බැඳියාවන් ඉටුකිරීමට සහ ඔප්පු හිමියන්ගේ සියලුම වගකීම් නිරාකරණය කිරීමට ඔප්පු වල පරිපාලන කටයුතු සඳහා, ප්‍රතිරක්ෂණය සඳහා සහ ඉතිරිව ඇති අවදානම් ආවරණය කිරීම සඳහා වන වියදම් ද වෙනුවෙන් රක්ෂණකරුවකු විසින් වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය වේ.

### පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනය

ක්‍රියාත්මකව පවතින විට සහ ඈවර කිරීමේදී යන අවස්ථා දෙකෙහි සියලු අවස්ථාවන්හි දී රක්ෂණකරුවෙකුගේ අලාභ ආවරණය කිරීම සඳහා පූර්ණ වශයෙන් පවතින ස්ථිර ප්‍රාග්ධනය.

### දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය

පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනයේ සමහරක් අන්තර්ග්‍රහණ ලක්ෂණ මෙහි නොමැති වුවද, ක්‍රියාත්මකව පවතින විට සහ ඈවර කිරීමේදී කිසියම් අලාභ අවශෝෂණයක් සපයා දෙන ප්‍රාග්ධනය.

### පවත්නා මුළු ප්‍රාග්ධනය (TAC)

පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනය සහ දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය එකතු කර, 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය) නීති ප්‍රකාරවල කිසියම් නියමිත අඩුකිරීම් සිදුකිරීමෙන් පවත්නා මුළු ප්‍රාග්ධනය නිර්ණය කරනු ලබයි.

### ප්‍රාරක්ෂණ ලාභය

ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මගින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

### නොඉපැයූ වාරිකය

ගෙවීමට නියමිත ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍ර දිනට අනතුරුව එළඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

### නොඉපැයූ වාරික සංචිතය

දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේදී උද්ගත විය හැකි හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරඹයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

### කල් ඉකුත් නොවූ අවදානම් සංචිතය

ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම්පෑම් වල වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මවා යන ප්‍රමාණය.

### සර්වත්‍ර ආයුකාලය

ආයෝජන ඉතිරිකිරීම් සංරචකය සහ අඩු වාරික සහිත කාලීන ජීවිත රක්ෂණය වැනි ස්ථිර ජීවිත රක්ෂණය, බොහොමයක් සර්වත්‍ර ජීවිත රක්ෂණ ඔප්පුවල නම්‍යශීලී වාරික විකල්පයන් අඩංගු වේ. තවද, සමහරක් තනි වාරිකයක් (එක්වර ගෙවන තනි වාරිකය) හෝ ස්ථිර වාරික (නියමිත ස්ථිර වාරික) අවශ්‍ය කෙරේ.

### පූර්ණ ජීවිත රක්ෂණය

පූර්ණ ජීවිත රක්ෂණය, රක්ෂණය වූ තැනැත්තාගේ ජීවිතය සඳහා ආවරණය සපයයි. මරණ ප්‍රතිලාභයක් ලබාදීමට අමතරව, මුදල් වටිනාකම ක්‍රමයෙන් එක් රැස්වන ඉතිරිකිරීම් සංරචකයක්ද පූර්ණ ජීවිත රක්ෂණයෙහි අන්තර්ගත වේ. මෙම ඔප්පු ස්ථිර හෝ සාම්ප්‍රදායික ජීවිත රක්ෂණ ලෙසින්ද හඳුන්වනු ලබයි.

# පොදු තොරතුරු

## කාර්යාල ලිපිනය

11 වන මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ircsl.gov.lk
වෙබ් අඩවිය : www.ircsl.gov.lk

## නෛතික ස්වභාවය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදි.

## කොමිසමේ අරමුණ සහ වගකීම්

ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

## ගිණුම් වර්ෂය

දෙසැම්බර් 31 දක්වා

## විගණකවරු

විගණකාධිපති

## බැංකුකරුවන්

ලංකා බැංකුව

## විගණන කමිටුව

ඒ.ආර්. දේසප්‍රිය මහතා
ජෙරම් බෝලින් මහතා
ආචාර්ය ඒ. ඒ. ශබීර් ගුලාම්හුසේන්

වයි. කනගසබේ මහතා
ඊ.ඒ.ඩී. පෙරේරා මහතා
උපුල් දේශප්‍රිය මහතා

කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය
ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා
සී.ජේ.කේ. පෙරේරා මහතා

ශ්‍රී ලංකා
රක්ෂණ
නියාමන
කොමිෂන් සභාව

11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9 | ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ircsl.gov.lk | වෙබ් අඩවිය : www.ircsl.gov.lk